# බස්නාහිර පළාතේ පළාත් සභාව
## மேல் மாகாண மாகாண சபை
## WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2013** දෙසැම්බර් **05** වන බ්‍රහස්පතින්දා
**2013 டிசெம்பர் 05 ஆந் திகதி வியாழக் கிழமை**
Thursday 05th December 2013

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බැකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ සභා ගොඩනැඟිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்ல .இல ,டென்சில் கொப்பேகடுவ மாவத்தை ,ஸ்ரீ ஜயவர்த்தனபுர , 204இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.17 ට පළාත් සභාව රැස් විය.**
*மு.ப. .0917* ***க்கு சபை கூடியது***
The Provincial Council met at *09.17* a.m.

**ඒ.එම්. යූසුෆ් ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.**
*கௌரவ உறுப்பினர் ஏ.எம்.யூசுப் அவர்கள் தலைமை வகித்தார்.*
*Hon.Member A.M. Yoosuf in the Chair*

# වාර්ෂික මුදල් ප්‍රකාශය - 2014
## පූර්ණ කාරක සභාව
## ANNUAL FINANCIAL STATEMENT - 2014
## COMMITTEE OF THE WHOLE COUNCIL

***2014 වාර්ෂික මුදල් ප්‍රකාශයේ ප්‍රදානයන් සලකා බැලීම සඳහා පළාත් සභාව පූර්ණ කාරක සභාවක් බවට පරිවර්තනය විය යුතු යැයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා [ඒ.එම්. යූසුෆ් මහතා] විසින් යෝජනා කරන ලදුව, පළාත් සභාව පූර්ණ කාරක සභාවක් බවට පත් විය.***

*Having stated by the Hon. Member in Chair, A.M. Yoosuf that the Provincial Council be converted into a Committee of the Whole Council, in order to consider the grants of the Annual Financial Statement of 2014, the provincial council converted itself into a Committee of the Whole Council.*

| | | |
|---|---|---|
| ශීර්ෂ අංක **- 105** | - | **සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන හා කාන්තා කටයුතු, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යාංශය** |
| ශීර්ෂ අංක **- 116** | - | **සෞඛ්‍ය දෙපාර්තමේන්තුව** |
| ශීර්ෂ අංක **- 117** | - | **ආයුර්වේද දෙපාර්තමේන්තුව** |
| ශීර්ෂ අංක **- 118** | - | **සමාජ සේවා දෙපාර්තමේන්තුව** |
| ශීර්ෂ අංක **- 119** | - | **පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව** |
| Head no - 105 | - | Ministry of Health, Indigenous Medicine, Social Welfare and Women's Affairs, Probation and Child Care Services and Council Affairs |
| Head no - 116 | - | Department of Health |
| Head no - 117 | - | Department of Ayurveda |
| Head no - 118 | - | Department of Social Services |
| Head no - 119 | - | Department of Probation and Child Care Services |

***[සංකේත කපා හැරීම]***
*[Symbolic write-off]*

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "*ශීර්ෂ අංක 105, 116, 117, 118 සහ 119 යන වැය ශීර්ෂයන්ගෙන් රුපියල් 10/- බැගින් අඩු කළ යුතු යැයි*" මම යෝජනා කරනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

වැය ශීර්ෂ පිළිබඳ විවාදය ආරම්භ කරමින් මම මුලින්ම ආරාධනා කරනවා රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියට.

[පූ.භා. 09.20]

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ස්තුතියි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වැය ශීර්ෂ අංක 105, 116, 117, 118 සහ 119 සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමා රක්ෂක, කාන්තා කටයුතු සහ සභා කටයුතු සම්බන්ධ අයවැය විවාදයට සහභාගී වීමට අවස්ථාව ලැබීම ගැන මම ස්තුති කරනවා. පළමුවෙන්ම සෞඛ්‍ය සම්බන්ධයෙන් අපට ලබා දීලා තිබෙන වාර්තාවන් සියල්ලම මා පරිශීලනය කර තිබෙනවා. මෙහිදී මට ප්‍රායෝගික අත්දැකීම් තිබෙන රෝහල් සම්බන්ධයෙන් කථා කළොත්, විශේෂයෙන්ම මීගමුව මූලික රෝහල යම්තාක් දුරකට මේ පළාත් සභාවලට පැවරීමෙන් පස්සේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ යම්කිසි ඉදිරි ගමනක් යෑමට උත්සාහ ගත්තත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රෝහලකට ඇතුළත් වන රෝගියෙකුට අවශ්‍ය කරන බෙහෙත් සපයා දීමට තවමත් අපේ පළාත් සභාව සමත් වෙලා නැහැ. යම් යම් බෙහෙත් වර්ග අදටත්

[ ගරු රෝස් ප්‍රනාන්දු]

මේ රෝහල්වලට ප්‍රමාණවත් පරිදි සැපයීමට අපේ සෞඛ්‍ය අමාත්‍යාංශය අසමත් වී තිබෙනවා. ඒත් එක්කම රෝග නිශ්චය කිරීම සම්බන්ධයෙන් කථා කළොත් මේ රෝහල්වල අවසාන රෝග නිශ්චයක් ලබා ගන්න නොහැකි තත්ත්වයක් තිබෙන්නේ. මොකද, පසුගිය අවස්ථාවකවත් රෝහලේ MRI Scanner, සම්පූර්ණ පරීක්ෂණයක් සඳහා අවශ්‍ය කරන උපකරණ නොමැති බවට දැන ගන්නට ලැබුණා. මෙහිදී යම්කිසි ආර්ථික හැකියාවක් නැති පුද්ගලයින්ට සිද්ධ වෙනවා, තමන්ගේ රෝග නිශ්චය සඳහා පෞද්ගලික වෛද්‍යවරුන්ගේ නිර්දේශය ලබා ගන්න යන්න. නමුත් ඔවුන්ට මූල්‍යමය හැකියාව නැත්නම් ඒ රෝගියා එතැනින්ම අසරණ වෙලා නිදහස් සෞඛ්‍ය සේවයේ ප්‍රතිඵල භුක්ති විඳීමට නොහැකි තත්ත්වයක් මතු වෙලා තිබෙනවා.

ඒත් එක්කම මීගමුව රෝහල ගත්තාම ශීතාගාර පහසුකම්වල විශාල ප්‍රශ්න රාශියක් තිබුණා. ශීතාගාර පහසුකම් ක්‍රමානුකූලව නොමැති වීම නිසා පසුගිය කාලේ රාගම රෝහලට මෘත ශරීර එවන්න සිද්ධ වුණා. මම අවස්ථා කිහිපයකදීම අපේ ගරු ඇමැතිතුමාගේ අවධානයට මෙයත් යොමු කළා. දැනට තිබෙන පහසුකම් ඉතාම සීමිත සහ ප්‍රමාණවත් නොමැති තත්ත්වයක් තිබෙන්නේ. ඉතින් මේ සම්බන්ධයෙනුත් අපි විශේෂයෙන්ම ලබන වසර සඳහා අවධානය යොමු කළ යුතු වෙනවා. ඒත් එක්කම මා ප්‍රායෝගිකව ගිහිල්ලා බලපු අවස්ථාවක, මෝචරිය කියලා අපි හඳුන්වන ස්ථානයේ හදිසි මරණ පරීක්ෂකවරු ඇවිල්ලා කටයුතු කළාම, අත සෝදා ගන්නවත් සබන් කැටයක් තිබුණේ නැති තත්ත්වයක් තමයි මීගමු රෝහලේ මට දැක ගන්නට ලැබුණේ. පෞද්ගලිකවම මා සහභාගී වුණු අවස්ථාවක. මෙහිදී මම දැක්කා ඉතාම පරණ කියත් පටි. යම්කිසි රෝගයක් නිශ්චය කර ගැනීමට කපලා පෙන්වන්න අවශ්‍ය කරන අවස්ථාවලදී අවුරුදු ගණනක් මළකඩ කන ලද තත්ත්වයේ උපකරණ තමයි මට දකින්න හම්බ වුණේ. ඉතින් සෞඛ්‍ය සේවය ගැන අපි ලස්සන පොත් ගහලා ලස්සන නම්වලින් විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කළත් මේ අඩුපාඩු ගැනත් අපි විශේෂයෙන් සැලකිලිමත් වෙන්න අවශ්‍යයි.

ඒත් එක්කම සමාජ සුභ සාධනය කියන ක්ෂේත්‍රයට අවධානය යොමු කළොත් සමාජ සුභ සාධනයේදී ඉතාම කුඩා ළමුන් සහ වැඩිහිටි අංශයේ යම්කිසි අවධානය යොමු වීමක් තිබෙනවා. නමුත් මට නිරීක්ෂණය කරන්න හම්බ වෙලා තිබෙනවා, කාන්තාවන්ගේ සුභසාධන කටයුතුවලදී යම්කිසි නිශ්චිත වයස් මට්ටමක් පසු කරලා වුණත් පවුලේ රැකවරණයක් නොමැතිව අසරණ වන අවස්ථාවලදී එවැනි අයට සම්බන්ධ වෙන්න රජයේ කිසිම වැඩ පිළිවෙළක් නැහැ. ඒ කියන්නේ, බාල වයස් දරුවන් සම්බන්ධයෙන් ළමා නිවාස තිබෙනවා. රෝගී තත්ත්වයන්ට පෞද්ගලික හෝ වැඩිහිටි නිවාස තිබෙනවා. නමුත් සමහර කාන්තාවන් ලිංගිකමය වශයෙන් අතවරවලට ලක් වෙලා නිවාස හෝ ගම්මානවල ජීවත් වෙන්න බැරි පරිසරයක් ඇති වුණොත් යම්කිසි මුදලක් ගෙවලා හරි ආරක්ෂාවක් ඇතුව නැවතිලා ඉන්න යම්කිසි ස්ථානයක් නොමැති අඩුපාඩුවක් තිබෙනවා. මම ඒ ගැනත් ඔබතුමා හරහා ගරු ඇමැතිතුමාගේ අවධානයට යොමු කරනවා. ඒත් එක්කම සමාජ සුභ සාධනයේදී විශේෂයෙන්ම අවධානය යොමු කරන්න ඕනෑ. අද විශාල වශයෙන් ශ්‍රී ලංකාව මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීමේ තර්ජනයක් තිබෙනවා. අද සෑම ගමකම හැම අස්සක් මුල්ලක් නෑරම මත්ද්‍රව්‍ය පැතිරිලා. මතට තිත කියලා ව්‍යාපෘතියක්, මෙතුමා ඉදිරිපත් කරපු 2014 අයවැය විවාදය සම්බන්ධයෙන්ම මුද්‍රණය කරපු පොතේ 49 වැනි පිටුවේ 15 වැනි ඡේදයේ සඳහන් වෙනවා,

මතට තිත අරමුණ, *මත්ද්‍රව්‍ය භාවිතය අවම කිරීම සඳහා ක්‍රියාත්මක කරන වැඩ සටහනකි.*

කෙසේ වෙතත් ලංකාවේ වැඩිම මත්ද්‍රව්‍ය ප්‍රමාණය ගෙන ඒම සම්බන්ධව විවිධ මතවාද තිබෙනවා. දැන් මේ අසු වුණු මත්ද්‍රව්‍ය ප්‍රමාණය සම්බන්ධයෙන් විවිධ ප්‍රශ්න මතු වෙලා තිබෙනවා. ඒවායේ ප්‍රමාණය අඩුවීමක් වෙලා තිබෙනවා. නීති කටයුතු කිරීමේදී රාජ්‍ය අනුග්‍රහය ලබන විවිධ පුද්ගලයින්ගේ මැදිහත් වීම සිද්ධ වෙලා තිබෙනවා කියන එක දැන ගන්න ලැබිලා තිබෙනවා. මතට තිත කියන එක පොතට සීමා වෙන්නේ නැතුව, හැබෑවටම මතට තිතක් ක්‍රියාත්මක වෙන්න ඕනෑය කියන එක විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් වශයෙන් ඔබතුමා මගින් ගරු ඇමැතිතුමාට යෝජනා කරනවා. විශේෂයෙන්ම, බස්නාහිර පළාත තමයි දැනුමෙන් පරිපූර්ණ, රටට විශාල මෙහෙවරක් කරන්න පුළුවන් පිරිසක් බිහි කරන පළාත් සභාව. එහෙම නම් මේ පළාත් සභාව ඇතුළේ මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් අපි කුමන පිළියමක්ද යොදන්නේද කියන එක සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු වෙන්න අවශ්‍යයි. අනාගතයේ ඉංජිනේරුවරු, එහෙම නැත්නම් විද්‍යාඥවරු, නීතිඥවරු,

ගණකාධිකාරීවරු වශයෙන් බිහි වෙන්න ඉන්න තරුණ පරම්පරාවයි මේකට ඇබ්බැහි වෙන්නේ. අද උස් පහත් භේද නැහැ. දුප්පත්ද, පොහොසත්ද කියලා නැහැ. සෑම තරාතිරමකම දරුවෙක් මෙම භයානක තත්ත්වයට ගොදුරු වීමේ ප්‍රවනතාවය වැඩි වෙලා තිබෙනවා. එහෙම නම් මේ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වනකොට ඒ මත්ද්‍රව්‍ය ගෙන එන්න රජයෙන් අනුග්‍රහය දක්වනවා නම්, එහෙම නැත්නම් ඒ සම්බන්ධව අනුබල දීමක් තිබෙනවා නම්, ඒ සම්බන්ධයෙන් වැට බැඳීම පළමුවෙන්ම කරන්න අවශ්‍යයි.

ඒත් එක්කම මෙවැනි දේවල්වලින් ඇති වන විපාක සම්බන්ධයෙන් පාසල් තුළදීම දැනුවත් කරලා ඒ සම්බන්ධයෙන් විවිධ තොරතුරු ලබා ගැනීමේ උපාය දූතයන් මේ අමාත්‍යාංශය මගින් පත් කරන්න අවශ්‍යයි. රජයේත්, පොලිස් නිලධාරීන්ගෙනුත් සියයට සියයක් සේවය සිදු වෙනවාද? සමහර විට ඒ අය කරන්නේ පාරේ ඉන්න කවුරු හරි කෙනෙක් අල්ලගෙන ගිහිල්ලා නඩුවක් දානවා කුඩු තිබුණාය කියලා. තරහකාරයෙක් හිටියොත් එයාවත් අල්ලගෙන යනවා. නමුත් ඒ මාර්ගයෙන් මේ මත්ද්‍රව්‍ය භාවිතය අවම කර ගන්න අපට කිසිම හැකියාවක් ලැබෙන්නේ නැහැ. ඒ නිසා එයට විධිමත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වීම අවශ්‍යයි කියලා මා යෝජනා කරනවා.

ඒත් එක්කම පරිවාස, ළමා රක්ෂක කටයුතු සම්බන්ධයෙන් කථා කරනකොට අපි දැක්කා, පසුගිය කාලේ පරිවාස කටයුතු භාර අපේ යම් යම් ආයතනවල මේ ළමයින් නවාතැන් අරගෙන, ළමයින්ව හදලා වඩලා සමාජගත කරන ආයතන තුළ සිද්ධ වුණු සිදුවීම් රාශියක්. ඒ පිළිබඳව විවිධ පුවත්පත්වල, ඒත් එක්කම ජනමාධ්‍ය මගින් අපට හෙළිදරව් වුණා. මෙහි තිබුණු ප්‍රධානම දේ තමයි නිසි අධීක්ෂණයක් නොමැති වීම හේතුවෙන් වසර ගණනාවක් විවිධ ලිංගික අපයෝජනයන්ට, එහෙම නැත්නම් දරුවන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත නොවන වටපිටාවක් තුළ තමයි මේ ආයතන ක්‍රියාත්මක වෙලා තිබුණේ. ඇතැම් ආයතන සම්බන්ධයෙන් නඩු පැවරීමටත්, ඒවා යම් යම් ස්ථානවලින් ඉවත් කිරීමටත්, වෙනත් ස්ථානවලට ඒ දරුවන් ස්ථානගත කිරීමටත් සිද්ධ වුණා. මෙවැනි තත්ත්වයන් සම්බන්ධයෙන් ඔබතුමා මාර්ගයෙන් මේ ඇමැතිතුමාගේ අවධානය මම යොමු කරන සිටිනවා.

ඒත් එක්කම අපි දේශීය වෛද්‍ය අංශය සම්බන්ධයෙනුත් යමක් කථා කරන්න අවශ්‍යයි. මේ දේශීය වෛද්‍ය අංශය ලංකාවට ආවේණිකව අනන්‍යතාවයක් පවත්වාගෙන යන වෛද්‍ය ක්‍රමයක්. අපි දන්නවා ශ්‍රී ලාංකික සමාජය අතර පමණක් නොවෙයි, විදේශීය ප්‍රජාවගේ පවා පිළිගැනීමක් තිබෙනවා. අතුරු ප්‍රතිඵල අඩු යම්කිසි බෙහෙතක් කිරීමෙන් වෙනත් රෝගයක් වැළඳීමේ ප්‍රවණතාවය අඩු වෛද්‍ය ක්‍රමයක් විධියට හඳුනාගෙන තිබෙනවා. නමුත් මේ දේශීය වෛද්‍ය අංශය ප්‍රචලිත කිරීමේ උත්සාහයක් අරගෙන තිබුණත් අපට ලබලා දීලා තිබෙන මේ මුද්‍රිත පත්‍රිකාව අනුව සුව පියස, සුවපස, සුවනාරි, රුවනාරි, ෂඩ්රස අසිරිය, හෙළ වෙද මහ සෘෂි, බෝධිනී, අරුළු - බුළු, දත් කැකුළු පාලා, හෙළ ඔසුවෙන් දිවි නැඟුමට, උත්තම ශ්‍රම පූජා ආදී විවිධ වැඩ සටහන් රාශියක් ක්‍රියාත්මක කරලා තිබුණත් මෙම ආයුර්වේද ඖෂධ පැළෑටිවල තිබෙන ගුණාත්මක භාවය සම්බන්ධයෙන් විධිමත් ප්‍රචාරණයක් කරලා, මෙම ඖෂධවල ප්‍රචාරයෙන් පස්සේ විදේශිකයින් පවා මේකට ඇදෑ ගන්න පුළුවන් ක්‍රමයක් අපි සූදානම් කළොත් අපට පුළුවනි මේ හරහා විදේශ විනිමය ලංකාවට ගෙන්න ගන්න. අපි උනන්දු වුණොත්.

අපේ ඉතාම වැදගත් ප්‍රතිකාර ක්‍රම රාශියක් තිබෙනවා. සමහර විට බටහිර වෛද්‍ය ක්‍රමයෙන් සුව කර ගන්න බැරි රෝග පවා මේ දේශීය වෛද්‍ය ක්‍රමයෙන් සුව කර ගන්න පුළුවන්, අතුරු ආබාධ රහිතව. ඉතින් මේ සම්බන්ධයෙන් ඔබතුමා හරහා අමාත්‍යතුමාට මම යෝජනාවක් කරනවා. විශේෂයෙන්ම ලංකාවට විදේශ විනිමය ඇද ගැනීමේ ක්‍රමයක් හැටියට මේක දියුණු කරන්න පුළුවන් තත්ත්වයක් තිබෙනවා. මේ සම්බන්ධයෙන් දැනටම විශාල වශයෙන් නිර්මාණය වෙලා තිබෙන හෝටල්වල එහෙම නැත්නම් තරු පහේ හෝටල්වල පවා සම්බාහන ක්‍රම ක්‍රියාත්මක වෙනවා. ඒ සම්බන්ධයෙන් විදේශිකයින්ගේ ඇල්මක්, නැඹුරුවක් තිබෙනවා. ඒ අනුව කුමන තත්ත්වයෙන් සංඛ්‍යා ලේඛන මේ පොත්පත්වල මුද්‍රණය කළත් මේ විෂයයන් සම්බන්ධයෙන් ගුණාත්මක භාවය ගැන අපි නැවත අවධානය යොමු කරන්න ඕනෑ. එසේ කියමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[පූ.භා. 09.30]

**ගරු සන්ධ්‍යා සිරිවර්ධන**
Hon. Sandya Siriwardana

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන සහ කාන්තා කටයුතු වැය ශීර්ෂ

[ ගරු සන්ධ්‍යා සිරිවර්ධන]

අංක 105, 116, 117, 118, 119 යටතේ කථා කිරීමට අවස්ථාවක් ලබා දීම පිළිබඳව පළමුවෙන්ම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම පළමුවෙන්ම කියන්න ඕනෑ, අපේ තිබෙන අමාත්‍යාංශ අතරින් ඉතාමත්ම වැදගත් වූ අමාත්‍යාංශයක් ලෙස අපේ සෞඛ්‍ය අමාත්‍යාංශය නම් කරන්න පුළුවනි. මොකද, ශ්‍රී ලංකාව දියුණු වන රටක් හැටියට, සංවර්ධනය වෙමින් පවතින රටක් හැටියට ගත්තාම අපි මොන සංවර්ධන කටයුතු කළත් අපට අපේ සෞඛ්‍ය තත්ත්වය නැත්නම් ජන ජීවිතය නඟා සිටුවීමට, අපේ ජීවනාලිය බඳු ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය යහපත් නැත්නම් ඒකෙන් ඇති වැඩක් නැහැ. ඉතින් මම හිතනවා, අපේ තිබෙන අමාත්‍යාංශ අතරින් වැදගත්ම අමාත්‍යාංශයක් වන මේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ තිබෙන්නා වූ භාරධූර කර්තව්‍යය අපගේ ගරු අමාත්‍ය ජගත් අංගගේ මැතිතුමන් මේ විෂය භාර අරගෙන, ඒ මුදල් ප්‍රතිපාදන කළමනාකරණය කරගෙන, මේ වනකොට වසර 05 කට ආසන්න කාලයක් අපත් සමග ඉතාමත්ම හොඳින් කටයුතු කර තිබෙනවා. අපේ රෝහල් ගත්තාම, අපේ රෝහල් පද්ධතියේ මූලික රෝහල් තිබෙනවා. ප්‍රාදේශීය රෝහල්. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය යටතේ පවත්වාගෙන යන අංශ. අප ප්‍රදේශයේ අත්තනගල්ල කොට්ඨාශයේ තිබෙන වතුපිටිවල රෝහල ගත්තාම අද ඉතාමත්ම හොඳ තත්ත්වයක පවතිනවා කියලා මට මේ අවස්ථාවේදී සඳහන් කරන්න පුළුවන්. මොකද, නිතරම මොකක් හරි අඩුපාඩුවක් කිව්වාම අපේ අමාත්‍යතුමන් ඒ ප්‍රදේශයට ඇවිල්ලා - මට මතකයි ගිය මාසේ දවසකත් අපේ මළ අපවාහන පද්ධතිය අබලන් වෙලා තිබෙන අවස්ථාවක පෞද්ගලිකවම ඇවිල්ලා ඒ කටයුතු සොයා බලා අවශ්‍ය කටයුතු සම්පාදනය කරලා, ඒ කරුණු කාරණා ගැන සොයා බලා කටයුතු කළා. ඒ වාගේම මෙතෙක් අඩුපාඩුවක්ව පැවැති වතුපිටිවල මූලික ප්‍රතිකාර ඒකකය දැන් විවෘත කිරීමට සූදානමින් තිබෙනවා. ඒ සම්බන්ධව මම කියන්නේ, ප්‍රාදේශීය රෝහලුත් ඉතාමත් යහපත් මට්ටමකින් පවතිනවා. සුළු සුළු අඩුපාඩුකම් තිබුණත් මම හිතන්නේ ඒවා ඉතාමත් හොඳින් පාලනය කරගෙන යන තත්ත්වයක් තිබෙනවා කියන එක මම මේ අවස්ථාවේදී කියනවා.

ඒ වාගේම 2013 වසර තුළ අමාත්‍යාංශය හරහා අපට ලැබුණු ප්‍රතිපාදන සහ අපේ ප්‍රතිපාදන තුළින් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය හරහා, MOH කාර්යාල හරහා විශේෂ වැඩ සටහන් කිහිපයක් අපි ක්‍රියාත්මක කළා. ඒ පිළිබඳව අගය කිරීමක් කරන්න ඕනෑ. මොකද, බෝ නොවන රෝග. රෝගයක් හැදෙන්න ඉස්සෙල්ලා බෝ නොවන රෝග තත්ත්වයට යන්නට. මොකද, බෝ නොවන රෝග තුළින් තමයි 80% කින් පමණ මරණ සංඛ්‍යාව වැඩි වෙලා තිබෙන්නේ. ඒ සම්බන්ධව අපි විශේෂ සායන පැවැත්වූවා අත්තනගල්ල කොට්ඨාශය පුරාවටම. ඒ අතරින් සුව සහන කම්ටු හැම පවුල් සෞඛ්‍ය නිලධාරී කොට්ඨාශයක් තුළම එක බැගින් පිහිටුවලා ඒ තුළින් ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය නංවාලීමට අවශ්‍ය කටයුතු සොයා බලමින් බෝ නොවන රෝග, දියවැඩියාව, කොලෙස්ට්‍රෝල්, අධික රුධිර පීඩනය ආදී කටයුතු සොයා බලා අවශ්‍ය වෛද්‍ය ප්‍රතිකාරවලට හුඟක් දෙනෙක් යොමු කළා. මම හිතනවා, ගම්බද ප්‍රදේශවල විශාල වශයෙන් දියවැඩියා රෝගීන්, කවදාවත් රුධිර පරීක්ෂාවකට ලක් නොවුණු, රුධිරයේ සීනි ප්‍රමාණය 200, 300 දක්වා වැඩි වූ රෝගීහු අපට හම්බ වෙලා ඒ අවස්ථාවේදීම රෝහල්ගත කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කළා.

ඒ වාගේම අපි දන්නවා, උත්තම ශ්‍රම පූජා වැඩ සටහනට සමගාමීව පාසල්වල මේ වැඩ සටහන ක්‍රියාත්මක කළා. ඉතාමත්ම ජනප්‍රිය වැඩ සටහනක්. ගුරුවරුන්ගේ සෞඛ්‍ය තත්ත්වය නංවාලීම සඳහා අපි ඒ වැඩ සටහන කළා. ඒක අවසානයේ අපි දෙමව්පියන් දැනුවත් කිරීමේ විශේෂ පෝෂණ වැඩ සටහනකුත් ක්‍රියාත්මක කළා. ඒ වාගේම පැවිදි පක්ෂය වෙනුවෙන් පැවිදි සුව පියස වැඩ සටහන මේ වනකොට - තවමත් අපට ක්‍රියාත්මක කරන්න වැඩ සටහන් දෙකක් තිබෙනවා. භික්ෂූන් වහන්සේලාගේ හිතසුව පිණිස ඒ අවශ්‍ය කටයුතු ඒ වාගේම රුධිර පරීක්ෂාවල් කරලා මම හිතන්නේ, මෙතෙක් සිද්ධ වෙලා නොතිබුණු දෙයක්. ඒ සම්බන්ධව අපේ ස්වාමීන් වහන්සේලා ඉතාමත් අගය කිරීමක් කළා. මේ වාගේ වැඩ කටයුතු රාශියක් මේ වනකොට MOH කාර්යාල හරහා සිදු කර තිබෙනවා.

ඒත් එක්කම සොඳුරු ළමාවිය සුරකිමු තුළින් මේ වනකොට පෙර පාසල් දරුවන්ගේ මුඛ සෞඛ්‍ය නංවාලීම සඳහා විශේෂ වැඩ සටහන්. දරුවන්ගේ මුඛ සෞඛ්‍ය තුළින් නරක් වෙලා තිබෙන දත් ඉවත් කරලා, ඒ වාගේම දෙමව්පියන් විශේෂ දැනුවත් කිරීමක් ඒ සම්බන්ධවත් කළා. ඉතින් මේ වැඩ සටහන් ඉතාමත් ජනප්‍රියව තිබෙනවා කියලා මේ අවස්ථාවේදී කියන්න පුළුවන්. එතැනදී ඇති වුණු ප්‍රධාන ගැටළුවක්ව තිබුණේ, සීමාසහිත ප්‍රමාණයකට තමයි

මෙම අවස්ථාවන් සලසා දෙන්න තිබුණේ. සියයක් වාගේ තෝරා ගත් පිරිසකට. මම ඔබතුමා මාර්ගයෙන් අපේ ගරු ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ලබන වසරේදී මේ වැඩ සටහන් සඳහා ජනතාවගේ නැඹුරුව වැඩි නිසා තව ටිකක් වැඩියෙන් ප්‍රතිපාදන ලබා දෙන්න කියලා. මොකද, ජනතාවගේ හිත සුව පිණිස කරන්නා වූ විශේෂ මෙහෙයක් කොට මම ඒ අවස්ථාව සලකනවා. මොකද, බෝ නොවන රෝග තුළින් ජනතාව දැනුවත් කරලා ඒ තුළින් රෝහල්ගත වන ප්‍රමාණය විශාල වශයෙන් අඩු කර ගත හැකි නිසා. ඒ වාගේ මාතෘ සායන ගත්තාම ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ අපට, ගිය වසරේ මාතෘ සායන දෙකක් අලුතෙන් හදලා දුන්නා.

ඒ වාගේම මේ වසරේදීත් අපේ තිහාරිය ප්‍රදේශයේ, වේයන්ගොඩ ප්‍රදේශයේ මාතෘ සායන දෙකක කටයුතු නිම වෙමින් තිබෙනවා. මේ දෙසැම්බර් මාසය අවසානය වෙද්දී ඒ දෙකේත් වැඩ කටයුතු අවසන් කරලා ජනතාවගේ ප්‍රයෝජනය සඳහා අත්පත් කර දෙන්න සූදානම් කරලා තිබෙනවා. ඒ වාගේම මෙම කටයුතුවලදී සුව සහන කමිටු පිහිටුවීම තුළින් මම හිතනවා අපේ ග්‍රාමීය ජනතාවගේ - මෙතෙක් නොවුණු දෙයක්. ග්‍රාමීය ජනතාවගේ නීරෝගී තත්ත්වය ඇති කර ගන්න හිත සුව පිණිස කරන්නා වූ මේ සුව සහන කමිටුව තුළින් ගමේ ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය සොයා බලා ඒවා ඉදිරියට වාර්තා කරන්න, අපි මාසයකට දෙකකට සැරයක් ඒ සුව සහන කමිටු රැස් වෙලා ගමේ අවශ්‍ය කටයුතු කරනවා. ඉතින් මේ සියලුම කටයුතුවලදී විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙන්න ඕනෑ - අපට හොඳ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීතුමෙක් ඉන්නවා. වෛද්‍ය ජයනාත් මැතිතුමා. අපි මුදල් ප්‍රතිපාදන වෙන් කරපුවාම එතුමා මේ කටයුතු පිටුපස ඉඳිමින්, අපේ පවුල් සෞඛ්‍ය සේවිකාවන් සමග ඒකරාශී වෙලා ඉතාමත් හොඳින් ඒ කටයුතු සම්පාදනය කරලා තිබෙනවා. අපට ගිහිල්ලා නිරීක්ෂණය කරන්න විතරයි තිබෙන්නේ. අවසාන වශයෙන් මම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මාර්ගයෙන් ගරු ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ ලබන වසරේදීත් මේ වාගේ වැඩ සටහන් තව තවත් දියත් කරන්න. අවශ්‍ය උපකරණ ගන්නට සහ ඒ මගින් වැඩි ප්‍රතිලාභයක් ලැබෙන නිසා වැඩිපුර මුදලක් යොදවන්න.

ඒ වාගේම ආයුර්වේදය ගැන කථා කරනකොට විශේෂයෙන්ම අපේ රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය කිව්වා වාගේ සංචාරකයින් විශාල වශයෙන් ඇද ගන්න පුළුවන් අවස්ථාවක් වෙනවා. ඒ වාගේම අපේ ප්‍රදේශයේ, දිවුලපිටිය කොට්ඨාශයේ අකරගම ආයුර්වේද රෝහලක් ඉදි කරලා තිබෙනවා. ගියවර පළාත් සභාවේ සෞඛ්‍ය ඇමැතිතුමා ලෙස ප්‍රසන්න රණතුංග මැතිතුමා සිටින කාලේ මගේ ඉල්ලීමක් අනුව කරපු දෙයක් ඒක. මේ වසර වනකොට ඒක හදලා ඉවර කරලා තිබෙනවා. ලබන සතියේ ඒක විවෘත කරන්න අවස්ථාව සලසාගෙන තිබෙනවා. විශේෂයෙන්ම මේ කටයුත්ත සඳහා අපට විශේෂයෙන් දායකත්වය ලබා දුන්නා ආයුර්වේද කොමසාරිස් නිමල් කරුණාසිරි වෛද්‍යතුමන්. ස්තුතිවන්ත වෙනවා.

ඒ වාගේම කාන්තා කටයුතු පැත්ත පිළිබඳව කථා කරන විට ජනගහනයෙන් 53% කට වැඩි කාන්තා පිරිසක් ශ්‍රී ලංකාව තුළ සිටිනවා. ඒ කාන්තාවන්ගේ ගෘහ ආර්ථිකය ශක්තිමත් කර ගැනීම සඳහා මේ වනකොට අපේ අමාත්‍යාංශය හරහා මැහුම්, තිර රෙදි, බෑග්, සෙරෙප්පු, කෙටි කෑම, කේක්, විසිතුරු අත්කම් වාගේ පාඨමාලා නිරන්තරයෙන් පවත්වනවා. ඉතින් මේ කටයුතු සොයා බැලීම සඳහා අපට දිස්ත්‍රික් වනිතා ව්‍යාපෘති නිලධාරීන් දෙදෙනයි ඉන්නේ. දිස්ත්‍රික්කයකට එක නිලධාරියෙක් බැගින් පත් කරන්න කියලා අපි ගිය වසරේදීත් ඉල්ලුවා. ලබන වසරේ ඒක ලබා දෙනවා නම් මීට වඩා කාර්යක්ෂම සේවාවක් අපට කර ගන්න පුළුවන් කියලා මම හිතනවා. ඒ වාගේම මම ඉල්ලීමක් කරනවා, මේ නිෂ්පාදනය කරන ද්‍රව්‍ය අලෙවිය සඳහා අපගේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලට එක වෙළෙඳ අලෙවි සැලක්වත් ලබා දෙන්න කියලා. ඒ වාගේම මේ වසර පහ තුළ අපත් සමග එකතුව මේ කටයුතු සඳහා විශේෂ දායකත්වයක් ලබා දෙන්න කටයුතු කරපු ගරු අමාත්‍ය ජගත් අංගගේ මැතිතුමාට, ලේකම්තුමා ප්‍රමුඛ කාර්ය මණ්ඩලයට ස්තුතිවන්ත වන අතර, අපේ පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂ අමල් හර්ෂ වෛද්‍යතුමාට විශේෂ ස්තුතියක් කරන්න ඕනෑ. මොකද, එතුමා මහජන නියෝජිතයන් විධියට අපට සලකලා කරන්න තිබෙන කාර්ය භාරය රෝහල් කටයුත්තක් දුරකථනයකින් දැනුම් දුන්නත් එහෙම නැත්නම් නිලධාරීන්ගේ මොකක් හරි අවශ්‍යතාවයක් කිව්වාම අපි වෙනුවෙන් ඒක විශේෂයෙන් සලකා කර දෙනවා. ඒ අතරම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂතුමන්ලාට, ආයුර්වේද කොමසාරිස් වෛද්‍ය නිමල් මැතිතුමා ඇතුළු සියලුම නිලධාරී මණ්ඩලයට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

[පූ.භා. 09.40]

**ගරු සිසිර ජයකොඩි**
Hon. Sisira Jayakody

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බස්නාහිර පළාතේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන අමාත්‍යාංශ වැය ශීර්ෂයට අපේ අදහස් එක් කරද්දී විශේෂයෙන්ම පසුගිය කාල පරිච්ඡේදය තුළ ගරු අමාත්‍ය ජගත් අංගගේ මැතිතුමා ඒ වාගේම අමාත්‍යාංශ ලේකම්තුමා, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂතුමා ඇතුළු සියලු දෙපාර්තමේන්තු ප්‍රධානීන්, සෞඛ්‍ය අමාත්‍යාංශය ඇතුළු අනෙකුත් අමාත්‍යාංශ මඟින් විශිෂ්ට කාර්යයක් සිදු කළයි කියන එක ඉතාමත් ඕනෑකමින් මතක් කර සිටිනවා. අපි නිදහස ලබා ගැනීමෙන් පස්සේ අපේ රටේ සංවර්ධන උපාය මාර්ගයේ සුවිශේෂ ලක්ෂණ කිහිපයක් තිබුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ තමයි සමාජ සුභසාධන ව්‍යාපාරය නොනැසී පවත්වාගෙන යාම. නිදහස් අධ්‍යාපනයත්, නිදහස් සෞඛ්‍ය සේවයත් ඒ තමයි අපේ රටේ ජාතිය රටක් ලෙස රටේ ජනතාව ඉහළට ඔසවා තබපු මහ විශාල සමාජ සත් ක්‍රියාදාමය. එහි භෞතික ප්‍රතිඵල අද මේ වනවිට අපි ලබමින් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ජාතික සෞඛ්‍ය සේවයේ සමාජ සුභසාධන ව්‍යාපාරය විසින් අපේ රටේ සමස්ත ජාතිය දකුණු ආසියාවේ අනෙකුත් රටවල් අභිබවා ගිය ඉමහත් වැදගත් සෞඛ්‍ය සම්පන්න මිනිසුන් පිරිසක් බවට පරිවර්තනය කරන්නට හැකියාව අපට ලැබිලා තිබෙනවා. ළදරු මරණ අනුපාතය අතින් අවම, ප්‍රසූතියේදී මව්වරුන්ගේ මියයාම අඩු රටක් බවට ලෝකයේ සංවර්ධනය වුණු රටවල් හා සමාන සුවිශාල ජයග්‍රහණ ජාතියට අත්පත් කර ගන්න අපට හැකියාව ලැබිලා තිබෙනවා. ඒ වාගේම වසංගත රෝග, බෝ වන රෝග හැකිතාක් අවම කර ගත්තු රටක් බවට පරිවර්තනය කරන්න පුළුවන්කම ලැබිලා තිබෙනවා. විශේෂයෙන්ම පුද්ගල ආයුෂ ප්‍රමාණය වැඩි කර ගන්න හැකියාවක් ලැබුණු රටක් බවට අපි පරිවර්තනය වෙලා තිබෙනවා. ඒ නිසා ආසියාවේ ඇතැම් රටවල් ප්‍රාග්ධන ආයෝජනවලට යද්දී ඒ ආයෝජනය කරන රටවල් අපේ ආර්ථිකයේ සිදු කරන සමාජ සුභසාධන වැඩි වියදම් පිළිබඳව හිනා වෙවී කථා කරන ඉතිහාසයක් තුළ අපේ ජාතිය ලබා ගත්තු ජයග්‍රහණය තමයි, සෞඛ්‍ය සේවය විසින් ලබා දීපු සහ නිදහස් අධ්‍යාපනය විසින් ලබා දීපු ජයග්‍රහණ. ඒ නිසා ඒ සමාජ සුභසාධන ව්‍යාපාර එලෙසින් පවත්වාගෙන යන්න අතිගරු ජනාධිපතිතුමා ප්‍රමුඛ රජයත්, ඒ වාගේම බස්නාහිර පළාත් සභාව විධියට අපේ පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයටත් හැකියාව ලැබිලා තිබෙනවා. ඒ නිසා තමයි අද පෞද්ගලික අංශය හා තරගකාරී විය හැකි රෝහල් පද්ධතියක් අපට ජනිත වෙලා තිබෙන්නේ. ඉස්සර රෝහලක් ළඟින් යනකොට නාස් හකුලාගෙන යන මිනිස්සු අද රජයේ රෝහලකට යන්නේ ඉතාම ප්‍රියමනාපව. විශේෂඥ වෛද්‍යවරු Channel සේවය යටතේ විශාල මුදලක් අය කරද්දී එවැනිම සේවයක් අපේ රාජ්‍ය සේවය තුළ සියලුම රාජ්‍ය සේවකයින්, වෛද්‍යවරුන්, අනෙකුත් කාර්ය මණ්ඩල ඉෂ්ට කරන බව ඉතාම ඕනෑකමින් මතක් කරනවා. අපි ඡන්ද කාලෙට මිනිස්සුන්ගේ ගෙවල්වලට යද්දී අපි දන්නවා, මිනිස්සු අපට මෙහෙම කියනවා, ආණ්ඩුවෙන් කියලා අපට කිසි දෙයක් හම්බ වුණේ නැහැ. තහඩු කෑල්ලක්වත් හම්බ වුණේ නැහැයි කියලා අපට කියනවා. අපි ඒ වෙලාවට දෙන උත්තරය තමයි මන්ත්‍රීවරුන්ගෙන් බලාපොරොත්තු වෙන්නේ තහඩු ලබා ගන්න එක නම් ඒක මහ භයානක කනගාටුදායක තත්ත්වයක්. ඊට වඩා මේ නිදහස් සෞඛ්‍ය සේවය විසින්, නිදහස් අධ්‍යාපනය විසින් අපි ජාතියට තිළිණ කරපු, ලබා දීපු සහනාධාර, ආධාර මොන තරම් තිබෙනවාද? ඒ නිසා එය නොනැසී පවත්වාගෙන යාම ඒවා ආරක්ෂා කර ගැනීම ඉදිරි කාල පරිච්ඡේදයේදී පළාත් සභාව විධියටත් අපේ යුතුමකමක් වෙනවා.

ඒ නිසා තමයි මම කියාගෙන ගියේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂඥ වෛද්‍ය සේවය, ශල්‍යාගාර පහසුකම්, මම ලේඛන ඉදිරිපත් කරන්න යන්නේ නැහැ. මේ පොත්වල සඳහන් වෙලා තිබෙන නිසා. නව ගිලන් රථ සේවාවන්, ඈත දුෂ්කර පළාත්වල ගිලන් රථ නොමැති රෝහල්වලට එවැනි අවශ්‍යතා, හදිසි අනතුරු ඒකක. ඊළඟට විශේෂයෙන්ම පුද්ගලයන්ගේ රෝගී තත්ත්වයන් මැන බැලීම සඳහා යොදා ගන්නා වූ, රෝග පරීක්ෂණ කටයුතු සඳහා අදාළ වන්නා වූ උපකරණ පද්ධති මේ සියල්ල දියුණු කරන්න, නවීන මාතෘ නිවාස ඉතා හොඳ තත්ත්වයේ, දියුණු රටවලට අභියෝග කළ හැකි තත්ත්වයේ සෞඛ්‍ය සේවයේ සුවිශේෂ ප්‍රගමණයක් පසුගිය කාල පරිච්ඡේදය තුළ ඇති කරන්න බස්නාහිර පළාතේ සෞඛ්‍ය අමාත්‍යාංශයටත්, අපේ ඇමැතිතුමාටත් මධ්‍යම රජයේ ආධාර උපකාර ඇතිව අතිගරු ජනාධිපතිතුමාගේ මඟ පෙන්වීම යටතේ පළාත් සභාව ඉදිරියට ගෙන යන්න හැකියාව ලැබිලා තිබෙනවාය කියන එක මතක් කරනවා.

ඒ නිසා අපි මේ ලබා ගත්තු විශිෂ්ට ජයග්‍රහණ හකුළුවන තැන් කිහිපයක් කෙරෙහි අවධානය යොමු කළ යුතු වෙනවා.

මේ සභාවේ විශේෂ විවාදයට ලක් වුණු, පසුගිය කාල පරිච්ඡේදයේ සාකච්ඡාවට ලක් වුණු, අපේ උපදේශක කාරක සභාවල සාකච්ඡා කරපු බෝ නොවන රෝග තත්ත්වයන් පිළිබඳව වැඩි අවධානයක් යොමු කරන්න බස්නාහිර පළාතේ සෞඛ්‍ය අමාත්‍යාංශයත් කටයුතු කරලා තිබෙනවා කියන එක මතක් කරනවා. විශේෂයෙන්ම බස්නාහිර පළාතේ පාසල් දරුවන් 11% කට පමණ ප්‍රතිශතයකට බෝ නොවන රෝග ඇති වීමේ භයානක ගැටළුවට ලක් වෙලා තිබෙන කාරණය නැවත වතාවක් මතක් කරනවා. විශේෂයෙන්ම රුධිරගත සීනි, කොලෙස්ට්‍රෝල් වාගේ දේවල් පාසල් දරුවන් සඳහා ඇති වීමේ ප්‍රවණතාවයකට පරිවර්තනය වෙලා තිබෙනවා. ඒවා මඟ හැරවීම සඳහා බස්නාහිර පළාතේ සෞඛ්‍ය අමාත්‍යතුමා විශේෂ වැඩ පිළිවෙළවල් පෙර පාසල් උපයෝගී කරගෙන, සොඳුරු ළමා විය සුරැකිමු වැනි වැඩ සටහන් තුළින් විශේෂයෙන්ම ළමා අවදියේ සිටම බෝ නොවන රෝගයන් වැළදීම පිළිබඳව අවධානම් තත්ත්වයන් වැළැක්වීම සඳහා වූ ක්‍රියා මාර්ගයන් ගැනීම පිළිබඳව අපේ සතුට ප්‍රකාශ කර සිටිනවා. ඒවා බස්නාහිර පළාතේ සෑම කොට්ඨාශයකම, සෑම දිස්ත්‍රික්කයක් තුළම පළල්ව ක්‍රියාත්මක කිරීමේ සහ ජාතික තලයට ගෙන යෑමේ වැඩ පිළිවෙළකට වහ වහා අවතීර්ණ විය යුතුයි කියන කාරණය අපි මතක් කර සිටිනවා. විශේෂයෙන්ම මේ බෝ නොවන රෝගයන්ගෙන් වැඩිහිටියනුත්, දරු පරම්පරාවත් වළක්වා ගැනීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය හා ඒකාබද්ධ වුණු වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යෑම සඳහා කටයුතු කරමුයි කියන යෝජනාව අපි මතක් කර සිටිනවා.

ඒ වාගේම විශේෂයෙන්ම රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය ප්‍රකාශ කළා මේ අවස්ථාවේ එතුමිය නැතත් මම කියන්න ඕනෑ. එතුමිය මත්ද්‍රව්‍ය උවදුර ගැන විශේෂයෙන් සඳහන් කළා. නීතිඥවරියක් වශයෙන් එතුමිය ලබලා තිබෙන අත්දැකීම විය හැකියි ඒ ප්‍රකාශ කළේ. මේ දවස්වල සෑම උසාවියක්ම මුහුණ දෙන මහ බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හවස 03.00, 04.00 වනකොට දම්වැල් දාගෙන 400 ක් විතර මහේස්ත්‍රාත් උසාවිවලට අරගෙන එනවා, රිමාන්ඩ්ගත කරන්න. ඒ මත්ද්‍රව්‍ය චෝදනා යටතේ. අවම වශයෙන් අප නිතර දකින මහර මහේස්ත්‍රාත් අධිකරණයේ දවසකට මත්කුඩු චෝදනාව යටතේ 400 කට වැඩි පිරිසකට බරපතළ චෝදනාවන් එල්ල වෙනවා. ඒ නිසා නාගරික ප්‍රදේශවල මේ තත්ත්වය මහා භයංකාර තත්ත්වයක් බවට පරිවර්තනය වෙලා තිබෙනවා. විශේෂයෙන්ම අපි දන්නවා අද රිය අනතුරු බහුලව සිද්ධ වෙනවා. රිය අනතුරු සම්බන්ධයෙන් පොලීසියේ මහත්වරු පරීක්ෂා කරන්නේ මත්පැන් බීලාද කියන එක විතරයි. මත්පැන් බීලාද කියලා විතරක් පරීක්ෂා කරනවා. ඒ හැර මත්ද්‍රව්‍ය අරගෙනද කියලා මැන බලන නිර්ණායකයක් ඔවුන් තුළ නැහැ. ඒ නිසා මේ බොහෝ රියැදුරන් මත්පැන් බොන අය නොවෙයි. මත්පැන් බීලා වාහන එළවන පරණ රියැදුරු මහත්වරු හොඳට ඉන්නවා. කිසිම අනතුරක් නොකර මත්පැන් බීලා වාහන එළවනවා. ඇතැම් රියදුරන් පානය කරන්නේ විවිධ මත්ද්‍රව්‍ය, මත්පෙති, එහෙම නැත්නම් වෙනත් මත්වන ද්‍රව්‍ය වර්ග. ඒ නිසා මේ භයානක තත්ත්වය වළක්වා ගැනීම සඳහා විශේෂ කාර්ය භාරයක් අද බස්නාහිර පළාත් සභාවේ සෞඛ්‍ය අමාත්‍යාංශයට පැවරෙනවා කියන මතක් කිරීම කරනවා.

පාසල් සිසුන් සහ සෞඛ්‍ය අමාත්‍යාංශයත් ඒකාබද්ධ කරමින් විශේෂයෙන්ම අපේ තරුණ ශිෂ්‍ය පරම්පරාව භයානක ලෙස විවිධ මත්ද්‍රව්‍යයන්ට ඇබ්බැහි වීමේ ප්‍රවනතාවයක් තිබෙනවා. ඒ නිසා උසාවියට ගියාම නීතිඥවරුන් වන අයට මේ කාරණයේ බරපතළ තත්ත්වය, භයානකකම වඩා හොඳින් දැක ගන්න පුළුවන්කම ලැබෙනවා. ඒ නිසා ඉතා ඕනෑකමින් කියනවා, විශේෂයෙන්ම ඒ සඳහා බස්නාහිර පළාතේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ මැදිහත්වීමක් සිදු වෙන්න ඕනෑ. විශේෂයෙන්ම ඔවුන් නිවැරැදි මාර්ගයට, නිවාරණ ක්‍රමයක් කරා ගෙන යන වැඩ පිළිවෙළකට බස්නාහිර පළාතේ සෞඛ්‍ය අමාත්‍යාංශය මැදිහත් විය යුතුයි කියන යෝජනාව අපි කරනවා. ඒ වාගේම විශේෂයෙන්ම බස්නාහිර පළාත විධියට -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

වෙලාව ඉවරයි. කථාව අවසන් කරන්න.

**ගරු සිසිර ජයකොඩි**
Hon. Sisira Jayakody

හොඳමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපේ අදහස් ටික ගොනු කර ගන්න මේ කාලය ප්‍රමාණවත් වෙන්නේ

[ ගරු සිසිර ජයකොඩි]

නැහැ. ඒ වුණත් අපි දන්නවා, බස්නාහිර පළාත විධියට විවිධ සමාජ සුභසාධන සේවාවන් සමාජ සේවා අමාත්‍යාංශය, පරිවාස අමාත්‍යාංශය -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමාට තවත් විනාඩි 05 ක කාලයක් ලබා දෙනවා.

**ගරු සිසිර ජයකොඩි**
Hon. Sisira Jayakody

අනෙකුත් අමාත්‍යාංශ විසින් සිදු කරනු ලබනවා. ඒ නිසා එම කාර්ය භාරයන් තුළින් - විශේෂයෙන්ම අපි අමතක නොකළ යුතු කාර්ය භාරයක් තිබෙනවා. ඒ අපේ වැඩිහිටි ජ්‍යෙෂ්ට පුරවැසියෝ. පසුගිය අවුරුදු 05 ක කාල පරිච්ඡේදය තුළ පුදුමාකාර සංවිධාන ජාලයක් බවට පරිවර්තනය කරලා තිබෙනවා. විශේෂයෙන්ම තනි වුණු, හුදෙකලා වුණු ජ්‍යෙෂ්ට පුරවැසියා නැවත වතාවක් සමාජ නායකයන් බවට පරිවර්තනය කරලා ඔවුන්ගේ සුභසාධනය සඳහා සාමූහිකව එකට එකතු වන, ජීවිතයට අලුත් අර්ථයක් දෙන, තමන්ගේ සැදෑ සමය ප්‍රිය මනාපව ගෙවිය හැකි, අනෙක් අයට උදව් උපකාර කරන තැනැත්තන් බවට පරිවර්තනය කරන්න නිසි වැඩ පිළිවෙළක් සඳහා බස්නාහිර පළාතේ පළාත් සභාව පසුගිය කාල පරිච්ඡේදයේ කටයුතු කළා කියන මතක් කිරීම කරනවා. එහි සමාජ සුභසාධන සත්කාර්යයන් සඳහා මන්ත්‍රීවරුන් වන අපටත් දායක වෙන්න පුළුවන්කම ලැබිලා තිබෙනවා. ඒ නිසා මම හිතන්නේ මේ ඡන්දය කාලයේ අපට යන්න, අපේ මන්ත්‍රීවරුන්ට ගමන් කරන්න අලුත් වේදිකාවක් නිර්මාණයක් කරලා තිබෙනවා. මම හිතනවා, ඒකත් එක පැත්තකින් විශාල කාර්ය භාරයක්.

ඒ වාගේම මම විශේෂයෙන්ම මතක් කර සිටිනවා, බස්නාහිර පළාතේ ආයුර්වේද දෙපාර්තමේන්තුව සම්බන්ධව. එය පාරම්පරික වෛද්‍යවරුන් සමග ඒකාබද්ධ වැඩ සටහනක් බවට පරිවර්තනය කළ යුතු වෙනවා. මෙය හුදෙකලා විය යුතු නැහැ. අපේ රටේ දේශීය අනන්‍යතාවය ගොඩ නැගෙන පාරම්පරික වෛද්‍ය ක්‍රමයත් එක්ක, ඒ පාරම්පරික වෛද්‍ය ක්‍රමයේ මූලිකාංග, ආයුර්වේද වෛද්‍ය ක්‍රමයත් එක්ක ඒකාබද්ධ කරගෙන ගමන් කිරීමේ අවශ්‍යතාවයක් තිබෙනවා. ඒ මගින් අපි කවුරුත් කථා නොකරන ප්‍රශ්නයක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ බස්නාහිර පළාතේ නාගරික සමාජයේ විශේෂයෙන්ම අපි සාකච්ඡාවට ලක් කරන්නේ නැති ප්‍රශ්නයක් තිබෙනවා. පළාත් සභාවේ සෞඛ්‍ය අමාත්‍යාංශයට සහ ආයුර්වේද දෙපාර්තමේන්තුවට අවධානය යොමු කළ යුතු ප්‍රශ්නයක් තිබෙනවා. ඒ තමයි විවාහ වෙලා දරුවන් අපේක්ෂිත, ඒත් නිසි කාල පරිච්ඡේදයේදී දරුවන් නොමැති විශාල සංඛ්‍යාවක් සිටිනවා. ඒ කරුණ නිසාම සමහර වෙලාවට ලංකාවේ දික්කසාද වීම් බරපතළ ලෙස වැඩි වෙලා තිබෙනවා. විවිධ හේතු ඒකට බලපානවා. බස්නාහිර පළාතේ විවාහ දික්කසාද කොපමණද කියතොත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ අංක 08 කියලා වෙනමම උසාවියක් දික්කසාද නඩු සඳහා විතරක් විවෘත කළා. ඒ තරම් නඩු ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා. ඉතින් මේක ඛේදනීය තත්ත්වයක්. එයට එක හේතුවක් තිබෙනවා. ඒ තමයි විශේෂයෙන්ම අපේ වැරැදි පාරිභෝජන රටාව. නුසුදුසු පාරිභෝගික ක්‍රමය සහ විශේෂයෙන්ම නිසි කලට දරු සඵලතාවයක් නොමැතිකම. දරුවන් අපේක්ෂිත, දරුවන් නොමැති විවාහක පවුල් විශාල ප්‍රමාණයක් ඒ තුළින් මානසික පීඩා විඳින අහිංසක යුවතිපතීන් අපේ රටේ බහුලව ඉන්නවා. ඒ අය වෙනුවෙන් පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව, පළාත් අමාත්‍යාංශය සහ පාරම්පරික වෛද්‍යවරුන් එකට ඒකාබද්ධ වුණු විශේෂ වැඩ පිළිවෙළක් සකස් කිරීම තුළින් එහි ප්‍රතිඵල අපේ රටේ අහිංසක තරුණ තරුණියන් වෙත ලබා දීලා අපේ රට වඩා යහපත් මිනිසුන්ගෙන් පිරි රටක් බවට පරිවර්තනය කරන්න අවශ්‍ය ශක්තිය ලබා දෙමුයි කියන මතක් කිරීම කරමින්, ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් නිහඬ වෙනවා.

[පූ.භා. 09.55]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මූලාසානාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා කාලය ලබා දීම ගැන. විශේෂයෙන්ම අපේ සිසිර ජයකොඩි ගරු මන්ත්‍රීතුමාගේ කථාව හා සම්බන්ධව මම කථා කරන්න ඉස්සෙල්ලා මම හිතන්නේ, අපේ බස්නාහිර පළාත් සභාවේ හදිසි ඒකකයක් අද ක්‍රියාත්මක වෙනවා කියලා තමයි මට හිතෙන්නේ. මොකද, පළාත් සභාවේ කථා කරන්නත් කවුරුත් නැහැ. ඒ නිසා හදිසි අංශයේ කෙනෙක් හැටියට මටත් අද කථා කරන්න සිද්ධ වෙලා තිබෙනවා. විශේෂයෙන්ම මේ රටේ ඉතාමත් වැදගත්

ප්‍රශ්නයක් වන සෞඛ්‍ය වැය ශීර්ෂය සම්බන්ධව විවාද වන අවස්ථාවේදී මේ ගැන කථා කරන්නවත් කවුරුත් නැහැ. ඒක ඉතාමත් කනගාටුදායක තත්ත්වයක්. හැමදාම අපි -

**ගරු විකුම් ගුණසේකර**
Hon. Wikum Gunasekara

අපි ඉන්නවා. ඇයි?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

පොඩ්ඩක් ඉන්න. අපි කිව්වාට අපි නැහැ නේ? හතර පස් දෙනා නේ ඉන්නේ. අපි කියන්නේ, 104 න් කීදෙනාද ඉන්නේ බලන්න. පොඩ්ඩක් ඉන්න ඔබතුමා ගැනත් කියනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමා මාතෘකාවට එන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම කියන්න යන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ දකින මුහුණු ටික තමයි හැමදාම මෙතැන දකින මුහුණු ටික. අවුරුදු හතර පහ පුරාම දැකපු මුහුණු ටික තමයි අද දකින්නේ. ඉතින් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ සිසිර ජයකොඩි ගරු මන්ත්‍රීතුමාත්, රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියත් සඳහන් කළ පරිදි මේ රටේ විශාලතම ඛේදවාචකය වෙන්නේ මත්කුඩු සම්බන්ධවයි. මත්කුඩු ඉතාමත් සීඝ්‍රයෙන් ව්‍යාප්ත වෙන පරිසරයක් තිබෙන්නේ. මෑත කාලයේදී අපි දැක්කා, පාසල් තුළටත් මේක පැතිරෙන්න පටන් අරගෙන තිබෙනවා. පාසල් අවට, පාසල් තුළට, පාසල් සිසුන් ගාව තිබිලා මේ මත්කුඩු සොයා ගත්තා. ඉතින් මේක විශාල ප්‍රශ්නයක්. මට පේන විධියට ඉදිරියේදී සෞඛ්‍ය සේවාවෙන් විශාල කොටසක් වෙන් කරන්න වෙනවා මත්කුඩු සම්බන්ධ පුනරුත්ථාපන කටයුතු සඳහා. නමුත් මම හිතන්නේ ඒක සාධාරණ නැහැ. අපේ සමාජයේ බදු ගෙවන අනෙක් අය හා බලපුවාම විශේෂයෙන්ම බීමත්කමින් ලෙඩ වන විශාල ප්‍රමාණයක් ඉන්නවා. මත්කුඩුවලින් ලෙඩ රෝග හැදෙන විශාල ප්‍රමාණයක් ඉන්නවා. මම දන්න තරමට. දැන් බොහෝ බටහිර රටවල්වල මත්කුඩු සහ මත්පැන් සම්බන්ධයෙන් රෝගවලට අද නොමිලේ ප්‍රතිකාර ලබා දෙන්නේ නැහැ. ඒ සියලු දෙනාගෙන්ම මුදල් අය කරන තත්ත්වයක් තමයි උදා වෙලා තිබෙන්නේ. මොකද, ඒ තරමට ඒ රටවල්වලත් මේක පිරිහිලා. ඒ නිසා අපි දන්නවා, විශේෂයෙන්ම මත්කුඩු සම්බන්ධයෙන් නොයකුත් වැටලීම් කරනවා. නමුත් ලොකු ලොකු අය බේරිලා ඉන්නවා. හන්දියේ ඉන්න පොඩි පොඩි ඉත්තෝ ටික තමයි අල්ලගෙන යන්නේ. ඒක නිසා මේ ගැන විශේෂ අවධානයක් යොමු විය යුතුයි. ඒත් එක්කම සෞඛ්‍ය සේවාව ගැන විශේෂයෙන්ම කථා කළොත් අපි දන්නවා, අද මේ පළාත් සභාවේ අයවැය ගත්තත් සෞඛ්‍ය අමාත්‍යාංශයට ලැබිලා තිබෙන්නේ ඉතාමත් සුළු ප්‍රමාණයක්. සියයට ගණන් ගත්තොත් මම හිතන්නේ 2% කටත් අඩුයි. එකයි ගණනක් තිබෙන්නේ. ඉතින් ඉතාමත් කනගාටු වෙනවා. අපේ අධ්‍යාපනයට 71% ක් ලැබිලා තිබෙන එක ගැන මම ඉතාමත් සන්තෝෂ වෙනවා. ඒත් එක්කම අධ්‍යාපනය හා සමාන -

**ගරු සිසිර ජයකොඩි**
Hon. Sisira Jayakody

හරියට ප්‍රතිශතය කියන්න. සියයට කීයද?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

සියයට ගණන දන්නේ නැති නිසා නේ මම කිව්වේ නැත්තේ. ගණන දන්නවා නම් මම කියනවා නේ? මම කලින් කිව්වේ Emergency Service එකක් මම මේ කරන්නේ. කවුරුත් නැතිකමට කථා කරනවා. පළාත් සභාවට වෙලා තිබෙන තත්ත්වය මේකයි. මේ නිසා තමයි පළාත් සභාව සුදු අලියෙක් කියලා කියන්නේ. පළාත් සභාවෙන් ඇති වැඩක් නැහැ. මේ පළාත් සභාවට එන්නෙත් නැහැ. අනුන්ට නොමිලේ ප්‍රතිකාරයක් කරන්නේ. ඒ නිසා සෞඛ්‍ය අමාත්‍යාංශයට හැමදාමත් ලැබෙන්නේ ඉතාමත් සොච්චමක්. ඒ ගැන අපි විශාල වශයෙන් කනගාටු වෙනවා. අපේ රටේ ඉදිරි අනාගතය, ඉදිරි පරපුර සෞඛ්‍ය සම්පන්න පරපුරක් වෙන්න නම් සෞඛ්‍ය අතින් හොඳ ශක්තිමත් වෙන්න නම් සෞඛ්‍ය සඳහා අපි මීට වැඩිය ලොකු ආයෝජනයක් කළ යුතුයි. ඒක නිසා තමයි මම කිව්වේ. මේ ගැන අපේ ගරු ඇමැතිතුමාට දොස් කියලා වැඩක් නැහැ. මම හිතන්නේ, මේ ගැන අපේ ගරු මහ ඇමැතිතුමාටත් දොස් කියලා වැඩක් නැහැ. මොකද, අපට ලැබෙන ප්‍රමාණයෙන් තමයි අපි මේවාට වෙන් කරන්නේ. අපේ අධ්‍යාපනයට විශාල ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා. නමුත් සෞඛ්‍ය ගත්තාම, උදය ගම්මන්පිල

[ ගරු ශ්‍රීනාත් පෙරේරා ]

ගරු ඇමැතිතුමාගේ අමාත්‍යාංශය ගත්තාම ඉතාමත් සුළු ප්‍රමාණයක් තමයි වෙන් වෙන්නේ. ඉතින් ඇත්තටම කථා කළොත් අද මේ පළාත් සභාව අයවැයක් ඉදිරිපත් කළාට මම හිතන්නේ හැම මාස තුනකට වරක්ම පරිපූරකයක් දාලා මහ ආණ්ඩුවෙන්, එහෙම නැත්නම් භාණ්ඩාගාරයෙන් හිඟා කන්න සිද්ධ වෙලා තිබෙනවා. මොකද, සල්ලි මදියි. සල්ලි නැහැ. ඉතින් ඒක තමයි අද පළාත් සභාවේ තත්ත්වය. ගොඩක් දෙනෙක් පළාත් සභාව සුදු අලියෙක් කියලා කියන එකට මම නම් දොස් කියන්නේ නැහැ. මොකද, ඇත්තටම පළාත් සභාව අද ඒ තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ. ඒක නිසා මමත් හැමදාම කියනවා. අපේ ගම්මන්පිල ගරු ඇමැතිතුමාත් හැමදාම කියනවා, මේ පළාත් සභාව, පළාත් සභාවක් හැටියට ගෙනියනවා නම් මීට වැඩිය පළාත් සභාවට ප්‍රතිපාදන ලැබිය යුතුයි. අපට ආදායම් මාර්ග නැති නිසා තමයි මේක වෙලා තිබෙන්නේ. ඉතින් ඒක නිසා සෞඛ්‍ය ගැන කථා කළොත් ජා-ඇළ ආසනය තුළ බැලුවාම මාතෘ සායන කිහිපයක්ම ඉදි වුණා. ගම්පහ දිස්ත්‍රික්කයේත් කිහිපයක් ඉදි වෙලා තිබෙනවා. නමුත් අද රෝගියෙක් රෝහලකට ගියාම ඒ රෝගියාට ලැබෙන සේවාව ගැන අපට සතුටු වෙන්න බැහැ. මීගමුවේ රෝහලට ගියත්, ගම්පහ රෝහලට ගියත්, ජාතික රෝහලක් වන රාගම රෝහලට ගියත් අඩුම ගාණේ ඉන්න ඇඳක්වත් නැති විශාල රෝගීන් ප්‍රමාණයක් බිම කොරිඩෝ එකෙත් පැදුරු දාගෙන ඉන්නවා අපි දකිනවා.

**ගරු විකුම් ගුණසේකර**
Hon. Wikum Gunasekara

ලෙඩ වෙලා ගියාම සතුටු වෙන්න බැහැ නේ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

සතුටු නැහැ. නමුත් සත්‍ය කථා කරන්න එපැයි. ඇත්ත කියන්න එපැයි. බොරු කියන්න බැහැ නේ මෙතැන ඇවිල්ලා. සෞඛ්‍ය සේවාවෙන් ජනතාවට ලැබිය යුතු සේවාව වෙනවාද කියන එක සම්බන්ධයෙන් අපට අද සතුටු වෙන්න බැහැ. ඒ සම්බන්ධව මම ගරු ඇමැතිතුමාට දොස් කියනවා නොවෙයි. නමුත්, සමස්තයක් වශයෙන් අපේ රට තුළ අද ඇති වෙලා තිබෙන ආර්ථික අර්බුදයත් එක්ක මම හිතන්නේ, අපට සෞඛ්‍ය සේවාවට වියදම් කරන්න මුදල් නොමැතිකම තමයි මේකට ප්‍රධාන හේතුව වෙලා තිබෙන්නේ. අද රෝහලකට ගියාම සමහර වෙලාවට සිලින්ජර් එකත් එළියෙන් ගේන්න කියනවා. ලේ ටික බලා ගන්න අර පොඩි ස්ලිප් එක එළියෙන් ගේන්න කියනවා. ඉතින් මේ වාගේ තත්ත්වයක් තමයි උදා වෙලා තිබෙන්නේ. අද විශාල වශයෙන්, බහුතර ජනතාවට පෞද්ගලික රෝහල්වලට ගිහිල්ලා සත්කාර ලබා ගන්න අවශ්‍ය මුදල් නැහැ. ඒක නිසා සෞඛ්‍ය සේවාව මීට වැඩිය දියුණු වෙන්න ඕනෑ. මේ රටේ අහිංසක දුප්පත් ජනතාවට මේ සෞඛ්‍ය සේවාවෙන් ලබා ගත යුතු, ලබා ගත හැකි සේවාව අද ඉෂ්ට වෙනවා මදියි. ඉතින් ඒ ගැන විශේෂයෙන්ම සැලකිලිමත් විය යුතුයි. පළාත් සභාවක් හැටියට මම හිතන්නේ, ඉදිරියේදී එතුමාට මීට වැඩිය ප්‍රතිපාදන ලැබුණොත් වැඩක් කරන්න පුළුවන්. නමුත් සත්‍ය කරුණ තමයි ප්‍රතිපාදන නැතිකම. ඉතින් ඒක නිසා අපි දොස් කියලා වැඩක් නැහැ. අපට පළාත් සභාවක් හැටියට මේ දින කිහිපය තුළදීම කථා කළා වාගේ අපේ තිබෙන මුදල් අද තිබෙන්නේ, මහ ආණ්ඩුවේ. අපට ගිහිල්ලා ඒවා ඉල්ලා ගන්න සිද්ධ වෙලා තිබෙනවා. නමුත් පළාත් සභාවේ රෝහල් ටික නඩත්තු කර ගන්න, අත්‍යවශ්‍ය බෙහෙත් ටික ලබා දෙන්නවත් ප්‍රමාණවත් නොවෙනවා කියන එක මේ අවස්ථාවේදී මතක් කරලා දෙන්න ඕනෑ. මම මීට වඩා කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. ඔබතුමා ඇති කියනවා නේ? ඔබතුමා මට මේ කාලය ලබා දීම ගැන මම ස්තූතිවන්ත වෙනවා. ඒත් එක්කම අපේ ගරු ඇමැතිතුමාටත් මම හිතන්නේ එතුමාගෙත් අවසන් අයවැය. ඊළඟ වතාවේවත් ටිකක් සල්ලි තිබෙන අමාත්‍යාංශයක්, සල්ලි ටිකක් වියදම් කරන්න පුළුවන් අමාත්‍යාංශයක් ලැබේවා කියලා ප්‍රාර්ථනා කරනවා.

[පූ.භා. 10.04]

**ගරු විකුම් ගුණසේකර**
Hon. Wikum Gunasekara

බොහොමත්ම ස්තූතියි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන හා කාන්තා කටයුතු, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යාංශයේ වැය ශීර්ෂ අංක 105, 116, 117, 118 සහ 119 පිළිබඳව කථා කිරීමට අවස්ථාවක් ලැබීම පිළිබඳව සතුටු වෙනවා. පළමුවෙන්ම මේ අවස්ථාව ලබා දීම පිළිබඳව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මාර්ගයෙන් ගරු ඇමැතිතුමාට මගේ ස්තූතිය පුද කරනවා. ඉතින් මම කාන්තා කටයුතු විෂයයෙන් පටන් ගන්නම්. පසුගිය කාලයේදී අපට කාන්තාවන් වෙනුවෙන් සුවිශේෂී කටයුතු

කිහිපයක් කරන්න පුළුවන් වුණා. කාන්තා කටයුතු සඳහා හොඳ නිලධාරිනියක් ඉන්නවා. මම රණවිරු කාන්තා - මොකද, රණවිරු විෂයය රේඛීය අමාත්‍යාංශයේ විෂයයක්. ඒක තුළ පළාත් සභාව හැටියට, රණවිරු මන්ත්‍රීවරු හැටියට අපට පොඩි ගැටළුවක් තිබුණා. රණවිරුවන්ට මොකක්ද අපට කරන්න පුළුවන් කියන එක පිළිබඳව. ඒ වාගේ ගැටළු එනකොට උපදේශක කාරක සභාවේදී මම යෝජනා කළාම ගරු ඇමැතිතුමාත් අසරණ වුණා. අඩු ආදායම් ලාභී කාන්තාවන්ට පමණයි මේ කටයුතු කරන්න පුළුවන් කියන එක සම්බන්ධව. ඒක තුළදී ඒ පුහුණු කටයුතු කිරීමේදී - විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ, ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා උපදේශක කාරක සභාවේ ඉන්නවා. එතුමාත් මේ ගැන උනන්දු වෙලා, පුහුණු කටයුතු කරන්න අවස්ථාව හදලා දුන්නා. ඉතින් රණවිරු කාන්තාවන් සඳහා පුහුණු වැඩ සටහන් කිහිපයක් කළා. පුහුණු කටයුතුවලට වෙන් කරපු සෑම මුදලක්ම රණවිරු කාන්තාවන් හැටියට කළුතර දිස්ත්‍රික්කයේත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 14 තිබෙන සංසද 14 ටම පුහුණු කටයුතු කළා. මේ දවස්වලත් පුහුණු වැඩ සටහනක් යනවා. කේක් පාඨමාලාව. මනාලියන් හැඩගැන්වීම සහ මැහුම් පාඨමාලාව. කෙටි කෑම සහ කේටරින් පාඨමාලාව. ඇත්ත වශයෙන්ම කේටරින් සහ කෙටි කෑම පාඨමාලාව හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රණවිරු කාන්තාවන් සහ ඒ ආශ්‍රිත කාන්තාවන් 130 ක් පමණ පුහුණු වෙනවා. ඉතින් අපට හරි සතුටුයි.

විශේෂයෙන්ම මම සඳහන් කරනවා, මේ කාන්තා කටයුතු විෂයයත් එක්ක ඔබතුමාට පුළුවන් නම් - අපට පොඩි ගැටළුවක් වෙලා තිබෙනවා වසර 30 ක් පමණ පැවැති යුද්ධයේදී ආබාධිත තත්ත්වයට පත් වුණු රණවිරුවන් එන්න එන්න ක්ෂය වෙනවා. ඒ තුළ ඔවුන් විවාහ වෙලා හිටපු බිරින්දෑවරුන් ගොඩක් වෙලාවට - මම දන්නවා පසුගිය දවස්වල බියගම ආසනයේ රණවිරු ගම්මානයේ ආබාධිත රණවිරුවෙක් හිටියා. ඇස් දෙකම පේන්නේ නැතුව හිටියේ. බුලට් එකක් ගිහිල්ලා ඔහුගේ ඔළුවේ තිබිලා. කවුරුත් දන්නේ නැහැලු. ඒක විෂ වෙලා ක්ෂණිකව රෝහලට ගෙනියන්න බැරි වෙලා. මොකද, ඒ අසනීප වුණු වෙලාවේ රෝහලට ගෙනයන්න ක්‍රමවේදයක් නැතුව ආබාධිත රණවිරුවා මිය ගියා. මේක තුළින් අපි හඳුනාගත්තේ, ගෙදර ත්‍රීවීලර් එකක් තිබිලා තියෙනවා. අඩු වශයෙන් කාන්තාව රියදුරු පුහුණුවක්වත් හදාරා තිබුණා නම්, ඒ රණවිරුවා බේර ගන්න තිබුණා. මම ගරු ඇමැතිතුමාට යෝජනා කරනවා කාන්තාවන්ට රියදුරු පුහුණු වැඩ සටහනකුත්, සමහර විට ඔබතුමාගේ විෂයයට මේක අදාළ නැති වෙන්න පුළුවන්. ප්‍රවාහන අමාත්‍යාංශයේ විෂයයක් වෙන්න පුළුවන්. ඒ වුණාට ඔබතුමාගේ කාන්තා කටයුතු විෂයය තුළ රණවිරු කාන්තාවන්ටත් රියදුරු බලපත්‍ර ලබා දීමේ වැඩ සටහනක් සකස් කරන්න පුළුවන් නම් ඒ පිළිබඳව අපි වඩාත්ම සතුටු වෙනවා. මොකද, මම දැනට ප්‍රවාහන අමාත්‍යාංශය සහ ඒ ආශ්‍රිතව මගේ මුදල් දාලා රණවිරු කාන්තාවන් කිහිප දෙනෙකුටම රියදුරු බලපත්‍ර ලබා දීලා තිබෙනවා. අද ඔවුන්ගේ අවශ්‍යතාවයන්, ආබාධිත රණවිරුවාව හරි අරගෙන ගිහිල්ලා ඒ අවශ්‍යතාවය ඉෂ්ට කර ගන්නවා. අපට ඒ පිළිබඳව බොහොම සතුටුයි. ඒ නිසා ඔබතුමා මේ පිළිබඳව අවධානය යොමු කරනවා නම් ගොඩක් වැදගත් වෙයි කියලා හිතනවා.

ඒ වාගේම මම මතක් කරන්න ඕනෑ. අපේ පළාත් සෞඛ්‍ය වෛද්‍යතුමා ඉතා විශිෂ්ට කාර්ය භාරයක් කරනවා. එතුමා බොහොම උනන්දුයි. ඕනෑම වෙලාවක ඔහුව දුරකථනයෙන් සම්බන්ධ කර ගන්න පුළුවන්. මොකද, නිලධාරීන් සම්බන්ධ කර ගන්නකොට ගැටළු තිබෙනවා. ඒ වුණත් සෞඛ්‍ය වෛද්‍ය අධ්‍යක්ෂතුමා ගැන බොහොම වැදගත් විධියට කියන්න ඕනෑ. මොකද, ඕනෑම වෙලාවක දුරකථනයෙන් සම්බන්ධ කර ගන්න පුළුවන්. එතුමා විදේශගත නොවූ ඕනෑම වෙලාවක අපට සම්බන්ධ වෙලා තිබෙනවා. මම එතුමාට පසුගිය කාලයේදී චෝදනාවකුත් කළා. බෙහෝ මන්ත්‍රීවරු මැදිහත් වෙලා තමයි ඔහුගේ කටයුතු කරන්නේ. ඒ නිසා මන්ත්‍රීවරු නිර්දය විධියට විවේචනයක් කරලා තිබුණා. අපේ කිහිප දෙනෙක් එතැන හිටියා. ඒ නිසා මම කියන්නේ එහෙම කරන්න එපා. මන්ත්‍රීවරු තමයි ඔබතුමන්ලාට වැටුප් ලබා දෙන්න හරි, අවශ්‍ය කටයුතු, මහ පෙන්වීම් හරි කරන්නේ. සම්මත කරන්න. ඒ නිසා මන්ත්‍රීවරුන් ගැන මීට වඩා වගකීමක් දරන්න කියන එක විශේෂයෙන් කියනවා. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂතුමා කොපමණ හොඳ වුණත් ඒ කාර්ය මණ්ඩලයේ ඉන්න කෙනෙක් යම් ප්‍රමාණයකින් මෙලෙස කටයුතු කළහොත් ඒක සමස්ත ආයතනයටම හොඳ නැහැ. සෞඛ්‍ය දෙපාර්තමේන්තුවටම හොඳ නැහැ. ඒ නිසා ඒ පිළිබඳව පොඩ්ඩක් අවධානය යොමු කරන්න කියලා විශේෂයෙන්ම ඉල්ලීමක් කරනවා. ඒ වාගේම හොරණ ආසනයේ දොඹගොඩ අපේ රණවිරු ගම්මානයක් තිබෙනවා. හොරණ රෝහලට තමයි රණවිරුවෝ සියලු

[ ගරු විකුම් ගුණසේකර ]

දෙනාම සෑම දෙයකටම පැමිණියේ. පසුගිය කාලවලදී හොරණ රෝහලේ Counter එකක් ආබාධිත රණවිරුවන් සහ ඒ ආශ්‍රිත රණවිරු පවුල්වලට වෙනම තිබුණා. දැන් ඒ Counter එක වහලා කියලා මම පසුගිය දවසක රණවිරු ගම්මානයට ගිය වෙලාවක කිව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මාර්ගයෙන් විශේෂයෙන්ම ගරු ඇමැතිතුමාගේ අවධානයට යොමු කරනවා, ඒ Counter එක නැවත Open කරන්න. ඔබතුමාට පුළුවන් නම් පානදුරේත් කරන්න. මම හිතන්නේ, පානදුරේ නම් ඒ තරම්ම රණවිරුවෝ ප්‍රමාණයක් නැහැ. ඒ වුණාට හොරණ, එතැනින් ගියාම ගෝවින්න, දොඹගොඩ රණවිරු ගම්මානය, මිල්ලනියේ රණවිරු ගම්මානයේ ඉන්නවා සුව කරන්නම බැරි ආබාධිත රණවිරුවෝ 9 දෙනෙක්. මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා ඒක ආරම්භ කරන්න. අපට ඔවුන්ව අමතක කරන්න බැහැ. ඔවුන්ගේ ජීවිතයේ කොයි කාලයක් ඔය දුක විඳියිද කියන්න බැහැ.

මම අවුරුදු 29 ක් මේ රෝද පුටුවේ. දුකක් තමයි අපි මේ විඳින්නේ. නමුත් ඒක සැපක් හැටියට සලකාගෙන කටයුතු කරනවා. මොකද, අපි සොල්දාදුවෝ නේ. ඒ නිසා සමහර අය ආවේගශීලී වෙන්න පුළුවන්. එදා සැලකුවා. අද අපට සලකන්නේ නැහැ. වියපත් වනකොට ආබාධිත තත්ත්වය වැඩි වෙනවා. එන්න එන්න වැඩි වනකොට ඔවුන්ට කේන්ති යන ගතියත් වැඩි වෙනවා. ඒක තුළ ඔවුන් බොහොම ආවේගශීලීව හැසිරෙන්න පුළුවන්. ඒක නිසා ගරු ඇමැතිතුමාගේ ඉදිරි කාල සීමාව තුළදී මේ අවස්ථාව කොහොම හරි නැවත ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වාගේම විශේෂයෙන්ම ආබාධිත ප්‍රජාව පිළිබඳව කථා කරනවා නම්, කොයි වෙලාවේ ආබාධයක් ඇති වෙයිද කියලා හිතන්නත් බැහැ. ඔබතුමාගේ හොඳ වැඩ සටහනක් තිබ්බා. රෝද පුටු, අත්වාරු සියලුම දේවල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල සමාජ සේවා නිලධාරීතුමාට දීලා තිබුණා. ඇත්ත වශයෙන්ම ඒකේ සංචිතය මදී. ඒවා ගෙන ගිහිල්ලා සනීප වුණාම සමහර අය ගෙනැල්ලා දෙන්නේ නැහැ. ගැටළුවක් තිබෙනවා තමයි. ඔබතුමාට හැකි නම් පුළුවන් විධියට සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකටම නැවතත් ආබාධිත උපකරණ රෝද පුටු ඒ ආශ්‍රිත දේවල් සපයා දෙනවා නම් ගොඩක් ස්තුතිවන්ත වෙනවා.

ඒ වාගේම මම බොහොම සතුටු වෙනවා පානදුර හදිසි අනතුරු ප්‍රතිකාර ඒකකය පිළිබඳව. ඒ වාගේම අපි විශේෂයෙන්ම කියනවා. තවත් කිහිප තැනක, දන්ත වෛද්‍ය ඒකකයේ එහෙම අඩුපාඩු කිහිපයක් තියෙනවා. ඒ ගැනත් අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා. ඒ වාගේම ක්ලිනික් එකට පැමිණෙන කට්ටියට, සායනවලට පැමිණෙන කට්ටියට එම ස්ථානයේ වහලයේ ගැටළුවක් තිබෙනවා. ඒ සම්බන්ධවත් ඔබතුමා මැදිහත් වන ලෙස මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාගේ මාර්ගයෙන් ඉල්ලා සිටිනවා. මොකද, අපි බොහොම සමගිව ඔබතුමා, ඇමැතිතුමා අපි දෙදෙනාම එකම ආසනය නියෝජනය කරන්නේ. ඒක තුළදී ඔබතුමා ඒ පිළිබඳවත් අවධානය යොමු කරනවා නම් ගොඩක් වටිනවා.

ඒ වාගේම ආයුර්වේද කොමසාරිස්තුමා ඇතුළු ඒ කාර්ය මණ්ඩලය පිළිබඳව මතක් කරන්න ඕනෑ. මොකද, අපි පසුගිය දවස්වල සායන කිහිපයක් කළා. ආයුර්වේද කොමසාරිස්තුමාගේ වැඩ පිළිවෙළ පිළිබඳව බොහොම සතුටු වෙනවා. අපි දන්නවා එතුමා වයඹ ඉන්න කාලේ ඉඳලාම රණවිරුවන් වෙනුවෙන් බොහොම උනන්දුවෙන් අපට උදව් කළා. වයඹදී ඒ පිළිබඳව අපට බොහොම ගෞරවයක් තිබෙනවා. අපට බෝ නොවන රෝග පිළිබඳව එතුමා සායක්කාර කියන වෛද්‍යතුමාව ගෙනල්ලා ඉතා විශිෂ්ට වැඩ සටහන් ක්‍රියාත්මක කළා. මම රණවිරු සේවා අධිකාරියේ ඉන්න කාලේ විශිෂ්ට වැඩ සටහනක් කළා. මෙවරත් මට සායන කිහිපයක් ලබා දුන්නා. එතුමාගේ කාර්ය භාරය පිළිබඳව සතුටු වෙනවා. ආයුර්වේද වෛද්‍යවරු, ප්‍රධාන වෛද්‍යවරු ඉන්නවා. කොහොම වෙතත් දැවැන්ත කාර්ය භාරයක් කරනවා. ඇත්ත වශයෙන්ම ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රයේ දැවැන්ත නඟා සිටුවීමක් කරලා තිබෙනවා. ඒ වාගේම ජපානය වාගේ රටවලට මේක හඳුන්වලා දීලා විශේෂ වැඩ සටහන් කරලා තිබෙනවා. ඒ නිසා ඒවාට ගොඩක් උනන්දු වෙලා තිබෙනවා. ආයුර්වේද කොමසාරිස්තුමා ඇතුළු සියලුම කාර්ය මණ්ඩලය. ඒ සියලු දෙනා ගැනම බොහොම සතුටින් අපට කථා කරන්න පුළුවන් වෙලා තිබෙනවා. ඒ වාගේම විශේෂයෙන්ම අවධානය යොමු කරන්න ඕනෑ, දරුවන්ගේ තත්ත්වය පිළිබඳව. මම දන්නවා පාසල්වලට ඔබතුමා සහ මම ගියාම හැම වෙලේම කථා කරන්නේ, දරුවන්ට ඇති වන පීඩනයන්. එතැනින් ගියාම දරුවන්ට ඇති වන තත්ත්වයන්. ඊට පස්සේ දරුවන්ගේ සෞඛ්‍ය රැක ගන්නේ කොහොමද? දරුවන්ට කොහොමද ඒ කටයුතු කරන්න

ඕනෑ කියන එක ගැන යම්කිසි කරීකාවකට යන්න ඕනෑ. ඔබතුමා දන්නවා පසුගිය කාලයේ අවුරුදු 04 දී දියවැඩියා හැදුණු දරුවෙක්, අවුරුදු 14 පමණ වනකොට නැති වෙලා ගියා. ඒ වාගේම කුඩා වයසේදීම බෝ නොවන රෝගවලට ගොඩක් දරුවන් ලක් වෙනවා. අද තිබෙන ආහාර රටාව, ඊට අමතරව ශිෂ්‍යත්ව ප්‍රතිඵල වැඩි කර ගන්න දෙමව්පියන්ගෙන් දෙන පීඩනයත් එක්ක දරුවෝ අසරණ වන වෙලාවල් තිබෙනවා. ඒ තුළ කොහොමද අපි මේ කවුන්සිලින් කරන්නේ. ඒ අවශ්‍ය කටයුතු කරන්නේ කොහොමද කියන එක පිළිබඳව වැඩ සටහනක් - ඔබතුමා ගිය වෙලාවට ඒක සඳහන් කළාට සමස්ත වැඩ සටහනක් අපේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල තුළ නිලධාරියෙක් පත් කරලා වැඩ සටහනක් කරලා දැනුවත් කරනවා නම්, වඩාත් වැදගත් වෙයි කියන එක විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ. ඒ වාගේම රෝහල් ක්ෂේත්‍රය. පසුගිය දවස්වල ඔබතුමාගේ ප්‍රධානත්වයෙන් තමයි පාලින්ද නුවර රෝහලට මුල්ගල තියන්න තිබුණේ. ඔබතුමා ගුණවර්ධන විද්‍යාලයේදී කිව්වා, එතැනට සහභාගී වෙන්න කියලා. මම එතැනට ගියා. එතැනට ගියාම මම හරි අපහසුතාවයට පත් වුණා. මොකද, ඔබතුමා කියපු නිසයි මම ගියේ. අපේ නිලධාරීන් මේවා තුළ මීට වඩා වගකීමක් දරන්න ඕනෑ. ඔබතුමා කියපු නිසා මම ගියේ. මම රණවිරු වැඩ සටහනකට ගියේ. අපේ නිලධාරීන් අඩු වශයෙන් ගණන් ගත්තේවත් නැහැ. මම දන්නවා එතැන හිටපු නිලධාරීන්. අපේ RDA Office එකේ නිලධාරීන් ගණන් ගත්තේවත් නැහැ. ඒක වැරදි නේ? ඔබතුමා කියපු නිසයි මම ගියේ. නැත්නම් මට යන්න අවශ්‍යතාවයක් නැහැ. ඒක නිසා මේ පිළිබඳව වගකීමක් දැරිය යුතුයි. එහෙම එක එක මතිමතාන්තරවල ඉන්න ඉඩක් නැහැ. නිලධාරීන්ට ඒ තත්ත්වයට පත් වෙන්න දෙන්න එපා.

සෞඛ්‍ය වෛද්‍ය අධ්‍යක්ෂතුමා කොපමණ හොඳ වුණත් සමහර දේවල්වලදී අපට ගැටළු තිබෙනවා. මේ සම්බන්ධව අපි බොහොම කනගාටු වෙනවා. ඊළඟට ඔබතුමාට මේ අමාත්‍යාංශය හම්බ වෙයිද දන්නේ නැහැ. ඊට පස්සේ හම්බ වන අමාත්‍යාංශ තුළ වුවත් ඔයිට වඩා වගකීමක් දරන්න ඕනෑ. ඇමැතිතුමා හැටියට මේ නිලධාරීන්ට ඒවාට යන්න දෙන්න එපා. නිලධාරීන් දේශපාලනය කරන්න ඕනෑ නැහැ. මම මහජන ඡන්දයෙන් පත් වුණු මන්ත්‍රීවරයෙක්. අපේ ගෞරවය රැකෙන්න ඕනෑ. ඒ නිසා විශේෂයෙන්ම ඒ ගැනත් අවධානය යොමු කරන්න කියමින් මම නිහඬ වෙනවා. ඔබතුමාට බොහොම ස්තුතියි.

[පූ.භා. 10.16]

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බස්නාහිර පළාත් සභාවේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන හා කාන්තා කටයුතු, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සම්බන්ධයෙන් සාකච්ඡා වන වෙලාවේ අදහසක් ඉදිරිපත් කරන්න අවස්ථාවක් ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන් බස්නාහිර පළාත් සභාවේ වසර විස්සකට ආසන්න පළපුරුද්දක් අත්දැකීමක් තිබෙන වර්තමාන සෞඛ්‍ය අමාත්‍ය ජගත් අංගගේ මැතිතුමා මේ සභාවේ සභාපතිවරයා හැටියට වසර 8 ක 9 ක කාලයක් ඔබතුමා සිටින මූලාසනය හොබවපු සභාපතිවරයෙක්.

මේ සියලු අමාත්‍යාංශ එක්ක මැදිහත් වෙලා ලබා ගත්තු අත්දැකීම් එක්ක බස්නාහිර පළාත් සභාවේ සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් වඩාත් කාර්යක්ෂම ඵලදායී සේවාවක් කරන්න, මෙතුමා 2009 වසරේ සිට සෞඛ්‍ය විෂයයට අදාළ අමාත්‍යවරයා හැටියට විශිෂ්ට සේවාවක් පසුගිය කාලය තුළ සිද්ධ කළාය කියන කාරණය අපි මතක් කරන්න කැමැතියි. විශේෂයෙන්ම ලෝකයේ රටවල් එක්ක සංසන්දනය කර සෞඛ්‍ය සේවාව පිළිබඳව සාකච්ඡා කරනකොට ලෝකයේ රටවල් 206 ක් තිබෙන අතර, නිදහස් සෞඛ්‍ය පවතින රටවල් 11 න් එක් රටක් හැටියට අපට ඉතා ආඩම්බරයෙන් වර්තමාන යුගය පිළිබඳව සාකච්ඡා කරන්න පුළුවන්. විශේෂයෙන් නිදහස් සෞඛ්‍ය සේවාව පවත්වාගෙන යන රටක් හැටියට. අද අපේ රටේ මීට වසර පහකට හයකට එහා ගියාම පෞද්ගලික අංශය සහ රාජ්‍ය අංශය අතර තිබුණු සෞඛ්‍ය සේවාවේ වෙනස එක මට්ටමකට ගෙන එන තත්ත්වයට අපේ රටේ නිදහස් සෞඛ්‍ය සේවාව, මහ ආණ්ඩුවත් පළාත් සභාවත් විසින් ප්‍රදේශයේ ජනතාවට සුභවාදී සේවාවක් ලබා දෙන තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ඒ අතරතුර විශේෂයෙන් බස්නාහිර පළාත් සභාවේ සෞඛ්‍ය සේවාව පිළිබඳව සාකච්ඡා කිරීමේදී අපේ රෝහල් පද්ධතිය වර්තමානයට ගැළපෙන ආකාරයට, මම ඉස්සෙල්ලා සඳහන් කරපු ආකාරයට පෞද්ගලික අංශයේ රෝහල්වල තිබෙන පහසුකම්වලට කිට්ටු වන ආකාරයට වර්තමානයේ අපේ පළාත් සභාවේ සෞඛ්‍ය සේවාව දියුණු කරන්නට අතිවිශාල මැදිහත් වීමක් අපේ ගරු අමාත්‍යතුමා ප්‍රධාන, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂතුමා ඇතුළු සියලු කාර්ය

[ ගරු ගුණසිරි ජයනාත් ]

මණ්ඩල ක්‍රියා කරලා තිබෙනවා. විශේෂයෙන් මම ජීවත් වන ප්‍රදේශය ගත්තොත් බියගම මැතිවරණ කොට්ඨාශයේ, බියගම ග්‍රාමීය රෝහල දිහා බැලුවොත් මීට අවුරුදු තුන හතරකට එහා එම රෝහලට ප්‍රදේශයේ ජනතාවට බෙහෙත් ගන්න ගියාම එක්කෝ වෛද්‍යවරයා නැහැ. මුළු රෝහලටම වෛද්‍යවරු එක්කෙනයි දෙන්නයි සිටියේ. ඒ වාගේම Nurses ලා නැහැ. අනෙකුත් කාර්ය මණ්ඩල නැහැ. බියගම රෝහල ගැන සඳහන් කළොත්, ඒ රෝහලේ අද වෛද්‍යවරු හත් දෙනෙක් ඉන්නවා. ඒ නිසා අද විශාල සේවාවක් ජනතාවට ලැබෙනවා. Nurses ලා තුන් හතර දෙනෙක් ඉන්නවා. අනෙකුත් පල්ලෙහා මට්ටමේ සෙසු කාර්ය මණ්ඩලය අවශ්‍ය ආකාරයට අද රෝහල්වලට ලබා දීලා තිබෙනවා. ඒ නිසා මම ඉතාම සතුටු වෙනවා. බියගම රෝහල පිළිබඳව සාකච්ඡා කිරීමේදී, අපේ ප්‍රදේශයේ ජනතාවට විශිෂ්ට සේවාවක් සපයන්න පුළුවන් තත්ත්වයට අද සෞඛ්‍ය සේවාව දියුණු කරලා තිබෙනවා. ඒ වාගේම තමයි බියගම රෝහලට ගිලන් රථයක අඩුවක් වෙලා තිබුණා. තිබුණු ගිලන් රථය හැම වෙලාවේම කැඩෙනවා. අවශ්‍ය සේවාව සපයා ගන්න බැහැ. දැන් මේ මාසයකට මත්තෙන් අපේ ගරු ඇමැතිතුමාත්, අධ්‍යක්ෂතුමාත් ගිහිල්ලා අලුත් ගිලන් රථයක් අපේ රෝහලට දුන්නා. ඒ වාගේම මාසයක් වාගේ කාලයක් තුළ බස්නාහිර පළාත් සභාවේ රෝහල්වලට ගිලන් රථ 45 ක් පළාත් අපේ අමාත්‍යාංශය මඟින් ලබා ගන්න කටයුතු කරලා තිබෙනවා. ඒක දැවැන්ත කාර්යයක්. බස්නාහිර පළාත් සභාවේ ඉතිහාසයේ සෞඛ්‍ය සේවාව දිහා බැලුවාම, එහෙම එකවර ගිලන් රථ ලබා දීපු අවස්ථාවක් අපට දකින්න නැහැ. ඒ නිසා එවැනි තත්ත්වයකට අපේ පළාත් සභාවේ සෞඛ්‍ය සේවාව දියුණු කරන්න අපේ ගරු ඇමැතිතුමාගේ වැඩ පිළිවෙළ තුළ හැකි වෙලා තිබෙනවා.

ඒ වාගේම අයුර්වේද වෛද්‍ය ක්‍රමය පිළිබඳව මම කථා කරන්න කැමැතියි. මම නියෝජනය කරන බියගම මැතිවරණ කොට්ඨාශයේ තිබෙන කඳුබඩ ග්‍රාමීය රෝහල. මේ කඳුබඩ ග්‍රාමීය රෝහලේ නේවාසික රෝගීන්ට ඉන්නට පුළුවන් පහසුකම තිබෙන්නේ, ඇඳන් 20 යි. කඳුබඩ ආයුර්වේද රෝහලට ගියොත් හැම මොහොතකම මේ ඇඳන් 20 පිරිලා. ඉතා විශිෂ්ට සේවාවක් සපයන්න පුළුවන් තත්ත්වයකට අද කඳුබඩ ආයුර්වේද රෝහල පත් කරලා තිබෙනවා. අද ඒ රෝහලෙන් පහසුකම්, සේවාවන්, ලබා ගන්න නිරන්තරයෙන් ජනතාව පැමිණෙනවා. ඒ නිසා හැම මොහොතේම නේවාසික රෝගීන් ඉන්න ඇඳන් 20 පිරිලා. ඊට එහා ගෙනියන්න කිසිදු ඉඩකඩක් නැහැ. ඒ නිසා ප්‍රදේශයේ ජනතාවගේ විශාල ඉල්ලීමක් තිබෙනවා. 2014 අයවැය සාකච්ඡා වන වෙලාවේදී මම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මඟින් ගරු ඇමැතිතුමාගේ අවධානයට යොමු කරනවා, කඳුබඩ ග්‍රාමීය රෝහලේ නේවාසික රෝගීන් 20 කට සරිලන ප්‍රමාණයක් ඇඳන් තිබෙන්නේ. ඒ තත්ත්වය ඊට වඩා එහාට ගෙන යන්න ඉතාම අවශ්‍ය වෙනවා. මොකද, එතරම් විශාල සේවාවක්, ජනතාවට විශ්වසනීය සේවාවක් කඳුබඩ ග්‍රාමීය රෝහලෙන් සිද්ධ වෙනවා. එම රෝහල මීට වැඩිය දියුණු කරන තත්ත්වයකට ගෙන යන්න කටයුතු කරන්නය කියන කාරණය මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාගේ මාර්ගයෙන් ගරු ඇමැතිතුමා වෙත යොමු කරන්න කැමැතියි.

ඒ වාගේම බටහිර වෛද්‍ය ක්‍රමය පිළිබඳව සැලකුවාම මම ඉතාම ස්තූතිවන්ත වෙනවා, අද අපේ රෝහල් පද්ධතිය දියුණු කරමින් විශේෂයෙන් අපට ආසන්න ප්‍රධාන නගරයක් වුණු කිරිබත්ගොඩ නගරයේ ආරම්භ කරලා තිබෙන කිරිබත්ගොඩ මූලික රෝහලේ හදිසි ප්‍රතිකාර ඒකකය. පළාත් සභාවේ අතිවිශාල මුදලක් යොදලා ප්‍රදේශයේ ජනතාවට හදිසි ප්‍රතිකාර ලබා ගන්න, හදිසි අනතුරක් සිද්ධ වුණාම කොළඹ මහ රෝහලේ දැඩි සත්කාර ඒකකයට එන්නේ නැතුව ඒ අවශ්‍ය ප්‍රතිකර්ම යොදා ගන්නට පුළුවන් පරිසරයක්, වාතාවරණයක් අවශ්‍ය පහසුකම් දීලා කිරිබත්ගොඩ රෝහල අද නවීකරණය කරලා, දියුණු කරලා තිබෙනවා. විපක්ෂය මොනවා කිව්වත්, ලෝකයත් ඒකක සංසන්දනය කළාම ඉතාම විශිෂ්ට නිදහස් සෞඛ්‍ය සේවාවක් අද අපේ රටේ තිබෙනවා. ඒ නිසාම තමයි මේ පහසුකම් අපේ ප්‍රදේශවල දියුණු කරලා තිබෙන්නේ. ඒ වාගේම රෝග මැඩ පැවැත්වීම ගත්තාම ඩෙංගු රෝගය බරපතළ ප්‍රශ්නයක් ලෙස බස්නාහිර පළාත් සභාව තුළ තිබෙනවා. අපි හැම වෙලාවේම මුහුණ දෙන ප්‍රශ්නයක්. මේ වසංගතය නැති කරන්නට, අවම කරන්නට, රෝගීන්ගේ ප්‍රමාණය අවම කරන්නට, මේක වළක්වා ගන්නට පසුගිය කාලය තුළ මේ අමාත්‍යාංශය අතිවිශාල මැදිහත්වීමක්, විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කරලා ඒ කාර්යය මැඩ පත්වන්නට විශිෂ්ට සේවාවක් පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂතුමා හරහා මේ පළාත තුළ විශිෂ්ට කාර්ය භාරයක් මේ අමාත්‍යාංශය කර තිබෙනවා කියන එක ඉතාම සතුටට කාරණයක්. ඒ වාගේම තමයි මම මතක් කරන්න කැමැතියි.

අපේ පරිවාස හා ළමා රක්ෂක සේවාව පිළිබඳව සඳහන් කළාම මම නියෝජනය කරන බියගම මැතිවරණ කොට්ඨාශයේ පිහිටා තිබෙනවා, මාකොළ සහතික කළ පාසල. පිරිමි දරුවන් රඳවා ගන්නා රැඳවුම් මධ්‍යස්ථානය. වර්තමානයේ මේ ස්ථානයේ ක්‍රියාකාරීත්වය පිළිබඳව ඉතාම කනගාටු වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාගේ මාර්ගයෙන් ගරු ඇමැතිතුමාගේ අවධානයට යොමු කරනවා මේ මධ්‍යස්ථානයෙන් ඉතා විශිෂ්ට සේවාවක් සිදු වෙනවා. දරුවන්ට අවශ්‍ය ආකාරයට පහසුකම් පසුගිය කාලය තුළ ඒ රැඳවියන් හැටියට එන දරුවන්ට ඉතා ආදරවන්ත, කරුණාවන්ත භාවයෙන් යුතුව ඒ කාර්ය මණ්ඩලය මෙහෙයවීම් කටයුතු කළා. නමුත් වර්තමානයේ එතැන ඉන්න පාලන අධිකාරිය පිළිබඳව අපට සෑහීමකට පත් වෙන්න බැහැ. ගරු ඇමැතිතුමාගේ අවධානයට යොමු කරනවා. එතැන ඉන්න පාලන අධිකාරිය මේ රටේ මහ ආන්දෝලනයක් ඇති කරපු, පරිවාස හා ළමා රක්ෂක අමාත්‍යතුමා හැටියට ඔබතුමාට මහ විශාල ගැටළුකාරී තත්ත්වයක් ඇති කරපු නිලධාරිනියක් මෙතැන ප්‍රධානියා හැටියට කටයුතු කරන්නේ. මතක ඇති ගෝනහේනේ කාන්තා රැඳවියන්ගේ මධ්‍යස්ථානයේ මහ ගැටළු රාශියක් ඇති කරලා, බස්නාහිර පළාත් සභාවට මහ චෝදනා ගණනාවක් ගෙනාපු නිලධාරිනියකට මෙතැන පාලනය භාර දීපු නිසා අද දරුවන්ට හව්හරණයක් නැහැ. දරුවන්ගේ කෑම ටික හරියට හම්බ වෙන්නේ නැහැ. දරුවන්ට ඒ පාසල තුළ අවශ්‍ය අනෙකුත් පහසුකම්, විශේෂයෙන් කෑම ප්‍රශ්නය, අනෙකුත් පහසුකම්, දරුවන්ට ආදරය කරුණාව කියන එක නැති මහ අකාරුණික තැනක් බවට මේ ස්ථානය පත් වෙලා තිබෙනවා. විශේෂයෙන් දරුවන්ගේ කෑම වේල පිළිබඳව දැඩි සුපරීක්ෂාවක් කරන්න කියන කාරණය මම මතක් කරනවා. මොකද, මේවාට අමාත්‍යාංශයෙන් විශාල මුදලක් වැය කරනවා. ඒවා ඉතාම කනගාටුදායක තත්ත්වයක් තිබෙනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාගේ මාර්ගයෙන් ගරු ඇමැතිතුමාගේ අවධානයට මම ඒ කාරණය යොමු කරනවා. ඒ වාගේම තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ දිනවල අපේ මහ ආණ්ඩුවේ සෞඛ්‍ය ඇමැතිතුමා අදහස් ප්‍රකාශ කරගෙන යනවා, අද උණ, හෙම්බිරිස්සාව ගාණට පිළිකා රෝගය පැතිරීමක් පිළිබඳව. මේක සත්‍යයක්. මහ වසංගතයක්. මේ තත්ත්වයන් පිළිබඳව අපි දැඩි ලෙස අවධාරණය කර ගන්න වෙනවා. මේ රටේ වැදගත්ම පළාත් සභාව හැටියට බස්නාහිර පළාත් සභාවට දැඩි අවධානයක් මේ සඳහා යොමු කරන්න වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මාර්ගයෙන් මම ගරු ඇමැතිතුමාට යෝජනා කරනවා, මේ පිළිබඳව අධ්‍යාපන අමාත්‍යාංශයත් එක්ක එකතු වෙලා අපේ පාසල් පද්ධතියට වෙනම වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියලා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමාට තව විනාඩි 05 ක කාලයක් ලබා දෙනවා.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

මොකද, මම ඒ කාරණය සඳහන් කරන්නේ අද දරුවන් ආහාර ගන්න ක්‍රියා පිළිවෙත, අපේ ආහාර ගන්න ආකාරය, අද වැරදි ආහාර පුරුදු නිසා දරුවෝ ඉතාම අයහපත් තත්ත්වයට පත් වෙලා තිබෙනවා. අද පාසල් වයසේ ඉන්න දරුවන්ගෙන් 15% කට දියවැඩියාව. පාසල් වයසේ ඉන්න දරුවෝ 100 ක් ගත්තොත් ඒකෙන් 15 ක් දියවැඩියා තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ වාගේම ලෝක සෞඛ්‍ය සංවිධානය ඊයේ පෙරෙයිදා වාර්තාවක් ඉදිරිපත් කළා, මේ ක්ෂණික ආහාර භුක්ති විඳීම පිළිකා රෝග කාරක ඇති වෙන්න ප්‍රධාන හේතුවක් වෙනවා කියලා. ඒ නිසා සෞඛ්‍ය අමාත්‍යාංශය හැටියට අධ්‍යාපන අමාත්‍යාංශයත් එක්ක එකට එකතු වුණු වැඩ පිළිවෙළක් තුළ දරුවන්ට නිසි ආහාර පුරුද්ද පිළිබඳව, අවශ්‍ය ආහාර මොනවාද, අනවශ්‍ය ආහාර මොනවාද, ඒ වාගේම හොඳ පෝෂණීය ආහාර පිළිබඳව දැනුවත් කරන, දරුවන් ඊට අනුගත වන ශක්තිමත් තිරසාර වැඩ පිළිවෙළක් අපේ පාසල් පද්ධතිය තුළ පළාත් සභාවේ සෞඛ්‍ය අමාත්‍යාංශය මැදිහත් වීමෙන් ක්‍රියාත්මක කරන්න කියන යෝජනාව කරනවා. ගරු ඇමැතිතුමාගේ අයවැය ඉලක්ක ජය ගන්න පුළුවන් හැකියාව ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[පූ.භා. 10.29]

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warnakumara

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බස්නාහිර පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන හා කාන්තා කටයුතු, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යාංශයේ වැය ශීර්ෂය තුළ කථා කිරීමට ලැබීම පිළිබඳව මම සන්තෝෂ වෙනවා. ඇත්තටම ජගත් අංගගේ ගරු ඇමැතිතුමාගේ අමාත්‍යාංශය මම දකින්නේ, මේ බස්නාහිර පළාත තුළ තිබෙන ක්‍රියා කරන්න අමාරුම අමාත්‍යාංශය හැටියටයි. ඒ වාගේම එකිනෙකට බද්ධ වුණු විෂයයක් තුළ ගමන් කරන අමාත්‍යාංශයක් හැටියට මම දකිනවා, මේ තුළ කටයුතු කරන්න හරි අමාරු බව. එහෙම කියන්නේ මේ තුළ යන වැඩ පිළිවෙළ, වෛද්‍යවරුත් එක්ක එහෙම නැත්නම් හෙද නිලධාරීතුමියන් එක්ක කටයුතු කරනකොට අපි දන්නවා, සමාජයේ කොයිතරම් අමාරු කාර්යයක්ද කියලා. ඒ අයට ඕනෑම දෙයක් අපට කියන්න පුළුවන්. නමුත් අපෙන් හෝ රෝගියෙකුගෙන් යම්කිසි වරදක් වුණු ගමන් සිය දහස් ගණනක් මැරෙන්න හරි ඒ අය උද්ඝෝෂණය කරනවා. ඒ වාගේ අමාත්‍යාංශයක් හැටියට දකිනවා. ඒ වාගේම අපට කථා කරන්න බැහැ. ඒ අයට කථා කරන්න පුළුවන්. ඒ කාර්යයත් එක්ක කටයුතු කිරීම හරියට දැලි පිහියෙන් කිරි කනවා වාගේ වැඩක් හැටියටයි මම මේ අමාත්‍යාංශය දකින්නේ. ඒ වාගේම සමාජ සුභසාධක කටයුතු කියන්නේ, යම්කිසි විධියකින් ඒ කාර්යය කරගෙන යනකල් හොඳයි. යම්කිසි වෙලාවක වැරැද්දක් වුණොත්, පරිවාසයේ ඉන්න ළමයෙකුගෙන් හරි යම්කිසි වරදක් වුණොත් මුළු රටටම වග කියන්න ඕනෑ. ඒ වෙනුවෙන් පෙනී සිටින්න ඕනෑ. හොඳ පෙනෙන පැත්තක් නොවෙයි. නරක විතරයි පෙනෙන්නේ.

ඒ වාගේ තමයි සමාජ සුභසාධන එක්ක අද වර්තමානයේ වැඩිහිටි සංවිධාන ඉතාමත් ජනප්‍රිය සංවිධානයක් හැටියට දකිනවා. මම අර මුලින් මතක් කළේ, එකට බද්ධ වුණු වැඩ පිළිවෙළක් කියලා. ඇත්තටම ඉතාමත් හරවත් විධියට දැක්ම සඳහන් කරනවා. සැමට සුව හා රැකවරණය. මේ පළාත් සභාව තුළ තිබෙන එකට බද්ධ වුණු විෂයය පථයක් තිබෙන එකම අමාත්‍යාංශය හැටියට මම ඒකයි මතක් කළේ. මොකද, ළමයින් ගැන, වැඩිහිටියෝ ගැන, රෝගීන් ගැන, සමාජ අවශ්‍යතා ගැන කටයුතු කරන අමාත්‍යාංශයක්. ඇත්තටම අපේ ජගත් අංගගේ ගරු ඇමැතිතුමා 2009 මැයි මාසේ මේ අමාත්‍ය ධුරය අරගත්තාට පස්සේ නවක මන්ත්‍රීවරු හැටියට අපි දැක්කා, මීට පෙර බලාගෙන හිටියා වාගේ පස්වැනි පළාත් සභාව තුළ එදා ඒ තිබුණු වැඩ පිළිවෙළ, ගරු ප්‍රධාන අමාත්‍යතුමා එදා හිටපු සෞඛ්‍ය අමාත්‍යතුමා හැටියට ගෙනාපු වැඩ පිළිවෙළ ඉදිරියට ගෙනිහිල්ලා, මුල් වකවානුවල ආපු බාධක සියල්ල ජයගන්න අපේ ජගත් අංගගේ ගරු ඇමැතිතුමාට පුළුවන් වුණා. මොකද, මුල් කාලයේ අපට මතකයි ඩෙංගු කියන වැඩ පිළිවෙළ බස්නාහිර පළාත තුළ ඉතාමත්ම ඉහළට පැතිරී ගිහින් තිබුණා. නමුත් ගිය පළාත් සභාවල අයවැය කථාවලදී විශේෂයෙන්ම මම මතක් කරන්න ඕනෑ, ගොඩක් අය කථා කළේ ඩෙංගු ගැන. නමුත් අද කවුරුවත් ඩෙංගු ගැන කථා කරන්නේ නැහැ. ඩෙංගු වසංගතය නැති නිසා. ඇත්තටම එදා ඩෙංගු කියන රෝගය ඉතාමත්ම ඉහළ මට්ටමක තිබුණු අතර, මිය ගිය ප්‍රමාණයත් ඉතාමත් ඉහළ මට්ටමක තිබුණා. ඒ නිසා අද ඒ ගැන කථා නොකරන්නේ ඒක සාර්ථකව මැඩ පැවැත් වූ නිසා.

ඇත්තටම අද අපට කථා කරන්න වෙලා තිබෙන්නේ, බෝ නොවන රෝග ගැන. ඇත්තටම අද ඒක ලොකුවට කථා කරනවා. සෞඛ්‍ය විෂයය හැටියට, මම හැමදාම කියනවා වාගේ ලෙඩේට බෙහෙත් දෙනවා වාගේම ඒ ලෙඩේ මුල හොයලා ලෙඩක් නොවන ආකාරයට කටයුතු කළොත් මම හිතන්නේ, අපේ මුදල් ප්‍රතිපාදන වැඩියෙන් වියදම් කළත් ඒ අරමුණ කරා අපට නිදහසේ - ලෙඩ වෙනුවෙන් වියදම් කරන මුදල් ප්‍රතිපාදන අඩු කරන්න පුළුවන්. ඒක මම හිතන්නේ වර්තමානයේ අපේ ප්‍රාදේශීය සෞඛ්‍ය නිලධාරීතුමන්ලා අපේ ජගත් අංගගේ ගරු ඇමැතිතුමාගේ උපදෙස් මත MOH හරහා ලොකු වැඩ පිළිවෙළක් ගෙන යනවා. එදා මවට පමණක් සීමා වෙලා තිබුණු වෛද්‍ය සායනය, මාතෘ සායනය අද මුළු පවුලටම ඒ තුළින් කටයුතු කරන්න පුළුවන් වෙලා තිබෙනවා. ලෙඩක් හඳුනාගෙන, ඒ ලෙඩේට අවශ්‍ය බෙහෙත් හේත් ගන්න පුළුවන් තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ ලෙඩේ පහළ මට්ටමේදීම, ගම් මට්ටමෙන් - එහෙම කිව්වොත් නිවැරැදියි. ගම් මට්ටමෙන්ම ඒ ලෙඩේ හඳුනාගෙන ඒ ලෙඩේ සුව කරන වැඩ පිළිවෙළකට යන්න පුළුවන්. එතකොට රෝහල්ගත වන ප්‍රමාණය ගොඩක් අඩු කරලා එහෙම නැත්නම් ක්ෂණිකව මිය යන, ක්ෂණිකව ආබාධිත තත්ත්වයට පත් වන රෝගීන් ගොඩක් අඩු කරන්න පුළුවන් වෙලා තිබෙනවා කියන එක ඇත්තටම මතක් කරන්න ඕනෑ. මොකද, අද අපේ ගුණසිරි ජයනාත් ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ සෞඛ්‍ය සායන ටික ඉතාමත් ඉහළ මට්ටමකට ගෙන

එන්න පුළුවන් වුණා. සමහර වෙලාවට ගම්වල අය කථා වෙන ආකාරයට නවලෝක රෝහලට ගියා වාගේ කියලා කියනවා. මොකද, රෝගියෙකුගේ මානසිකව සුව කරන්න පුළුවන් රෝග ගොඩක් තිබෙනවා. සමහර වෙලාවට රෝගියාට කථා කරන විලාශයෙන් රෝගියාත් එක්ක සමීපව කටයුතු කරන ආකාරයෙන් රෝග සුව කරන්න පුළුවන්. ඒ වාගේම තමයි දැක්මත් එක්ක හොඳ තැනකට ගිහිල්ලා, පිරිසිදු මනසින් සතුටින් තබන තත්ත්වයට ගොඩ නැඟුවාම සමහර වෙලාවට නිකම්ම රෝග සුව වන අවස්ථාවල් තිබෙනවා. ඒ නිසා ඒ තැනට සෞඛ්‍ය සායන ඔක්කොම ටික ගෙන එන්න පුළුවන් වෙලා තිබෙනවා. බස්නාහිර පළාතේ තිබෙන 80% ක් විතර මුදල් ප්‍රතිපාදන වෙන් කරලා, ඒ අවශ්‍යතාවය අනුව පවුලේ සියලු දෙනාටම ඒ තුළින් සේවාවක් ලබා ගන්න පුළුවන් ආකාරයට කටයුතු කරන්න ඇත්තටම වර්තමානයේ ජගත් අංගගේ ගරු ඇමැතිතුමාගේ අමාත්‍යාංශය හරහා හැකි වෙලා තිබෙනවා.

ඒ වාගේම මම මුලින් මතක් කළා වාගේ සමාජ සුභසාධන වැඩ පිළිවෙළ තුළ අද ගමේ තිබෙන ශක්තිමත්ම, ගමේ තිබෙන ප්‍රායෝගිකම සමිතිය හැටියට ඇත්තටම වැඩිහිටි සමිති - වැඩිහිටි කිව්වාම ඇත්තටම අතිගරු ජනාධිපතිතුමා ඒ වචනය අයින් කරලා ජ්‍යෙෂ්ඨ පුරවැසියෝ කියන නාමය තමයි දුන්නේ. මොකද, වැඩිහිටියෝ කිව්වොත් අපි හිතන්නේ මොනවත් කරන්න බැරි, අයින් කළ යුතු කොටසක් හැටියටයි. නමුත් ජ්‍යෙෂ්ඨ පුරවැසියෝ කිව්වාම ඒ අයට ලොකු ආඩම්බරයක්, ගාම්භීරත්වයක් තිබෙනවා. මම හිතන්නේ, ඒ සමිතිය තමයි ප්‍රායෝගිකම සමිතිය හැටියට තිබෙන්නේ. මොකද, එය ප්‍රායෝගිකයි කියන්නේ, ඒ තුළ රාජ්‍ය සේවයේ විශ්‍රාමිකයෝ ඉන්න පුළුවන්. ඒ වාගේම ව්‍යාපාරිකයෝ. හොඳ බුද්ධිමතුන්, උගතුන් මේ රටට ලොකු සේවයක් කරපු කොටසක් තමයි එතැන ඉන්නේ. ඒ තමයි පරිණත කට්ටිය. ඒ අය අතර රුපියලට දෙකට නොවෙයි, ශත ගණන්වලට ගණුදෙනු කරපු කට්ටියත් අද රුපියල් ලක්ෂ ගණන්වලින් ගණුදෙනු කරන, මේ වර්තමානයේ දැකපු අත්දැකීම් එක්ක පරිණත වූ කොටසක් තමයි ඇත්තටම ඒ සමිතිවල ඉන්නේ. එම නිසා ඒ සමිති ඉතාමත් සාර්ථකව ඒ අයව හුදෙකලා නොකර වැඩිහිටියන්ට වෙන් කරන මුදල, සමහර වෙලාවට සෞඛ්‍ය වෙනුවෙන් වෙන් කරන මුදල වියදම් කරනවා අඩු වෙන්න පුළුවන්. ඒ අයගේ මානසිකත්වය තුළ ලෙඩ රෝග අඩු වෙලා තිබෙනවා. හුදෙකලා නොවීම තුළ ඒ අයගේ ලෙඩ රෝග අඩු වෙලා, ඒ අය අපට වැඩිය ශක්තිමත් හොඳ සෞඛ්‍ය සම්පන්න කොටසක් හැටියට සමාජයේ ලොකු මෙහෙවරක් කරනවා කියන එක ඇත්තටම මතක් කරන්න ඕනෑ. ඒකට ලොකු වාසියක් වුණේ මේ සෞඛ්‍ය අමාත්‍යාංශය. මොකද, අපට එදා ඒ ජ්‍යෙෂ්ඨ පුරවැසි සංවිධානවලට කිසිම ප්‍රතිපාදනයක් ලබා දෙන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. නමුත් අද අපට ඒ අයගේ අවශ්‍යතාවයන් වෙනුවෙන් ඒ අය කරන සේවයට අපට ලබා දෙන්න පුළුවන් ශක්තිය, වටපිටාව මේ පළාත් සභාව තුළින් අපි ලබා දීලා තිබෙනවා. අපේ ප්‍රතිපාදන ලබා දීලා ඒ අවශ්‍යතාවයන් වෙනුවෙන් ඇත්තටම කටයුතු කරන්න පුළුවන්කමක් තිබෙනවා.

විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ. පළාත් සභාවක් හැටියට මේ ගෙන යන වැඩ පිළිවෙළට මධ්‍යම රජයේ සෞඛ්‍ය අමාත්‍ය මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ලොකු සේවයක්, ලොකු හයියක් බවට පත් වෙලා තිබෙන බව ඇත්තටම මේ අවස්ථාවේ මතක් කරන්න ඕනෑ. මධ්‍යම රජය ලබා දෙන ඒ ශක්තිය තුළ මම හිතන්නේ, අපේ ජගත් අංගගේ ගරු ඇමැතිතුමාට මේ කාර්යය ඉතාමත් සාර්ථකව ඉස්සරහාට ගෙනියන්න, ප්‍රදේශයට අවශ්‍ය විදියට, ජනතාවගේ අවශ්‍යතාවය අනුව කටයුතු කරන්න ඉඩ සලසා ගන්න හැකි වුණා. ඇත්තටම එතුමා නිහඬ ඉතා අමාරු සේවයක් කළා කියලයි මම විශ්වාස කරන්නේ. මොකද, මා මුලින් කිව්වා වාගේ සෞඛ්‍ය ක්ෂේත්‍රයත් එක්ක ගැටෙනකොට ගණුදෙනු කරන්න හරි අමාරුයි. නමුත් කළුතර දිස්ත්‍රික්කයට තිබෙන එකම අමාත්‍ය ධූරය හැටියට එතුමා අපේ දිස්ත්‍රික්කයටත් සලකන ගමන්, මුළු බස්නාහිර පළාතටම සමව එතුමාගේ සේවය ලබා දුන්නා කියන එක මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. මොකද, ඒක අපි ප්‍රායෝගිකව අත් විඳිනවා. ඒක අපි ප්‍රායෝගිකව දකිනවා. එදා තිබුණු රෝහල නොවෙයි අද ගියාම තිබෙන්නේ. එදා රෝහලකට ගියාම ලෙඩ වැඩි වන තත්ත්වයක් තමයි තිබුණේ. නමුත් අද අපට සියයට සියයක් එතැන නැති වුණත්, 50% ක් 60% ක් 75% කට හරි හරියාකාරව කටයුතු කරන්න අපට පුළුවන් වෙලා තිබෙනවා. රෝහලක් වුණාම ලෙඩ වැඩි වන තැනක් නොවෙයි, ලෙඩ අඩු වන තැනට ගෙන එන්න කටයුතු කරන්න පුළුවන් වෙලා තිබෙනවා, මේ පස්වැනි පළාත් සභාව තුළ අපේ ජගත් අංගගේ ගරු ඇමැතිතුමාගේ කාර්යයත් එක්ක. ඒ කාර්යයේදී ඇත්තටම විශේෂයෙන්ම නිලධාරීන් හැටියට බහුතරයක් ඒ සහයෝගය ලබා දෙන්න කටයුතු කරනවා. අපේ

[ ගරු ලලිත් වර්ණකුමාර ]

අමාත්‍යාංශයේ ලේකම්තුමා. ඒ වාගේම විකුම් ගුණසේකර ගරු මන්ත්‍රීතුමා මතක් කළා වාගේ පළාත් අධ්‍යක්ෂතුමා. එතුමා ප්‍රායෝගිකව ඒ කාර්යය ඉතාමත් සාර්ථකව කරනවා. එතුමාට ප්‍රශ්න ආවත් පහළ නිලධාරීන් කොයි ආකාරයට කටයුතු කළත් ඉහළ වගකීම් දරන අය ඇත්තටම ඒ කාර්යයේ කටයුතු කරනවා. ඇත්තටම මමත් ස්තුතිවන්ත වෙන්න ඕනෑ. අපේ විකුම් ගුණසේකර ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ පළාත් අධ්‍යක්ෂතුමාට ඕනෑම වෙලාවක දුරකථනයෙන් කථා කරන්න පුළුවන්. මම අගය කරන දෙදෙනෙක් ඉන්නවා. ඇත්තටම මේ පළාත් සභාව තුළ ඒ කාර්යය මැනවින් කරනවා. පළාත් පාලන කොමසාරිස්තුමියත් එහෙමයි. හදිසියේ ගන්න බැරි වුණොත් නැවත ගන්නවා. පළාත් අධ්‍යක්ෂතුමාත් එහෙමයි. ඇත්තටම මගේ පෞද්ගලික අත්දැකීමේ හැටියට මේ පළාත් සභාවේ සෞඛ්‍ය අමාත්‍යාංශ වැය ශීර්ෂයට කථා කිරීමේදී මම ඒක ආඩම්බරයෙන් මතක් කරන්නට ඕනෑ. අපි සියලු දෙනාගේම අරමුණ විය යුත්තේ, නිරෝගී මනුස්සයෙක්, නිරෝගී ජනතාවක් මේ පළාත තුළ හෝ මේ රට තුළ ස්ථාපිත කිරීම. ඒ තුළදී ඇත්තටම මම දකින්නේ, අපි ලෙඩවලට බෙහෙත් කරනවා වෙනුවට ලෙඩවලට ලොකු මුදලක් වැය කරනවා. ලෙඩ එන තැන, ලෙඩ මූලාරම්භය හොයලා එතැනට වැඩියෙන් මුදලක් වියදම් කරලා ලෙඩ නොඑන තත්ත්වයට කටයුතු කරන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කළොත් ඇත්තටම අපි වාසනාවන්තයි කියලා මම විශ්වාස කරනවා. මොකද, ලෝකයේ කොහේවත් නැහැ මේ වාගේ වියදම් කරලා නොමිලේ අධ්‍යාපනය සහ සෞඛ්‍ය දෙන රටක්. මම හිතන්නේ, ලෝකයේ ධනවත් රටක්වත් නැහැ, මේ විධියට අධ්‍යාපනය සහ සෞඛ්‍ය නොමිලේ දෙන. ඉතින් ඒ නිසා ඒකේ ප්‍රතිලාභ ගන්න අපි මානුෂිකව ජනතාවට කිව්වාට වැඩක් නැහැ. අපි නීතිරීති තුළින්, යම්කිසි නීතිරීති ගෙනැල්ලා ඒ ලෙඩවල මූලාරම්භය සොයා බලා කටයුතු කරමුයි කියන එක මතක් කරනවා.

විශේෂයෙන්ම පළාත් සභාවක් හැටියට හොඳම කියනවා වාගේම අවසාන වශයෙන් අඩුපාඩුවකුත් මතක් කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මගින් ගරු ඇමැතිතුමාට මතක් කරන සිටිනවා. වෛද්‍යවරු සියලු දෙනාම නොවෙයි. සුළු කොටසක් හරි තමන්ගේ - ඉස්සර ඉස්කෝලේ හාමිනේලා අද ගුරුවරු බවට පත් වනකොට ඒ අය වෙනස්. ඉස්සර හිටපු වෛද්‍යවරු, වෙද මහත්වරු වාගේම අද වෛද්‍යවරු හාත්පසින්ම වෙනස්. සියල්ලෝම නොවෙයි මම කියන්නේ. සමහර තැන්වලදී ලෙඩෙකුට, මියගිය අයෙකුගේ පවුලේ උදවියට කථා කරන විධිය මිය ගිය කෙනා තමන්ට තවත් එකක් බවට සීමා කරනවා. නමුත් යම්කිසි අවස්ථාවක කෙනෙක් මිය ගියොත්, ඒ මියගිය කෙනා පවුලේ භාරකාරයා නම් ඒ අමාරුව තිබෙන්නේ ඒ පවුලටයි. නමුත් සමහර වෛද්‍යවරුන්ට ඒක සාමාන්‍ය දෙයක් විතරයි. කපලා, කොටලා, පරීක්ෂණ කරලා, හුරු වෙලා තිබෙන්නේ. රියදුරෙක් වුණත් වාහනයට නැගපු ගමන් හොඳ පළපුරු කෙනෙක් නම් භය නැහැ. නමුත් දෙයක්, අනතුරක් වුණාම ඒක එයාට සමාන්‍ය දෙයක්. ඒ වාගේම හැම දේම, හැමදාම කරනකොට සාමාන්‍ය දෙයක් නොවී පවුල ගැන, ඒ වගකීම ගැන ලොකු වගකීමක් හැටියටත්, මියගිය කෙනාගේ වගකීමක් හැටියට තමන්ගේ අතින් යම්කිසි වරදක් වුණා නම්, ඒක භාර අරගෙන ඊළඟට නොවන තැනට කටයුතු කරන්න වෛද්‍යවරුන්ගේ මානසිකත්වය හදන්න පුළුවන් නම්, සියල්ලම ගැන නොවෙයි මම මේ කියන්නේ. ප්‍රායෝගික අත්දැකීම්වලින් සමහර අය ගැන මම කියන්නේ. එහෙම හදන්න පුළුවන් නම් ලොකු සේවාවක් මේ රටට වෙනවා කියන එක මතක් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[පූ.භා. 10.43]

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළාත් සභා ක්‍රමය තුළ මේ පළාත් සභාව තුළ මම හිතන්නේ, මහ ඇමැතිවරයාත් එක්ක ඇමැතිවරු හතර දෙනෙක් ඉන්න පළාත් සභාවේ ඉතාමත්ම අහිංසකම දේශපාලන අමාත්‍යවරයා විධියට මේ සභාව තුළ ඉන්න -

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warnakumara

අනෙක් අය චණ්ඩිද?

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

අනෙක් අයට මොන මොනවා හරි කාරණා තිබෙනවා. නමුත් මෙතුමා බොහොම අහිංසක විධියට, ඇල් වතුරත් නිවලා බොන විධියට ඉඳලා - මේ පළාත් සභාව තුළ

හිටපු සභාපතිවරයෙක් විධියට අත්දැකීම් රාශියක් සපිරුණු දේශපාලඥයෙක්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ගම්මන්පිල ඇමැතිතුමා -

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

එතුමා මගේ යාළුවා නේ. බාධා කරන්න එපා. ඒ නිසා මෙතුමා පළාත් සභාව තුළ නිහඬව සුවිශාල කාර්ය භාරයක් කරපු සහ කරන්න උත්සාහ කරපු අමාත්‍යවරයෙක් විධියට හඳුන්වන්න පුළුවන්. හැබැයි මේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයාට පස්සේ දෙවැනියට විශාලතම වැය ශීර්ෂය හිමි වෙන්නේ සෞඛ්‍යයට. මේ රටේ ගත්තත් නිදහස් අධ්‍යාපනය. ඊට පස්සේ නිදහස් සෞඛ්‍යය. මේ කාරණා දෙක තමයි මේ සිවිල් සමාජයේ බද්ධ වුණු ප්‍රධානතම සමාජ සේවා කාරණා දෙක. බස්නාහිර පළාත් සභාව විධියට, පළාත් සභා බල ප්‍රදේශයේ අපි හැමදාම මතු කරපු තර්කයක් තමයි පර්යන්ත රෝහල් තිබෙනවා. Terminal Hospital. පිළියන්දල හන්දියට එනකොට ගහලා තිබෙනවා පර්යන්ත රෝහල කියලා ඊතලයක්. හැබැයි පර්යන්ත රෝහලට ගියාම Prescription එක විතරයි දෙන්නේ. ඒ කියන්නේ දොස්තර මහත්තයා ඉන්නවා. බෙහෙත් තුණ්ඩුව ලියලා දෙනවා. පිළියන්දල හන්දියට ගිහිල්ලා ෆාමසියෙන් ගන්නවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

Prescription එක විතරද දෙන්නේ?

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ඒකේ වෙන දෙන්න දෙයක් නැහැ. හැබැයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාමත් කනගාටුවෙන් කියන්න වෙනවා. වෘත්තීය සමිති ව්‍යාපාරය සෞඛ්‍ය සේවය තුළියට අරගෙන. පිළියන්දල රෝහල පාලනය කරන්නේ DMO නොවෙයි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ වෘත්තීය සමිතිය. මේ පිළිබඳව දිගින් දිගටම ගරු ප්‍රධාන ඇමැතිතුමාත් එක්ක කථා කළා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ වෘත්තීය සමිතියේ උවමනාව මත එක්තරා සේවකයෙක් මාරු කළා. ඔබතුමා දැන් ගියොත් වෘත්තීය සමිති නායකවරු රෝහල ඇතුළේ කාලය ගත කරන ආකාරය, ඔවුන් සේවය කරන ආකාරය දුටුවොත් ඔබතුමාට කනගාටුවට පත් වෙන්න සිද්ධ වෙනවා, ඔබතුමා ගත්තු තීන්දු සම්බන්ධයෙන්. හොඳට වැඩ කරන මිනිස්සු යවනවා. වෘත්තීය සමිතිවලට ඕනෑ විධියට තමන්ගේ දේශපාලන ක්‍රියාදාමය නොවෙයි - ඒ රෝහල තුළ ඔවුන් තමන්ගේ වෘත්තීය සමිති ව්‍යාපාරය පාවිච්චි කරන්නේ, වෘත්තීය සමිති අයිතිවාසිකම්වලටවත්, එහෙම නැත්නම් අහිංසක ජනතාව වෙනුවෙන්වත් නොවෙයි. ඔවුන්ගේ කාලය පැය අට -

**ගරු ගාමිණී සිල්වා**
Hon. Gamini Silva

DMO වැඩ කරන්නේ එක්සත් ජාතික පක්ෂයට ඕනෑ විධියට.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

සඳහා - ගාමිණී සිල්වා ගරු මන්ත්‍රීතුමා.

**ගරු ගාමිණී සිල්වා**
Hon. Gamini Silva

DMO වැඩ කරන්නේ එක්සත් ජාතික පක්ෂයට ඕනෑ විධියට.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මම කනගාටු වෙනවා. අපි DMO මහත්තයා එක්ක කථා කරලා තිබෙන්නේ, Telephone එකෙන් විතරයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි -

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

ඒ කියන්නේ ඉස්පිරිතාලෙට ගිහින් නැහැ.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ඔබතුමිය දන්නේ නැති වුණාට මම පෞද්ගලිකව ඔය රෝහලට රුපියල් ලක්ෂ 110 ක් දීලා, වාට්ටු සංකීර්ණයක් හදලා දීලා තිබෙනවා මන්ත්‍රීතුමිය. දැනගෙන ගියොත් කතරගම. නොදැන ගියොත් අතරමග. ඔබතුමිය අහක යන කෝච්චිවලට බෙල්ල තියන්න එපා. මම ආසයි ඔබතුමිය

[ ගරු නිරෝෂන් පාදුක්ක ]

ලස්සනට ඇඳලා ඉන්නවා බලන්න. මම ආස නැහැ එළියෙන් පේන ලස්සන ඇතුළෙන් අවලස්සන කරන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා හරහා මේ (බාධා කිරීම්)

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමා මූලාසනයට කථා කරන්න.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මූලාසනයට තමයි ඉතින් කථා කරන්නේ.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල (කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත සහ පරිසර කටයුතු අමාත්‍යතුමා)**
Hon. Udaya Prabhath Gammanpila (Minister of Agriculture, Agrarian Development, Minor Irrigation, Industries and Environmental Affairs.)

එළියෙන් පේන ලස්සන ඇතුළේ නැහැයි කියලා කියන්නේ කොහොමද?

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

පෞද්ගලිකව හම්බ වෙන්න ඒක කියලා දෙන්නම්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි -

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

හොඳයි කියන්න. නැගිටලා කියන්න. මොකක්ද අංකය?

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මොකක්ද 36 (1)? කියන්න?

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට අපහාස කළා වාගේ හැඟෙනවා. ඒ ගැන ක්‍රියාත්මක වෙන්න ඕනෑ. ඒක ඉල්ලා අස් කර ගැනීමක් කරන්න කියන්න.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමා එතුමිය ගැන ඇහුවේ නැහැ. එතුමා ඇහුවේ එළියෙන් පේන ලස්සන පෙන්නන්නේ කොහොමද කියලා. ඒක එතුමියට කිව්වේ නැහැ. ඒක නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මාර්ගයෙන් ඉල්ලා සිටින්නේ, සෞඛ්‍ය අමාත්‍යාංශය තුළ මීට වඩා කාර්යක්ෂම සේවාවක් ජනතාවට ලබා දෙන්න පුළුවන්කම තිබුණා. නමුත් මම හිතන්නේ, සේවක අයිතිවාසිකම් වෙනුවෙන් සමහර අය පාවිච්චි කරන න්‍යාය පත්‍ර බොහොම කනගාටුදායකයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. හැබැයි, මේ අවස්ථාවේදී ඇහුම්කන් දීම අතින් අමාත්‍යවරයා ඉදිරියෙන් ඉන්නවා. ඒ විතරක් නොවෙයි. ඒ අමාත්‍යාංශයේ වෛද්‍ය හර්ෂ ද සිල්වා මහත්මයාට කථා කළොත් ප්‍රශ්නයට උත්තරයක් තිබෙනවා. කල් මැරීමේ න්‍යාය පත්‍රයක් එතුමා ළඟ තිබුණේ නැහැ. අපි ඇහුවොත් Yes or No වචන දෙකෙන් එකක් එතුමා ළඟ තිබුණා. මම හිතන්නේ, ඒකත් මේ අමාත්‍යතුමා තුළ තිබෙන සම්බන්ධීකරණ හැකියාවත්, ඒ අමාත්‍යාංශය ඉතා විශාල අර්බුද මැද්දේ ඉදිරියට ගේන්න උදව් වුණාය කියලා අපි විශ්වාස කරනවා. ඒ නිසා බස්නාහිර පළාතේ සෞඛ්‍ය අමාත්‍යාංශය - හැබැයි මේ අයවැය දිහා බැලුවාම, මේ සභාව දිහා බැලුවාම, ඇවිල්ලා ඉන්න මන්ත්‍රී කණ්ඩායම දිහා බැලුවාම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හිතනවා මේ සභාවේ මන්ත්‍රීවරු පරිවාසයට යටත් කරන්න වෙනවා. ළමා මන්ත්‍රීවරු නැහැ. සෞඛ්‍ය අමාත්‍යාංශ වැය ශීර්ෂයේදී මේ සභාව තුළ තිබෙන තත්ත්වය, කනගාටුදායකයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මන්ත්‍රීවරු සෞඛ්‍ය සායනයේ ඉන්නවා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

කෑම බොන්න ගිහිල්ලා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි අවංකවම බස්නාහිර පළාත් සභාවේ විශේෂ අවධානය

යොමු කරන්නේ, ප්‍රධාන ඇමැතිතුමාගේ වැය ශීර්ෂය සම්බන්ධයෙන් පමණයි. නමුත් ඊට එහා ගිය සුවිශාල කාර්ය භාරයක් බස්නාහිර පළාතේ ජනතාවට දැනෙන සේවාවක් මේ සෞඛ්‍ය අමාත්‍යාංශය හරහා කරන්න පුළුවන්. ඒ නිසා මේ පළාත් සභාව තුළ අධ්‍යාපන ක්ෂේත්‍රයේ අලුතෙන් හිතන්න ඕනෑ ආකාරයක් ඇවිල්ලා තිබෙනවා. (බාධා කිරීමක්) මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ අපි යෝජනා කරනවා අද මේ වනකොට - ඊයේ මම ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ වැය ශීර්ෂයේදී කථා කළා කුණු දහනය කරන යන්ත්‍රයක් වත්තලට ගෙනැල්ලා ඒක හයි කරන්නේ නැතුව කැළි කසළ අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය ළඟ තිබෙනවා. පුළුවන් නම් ඒක සෞඛ්‍ය අමාත්‍යාංශයට දෙන්න. රෝහල්වල කසළ ගොඩ ගැහිලා තිබෙනවා. මම ජාතික රෝහල් දෙක තුන ගැන කථා කරන්නේ නැහැ. හැබැයි, ඒ යන්ත්‍රය ලබලා දුන්නොත්, සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ තිබෙන භූමි භාගයක සවි කළොත් අඩුම ගාණේ සතියකට දවසක් ගෙනැල්ලා සියලුම රෝහල් අපද්‍රව්‍ය පිච්චීමේ ව්‍යාපාරයකට මේ යන්ත්‍රය දායක කර ගන්න පුළුවන් වේවි කියලා මම විශ්වාස කරනවා. ඒ සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයත් ගරු ප්‍රධාන ඇමැතිතුමාත් අතර අන්‍යෝන්‍ය අවබෝධයකින් ක්‍රියා කළොත් මම හිතනවා, මේ යන්ත්‍රයේ ප්‍රයෝජනය අනාගතයේදී මේ බස්නාහිර පළාත් සභාවේ ජනතාවට ලබා ගන්න පුළුවන් වේවි කියලා.

ඒ නිසා අවසාන වශයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහොම අසීරු කාලයක්. පසුගිය අවුරුදු 05 මේ පළාත් සභාව තුළ විපක්ෂයේ මන්ත්‍රීවරු කුඩා ප්‍රමාණයක් ඉඳිද්දී දැවැන්ත මන්ත්‍රීවරු රාශියක් ආණ්ඩු පක්ෂය නියෝජනය කරද්දී සියලුම ආශිර්වාදය ආණ්ඩු පක්ෂයට තියෙද්දී, ඕනෑ නම් මේ ඇමැතිවරයාට හොරකම් කරන්න තිබ්බා. නමුත් ඒ ඇමැතිවරයා එහෙම කළේ නැහැ. ආණ්ඩුව පැත්තේ ඉන්නකොට වැඩි ගණනට බිල් දාන්න තිබ්බා. එහෙම කළේ නැහැ. තමන්ට අයිති නැති විෂයයන් අමාත්‍යාංශයට ගෙනැල්ලා සුම්මා මනී හොයා ගන්න තිබ්බා. ඒවා කළේ නැහැ. (බාධා කිරීමක්). මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ යථාර්ථය තුළ හෘදය සාක්ෂියට එකඟව අපේ ඇමැතිතුමාට කවදා හරි දවසක සතුටු වෙන්න පුළුවන්. දේශපාලනයෙන් සමු ගත්තු දිනයක හෝ මම මගේ කාර්ය භාරය හරියට කළා. මහජන මුදල් හොරකම් කළේ නැහැ. ඒ නිසා ලබන ආත්මේ මම බල්ලෙක් හෝ කපුටෙක් වෙලා ඉපදෙන්නේ නැහැ කියන කාරණය එතුමාගේ හිතේ සාක්ෂාත් කරගෙන බොහොම ගෞරවනීය දේශපාලඥයෙක් විධියට සහ අපි මේ සභාවේ පළමුව දුටු සභාපතිවරයා විධියට, එතුමා අවුරුදු 05 ක් ඇමැතිවරයෙක් විධියට යම් කාර්යයක් කළා කියලා අපි සතුටු වෙනවා. ඒ නිසා එතුමාට දේශපාලනයේදී තවත් අභියෝග අනාගතයේදී එයි. එතුමාට අනාගත බලාපොරොත්තු ඇති. මේ අවුරුදු 05 තුළ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ විවිධ අත්දැකීම්වලට මුහුණ දෙන්න ඇති. ඒ හරහා ඉදිරියේදී පළාත් සභා ක්‍රමය තුළ සෞඛ්‍ය ක්ෂේත්‍රය ප්‍රධානතම විෂයය බවට පත් විය යුතුයි. අධ්‍යාපනයට පස්සේ දැවැන්තම ව්‍යාපාරය බවට සෞඛ්‍ය පත්විය යුතුයි කියන මූලික කාරණය මතක් කරමින්, අනාගතයේදී මේ වැය ශීර්ෂය තුළ රෝහල් පරිපාලනයට එහෙම නැත්නම් අලුතෙන් මේ රෝහල් පද්ධති තුළට එකතු විය යුතු දේවල් මොනවාද කියන එක පිළිබඳව, විශේෂයෙන්ම අද වනකොට ගමේ ඉස්සර තිබුණු රෝහල් කමිටු ක්‍රියාත්මක වෙනවා බොහොම අඩු මට්ටමකින් තිබෙන්නේ. රෝහල් සම්බන්ධයෙන් ගමේ දායකත්වය ලැබෙන්නේ නැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

හොරෙන් පිහිටුවන්නේ.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

හොරෙන් පිහිටුවන්නේ. එදා වගේ අද ගමේ දායකත්වය නැහැ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා මේ පිළිබඳවත් අමාත්‍යවරයාගේ දැඩි අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා. බොහෝ දුරට මේ පළාත් සභාව විසුරුවා හරීවි. ඒ නිසා අනාගතයේදී අපේ අමාත්‍යවරයාටත් අසුභ අනාගතයකින් තොර සුභ අනාගතයක් උදා වේවා කියලා ප්‍රාර්ථනය කරමින් නිහඬ වෙනවා.

[පූ.භා. 10.52]

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බස්නාහිර පළාත් සභාව තුළ දෙවැනි විශාලතම අයවැය ශීර්ෂය යටතේ, පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, කාන්තා කටයුතු, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු

[ ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන ]

අමාත්‍යාංශය යටතේ අහම්බෙන් වුණත්, හදිසියේ වුණත් කථා කරන්න ලැබීම මම හිතන්නේ එක අතකට වාසනාවක් හැටියට මා සලකනවා. විශේෂයෙන්ම සෞඛ්‍ය කියලා කියන්නේ, අපේ රටේ ජනතාවට දැනෙන උග්‍රම දෙයක් කියන එකයි අපි විශ්වාස කරන්නේ. සෞඛ්‍ය අමාත්‍යාංශය හරහා පසුගිය කාල වකවානුව තුළ අපේ ගරු ඇමැතිතුමා විශාල වැඩ කොටසක් එතුමාගේ වපසරිය තුළ ඉදිමින් ක්‍රියාත්මක කරන්න කටයුතු කළා. අපට මතකයි, මේ අමාත්‍යාංශය හරහා ක්‍රියාත්මක කරන වැඩ සටහන්වලදී විශේෂයෙන්ම කාන්තාවක් හැටියට, මවක් හැටියට අපි දැක්කා ගරු ඇමැතිතුමා මේ අමාත්‍යාංශය භාර ගත්තාට පස්සේ ළමා හා මාතෘ සායන පිළිබඳව දැඩි අවධානයක් යොමු කරවමින් ඒවායේ තිබුණු තත්ත්වයන් නඟා සිටුවන්න කටයුතු කරපු ආකාරය. විශේෂයෙන් අපට අපේ ගම්වල මීට කලින් තිබුණු මාතෘ සායනවල අම්මා කෙනෙක්ට වාඩි වෙන්න ස්ථානයක් තිබුණේ නැහැ. සමහර විට අම්මලා අත දරුවෙක් අරගෙන ගිහිල්ලා, ඒ දරුවාට කිරි ටික දුන්නේ, වාඩි වෙලා හිටියේ ගස් යට. ගල් යට. ඒ යුගය අවසන් කරන්න අපේ ගරු සෞඛ්‍ය ඇමැතිතුමා පසුගිය කාල වකවානුව තුළ බැසිල් රාජපක්ෂ ගරු ඇමැතිතුමාත් සමග ඒකාබද්ධ වෙමින් ළමා හා මාතෘ සායන නඟා සිටුවන්න වැඩ සටහනක් ක්‍රියාත්මක කළා. අපි බොහොම ආඩම්බරයෙන් කියන්නේ, මේ වනකොට එවැනි මාතෘ සායන 63 ක් ගම්පහ, කොළඹ, කළුතර දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක වෙලා, සංවර්ධනය වෙලා වැඩ අවසන් වෙලා තිබෙනවා. ඒත් එක්කම එය තව තවත් පුළුල්ව ඉස්සරහාට ගෙනියන්න, වසරින් වසර එවැනි මාතෘ සායන ගැන සොයා බලා කටයුතු කරන්න එතුමා ක්‍රියාත්මක වෙලා තිබෙනවා. විශේෂයෙන්ම ඒ වැඩ සටහන ක්‍රියාත්මක වීමට පටන් ගැනීමත් එක්කලා වෙනදාට වඩා නාගරික පැතිවල ජනතාවට අපේ ආණ්ඩුවේ තිබෙන මාතෘ සායන ගැන, වෛද්‍යවරු ගැන විශ්වාසයක් ඇතිව ඒවාට සම්බන්ධ වීමේ වැඩි ප්‍රවණතාවයක් අපට දකින්නට ලැබෙනවා.

විශේෂයෙන්ම රෝහල් ගැන කථා කරනවා නම්, මීරිගම රෝහලට හැමදාම තිබුණේ කුඩම්මාගේ සැලකිලි. අද වනකොට මීරිගම රෝහල ඉතාමත් හොඳ මට්ටමකට දියුණු කරන්න අමාත්‍යතුමාගේ මැදිහත් වීමෙන් විශේෂයෙන්ම අතිගරු ජනාධිපතිතුමාගේ මැදිහත් වීමෙන් ලංකාවේ පළමුවැනි Eco friendly එහෙම නැත්නම් හරිතවලට සම්බන්ධව රෝහල බිහි කරන්න, මීරිගම මූලික රෝහලක් හැටියට දියුණු කරන්න, කටයුතු කරන්න අපේ අමාත්‍යතුමා අපට පසුගිය කාල වකවානුව තුළ සහයෝගය දුන්නා. ගැරඩි වැටුණු, එහෙම නැත්නම් සර්පයින් වැටුණු මාතෘ ළමා වාට්ටුවක් තිබුණු මීරිගම රෝහලේ අද එවැනි තත්ත්වයක් දකින්න ලැබෙන්නේ නැහැ. අද ඉතාමත් ලස්සනට සංවර්ධනය වුණු රෝහලක් හැටියට මීරිගම රෝහල තුළ අපට නොහිටපු ළමා විශේෂඥ වෛද්‍යවරියක් ඒ වාගේම VOG කෙනෙක් ලබා දීලා පළාත් සභාව තුළ සෞඛ්‍ය අමාත්‍යාංශය හරහා අපි වැඩක් කළා කියලා බොහොම ආඩම්බරයෙන් ජනතාවට කථා කරන්න අවස්ථාවක් අපේ ඇමැතිතුමා අපට ලබා දීලා තිබෙනවා. ඒ වාගේම ගරු ප්‍රධාන ඇමැතිතුමා සෞඛ්‍ය ඇමැතිතුමා හැටියට ඉන්න කාලේ පටන් ගත්තු අක්ෂි සායන සහ අක්ෂි ශල්‍යාගාර වැඩ සටහන වඩාත් සංවර්ධනය කරන්න අවශ්‍ය පහසුකම් අපේ අමාත්‍යාංශය හරහා අපට ලබා දෙන්න කටයුතු කළා. මෙවැනි වැඩ සටහන් ගණනාවක් තුළ අපි පළාත් සභා මන්ත්‍රීවරුන් හැටියට මීරිගම කොට්ඨාශය තුළ කටයුතු කරන්නේ, බොහොම ආඩම්බරයෙන්. එක පැත්තකින් ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ අධ්‍යාපන අමාත්‍යාංශය හරහා විශාල වැඩ කොටසක් පසුගිය කාල වකවානුව තුළ කළා වාගේම, නිමල් ලාන්සා ගරු ඇමැතිතුමාගේ අමාත්‍යාංශයෙන් මේ වනකොට මීරිගම කොට්ඨාශයේ පළාත් සභාවට අයිති පාරවල් ටික සේරම හදලා ඉවර කළා වාගේම සෞඛ්‍ය ඇමැතිතුමාත් එකතු කරගෙන මීරිගම රෝහලෙන් පටන් අරගෙන, මීරිගම ළමා හා මාතෘ සායන සංවර්ධනය කරලා විශාල වැඩ කොටසක් කරගෙන යනවා.

ඒත් එක්කම ආයුර්වේද කටයුතු ගැන කථා කරනකොට විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ, ආයුර්වේද කොමසාරිස්තුමා ගැන. එතුමා විශාල සහයෝගයක් ලබා දෙනවා. පසුගිය කාල වකවානුව තුළ අපට බෝ නොවන රෝග පිළිබඳ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමේදී අති දැවැන්ත සහයෝගයක් ලබා දුන්නා. අපි හැමදාම ඩෙංගු මරණ ගැන කථා කළා. එහෙම නැත්නම් බෝවන රෝග ගැන කථා කළා. හැබැයි, අපේ අවධානය බොහොම සුළුවෙන් තමයි මේ බෝ නොවන රෝග ගැන යොමු කරලා තිබුණේ. අද ඒ තත්ත්වය වෙනස් කරලා ජනතාව වෙනුවෙන් - මේ බෝ නොවන රෝගවලින් තමයි මම හිතන්නේ - ලෝකයේ වැඩිම මරණ සිද්ධ වෙන්නේ රිය අනතුරුවලින්. ඊට පස්සේ වැඩිම මරණ ප්‍රමාණයක්, අපි ඩෙංගු ගැන කථා කළත්, ඒඩ්ස් ගැන කථා කළත්,

බෝ වෙන රෝග ගැන කථා කළත්, වැඩිම මරණ ප්‍රමාණයක් සිද්ධ වෙන්නේ බෝ නොවන රෝගවලින්. මේ ගැන අවධානය යොමු වීමක් තිබුණේ නැහැ. විවිධ වැඩ සටහන් හඳුන්වා දෙමින් ජනතාව අවදි කරන වැඩ පිළිවෙළක් අපේ අමාත්‍යාංශයෙන් අමාත්‍යතුමා ඇතුළු නිලධාරී මණ්ඩලය, ආයුර්වේද කොමසාරිස්තුමාගේ සහයෝගය සහ අපේ අනෙකුත් නිලධාරීන්ගේ සහයෝගය අනුව අපට ක්‍රියාත්මක කරන්න පුළුවන්කම ලැබුණා. මම හිතන්නේ, අද වනකොට ජනතාව දන්නවා ඇපල්, මිදි වෙනුවට ළමයාට වෙරළු ගෙඩියක්, නෙල්ලි ගෙඩියක් දෙන එක වැදගත් කියන පණිවිඩය අපට මේ වැඩ සටහන් හරහා ගමට ගෙන යන්න පුළුවන්කම ලැබුණා. විශේෂයෙන්ම මම මතක් කරන්න ඕනෑ. පසුගිය කාල වකවානුව තුළ අපි විශාල ජනතාවක් සම්බන්ධ කරගෙන සෞඛ්‍ය කඳවුරු ක්‍රියාත්මක කිරීමේ වැඩ සටහනක් ක්‍රියාත්මක කරන්න පටන් ගත්තා. සමහර විට අම්මලා අපි ළඟට ඇවිල්ලා අපට කථා කරපු දේවල් ගැන අහනකොට, ඒ අයගේ හඬට ඇහුම්කන් දෙනකොට අපට වෙලාවකට හිතුණා, අපිත් මේ පිළිබඳව අවධානය යොමු කරන්න වුවටක් ප්‍රමාද වුණාද කියලා. ඉතින් මම හිතන්නේ, දැන් ක්‍රියාත්මක වන වැඩ සටහන් එක්ක ඒ අම්මලා අවදි වෙලා අද දරුවන්ට වඩාත්ම සුදුසු දේ ලබා දෙන්න අපට කටයුතු කරන්න පුළුවන්කම ලැබිලා තිබෙනවා. ඒත් එක්කම අපි පසුගිය කාල වකවානුව තුළ දැක්කා ගරු ඇමැතිතුමා පළාත් සභා ඉතිහාසයේ වැඩිම ගිලන් රථ ප්‍රමාණයක්, පළාත් සභාව හරහා ගිලන් රථ 19 ක් මිලදී අරගෙන මධ්‍යම රජයේ ගරු සෞඛ්‍ය ඇමැතිතුමගේ සහයෝගය අරගෙන, තවත් ගිලන් රථ 21 ක් අරගෙන සෑම රෝහලකටම මේ වනකොට ගිලන් රථයක් ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා. ඇත්තටම අපේ රෝහල ගත්තොත් වෙනදාට ගිලන් රථයක් සොයා ගන්න අපට වතුපිටිවල රෝහලට කථා කරන්න සිද්ධ වුණා. මීරිගමින් ගෙන්වා ගන්න. අද අපට ගිලන් රථ දෙකක් ලැබිලා ජනතාවට වඩාත් හොඳ සෞඛ්‍ය සේවාවක් ලබා දෙන්න අපට හැකියාව ලැබිලා තිබෙනවා.

ඒත් එක්කම කමිටු ගැන අපේ නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා කථා කළා. මම හිතන්නේ එතුමා මන්ත්‍රීවරයෙක් හැටියට තමන්ගේ කාර්ය භාරය හරියට ඉෂ්ට කරනවාද කියලා අපට වෙලාවකට හැඟෙනවා. මොකද, අපේ පළාත්වල නම් අපි මන්ත්‍රීවරු සම්බන්ධ කරගෙන තමයි රෝහල් කමිටු පිහිටුවලා තිබෙන්නේ. ඒවා ක්‍රියාත්මක වෙනවා. අද වනකොට අපි පක්ෂ විපක්ෂ භේදයකින් තොරව සියලුම අයට ආරාධනා කරලා තිබෙනවා මේවාට සම්බන්ධ වෙන්න කියලා. හැබැයි, අපි දකින්නේ විපක්ෂයේ මන්ත්‍රීවරු ඒවාට සම්බන්ධ වෙන්නේ නැහැ. ඔවුන් කරන්නේ ඒවා විවේචනය කිරීම පමණයි. අද විශාල වැඩ කොටසක් මේ රෝහල් කමිටු හරහා සිදු කෙරනවා. මීරිගම රෝහල සංවර්ධනය කරන්න මූලිකත්වය අරගෙන තිබෙන්නේ රෝහල් කමිටුව. රෝහල් කමිටුව විවිධ විධියේ - එතුමා පෞද්ගලික සල්ලි ගැන කථා කළා. පෞද්ගලිකව මුදල් දෙන්න ඕනෑ නැහැ. මිනිස්සු ඕනෑ තරම් ඉන්නවා මේවාට උදව් කරන්න. අපට තිබෙන්නේ පෙළ ගැහෙන්න. පෙළ ගැහිලා රෝහල් කමිටු හරහා ජනතාව අතරට නිතර යනවා නම් ඒ අය සම්බන්ධ කර ගන්නවා නම් ජනතාව බොහොම උනන්දුවකින්, ආදරයකින්, හැඟීමකින්, කැක්කුමකින්, තමන්ගේ ප්‍රදේශයේ රෝහල සංවර්ධනය කරන්න, මාතෘ සායනය සංවර්ධනය කරන්න අපේ තිබෙන කුඩා පරිමාණයේ මූලික රෝහල් සංවර්ධනය කරන්න පෙළ ගැහිලා ඉන්නවා. ඇත්තටම මම කනගාටු වෙනවා, නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා මේ අවස්ථාවේ සභාවේ නොමැති වුණත් එතුමා තමන්ගේ පළාත් සභා මන්ත්‍රී ධූරයේ කාර්ය භාරය හරියට කරනවාද කියලා අපට පුංචි සැකයක් මතු වෙනවා. තමන්ගේ කාර්ය භාරය හරියට කරනවා කිව්වාට DMO මහත්තයාව හම්බ වෙලා තිබෙන්නේ දුරකථනයෙන් විතරයි කිව්වා. අපි මාසයකට සැරයක් අනිවාර්යයෙන්ම රෝහල් කමිටුවේදී DMO මහත්තයාව දකිනවා. අපි එතුමා එක්ක කථා කරනවා. මේවා මන්ත්‍රීවරුන්ගේ වගකීම් සහ යුතුකම් හැටියට අපි හඳුනාගන්න ඕනෑ. තමන් ආණ්ඩු පක්ෂයේ ඉන්නවාද, විපක්ෂයේ ඉන්නවාද කියන එක නොවෙයි ජනතාවට සේවය කිරීමයි වැදගත් වෙන්නේ. ආණ්ඩු පක්ෂයේ හිටියත්, විපක්ෂයේ හිටියත් තමුන්ට උවමනාවක් තිබෙනවා නම්, හැඟීමක් තිබෙනවා නම්, කැක්කුමක් තිබෙනවා නම් ජනතාව වෙනුවෙන් සේවය කරන්න ඒ වැඩ සටහන් අපට ක්‍රියාත්මක කරන්න අපි ආණ්ඩුවේ නැහැයි කියන දේට යන්න අවශ්‍ය වෙන්නේ නැහැ.

ඒත් එක්කම මතක් කරන්න ඕනෑ, පසුගිය කාල වකවානුව තුළ විශේෂයෙන්ම සමාජ සේවා අමාත්‍යාංශය මුල් කරගෙන, අලුතෙන් පත් වෙලා ඉන්න සමාජ සේවා කොමසාරිස්තුමිය ඉතාමත් හොඳ වැඩ කටයුත්තක් කරනවා. ඇත්තටම එතුමියත් එක්කම කිහිප වතාවක්ම

[ ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන ]

සම්බන්ධ වෙලා වැඩ කටයුතු කරන්න අපට හැකියාව ලැබුණා. ඒ කටයුතු කරද්දී විශේෂයෙන්ම අපි දන්නවා, ගොඩක් වෙලාවට දරුවන්, පසුගිය කාල වකවානුව තුළ අපි පළාත් සභාව නියෝජනය කළත් අපට බැරි වුණා අපේ අහිංසක අම්මලාගේ දුක නිවන්න. තමන්ගේ ස්වාමි පුරුෂයා තමන්ව හැර දාලා ගිහිල්ලා ඉන්න මොහොතකදී එහෙම නැත්නම් තමන්ගේ ස්වාමි පුරුෂයා වියෝ වෙලා ඉන්න මොහොතකදී අම්මා කෙනෙකුට දැනෙන වේදනාව, තමන්ගේ දරුවාට හරියට අධ්‍යාපනයක් ලබලා දෙන්න ආර්ථික ශක්තියක් නැත්නම්, තමන්ගේ දරුවාව පාසල් යවන්න පොත් ටික ගන්න ආර්ථික ශක්තියක් නැත්නම් ඒ අම්මාට දැනෙන වේදනාව අනන්තයි, අප්‍රමාණයි. අපි බස්නාහිර පළාත් සභාවේ සමාජ සේවා අමාත්‍යාංශය සම්බන්ධ කරගෙන පාසල් යන සෑම දරුවෙකුටම රුපියල් 500 ක සහනාධාරයක් ලබා දෙන්න සැලසුම් කරලා තිබෙනවා. මේ ප්‍රමාණය අපි එක දරුවෙක්ට සීමා කරන්නේ නැහැ. දරුවෝ දෙන්නෙක් ඉන්නවා නම් රුපියල් 500, රුපියල් 1000 වෙනවා. තුන් දෙනෙක් ඉන්නවා නම් රුපියල් 1500 වෙනවා. මම හිතන්නේ, මේ හරහා අපි දන්නවා පාසල් නොයන දරුවන් නැවතත් සමාජගත කරන්න, ඒ අය නැවතත් පාසලට යොමු කරන්න අපට පුළුවන්කමක් ලැබුණා. මම හිතන්නේ විශාල වැඩ කොටසක් සිදු කළා.

අපේ වැඩිහිටියන් වෙනුවෙන් ඇස් කණ්ණාඩි ලබා දෙන වැඩ සටහන්වලදී - ඒත් එක්කම මතක් කරන්න ඕනෑ මීරිගම සෙත් සෙවණ වැඩිහිටි නිවාසය. ඉතාමත් හොඳ මට්ටමකට ගෙන එන්න අපේ අමාත්‍යතුමාට හැකියාව ලැබිලා තිබෙනවා. පසුගිය කාල වකවානුව තුළ තිබුණාටත් වඩා, අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමා සෞඛ්‍ය ඇමැතිතුමා හැටියට ඉන්න කාලේ විශාල වැඩ කොටසක් කළා. ඒ කරගෙන ගිය වැඩ කොටස ඉස්සරහාට ගෙනියන්න, ඒ අම්මලාට අවශ්‍ය සහයෝගය, ශක්තිය ලබා දෙන්න අපට පුළුවන්කම ලැබුණා. අපි ගරු ඇමැතිතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ, තමන්ගේ කාර්යය නිසියාකාරයෙන් ඉෂ්ට කරමින් ජනතාවට සේවය කිරීමට මන්ත්‍රීවරු හැටියට අපට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන්. විශේෂයෙන්ම අමාත්‍යාංශයේ ලේකම්තුමා, අමල් මැතිතුමා ප්‍රමුඛ සියලුම නිලධාරීන්ට මේ කරගෙන ගිය කටයුතු ඉදිරියටත් කරන්න හැකියාව, ශක්තිය, ධෛර්යය ලැබේවා කියලා ප්‍රාර්ථනා කරනවා. ඒ වාගේම කරන ලද කාර්යයට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

[පූ.භා. 11.01]

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන හා කාන්තා කටයුතු, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව මුලින්ම මම මගේ ස්තුතිය පුද කරන්න කැමැතියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද බස්නාහිර පළාත් අයවැය තුළ අධ්‍යාපන අමාත්‍යාංශයට පසුව විශාලතම මුදල් ප්‍රමාණයක් වෙන් වන වැය ශීර්ෂයක් වශයෙන් මේ වැය ශීර්ෂය තුළදී අපට කථා කරන්න පුළුවන්කම ලැබෙනවා. විශේෂයෙන්ම සෞඛ්‍ය අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ බස්නාහිර පළාත තුළ ජනතාවට නිරෝගිමත් ජීවිතයක් පවත්වාගෙන යාම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය හරහා කෙරෙන වැඩ කොටසක් විශාල වශයෙන් තිබෙනවා. මවක් දරුවෙක් පිළිසිඳ ගත්තු අවස්ථාවේ ඉඳලා නීරෝගී දරුවෙකු බිහි කිරීමට අවශ්‍ය කරන වැඩ සටහන බස්නාහිර පළාත් සෞඛ්‍ය සේවා අමාත්‍යාංශය තුළ කෙරෙනවා කියන එක ප්‍රකාශ කරන්න කැමැතියි. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල හරහා, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් මගින් නිරෝගීමත් දරුවෙක් බිහි කරන්න ප්‍රාදේශීය වශයෙන් කරගෙන යන, සෞඛ්‍ය මධ්‍යස්ථාන, ළමා හා මාතෘ මධ්‍යස්ථාන හරහා කෙරෙන සේවය බස්නාහිර පළාත තුළ අපි අගය කරන්න ඕනෑ.

විශේෂයෙන්ම දරුවෙක් පිළිසිඳ ගත්තු මොහොතේ ඉඳලා ඒ දරුවා උපත ලබලා දරුවා හදා වඩා ගන්නා කාලය වනතුරු පවත්වන ඒ සායන තුළ කෙරෙන සේවය අපි අගය කරන්න ඕනෑ. විශේෂයෙන්ම මේ සඳහා පෞද්ගලික රෝහලකට ඇතුළත් වෙලා, ඒ සඳහා පෞද්ගලික රෝහලකින් වියදම් දරලා, පෞද්ගලික රෝහලකින් එම සේවය ලබා ගත්තා නම් අති විශාල මුදලක් වැය කරන්න සිද්ධ වෙනවා. සාමාන්‍යය විධියට බිහි වන දරුවෙකු සඳහා රුපියල් 60,000 ක වාගේ මුදලක් අවම වශයෙන් දරන්න සිද්ධ වෙනවා. එහෙම නැත්නම් සිසේරියන් සැත්කමක් කරලා දරුවෙක් ලබා ගන්නවා නම් ඒ සඳහා රුපියල් 120,000 ක 150,000 ක වාගේ මුදලක් පෞද්ගලික

රෝහලකදී වියදම් කරන්න වෙනවා. අනෙකුත් සායන සඳහා, දරුවෙක් වෙනුවෙන් ලබා දෙන බෙහෙත් එන්නත් සඳහා විශාල මුදල් පෞද්ගලික රෝහලකදී දරන්න වෙනවා. නමුත් අපේ රටේ විශාල පිරිසක් අද ප්‍රයෝජන ගන්නේ සෞඛ්‍ය වෛද්‍ය මධ්‍යස්ථාන, එහෙම නැත්නම් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්ගේ උපදෙස්. ඒ සඳහා අද බස්නාහිර පළාත් සභාව තුළින් විශාල සේවයක් මේ වනකොට කරගෙන ගිහිල්ලා තිබෙනවා. ඒ සෞඛ්‍ය මධ්‍යස්ථාන සඳහා අවශ්‍ය පහසුකම් ලබා දීලා තිබෙනවා. නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කියන්නේ මේ කරගෙන යන සේවය තව තවත් ජනතාවට පහසුකම් සැලසිය යුතු තත්ත්වයකට ඇවිල්ලා තිබෙනවා. වර්තමානයේ රටේ කෙරීගෙන යන ශීඝ්‍ර දියුණුවත් එක්කලා මේ සඳහා වැඩි පහසුකම් ලබා දෙන්නට ඕනෑ. සමහර වෙලාවට අපි දකිනවා, තවමත් ගම්වල තිබෙන්නේ මීට කලින් පවත්වාගෙන ආපු ඒ සෞඛ්‍ය වෛද්‍ය මධ්‍යස්ථානමයි. එහි සමහර වෙලාවට අද තිබෙන ප්‍රමාණය මදී. විශාල ජනගහනයක් ඒ සඳහා ඇතුල් වෙලා තිබෙනවා. අපේ ගමකට ගිහිල්ලා බැලුවොත්, අපේ ගමේ සෞඛ්‍ය වෛද්‍ය මධ්‍යස්ථානයේ ඒ නිලධාරීන් එන දවසේදී විශාල ගැබිණි මව්වරු පිරිසක් ඇවිල්ලා පෝලිම් ගැහිලා ඉන්නවා. ඒ නිසා සමහර වෙලාවට දින කිහිපයක් වැඩි කරන්න - එක දිනයක් වෙන්න පුළුවන්, ගමේ ඒ වැඩ සටහන පවතින්නේ. ඒ සඳහා දින කිහිපයක් වැඩි කරන්න පුළුවන්. එහෙම නැත්නම් වෛද්‍යවරු වැඩි කරන්න පුළුවන්. එහෙම නැත්නම් කොට්ඨාශවලට බෙදලා අලුතෙන් ස්ථාන ආරම්භ කළ යුතුයි කියලා මම යෝජනා කරනවා.

අපි අවංකව පිළිගන්න ඕනෑ. සමහර අවස්ථාවලදී එහි තිබෙන පහසුකම් ප්‍රමාණවත් මදී. අපට හැකි පමණ ලබා දීලා තිබෙනවා. නමුත් තව තවත් ලබා දීලා ඒ තත්ත්වය වැඩි කළ යුතුයි. ඒ වාගේම තමයි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් හරහා ගම්වල කෙරෙන බෝ වන රෝග වැළැක්වීම සඳහා ගෙන යන වැඩ පිළිවෙළ. ඒ සඳහා විශාල පරිශ්‍රමයක් දරනවා. විශේෂයෙන්ම, පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන් ගම්වල කරගෙන යන සේවය. ගමේ ගෙයක් ගෙයක් ගාණේ ගිහිල්ලා සෞඛ්‍යයට අදාළ කරුණු රැස් කරලා, ඒ පිළිබඳව සොයා බලා ගෙන යන වැඩ පිළිවෙළ අගය කරන්න ඕනෑ. ඒ සඳහා සෞඛ්‍ය අමාත්‍යතුමා වශයෙන් ගරු ඇමැතිතුමාගේ අවධානය යොමු වෙලා, ඒ සඳහා වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කිරීම පිළිබඳවත් අපේ විශේෂ ස්තුතියක් ගරු ඇමැතිතුමා ප්‍රමුඛ නිලධාරීන් සඳහා එක්කරන්න ඕනෑ.

ඒ වාගේම තමයි රෝහල් පද්ධතිය ගත්තොත් මීට කලින් තිබුණාට වඩා විශාල පහසුකම් ප්‍රමාණයක් රෝහල්වල ඇති කරලා තිබෙනවා. රෝහල්වලට අවශ්‍ය ස්ථාන ලබා දීලා තිබෙනවා. ඒ සඳහා අවශ්‍ය කරන මුදල් ප්‍රතිපාදන විශාල වශයෙන් ලබා දීලා තිබෙනවා. ඒ කටයුතු පිළිබඳව මේ වැය ශීර්ෂයේදී අපි ඇගයීමට ලක් කරන්න ඕනෑ. කෙසේ නමුත් මම කනගාටුවෙන් ප්‍රකාශ කරනවා අපේ හෝමාගම මූලික රෝහල ගැන බැලුවොත්, එම රෝහලේ විශාල කටයුතු ප්‍රමාණයක් කෙරිලා තිබෙනවා. පෞද්ගලික අංශයේ දානපතීන් සහ අනෙකුත් අය හරහා. නමුත් ඊයේ පුවත්පතක පළ වෙනවා, හෝමාගම මූලික රෝහලේ පල්දෝරු පද්ධතිය පිළිබඳව. ඇත්තටම මම ඒ වැඩ පිළිවෙළ පිළිබඳව අගය කරන්නේ නැහැ. මොකද, මීට වසර කිහිපයක ඉඳලාම මේකේ මුදල් වෙන් වෙනවා. අවසාන මොහොතේදී ඒ මුදල්වලට වෙන්නේ මොකක්ද කියන එක අපි දකින්නේ නැහැ. මොකද, පසුගිය දෙසැම්බර් 31 වැනිදා වනකොට එහි ඉදි කිරීම් පැවරීම සඳහා අවශ්‍ය කාලය වෙන් වෙලා තිබුණා. අවශ්‍ය කටයුතු සම්පාදනය වෙලා තිබුණා. නමුත් පසුගිය 2012 දෙසැම්බර් 31 වැනිදා කරන්න බැරි වුණු වැඩේ 2013 මේ වර්ෂයේ කරනවා කියලා පොරොන්දු වුණා. මම උපදේශක කාරක සභාවේදී ඒ පිළිබඳව නිතර නිතර ඇහුවා. නමුත් අද වනතෙක් ඒ කටයුත්ත කිසිම ආයතනයකට පැවරීමක් කරලා නැහැ. ඊයේ මාධ්‍යවේදීන් අහනවා, ගමේ ජනතාව අහනවා හෝමාගම රෝහලේ දුගඳ හමන්නේ මොකද කියලා. මේවා වාගේ දේවල් ගරු ඇමැතිතුමාගේ නොවෙයි, උපදේශක කාරක සභාවේ ඉන්න නිලධාරීන්ගේ නොවෙයි, එතැනින් එහා ඉන්න නිලධාරීන් කාගේ හෝ අඩුපාඩුවක් නිසා එය හැම දෙනාටම ගඳ ගහන වැඩක් බවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා ඒ පිළිබඳව මම මගේ කනගාටුව ප්‍රකාශ කරනවා.

ඒ වාගේම තමයි බස්නාහිර පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව ගැන විශේෂයෙන් වචන කිහිපයක් කථා කරන්න ඕනෑ. බස්නාහිර පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව මේ ප්‍රදේශයේ, බස්නාහිර පළාත තුළ කාගේවත් හව්හරණක් නොලබන ජනතාවක් වෙනුවෙන් අද විශාල සේවයක් කරනවා.

[ ගරු ජනක වැලිවත්ත ]

තමන්ට තමන්ගේ අවශ්‍යතාවයන් සපුරා ගන්න බැරි විශාල කොටසක් සිටිනවා. ඒ ජනතාවට සමහර වෙලාට තමන්ට ඇස් කණ්ණාඩි යුගලක් අවශ්‍ය වෙන්න පුළුවන්. ඒ ඇස් කණ්ණාඩි යුගලය ලබා ගැනීමට ප්‍රතිපාදන නැති වෙන්න පුළුවන්. එහෙම නැත්නම් සමහර වෙලාවට දෘෂ්‍යාබාධිත පුද්ගලයෙකුට රෝද පුටුවක් අවශ්‍ය වෙන්න පුළුවන්. ඒක ලබා ගන්න විධියක් නැති වෙන්න පුළුවන්. සමහර වෙලාවට ස්වයං රැකියා ආධාර ලබා දීම්, ඒ වාගේ විශාල වැඩ කොටසක් බස්නාහිර පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව හරහා කෙරෙනවා. එහි ප්‍රයෝජන අපේ ගම්වල ජනතාවට ලබා දෙන්න කටයුතු කරගෙන යනවා. ඒ සඳහා විශාල මුදල් ප්‍රමාණයක් පළාත් සභාවේ සමාජ සේවා දෙපාර්තමේන්තුව හරහා වෙන් කෙරෙනවා. එයින් විශාල ප්‍රයෝජන ප්‍රමාණයක් අපි ලබා ගන්නවා.

මම මේ වැඩ සටහන තුළදී දකින්නේ, මේ වැඩ සටහන් ක්‍රියාත්මක කරන්න හැම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකම සමාජ සේවා නිලධාරියෙක් ඉන්නවා. ඒ වාගේම සමාජ සේවා කොමසාරිස්තුමිය ඇතුළු නිලධාරි මණ්ඩලයත් කාර්යක්ෂමතාවයෙන් කටයුතු කරනවා. නමුත් සමහර දේවල්වලදී ඒ සඳහා ගත වන කාලය ඉතාමත්ම වැඩියි. සමහර වෙලාවට පුද්ගලයෙකුට ඇස් කණ්ණාඩි දෙකක් ලබා ගන්න උවමනා වුණොත්, එහෙම නැත්නම් අසරණ පුද්ගලයෙකුට රෝද පුටුවක් ලබා ගන්න අවශ්‍ය වුණොත් එහිදී මුලින්ම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට යන්න ඕනෑ. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් සමාජ සේවා නිලධාරීතුමා හමු වෙලා අයදුම්පත්‍රයක් ලබා ගන්න ඕනෑ. ඒ අයදුම් පත්‍රය ග්‍රාම නිලධාරීතුමා නිර්දේශ කරන්න ඕනෑ. නැවත සමාජ සේවා නිලධාරීට භාර දෙන්න ඕනෑ. සමාජ සේවා නිලධාරීතුමා නැවත සමාජ සේවා දෙපාර්තමේන්තුවට එවන්න ඕනෑ. ආපහු එහෙන් නැවත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට එවනවා. මේ සඳහා විශාල කාලයක් වැය වෙනවා. ඒ නිසා සමහර වෙලාවට කිසිත් නොදන්න, කිසිඳු හඬිහරණක් නැති පුද්ගලයෙක් එක පාරක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට යයි. දෙවැනි පාර යයි. තුන්වැනි පාර යනකොට මේ වැඩේ අත ඇරලා දායි. මොකද, කාලයක් යන නිසා. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම යෝජනා කරන්නේ, මේ කටයුත්ත ජනතාවට ඉතාමත්ම සරල කරන එක තමයි හොඳම කටයුත්ත. මොකද, මම දැකපු අත්දැකීමක් තමයි එක අවස්ථාවක පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පවත්වන ලද අක්ෂි සායනයක සියලුම ලේඛන ටික හදලා සමාජ සේවා නිලධාරීතුමියට භාර දුන්නාම - මටයි භාර දෙන්න ගියේ. මමයි ඒ කටයුත්ත භාරගෙන කළේ. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලේඛන ටික තිබිලා තිබුණා මාස 2 ½ ක්. මාස 2 ½ ට පස්සේ, ඒත් යවලා නැති නිසා මම දෙතුන් පාරක් කථා කළාම ඒ නිලධාරීන්ට වැඩ වැඩියි කියලා තිබුණා. සමාජ සේවා නිලධාරීතුමිය නොවෙයි. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීතුමියක්. ඊට පස්සේ ප්‍රාදේශීය ලේකම්තුමාට කථා කරලා තමයි නැවත සමාජ සේවා දෙපාර්තමේන්තුවට භාර දෙන්න වුණේ.

ඒ නිසා මේ කටයුතු සැහැල්ලු කරලා, ගරු ඇමැතිතුමා වශයෙන් ඔබතුමා මේ අමාත්‍යාංශය නඟා සිටුවන්න නිලධාරී මණ්ඩලයත් එක්ක දරන උත්සාහය තවත් සරළ කරලා මේ ලබා දුන්නු වැඩ කොටස බස්නාහිර පළාතේ ජනතාව වෙත තව තවත් වැඩියෙන් වැඩ කටයුතු කරලා, කාගේවත් හඬිහරණක් නොමැති, පිහිටක් නොමැති බස්නාහිර පළාතේ ජනතාව වෙනුවෙන් තවත් විශාල වැඩ කොටසක් කරන්න ඔබතුමා දරන උත්සාහයට අපේ ස්තූතිය පුද කරනවා. ඒ වාගේම මේ කටයුත්ත වෙනුවෙන් පළාත් ලේකම්තුමා, ඒ වාගේම බස්නාහිර පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂතුමා, ඒ වාගේම ප්‍රාදේශීය අධ්‍යක්ෂවරු, අනෙකුත් සියලුම දෙපාර්තමේන්තුවල අධ්‍යක්ෂවරු, සියලුම නිලධාරී මහත්වරුන් දක්වන සහයෝගයටත් ස්තූතිය පුද කරනවා. මෙතෙක් මේ පළාත් සභාව තුළ වැඩ කටයුතු කරගෙන ඇවිල්ලා අපට ලබා දීපු සහයෝගය සහ ගෙවුණු වසර 05 තුළ බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක් වශයෙන් අපට, ප්‍රදේශයට, ජනතාවට කරනු ලැබූ ශක්තිය, තව තවත් ඉදිරියට කරගෙන යන්න හැකියාව ශක්තිය ලැබේවායි කියා ප්‍රාර්ථනා කරමින්, ඒ පිළිබඳව ස්තූතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. ස්තූතියි.

[පූ.භා. 11.11]

**ගරු යසපාල කෝරළගේ**
Hon . Yasapala Koralage

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සෞඛ්‍ය, දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ කෙටි වෙලාවක් හරි කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව බොහොම ස්තූතිවන්ත වෙනවා. කෙසේ වෙතත් බස්නාහිර පළාත් සභාවේ වර්තමාන සෞඛ්‍ය අමාත්‍යාංශය, දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විවිධ පැතිකඩවලින්, විවිධ

ක්ෂේත්‍රවලින්, විවිධ මුහුණුවරකින් ජනතාවට සේවාවක් කරන්න, ජනතාව නිරෝගීමත්ව පවත්වාගෙන යන්න පසුගිය කාල සීමාව තුළ දැඩි කැපවීමක්, දැඩි මහන්සියක් ගරු ඇමැතිතුමාත්, ඒ වාගේම විශේෂයෙන්ම සෞඛ්‍ය අමාත්‍යාංශයේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂතුමා ඇතුළු ඒ නිලධාරී මණ්ඩලය, ආයුර්වේද කොමසාරිස්තුමා ඇතුළු ඒ නිලධාරී මණ්ඩලය සහ අපේ පළාත්වල, අපේ කොට්ඨාශවල සිටින සියලුම දෙනා දැඩි වෙහෙස මහන්සියක් ගත්තා කියන එක මේ අවස්ථාවේ ඉතාමත් සතුටින් මතක් කරන්න ඕනෑ. මට මතකයි ගරු ඇමැතිතුමා අලුත් සංකල්ප කිහිපයක් බස්නාහිර පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ හඳුන්වා දුන්නා. උත්තම පූජා වැඩ සටහන, සොඳුරු පවුල වාගේ වැඩ සටහන් තුළින් ජනතාව අතරට ගියා. රෝගීන් වෙලා රෝහලට යනවා වෙනුවට රෝගී වීම වළක්වා ගන්නේ කොයි ආකාරයෙන්ද කියන එක පිළිබඳවත්, මානසික සුවයක් ඇතුව සමාජය තුළ ජීවත් වෙන්න පරිසරයක් නිර්මාණය කිරීමේ වගකීමත් මේ වැඩ සටහන තුළින් ක්‍රියාත්මක වුණා. මට මතකයි මගේ කොට්ඨාශය තුළ මගේ පළාත තුළ විශේෂයෙන්ම කළුතර දිස්ත්‍රික්කය තුළ අපි අරගෙන ගියා සොඳුරු පවුල කියන වැඩ සටහන. ඒ අවස්ථාවේදී වැඩිහිටියෝ, දෙමව්පියෝ පුදුමාකාර වින්දනයක් ඒ වැඩ සටහන තුළ ක්‍රියාත්මක වුණා. ඒ වාගේම මාපිය වන්දනා කියන වැඩ සටහන ගෙනැල්ලා සමාජය තුළ අලුත් චර්යා ධර්මයක්, සමාජය තුළ අලුත් ආකල්ප ඇති කරන්න සෞඛ්‍ය අමාත්‍යාංශය වෙදකමට වඩා හෙදකම මුල් කරගෙන වැඩ සටහන් ක්‍රියාත්මක කළාය කියන එක පිළිබඳව මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා. මේ වැඩ සටහන් ක්‍රියාත්මක කරන්න ගරු ඇමැතිතුමාට යෝධ නායකත්වයක්, පිටිවහලක් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂතුමා ඇතුළු නිලධාරී මණ්ඩලය ලබා දුන්නා. ඒ වැඩ සටහන් පිටිපස්සේ අපි ගමන් කළා. අපට පුළුවන්කමක් ලැබුණා සෞඛ්‍ය අමාත්‍යාංශය, සමාජ සේවා අමාත්‍යාංශය හරහා විශාල කාර්ය භාරයක් අපේ පළාත්වලට කරන්න. භෞතික සම්පත් ලබා දීම පිළිබඳව මතක් කරන්න ඕනෑ.

මට මතකයි පසුගිය කාල සීමාව තුළ විශේෂයෙන්ම හොරණ රෝහලේ තිබුණු අඩුපාඩුකම් විශාල ප්‍රමාණයක් සකස් කරලා, අවුරුදු 15 කට ආසන්න කාලයක සිට රෝහලට ගිලන් රථයක් අලුතින් ලබා දීලා තිබුණේ නැහැ. ගරු ඇමැතිතුමා මැදිහත් වෙලා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂතුමා මැදිහත් වෙලා අලුතෙන් ගිලන් රථයක් ලබා දුන් අවස්ථාව මට මතක් වෙනවා. පුදුමාකාර අලුත් වැඩ පිළිවෙළකට යන්න සෞඛ්‍ය අමාත්‍යාංශය තුළ මේ වකවානුවේ පුළුවන් වුණාය කියන එක මම පැහැදිලි කරනවා. ඒ වාගේම මතක් කරන්න ඕනෑ සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ අවශ්‍ය නිලධාරී මණ්ඩලය, විශේෂයෙන්ම කම්කරු පත්වීම්වල බොහොම හිඟතාවයක් පවතිනවා. ඒ පිළිබඳව මම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මඟින් ගරු අමාත්‍යතුමාට මේ අවස්ථාවේදී පෙන්වා දෙනවා ඒ සේවක අඩුපාඩුකම් ටික කඩිනමින් සකස් කරනවා නම් මීටත් වඩා හොඳ සේවාවක් කරන්න අපේ රෝහල් තුළ පුළුවන්කමක් ඇති වෙනවා කියන එක.

ඒ නිසා මම ගොඩක් අගය කරන්නේ, ආයුර්වේද වෛද්‍ය ක්‍රමය පිළිබඳව කථා කරන්න ඕනෑ. අපේ පළාතේ දීර්ඝ කාලයක් පැවතුණු ආයුර්වේද රෝහල නවීකරණය කරලා අලුත් පැත්තකට හරවන්න පුළුවන්කමක් ලැබුණේ මේ යුගයේදී. අපට අලුත් වැඩ පිළිවෙළකට ගෙනියන්න පුළුවන්කමක් ලැබුණේ මේ යුගයේදී. ඒ නිසා අද පළාතේ තිබෙන විශේෂයෙන් මතක් කළ යුතුයි වීදියගොඩ ආයුර්වේද රෝහල. අද අලුත් පැත්තකට පෙරළිලා විශාල රෝගීන් සංඛ්‍යාවක් නේවාසිකවත්, දිනපතාත් සේවාව ලබා ගන්න රෝහලක් බවට පත් වෙලා තිබෙනවා. එවැනි සේවාවක් කරගෙන යන්න මේ අමාත්‍යාංශය හරහා අපට පසුගිය කාලයේ පුළුවන්කමක් ලැබුණේ, හොඳ වැඩ පිළිවෙළක්. ගරු ඇමැතිතුමාගේ කැපවීම වාගේම සෞඛ්‍ය අමාත්‍යාංශ නිලධාරීන්ගේ කැපවීම නිසයි. එය අපි මේ අවස්ථාවේදී අගය කරනවා. මේ පළාත් සභාව නිමාවන යුගය මේ. ඒ නිසා අලුත් අදහස්, අලුත් වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කරන්න මෙය හොඳ අවස්ථාවක් වශයෙනුයි මා දකින්නේ. ඒ නිසා අපි ජංගම සේවාවල් පැවැත්වූවා. සායන පැවැත්වූවා. ඒ අවස්ථාවේදී මම පෙන්වා දෙනවා රෝහලට එකතු වන, දිනපතා බෙහෙත් අරගන්න එක දවසකට 700 ක් 800 ක් වාගේ සායනවලට එකතු වන රෝගීන් සංඛ්‍යාව ගම් මට්ටමින් බෙදා දෙන්න පුළුවන් නම්, ගම් මට්ටමින් පවත්වාගෙන යන සායනවලින් ඒ අය බෙහෙත් ලබා දීමේ ක්‍රමවේදයක් එම ස්ථානයේදී පවත්වාගෙන යන්න පුළුවන් නම් ඒ රෝගී ජනතාවට විශාල සේවාවක් වෙනවා කියන එකයි මම මේ අවස්ථාවේදී පෙන්වා දෙන්නේ. ඒ නිසා ක්‍රමවේදයක් සකස් කරන්න ඕනෑ. බෙහෙත් ප්‍රමාණය අපතේ යන්න පුළුවන්. ඒ නිසා ඒවාට ක්‍රමවේදයක් සකස් කරලා ගම්මානවල ජනතාව උදේ 08.00 සිට දවස 02.00, 03.00 වනකල් රෝහලේ ගත

කරනවා වෙනුවට ඒ අයට ගම් මට්ටමේ සායනවලින් බෙහෙත් ටික ලබා ගන්න ක්‍රමවේදයක් සකස් කරන්න පුළුවන් නම් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එය සකස් කරන්න කියලා සෞඛ්‍ය අමාත්‍යතුමා වෙත අවධානය යොමු කරනවා. විශේෂයෙන්ම සෞඛ්‍ය අමාත්‍යාංශය, දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මේ ගෙන යන වැඩ සටහන තව තවත් ශක්තිමත් කරන්න ඒ නිලධාරීන් කරපු සේවාව පිළිබඳව නැවත වරක් අගය කරමින් ගරු ඇමැතිතුමා ගෙන යන වැඩ පිළිවෙළ අගය කරමින් මම මේ අවස්ථාවේදී මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[පූ.භා. 11.20]

**ගරු නෙලුක් මල්ලව**
Hon. Neluk Mallawa

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බස්නාහිර පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන හා කාන්තා කටයුතු, පරිවාස හා ළමා රක්ෂක සේවා, සභා කටයුතු අමාත්‍යාංශයේ වැය ශීර්ෂයට කථා කිරීමට ලැබීම සම්බන්ධයෙන් මම සතුටු වෙනවා. රටේ ප්‍රගතියට, සමාජ ප්‍රගතියට, අධ්‍යාපන අමාත්‍යාංශයෙන් යම් සේවාවක් වෙනවා නම් රටේ ආර්ථික ඒ වාගේම සමාජය නිසි ලෙස නඟා සිටුවන්න, සමාජය නිරෝගී කරවන්න, සදාචාර සම්පන්න කරවන්න බොහෝ වෙලාවට නිවැරදි කරන්න, සමාජය තුළ තිබෙන සිවිල් බලය වැඩි කරන්න මේ අමාත්‍යාංශයේ අදාළ දෙපාර්තමේන්තු මගින් විශාල කාර්ය භාරයක් ක්‍රියාත්මක වෙනවා. මෙතැනදී අපි සෞඛ්‍ය අමාත්‍යාංශය පැත්තෙන් ගන්නකොට වත්මන් රජය, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය, බස්නාහිර පළාත් සභාව සමග එකට එකතු වෙලා පළාත් අමාත්‍යතුමා යටතේ පවතින අපේ සෞඛ්‍ය ආයතන, විශේෂයෙන්ම ගත්තාම සෞඛ්‍ය සායන වැනි දේ අතිවිශාල ප්‍රමාණයක් සංවර්ධනය කරන්න, ඒ වාගේම නවීන පන්නයේ උපකරණ සහිතව ඒ පහසුකම් ලබා දෙන්න ක්‍රියාත්මක වුණා. මම හිතන්නේ බොහෝ මන්ත්‍රීවරු ඒ පිළිබඳව කථා කළා. නමුත් දිගින් දිගට එය කථා කළ යුතුයි කියලා මම විශ්වාස කරන්නේ නැහැ. හැබැයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මන්ත්‍රීවරු කථා කරපු බරපතළම කාරණය පිළිබඳව මම හිතන්නේ, අවධානය යොමු කළ යුතුව තිබෙනවා.

මන්ත්‍රීවරුන්ගේ වැඩි අවධානයක් යොමු වුණේ බෝ නොවන රෝග කාණ්ඩය සම්බන්ධව. බෝ නොවන රෝග සම්බන්ධව කථා කරනකොට අපි පුරුදු වෙලා ඉන්නේ, ලෙඩක් හැදුනාම බෙහෙත් ගන්න. ලෙඩේ හැදෙන්න පෙර ගන්න තිබෙන පියවර සම්බන්ධයෙන් අපේ තීන්දුවක්, තීරණයක් නැහැ. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පිළිබඳව මම හිතන්නේ පළාත් සභාව හැටියට, අදාළ අමාත්‍යාංශය හැටියට බරපතළ තීන්දුවකට පැමිණිය යුතුව තිබෙනවා. මෙතැනදී අපි ලෙඩක් හැදුණාම බෝ නොවන කාණ්ඩයේ රෝග සම්බන්ධයෙන්, පිළිකාව, හෘද රෝගය එහෙම නැත්නම් දියවැඩියාව ආදී වූ රෝග සම්බන්ධයෙන් අපි රෝගීන්ට උපදෙස් දෙන්නේ තෙල් කන්න එපා, ලුණු කන්න එපා, සීනි කන්න එපා කියලා. ජාතියක් හැටියට අපි තරම් තෙල් කාපු, අපි තරම් ලුණු කාපු, අපි තරම් සීනි කාපු කොටසක් නැහැ. හැබැයි ඒ රෝගාබාධ අපට හැදුණේ නැහැ. අද දවසේදී බාල මහළු භේදයකින් තොරව මේ රෝගවලට සමාජය ගොදුරු වන වටපිටාවක් නිර්මාණය වුණේ ඔය අපි ලෙඩේ හැදුනාට පස්සේ කන්න එපා කියන දේවල් නිසා නොවෙයි. ලෙඩේ හැදෙන්න පෙර කන බොන දේවල් නිසා. සෞඛ්‍ය පහසුකම් දෙනකොට අපි සතුටු වෙනවා. රිජ්වේ ආර්යා ළමා රෝහලට දියවැඩියා වාට්ටුවක් විවෘත කරනකොට අපි කියන්නේ, සෞඛ්‍ය පහසුකම් දුන්නා කියලා. හැබැයි, ඒකේ ඛේදවාචකය අපි දකින්නේ නැහැ.

එහි ඛේදවාචකය තමයි ළමයින්ටත් දියවැඩියාව තිබෙනවා. ඒගොල්ලන්ටත් වෙනම වාට්ටු හදන්න වෙලා. දරුවෝ වෙනුවෙන් පිළිකා ඒකකත් විවෘත කරන්න වෙලා. මේ රෝහල් ආරම්භක කාලයේ ඒ ඒකක තිබුණේ නැහැ. හැබැයි, ඒ ඒකක විවෘත කරන්න වෙලා. ඒ වෙනුවෙන් වෙනම පහසුකම් දෙන්න වෙලා. ඒ ඛේදවාචකය අපි හඳුනා නොගනිමින් ඉන්නවා. ඒ නිසා සෞඛ්‍ය පහසුකම් කොපමණ වැඩි කළත් තේරුමක් නැහැ. සෞඛ්‍ය පහසුකම් වැඩි කිරීම තුළ රෝගීන් එතැනට ඇතුළු වෙන්නේ - ඒ බෝ නොවන කාණ්ඩයේ රෝගයක් වැළඳුනොත් මිය යාමෙන් තොර වෙනත් විකල්පයක් නැහැ. නියත වශයෙන්ම මිය යනවා. ඒ මිය යන රෝග වැළඳෙන අයට වාට්ටු නිර්මාණය කිරීමට වඩා ඒ පෝලිමට ඇතුළු වන ප්‍රමාණය නවත්වා ගත යුතුයි කියලා මම විශ්වාස කරනවා. විශේෂයෙන්ම දරුවන්ට තිබෙන ආහාර. දරුවෝ කේන්ද්‍ර කර ගෙන, දරුවෝ ඉලක්ක කර ගෙන අද වෙළඳපොළ ගොඩ නගලා තිබෙන දේවල්. මෙන්න මේ ආහාරපානවලට අපි වැඩි අවධානයක් යොමු කළ යුතුව තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම ආකලන අංකය හැටියට සඳහන් කරන E අංකය යටතේ වෙළඳ පොලට එන බොහෝ ආහාර. අද දවසේදී ලංකාවේ ඒ රසායනික ද්‍රව්‍ය භාවිතය තහනම් නොවුණත්, ලෝකයේ එම රසායන ද්‍රව්‍ය තහනම් වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙන්න මේ තහනම් වීම ඇයි අපට ගන්නට බැරි. අපට පිළිකා රෝහලේ වාට්ටුවක් හදන්න පුළුවන් නම්, අපට මේ නීතිය ගන්න බැරි ඇයි? මහජන මුදලින් වාට්ටු හදන්න පුළුවන්. මහජන මුදලින් සියලු දේ කරන්න පුළුවන්. හැබැයි, අපි සූදානම් නැහැ, අඩුම ගණනේ මේ ආහාරවලට දාන අජිනෝමොටෝ ටික නවත්වා ගන්න. බොහොම පැහැදිලිවම මේ E 621 කියන සංඝටකය ළමයින්ට දෙන පොඩි ටිපි ටිප් පැකට් එකේ ඉඳලා අනෙකුත් ආහාර වෙනකල්ම තිබෙනවා. මේ E 621 කියලා කියන්නේ, මොනෝ සෝඩියම් ග්ලූටනේට් කියන රසායන ද්‍රව්‍ය. මෙය උග්‍ර පිළිකාකාරකයක්. මෙය පිළිකාකාරකයක් බව අපේ වෛද්‍යවරු දන්නවා. වෙළඳ පොළ දන්නවා. රජය දන්නවා. සෞඛ්‍ය අමාත්‍යාංශය දන්නවා. මේ සියල්ල දන්නවා. මෙම පිළිකා කාරකය අද දවසේ දරුවන්ට ලබා දෙන්නේ, කිසිම පැකිලීමකින් තොරව. E 621, E 622 කාණ්ඩයේ වූ බොහෝ පිළිකාකාරකයන් අද වන කොට ලෝක වෙළඳ පොළෙන් අයින් කරලා. ලෝකයේ බොහෝ රටවල්වල තහනම් කරලා. මේ තහනම් කරපු ඒ බොහෝ රසායන ද්‍රව්‍ය අද වෙද්දී කිසිම පැකිලීමකින් තොරව අපේ ආහාරවලට දානවා. මේ ආහාරවල තිබෙන රසායනික සංයුතිය අපි හඳුනා නොගනිමින් ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේදී අප වෙත එන කෘමිනාශක රසායනික පොහොර, කල් තබා ගැනීමට යොදන දේවල්, ඒ වාගේම වර්ණකාරක රස කාරක දේවල් අපට සීමා කරන්න බැරි නම්, අපට බෝ නොවන රෝග නවත්වන්න බැහැ. බෝ නොවන රෝග කියන ව්‍යසනය කොතරම්ද කිව්වොත් අද දවසේදී හෘද රෝගයෙන් විතරක් දෙතුන් සියයක් මිය යනවා. කිසිම අඩු පාඩුවක් නැතිව මේ මරණය දැක දැක, දරුවන්ගේ අභිවෘද්ධිය දකින්න බලාපොරොත්තු වුණු, දරුවන්ගේ දියුණුව බලාපොරොත්තුවෙන් දරුවන් විවාහ කරදී දරු මුණුබුරන්ගේ දරුවන් දකින්න බලාපොරොත්තු වුණු මේ පරපුර හෙට දවසේ දරුවන්ගේ පාංශුකූලය දකින මට්ටමට නිර්මාණය වෙලා තිබෙනවා. මෙතැනට අපි තීන්දු තීරණයක් ගත යුතුව තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වෙනුවෙන් අපි පැකිළිලා වෙළඳ පොලට යට වෙලා, වෙළෙන්දන්ට යට වෙලා, වෙළෙන්දන්ගේ වුවමනාව මත තීන්දු තීරණ ගන්නවා නම්, මම හිතන්නේ අපි ජාතියක් හැටියට කරන්නේ බරපතළ වැරැද්දක්. රාජ්‍ය නායකයෝ හැටියට, දේශපාලඥයෝ හැටියට මේ අධිකාරිය ඒ තීන්දු තීරණවලට පැමිණිය යුතුව තිබෙනවා. තමන්ගේ රට ජාතිය ගැන හිතන, යුරෝපයේ සුද්දාට සුද්දාගේ පැවැත්ම ගැන හිතන්න පුළුවන් වාගේම අපට අපේ පැවැත්ම ගැනත් හිතන්න පුළුවන් වෙන්න ඕනෑ. අපේ සෞඛ්‍ය අමාත්‍යාංශය, පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව කොපමණ වෙහෙස ගත්තත්, ඔවුන් සායන පවත්වමින් ඒ රෝගීන්ට නිසි ප්‍රතිකාර කළත්, අපට මේ රෝගය වැළඳුනාට පස්සේ එතැනින් මිදෙන්න අවශ්‍ය වටපිටාව ගොඩ නගනවාට වඩා, එතැනට ඇතුළු වන පෝලිම් ගත වන ප්‍රමාණය අඩු කිරීමට මම හිතන්නේ, අපි පසුබට නොවිය යුතුයි කියලා. ඒ විතරක් නොවෙයි. පුංචි උදාහරණයක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මට කියන්න පාන් පිටි ටිකක ගුල්ලෙක් දැකපු දවසක්. පරිප්පු ටිකේ ගුල්ලෙක් දැකපු දවසක්. එහෙම දෙයක් අද නැහැ. පරිප්පුවලට බොහොම පැහැදිලිවම මැලතින් ආවරණයක් තිබෙනවා. පාන් පිටිවලට පිටින් ජීවීන්ට ඇතුළු වෙන්න බැරි තරම් රසායන ද්‍රව්‍ය ඇතුළු කරලා තිබෙනවා. අපි පාන් පිටි ග්‍රෑම් 500 ක් ගෙනාවත්, හළලා රොටි හදපු අපට පාන් පිටි ගෝනියකවත් ගුල්ලෙක් සොයා ගන්න බැරි තරම් අද රසායනික ආවරණයක් කරලා තිබෙනවා. මේ ව්‍යසනය අපි හඳුනා ගන්නේ නැතිව බොරුවට ලෙඩ්ඩුන්ට වාට්ටු හදන එක මම හිතන්නේ, කිසිම තේරුමක් නැහැ. ඒ නිසා මෙතැනදී පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය දරන උත්සාහයට, නිවාරණය වෙනුවෙන් දරන උත්සාහය සම්බන්ධයෙන් දෙවරක් සිතිය යුතුව තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ, ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතේ ප්‍රජා සෞඛ්‍ය වෛද්‍යවරු අතිමහත් වූ සේවාවක් අපේ කොට්ඨාශවල කරනවා. ඔවුන්ගේ කැප වීම සෙනසුරාදා, ඉරිදා, පෝය හා උදේ, හැන්දෑවේ කියලා නැහැ. ඒ කැප වීම උපරිමයෙන් කරනවා. මම හිතන්නේ, වැඩ සටහන් හය දහස් ගණනක් මේ වන කොට බස්නාහිර පළාත තුළ ප්‍රජා සෞඛ්‍ය ක්ෂේත්‍රයේ පමණක් සිද්ධ වෙලා තිබෙනවා. මෙවැනි වටපිටාවක් තුළ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමාගේ වෙලාව අවසන් වෙනවා.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගෙන් විනාඩි පහක් දෙන්න.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

විනාඩි 05 ක් විපක්ෂයෙන් දෙනවා.

**ගරු නෙලුක් මල්ලව**
Hon. Neluk Mallawa

බොහොම ස්තුතියි. එතකොට මේ සිද්ධිය සම්බන්ධයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ප්‍රජාව දැනුවත් කරන්න, ප්‍රජාව බලමුළු ගන්වන්න, ප්‍රජාව එකතු කරන්න යන කොට අපි ප්‍රජාවට ආදර්ශවත් වෙන්න ඕනෑ. කොත්තු කඩේ ඉඳලා සුපර් මාර්කට් එක දක්වාම අද තිබෙන්නේ, අපව වනසන, අප නසන රසායන ද්‍රව්‍ය අඩංගු ආහාර. කෑම වර්ග. ඔබතුමන්ලා ගොඩවෙන්න සුපර් මාර්කට් එකේ වෙනදාට අපි කන හුනු බිත්තරේ E කාණ්ඩයේ සංඝටක හතක් තිබෙනවා. හුනු බිත්තර පැකට් එකේ E කාණ්ඩයේ සංඝටක හතක් තිබෙනවා. මේ විෂ කාරක, මේ විෂ සහිත ඒ E කාණ්ඩයේ සංඝටක අපි අයින් කළ යුතුව තිබෙනවා. ලෝකයේ අපි භාවිතා කරන යෝගට් එකේ ඉඳලාම කෝඩියල් එක දක්වාම භාවිතා කරන E 102 කියන, ටාටසින් කියන රසායන ද්‍රව්‍ය අද බහුලයි. නමුත් යුරෝපයේම තහනම්. මුළු යුරෝපාකරයේම තහනම්. නමුත් ඒක නිපදවන්නේ යුරෝපයෙන්. අපට ලබා දෙන්නේ යුරෝපයෙන්. ඒ වස විස අපේ පැවැත්ම වෙනුවෙන් පාවිච්චි කරනවා. ඒ නිසා මෙවැනි දේ ගැන අපි වඩා සිතිය යුතුව තිබෙනවා. ප්‍රජා සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ඉන්න වෛද්‍යවරු මේ පිළිබඳව දැනුවත් කරමින්, දැනුවත් වෙමින් ගියාට වෙළඳ පොළට එන්න තිබෙන ඉඩකඩ වැඩියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මතට තිත තිබ්බාට වැඩක් නැහැ අරක්කු තහනම් කරන්නේ නැතිව. ජාවාරම්කාර වෙළෙන්දෝ මූලික හැටියටම රූපවාහිනිය හරහා වෙළඳ දැන්වීම් ලබා දෙමින්, දරුවෝ මූලික කර ගනිමින් මේ කරන ජාවාරමට තිත තියන්න අපට පුළුවන්. බලයක් තිබෙන, හැකියාවක් තිබෙන රජයක් හැටියට මේ තීන්දු තීරණ ගන්න පුළුවන්. මේ තීන්දු තීරණ නොගන්නවා නම් අපට පුළුවන් වෙන්නේ එන එන ලෙඩාට බෙහෙත් දෙන්න විතරයි. එන එන ලෙඩාගේ මිය යාමේ පාංශුකූලයට සහභාගී වෙන්න විතරයි. ඒ නිසා මේ තීරණය ගන්න තරම් පෞරුෂයක් මම හිතන්නේ වත්මන් රජයට තිබෙනවා. ඒ බලපෑම මම හිතන්නේ, පළාත් සභාව හැටියට අපි කළ යුතුව තිබෙනවා.

ප්‍රජා සෞඛ්‍ය ක්ෂේත්‍රයට අමතරව මේ අමාත්‍යාංශය යටතේ තිබෙන අනෙකුත් විෂයයන් යටතේ විශේෂයෙන්ම සමාජ සේවා දෙපාර්තමේන්තුව. සමාජ සේවා දෙපාර්තමේන්තුවේදී මට ලබා දුන්න කෙටුම්පත්වල සඳහන් වෙනවා, ජ්‍යෙෂ්ට පුරවැසියන්ට අභිමානයෙන් ජීවත් වෙන්න අවශ්‍ය පසුබිම නිර්මාණය කිරීමට උපකාරී වීම අපේ වගකීමයි කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජ්‍යෙෂ්ට පුරවැසියා කියන කෙනා අපි විශේෂයෙන් ගනුදෙනු කරන කොටසක්. ඔවුන් තුළ තිබෙන බහුශ්‍රැත භාවය, ඔවුන් තුළ තිබෙන පරිණත භාවය, ඔවුන් තුළ තිබුණු දැනුමේ විහිදීම. ඒ ජ්‍යෙෂ්ට පුරවැසි සංවිධානයක් ගත්තාම මුළු සමාජයම එතැන ඉන්නවා. එතැන ඉන්නවා, වෛද්‍යවරු. ප්‍රාදේශීය ලේකම්වරු. අමාත්‍යාංශ ලේකම්වරු. කම්කරුවෝ. ගොවියෝ. මේ මුළු ජන සමාජයම ඉන්නවා. ඒ ජන සමාජය තුළ තිබෙන අත්දැකීම් සම්භාරය මම හිතන්නේ, අපි තනි තනිවම විඳින්න ගත්තොත් ඒක මහා සම්පතක්. ඒ නිසා ජ්‍යෙෂ්ට පුරවැසියන් මේ වන විට, ජ්‍යෙෂ්ට පුරවැසි සංවිධානය - අපේ පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව හරහා ජ්‍යෂ්ට පුරවැසි සංවිධානය ස්වයං රැකියාවලට යොමු වෙමින් හා අනෙකුත් කටයුතුවලට යොමු වෙමින් අපේ ඉන්න ජ්‍යෙෂ්ට පුරවැසියන් ශක්තිමත් කරමින් සමාජය තුළ එදා දවසේ සේවයක් කළ අය සමාජයට වඩා වැඩදායී සේවයක් කිරීමට බරපතළ ආකාරයට පෙළඹෙන තත්ත්වයක් තිබෙනවා. මම හිතන්නේ, ජ්‍යෙෂ්ට පුරවැසි සංවිධානවලට දෙපාර්තමේන්තුවෙන් දක්වන දායකත්වය වැඩි කිරීමට අවශ්‍ය ශක්තිය අමාත්‍යාංශය මඟින් ලබා දීමට කටුයතු කරනවා නම් සතුටුදායකයි. එම නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා දීර්ඝ වශයෙන් කථා කරන්නේ නැහැ. මෙම අමාත්‍යාංශයේ කටයුතු කර ගෙන යන්න ගරු අමාත්‍යතුමා දක්වන වෙහෙස අපට දැනෙනවා. පෙනෙනවා. ඒ වෙහෙස වෙනුවෙන් අපේ නිලධාරී මණ්ඩලය එතුමාට දක්වන දායකත්වය, දකින ගමන් එම ඉලක්කයන් සාක්ෂාත් කරන්න එතුමාට ධෛර්යය ශක්තිය

හැකියාව ලැබේවායි කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මේ අවස්ථාවේදී ගරු සභාපතිතුමා මූලාසනාරූඪ වනවා ඇත.

***ඊට අනුකූලව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා [ඒ.එම්. යූසුෆ් මහතා ] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.***
*Accordingly Hon. Presiding Member [Mr. A.M. Yoosuf M.P.C] left the Chair and Hon. Chairman [Mr. Sunil Wijeratne] took the Chair.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට මංජු ශ්‍රී අරංගල ගරු විපක්ෂ නායකතුමාට විනාඩි 10 ක් තිබෙනවා.

[පූ.භා. 11.32]

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, සෞඛ්‍ය අමාත්‍යාංශය පිළිබඳ අයවැය වැඩ සටහනට යම් වචනයක් ප්‍රකාශ කරන්න ලැබීම පිළිබඳව මම ස්තුතිවන්ත වෙනවා. ඒ උපදේශක කාරක සභාව නියෝජනය කරන පුද්ගලයෙක් විධියට. විශේෂයෙන්ම ඇමතිතුමාට අපි ස්තුතිවන්ත වෙනවා. රටේ මිනිස්සුන්ට කැඳ නැති වුණත් අද පල්ලෙහායින් අපි උඩට එන කොට කැඳ වීදුරුවක් හරි දුන්නා. ඒ නිසා ප්‍රථමයෙන්ම සෞඛ්‍ය ඇමතිතුමාට අපේ ගෞරවයත්, ස්තුතියත් පුද කරන්න කැමැතියි. එතුමා ඇත්තෙන්ම අර නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ ඉතාමත්ම හොඳ අමාත්‍යවරයෙක්. එතුමා එක්ක ඕනෑ දෙයක් සාකච්ඡා කරලා තීන්දු තීරණ ගන්න පුළුවන්කම තිබෙනවා. හැබැයි, එතුමා කොයි තරම් හොඳයි ද කියනවා නම්, සීයක් ඉල්ලුවාම අඩලා පනහක්වත් ගන්න බැහැ. හැබැයි තිහක් දීලා සන්තෝෂ වෙනවා. ඒක තමයි එතුමාගේ තියරිය. ඒ නිසා අපට නොදුන්නත් අනික් කට්ටියට අත දිග ඇරලා දෙනවා. ඒ පිළිබඳව කිසි ප්‍රශ්නයකුත් නැහැ. ඉතින් අපි කල්පනා කරන්නේ, අපි උපදේශක කාරක සභාවේ ඉන්න සාමාජිකයෝ හැටියටත්, ඊළඟ සැරේත් මේ ඇමති ධූරය හම්බ වුණොත්, මොන ඇමති ධූරයක් හරි හම්බ වුණොත් උපදේශක කාරක සභාවේ ඉන්න මන්ත්‍රීවරුන්ට අඩු ගණනේ හයිය හත්තිය දෙන මිනිස්සු කියලා පොඩි තල්ලුවක් දෙන්නය කියන ගෞරවනීය ඉල්ලීම කරනවා. හැබැයි, අපට තමුන්නාන්සේ හොඳ ඇමතිවරයෙක්. ආණ්ඩු පක්ෂයේ සමහර ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඇහුවාම කියන දේ තමයි එතුමා ගුණත් නැහැ අගුණත් නැහැ. හරියට පතෝල වාගේ තමයි කියලා. මම දන්නේ නැහැ ඒක මොකද කියන්නේ කියලා. ඔය මොන ප්‍රශස්ති කියලා වර්ණනා කළත් ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ මතය සමහර වෙලාවට ඒක තමයි. ඒ නිසා මම මතක් කරන්න කැමැතියි. මට ඉස්සෙල්ලා කථාව කරපු නෙලුක් මල්ලව ගරු මන්ත්‍රීතුමාගේ කාරණය. හැබැයි, ඊට ප්‍රථම කියන්න ඕනෑ මේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඇමතිතුමා හොඳ පුද්ගලයෙක්. අපි දන්නවා, සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඒ අදාළ ආයතනවල සියලුම නිලධාරීන් අපි යමක් කිව්වාම පසුබට නොවී කරලා දෙන උදවිය හැටියට අපි ප්‍රථමයෙන්ම ඒ සියලු දෙනාට ගෞරවයත්, ස්තුතියත් පුද කරන්න කැමැතියි. අමාත්‍යාංශයේ ලේකම්තුමා. ඒ වාගේම තමයි පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂතුමා. හැම කෙනෙක්ම එතුමා පිළිබඳව බොහොම සතුටින් කථා කළා. ඇත්තෙන්ම අපි දුරකථනයෙන් පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂතුමාට යම් දෙයක් කිව්වොත් ඒක බැහැර කරන්නේ නැතිව කරන්න පුළුවන් ඉහළම උදව්ව, උපකාරය කරනවා. ඒ වාගේම සමාජ සේවා අධ්‍යක්ෂතුමිය. වර්තමානයේ සමාජ සේවා අධ්‍යක්ෂතුමිය බෙහොම ක්‍රියාකාරී ළඳක් විධියට, එතුමිය ඒ අධ්‍යක්ෂ ධූරය පිරිපුන් බවින් යුක්තව කරනවාය කියන එක අපි මතක් කරන්න කැමැතියි. ඒ වාගේම ආයුර්වේද කොමසාරිස්තුමා. මේ සමස්ත නිලධාරීන් බැලුවාම ඇමතිතුමාට ආශිර්වාදයක් වෙලා තිබෙනවාය කියන එක අපි මතක් කරන්නට ඕනෑ.

ඊළඟට මම මේ අවස්ථාවේදී නෙලුක් මල්ලව ගරු මන්ත්‍රීතුමා මතු කරපු කාරණාවට අවතීර්ණ වෙන්න කැමැතියි. දැන් එතුමා කිව්වා, මේ රටේ තිබෙන වස විස ගැන. ඒ වාගේම විදේශ රටවලින් ගෙන්වන පොහොර පිළිබඳව. මේවා සියල්ල කරන්නේ කවුරුවත් නොවෙයි. මේ බලය තිබෙන ආණ්ඩුව. මේ ආණ්ඩුවට යම් ප්‍රතිපාදනයක් තිබෙන්නට ඕනෑ. මේ රටේ මිනිස්සුන්ව සෞඛ්‍ය සම්පන්න ජනතාවක් විධියට ජීවත් කරවීමේ උවමනාවක් තිබෙනවා නම්, සැබෑ නිර්ණායකයන් යටතේ මේ මිනිස්සුන්ගේ සෞඛ්‍යට අවශ්‍ය දේවල් සපයන්න සහ ඒවා ඉටු කර දෙන්න ඕනෑ. අපි දන්නවා. අද ආණ්ඩුවට තිබෙන්නේ, එවැනි ව්‍යාපෘතියක් නොවෙයි. ජේම්ස් පැකර්ගේ ව්‍යාපෘතිය යටතේ, ජේම්ස් පැකර්ගේ ආයෝජන

[ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා]

යටතේ මේ රටේ මිනිස්සු සම්පූර්ණයෙන්ම සෞඛ්‍යයෙන් හීන, දුර්වල ජාතියක් බවට පරිවර්තනය කරන්න හදනවා. දැන් එතුමා කිව්වා මතට තිත තිබ්බා නම්, ඒක හරියට තියා ගන්න නම් කරන්න ඕනෑ එකම දේ තමයි අරක්කු තහනම් කරන එක කියලා. අපි දන්නවා. අපි කියන්නෙත් ඒක තමයි. මතට තිත කියලා කිව්වාට අද වෙලා තිබෙන්නේ තිතට මත් වෙන්න ගහන එක තමයි. දැන් ඊයේ පෙරේදා බැරල් පිටින් එන්නේ. එතනෝල් බැරල් පිටින් එනවා. කුඩු කන්ටේනර් පිටින් එනවා. රජයේ සාක්කිකාරයෙක් වුණාම කුඩු ටිකත් එළියට දෙනවා. ඒ වාගේම අරයා රජයේ සාක්කිකාරයෙක් බවට පත් වෙනවා. නීතිපතිවරයා අද ඒ නඩු ඉවත් කර ගන්නවා. ඒ තත්ත්වයටයි ගිහිල්ලා තිබෙන්නේ. ඒ නිසා අපි මතක් කරන්න කැමැතියි. සෞඛ්‍ය ඇමතිතුමාට මේ ජේම්ස් පැකර්ගේ ව්‍යාපෘතිය යටතේ හෙට අනිද්දා වගකීමක් එනවා. මේ රටේ නියත වශයෙන්ම ගණිකා වෘත්තිය ස්ථාපනය වෙනවා. ඒක නවත්වන්න පුළුවන්කමක් ඇත්තේ නැහැ. ඒ නිසා අපි ඔබතුමාට සෞඛ්‍ය ඇමතිවරයා හැටියට යෝජනාවක් කරන්න කැමැතියි. ඒක පටන් ගන්න අවශ්‍ය කටයුතු සම්පාදනය කරන්නය කියන එක.

ඒ වාගේම තමයි අපි අනික් කාරණා පිළිබඳව මතක් කරන්නේ. ඇත්තෙන්ම අද ජනයාට අවශ්‍ය වෙලාවට, නිසි වෙලාවට තමන්ගේ රෝගයකට බෙහෙත් හේත් ගන්න ගියාම අද රෝහල්වල තිබෙන තත්ත්වය පිළිබඳව අපි කල්පනා කරන්නට ඕනෑ. අර මන්ත්‍රීවරයෙක් ප්‍රකාශ කළා වාගේම වෛද්‍යවරයා තුණ්ඩුව ලියලා දුන්නාම, ඉස්සරහ ෆාමසියට ගිහිල්ලා බෙහෙත් ටික ගන්න වෙන තරමට තත්ත්වය දුර්වල වුණොත්, මේ රටේ මිනිස්සුන්ගේ සෞඛ්‍ය තත්ත්වය ඉතාම පරිහානියකට පත් වෙනවා. රටේ මිනිස්සු ආර්ථික වශයෙන් බොහොම අමාරුවෙන් ජීවත් වෙන්නේ. හැබැයි, ඒක මේ ඇමතිතුමාගේ තිබෙන වරදක් නොවෙයි. අපි දන්නවා. මේ අයවැය දිහා බැලුවත් එතුමාට වැඩ කරන්න අවශ්‍ය මුදල් ප්‍රතිපාදන ලැබෙන්නට ඕනෑ. ඒ ලැබුණේ නැත්නම් එතුමාට වැඩ කරන්න පුළුවන්කමක් නැහැ. මේ රටේ අධ්‍යාපනයට අති විශාල මුදලක් වෙන් වෙන කොට, මම හිතන්නේ සෞඛ්‍යයටත් ඒ හා සමානව මුදලක් වෙන් වුණොත් විතරයි, මේ රටේ සෞඛ්‍ය සම්පන්න ජනතාවක් බිහි කරන්න පුළුවන් වන්නේ. එහෙම බිහි කළොත් විතරයි අධ්‍යාපනයට වෙන් කරන මුදලින් නිසි ඵල ප්‍රයෝජන ගන්න පුළුවන් වෙන්නේ. ජනතාවක් බිහි කරන්න පුළුවන්කම ඇති වෙන්නේ. ඒ වාගේම තමයි අද අපි දන්නවා. අද නගරයක් පාසා රසායනාගාර බිහි වෙමින් යනවා. මම හිතන්නේ, මේවායේ ඉන්නේ සුදුසුකම් තිබෙන උදවිය ද, නැති උදවිය ද කියලා කියන්න පුළුවන්කමක් ඇත්තේ නැහැ. ඒ නිසා මේවා නියාමනය කරන්නට වැඩ පිළිවෙළක් හදන්නට ඕනෑ.

ඒ වාගේම තමයි අද ජනතාව සෞඛ්‍ය තුළින් පරිහානියට පත් වන එක හේතුවක් අපේ ආහාර රටාව පිළිබඳව තිබෙන ගැටලුව. මම හිතන්නේ, චීනයටත් වැඩිය චීන කඩ තිබෙන්නේ, ශ්‍රී ලංකාවේ. ඒවායේ තිබෙන රස කාරක, දිව රස ගන්වන්න යොදා ගැනීම තුළ මේ චීන කෑම හරහා අනන්ත අප්‍රමාණ මිනිස්සුන්ට විවිධ ලෙඩ රෝග බෝ වෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමා මාර්ගයෙන් ගරු සෞඛ්‍ය ඇමතිතුමාට කියන්න කැමැතියි, නගරවල තිබෙන මේ කඩවලට යොදන රස කාරක පිළිබඳව මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් හරහා විශාල නියාමනයක් කරන්නට සිද්ධ වෙනවාය කියන එක අපි මතක් කරන්නට ඕනෑ.

ආයුර්වේද රෝහල් පද්ධතිය අද ක්‍රමානුකූලව දියුණු වෙමින් යනවා. හැබැයි, අපි කනගාටුවෙන් යුක්තව මතක් කරන්නට ඕනෑ. ආයුර්වේදයේ උගන්වන්නේ තණ බිස්ස පාගන එක තමයි හොඳම සෞඛ්‍ය ක්‍රමය කියලා. අද මීගොඩ ආයුර්වේද රෝහලේ ලක්ෂ හැට පහක්, හැත්තෑවක් විතර වියදම් කරලා අර තණ බිස්ස පාගලා යන්න තිබෙන තත්ත්වය වෙනස් කරලා, අද එහේ ජොගින් පාර්ක් හදනවා. ඒ නිසා මේක වැරදි ක්‍රමයක්. ගරු සභාපතිතුමා මඟින් අපේ අමාතිතුමාට යෝජනා කරන්න කැමැතියි. මේ පිළිබඳව සොයා බලන්නය කියලා. ඒ වාගේම ජනක වැලිවත්ත ගරු මන්ත්‍රීතුමා මතක් කළ කාරණය. හෝමාගම රෝහලේ ගලිය උතුරලා ගිහිල්ලාලු. ඒ මන්ත්‍රීතුමාම කියනවා මේ සල්ලි මොනවා වෙනවාද කියන්නත් බැහැ. මේ සැරෙත් මොනවා වෙනවාද කියලා කියන්නත් බැහැයි කියලා. ඉතින් ගරු ඇමතිතුමනි, ආණ්ඩු පක්ෂයේ ඉන්න, ඒ වාගේම උපදේශක කාරක සභාව නියෝජනය කරන ගරු මන්ත්‍රීවරයෙක් මෙහෙම කියන කොට, තමුන්නාන්සේගේ අමාත්‍යාංශයට ජනක මන්ත්‍රීතුමා කණේ පාරක් දීලා ද කියලා තමයි අපට තේරෙන්නේ. ඒ නිසා මම හිතන්නේ, අපේ මන්ත්‍රීවරු යමක් ප්‍රකාශ කරන කොට ඇමතිතුමාවත් ආරක්ෂා කරලා ප්‍රකාශ කරනවා නම් මීට වැඩිය හොඳයි.

ඒ නිසා මම අවසාන වශයෙන් ගරු සභාපතිතුමා මාර්ගයෙන් ගරු ඇමතිතුමාට මතක් කරන්න කැමැතියි. අද ආයුර්වේද රෝහල්වලට කම්වු පත් කරනවා. ඒ වාගේම ප්‍රධාන රෝහල්වලට රෝහල් කම්වු පත් කරනවා. මෙලෝ වග විභාගයක් නැතිව, රෝහල්වලට උදව්වක් උපකාරයක් දෙන්න බැරි දේශපාලන හෙංචයියෝ පැටව් ගහන තැනට අද පැටව් ගස්සන, අර සාම විනිසුරු පදවි දෙනවා වාගේම රෝහලට යමක් කරන්න බැරි පුද්ගලයෝ, රෝහලේ දියුණුව වෙනුවෙන් යමක් කරන්න බැරි පුද්ගලයෝ අද පත් කරලා තිබෙනවා. මම හිතන්නේ, ඔබතුමා මගින් ගරු ඇමතිතුමාට මතක් කරන්න කැමැතියි. ඒවා පිළිබඳවත් සොයා බලලා කටයුතු කරන්න කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු සේනක දමයන්ත ද සිල්වා**
Hon. Senaka Damayantha de Silva

ගරු සභාපතිතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කරනවා. විශේෂයෙන්ම සෞඛ්‍ය ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා, අද දින වෛද්‍ය සායනයක් පැවැත්වීම සම්බන්ධව. සියලු රෝග පිළිබඳව විනිශ්චය ලබා ගැනීම සම්බන්ධව. ඒ එක්කම සඳහන් කරන්නට ඕනෑ. අද අපේ ගරු මන්ත්‍රීවරු ඔක්කොම ගෙදර යන කොට, ඒ වෛද්‍ය සායනයට සම්බන්ධ වුණු ගරු මන්ත්‍රීවරුන්ට බොහොම සන්තෝෂයෙන් ගෙදරට යන්න පුළුවන්. මම හිතන්නේ ගොඩක් බර අඩු වෙලා තිබෙනවා. ඒ ආවාට වඩා කිලෝ හයක් අඩු වෙලා තිබෙනවා. මේ තරාදිය චෙක් කරලා බලන්න. තරාදිය වැරදියි. කිලෝ හයක් අඩුයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, කාලය නැහැ. පසුව කාලය දෙන්නම්.

**ගරු සේනක දමයන්ත ද සිල්වා**
Hon. Senaka Damayantha de Silva

මේ තරාදිය පොඩ්ඩක් චෙක් කරලා බලන්න. තරාදිය වැරදියි. කිලෝ හයක් අඩුයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට ගරු සෞඛ්‍ය අමාත්‍යතුමාට අවස්ථාව ලබා දෙනවා.

[පූ.භා. 11.44]

**ගරු ජගත් අංගගේ** (සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන හා කාන්තා කටයුතු, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යතුමා)
Hon. Jagath Angage (Minister of Health, Indigenous Medicine, Social Welfare and Women's Affairs , Probation and Child Care Services and Council Affairs)

ගරු සභාපතිතුමනි, මා අතිශයින්ම ස්තුතිවන්ත වෙනවා. අද සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත් විෂය ධාරාවන් යටතේ ගරු මන්ත්‍රීවරුන් 13 දෙනෙකු මේ අයවැය විවාදයට සම්බන්ධ වුණා. මෙහිදී ඔවුන් විසින් කරන ලද ඉතාමත් සාධාරණ, මානව හිතවාදී විවේචන මා අතිශයින්ම ගරු කොට සලකනවා. ආණ්ඩු පක්ෂයේත්. විපක්ෂයේත්. මොකද, හේතුව අද දවස වන විට සෞඛ්‍ය අමාත්‍යාංශයත්, ඒ වාගේම සමාජ සේවා දෙපාර්තමේන්තුවත්, දේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුවත් ආදී මේ දෙපාර්තමේන්තු තුළ කරන සේවය ජනතාවට වඩාත් අවශ්‍ය මොහොතක තමයි අද අපි මේ විවාදය පවත්වන්නේ.

ගරු සභාපතිතුමනි, 2014 ඇස්තමේන්තු තුළින් බස්නාහිර පළාත් සභාව රුපියල් මිලියන 38,000 ක් පුනරාවර්තන වියදම් සඳහා වෙන් කරන කොට, බස්නාහිර පළාත් සෞඛ්‍ය සේවා අමාත්‍යාංශය පවත්වාගෙන යන්න මිලියන 8338 ක් පමණ වෙන් කර තිබෙනවා. මෙය සමස්ත වියදමෙන් 21.9% ක් බවට සටහන් වෙනවා. මෙහිදී මා විශේෂයෙන්ම සිහිපත් කරන්නේ. අද ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සේවය පවත්වාගෙන යාම සඳහා මොන තරම් විශාල ආයෝජනයක් රජය විසින් දරන්න සිද්ධ වෙලා තිබෙනවාද කියන කාරණය පිළිබඳව යම්කිසි ඉඟියක් පළ කිරීම සඳහායි. ඒ වාගේම ප්‍රාග්ධන ආයෝජන සඳහා බස්නාහිර පළාතේ මුළු ප්‍රාග්ධන වියදම රුපියල් මිලියන 5644 ක් වන කොට 2014 වර්ෂය සඳහා බස්නාහිර පළාතට, අපේ දෙපාර්තමේන්තුවට රුපියල් මිලියන 758.5 ක, 13.44% ක ප්‍රාග්ධන ආයෝජනයක් ක්‍රියාත්මක කිරීමට, වෙන් කිරීමට තමයි පුනරාවර්තන වියදම්වලට සාපේක්ෂව තිබෙන්නේ. කෙසේ වෙතත් ගරු සභාපතිතුමනි, පසුගිය ගෙවී ගිය වසර හතරහමාරක පමණ කාලය තුළදී බස්නාහිර පළාතට පැමිණි සෞඛ්‍ය අභියෝග හා ඒ අභියෝගවලට මුහුණ දුන් ආකාරයත්, මේ වන කොට බස්නාහිර පළාතේ පවතින තත්ත්වයන් පිළිබඳවත් නැවත ආපසු හැරී බැලීමක් කිරීමට ඉතාම වැදගත් අවස්ථාව හැටියට මා සලකනවා.

[ගරු ජගත් අංගගේ - අමාත්‍යතුමා]

ගරු මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලා මේ අවස්ථාවේදී කළ විවිධ විවේචන සහ කළ ප්‍රසාදනීය අදහස් පිළිබඳව සලකා බැලීමේදී ඔබතුමන්ලා දන්නවා, පසුගිය කාල පරිච්ඡේදය තුළම හැමදාම පත්තරේ ප්‍රධාන අකුරෙන් පළමු වැනි පිටුවේ ලියවුණේ ඩෙංගු රෝගය නිසා මරණයට පත් වන මිනිස්සුන්ගේ ජීවිත පිළිබඳවයි. අද අපි ඩෙංගු රෝගය පාලනය කිරීම සඳහා සුවිශේෂී කාර්යභාරයක් බස්නාහිර පළාත තුළ ක්‍රියාත්මක කරලා, මේ තත්ත්වය ඉතාමත්ම හොඳින් පාලනය කරන්න අපට හැකියාව ලැබුණා. අද මේ සභාවේදී මේ විවාදයේදී ඩෙංගු රෝගීන් පිළිබඳව, ඩෙංගු මරණ පිළිබඳව කිසිම කෙනෙකුගේ කටින් වචනයක් පිට වුණේ නැහැ. එසේ ප්‍රකාශ නොවීමට කාරණාව වුණේ - මූලික කාරණාව ඔබතුමන්ලා පැහැදිලිව දන්නවා. අපි බස්නාහිර පළාතේ ඩෙංගු රෝගය පාලනය කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ගය. පසුගිය දවස්වල මෙම සභාව අනුමත කරපු, 2013 මහජන පීඩා වැළැක්වීමේ ප්‍රඥප්තිය. ඩෙංගු රෝගය පාලනය කිරීම සඳහා ක්ෂණික විහිදුම් බලකාය. ක්ෂණික ආමන්ත්‍රණ යටතේ රෝගය පැතිරී යන ස්ථාන හඳුනා ගැනීමට ක්‍රියාත්මක වීම ආදී විවිධ ක්‍රියාමාර්ග. ඒ එක්කම ඩෙංගු රෝගීන්ට ප්‍රතිකාර කිරීමේ දැඩි සත්කාර ඒකක. මේ සියල්ල හොඳින්ම ක්‍රියාත්මක වෙද්දී පසුගිය කාලයේ, අපි මීගමුවෙන් ආරම්භ කරපු අලුත් ඩෙංගු රෝගීන්ගේ හදිසි දැඩි සත්කාර ඒකකය. මේ වන කොට අපි රෝගීන් 1500 කට පමණ මේ දැඩි සත්කාර ඒකකය තුළ සේවාවන් සපයලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, මේ දැඩි සත්කාර ඒකකය තුළ එකදු මරණයක්වත් වාර්තා වන්නේ නැහැ. මේ නිසා අපට පුළුවන් වුණා, මේ වෛද්‍ය උපකරණ සහ මේ අංශය නඩත්තු කරන්න මිලියන 42 ක මුදලක් ආයෝජනය කරලා, ඒ තුළින් අති විශාල සේවාවක් කරන්න. විශේෂයෙන් මේ රටේ ඩෙංගු රෝගය නිසා ජීවිතක්ෂයට පත් වන මිනිස්සුන්ගේ ජීවිත ආරක්ෂා කර ගන්න අද අපට ඒ තුළින් හැකියාව ලැබුණා. පසුගිය දවස්වල විශේෂඥ වෛද්‍යවරුන්ගෙන්, ශල්‍ය වෛද්‍යවරුන්ගෙන් අපට දැඩි චෝදනාවකට ලක් වුණා. තාක්ෂණික වශයෙන් ලෝකය දියුණු වෙලා. ඒ අනුව ශල්‍යාගාර තුළ රෝගීන්ට වන අපහසුතාවය අවම කිරීමට, සත්කාර කිරීමට අවශ්‍ය කරන යන්ත්‍රෝපකරණ අවශ්‍යයි. මේවා දෙන්නේ නැත්නම් රෝගීන්ට දැඩි ලෙස පීඩාවන්ට පත් වෙන්න සිද්ධ වෙනවාය කියලා. මේ වන කොට අපි ඒ සියලු අවශ්‍යතාවයන් සපුරලා තිබෙනවා. මේ වන කොටත් මීගමුව, ගම්පහ, හොරණ, වතුපිටිවල ආදී රෝහල්වලට අවශ්‍ය කරන ලැපරස්කොපි මැෂින් මේ වන කොට ලබා දීලා තිබෙනවා. සුළු තුවාලයක් තුළින් අවශ්‍ය කරන ශල්‍යකර්ම, අවශ්‍ය කරන තාක්ෂණික ක්‍රමවේදයන් උපයෝගී කර ගනිමින්, ක්‍රියාත්මක කරන්න. අපි මේ එක ලැපරස්කොපි යන්ත්‍රයක් සඳහා මිලියන 14 ක මුදලක් ආයෝජනය කර තිබෙනවා. ඉතින් මේ ආකාරයෙන් අද සෞඛ්‍ය සේවයේ විශාල අභිවෘද්ධිය පිළිබඳව අපේ මන්ත්‍රීවරු කථා කළා. සියලුම රෝහල්වල ගිලන් රථ සේවා අපි යාවත්කාලීන කරලා තිබෙනවා. අපි සේවයට අලුතින් ගිලන් රථ 40 ක් අද එකතු කළා. මේ ගිලන් රථ 40 ත් එක්ක අපට විවිධ ව්‍යාපෘති යටතේ ලැබී තිබෙන නවීන ගිලන් රථ සමගම මුළු බස්නාහිර පළාතේම ගිලන් රථ සේවය අලුතින් යාවත්කාලීන කරලා, අපි ඒ අවශ්‍යතාවයන් සම්පූර්ණයෙන් සකස් කරලා තිබෙනවා.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, රෝග නිවාරණ සේවා කටයුතු විධිමත් කරන්න අවශ්‍ය කරන සියලු සේවාවන් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල 39 ක් හරහා, ඒ වාගේම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල යටතේ ළමා සෞඛ්‍ය සායන 450 ක් ක්‍රියාත්මක කරමින් මේ ප්‍රදේශය තුළ පවුල් සෞඛ්‍ය අභිවෘද්ධිය ඉතාමත් යහපත් මට්ටමකට, ඉහළට ගෙනියන්න අපි ක්‍රියාත්මක වී තිබෙන බව මං සතුටින් ප්‍රකාශ කරනවා.

ගරු සභාපතිතුමනි, මේ සියලු කාරණා තුළින් සිදු වුණේ, බස්නාහිර පළාතේ ජීවත් වන ජනතාවට - 2009 වර්ෂයේ අපි මේ වගකීම භාර ගන්න කොට බස්නාහිර පළාත් සභාවේ පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂවරයා, අමාත්‍යාංශ ලේකම්වරයා ඒ වාගේම අනෙකුත් දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ප්‍රධානීන්, ඒ වාගේම සමාජ සේවා දෙපාර්තමේන්තුව, අනිකුත් ක්ෂේත්‍රවල සියලු ප්‍රධානීන්, පරිවාස දෙපාර්තමේන්තුවේ නිලධාරීන් එකට එකතු වෙලා මේ වගකීම භාර ගත් දිනට වැඩිය, ප්‍රතිශතාත්මකව බැලුවොත් විශාල පියවර කිහිපයක් ඉස්සරහාට යන්නට අපට පුළුවන් වුණේ ගරු සභාපතිතුමනි, ඔබතුමාගේත්, ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේත්, කැබිනට් මණ්ඩලය සහ මේ ගරු මන්ත්‍රීවරුන්ගෙනුත් ලැබුණු සහයෝගය නිසා කියන එක මම කිසිවිටකත් අමතක කරන්න සූදානම් නැහැ.

ගරු සභාපතිතුමනි, මම අතිශයින්ම සන්තෝෂ වෙනවා. මේ වන කොට බෝ නොවන රෝග පිළිබඳව මුළු

ලෝකයම කථා කරනවා. 2010 උත්තම ශ්‍රම පූජා ව්‍යාපෘතියෙන් අපි ආරම්භ කළේ මේ වැඩ සටහන. 2010 වර්ෂයේදී. මේ වන විට ලක්ෂ ගණනාවක්, පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවත්, පළාත් ආයුර්වේද දෙපාරත්මෙන්තුවත් ඒකාබද්ධ ව්‍යාපෘති යටතේ ක්‍රියාත්මක කරමින්, ජනතාව දැනුවත් කරමින් ඔවුන්ගේ ආහාර රටාව වෙනස් කරන්න, මානසික ආතතිය අවම කර ගැනීම සඳහා අවශ්‍ය කරන උපදේශනය ලබා දෙන්න, ඔවුන්ට අවශ්‍ය කරන ව්‍යායාම ලබා ගැනීම සඳහා ඔවුන්ව පෙළඹවීමට අවශ්‍ය විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කරමින් අති විශාල වැඩ කොටසක් ඉෂ්ට කරලා තිබෙනවා. මේ රෝගී තත්ත්වයන් පාලනය කර ගැනීම සඳහා.

ඒ නිසා ගරු සභාපතිතුමනි, බැලූ බැල්මට ඇහැට නොපෙනෙන ක්‍රියාවලියක තමයි සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට සහ අවශේෂ දෙපාර්තමේන්තුවලට ක්‍රියා කරන්න සිදු වෙලා තිබෙන්නේ. සාමාන්‍යයෙන් අපට භෞතිකව ඇහැට පෙනෙන බොහෝ දේ පිළිබඳව කථා කරන්න පුළුවන්. නමුත් අපි ජීවත් වන මේ පරිසරය තුළ ජීව වායුව කියලා එකක් තිබෙනවා. ඒ ජීව වායුව නැති මොහොතක අපි ජීවිතය අවසාන කරලා ඇද වැටෙනවා. නමුත් ජීව වායුව අපට ඇහැට නොදකින නිසා මේ ඔක්සිජන් කියන වායුව අප ළඟ, මේ පරිසරය තුළ ගැවසෙන බව අපට පේන්නේ නැහැ. නමුත් බොහෝ විට සෞඛ්‍ය දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක කිරීමේදී සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ කටයුතු කරන සියලු දෙනාට දැඩි ඉවසීමේ ගුණයක් තිබිය යුතු බව, ඔබ අපි කවුරුත් පිළිගන්නා කාරණාවක්. සමහර වෙලාවට රෝහලට එන රෝගියෙක් මහත් වේදනාවෙන්, කිසි කෙනෙකුට නොරුස්සන ස්වභාවයෙන් තමයි රෝහලට ඇතුළු වෙන්නේ. නමුත් ඒ හා සමානවම ප්‍රතිකාර කරන වෛද්‍යවරයාට හෝ අනෙකුත් කාර්ය මණ්ඩලයට කේන්තියක් ආවොත් එහෙම මේ දෙපාර්ශ්වය ඇතුළේ මේ ගනුදෙනුව කර ගන්න බැහැ.

ඒ වාගේම තමයි දෙපාර්තමේන්තුව ඇතුළේ සියලු කටයුතුවලදී බොහෝ දේ පෙනෙන්නේ නැහැ. ඇහැට දකින්නට නැහැ. ඒකෙන් වෙන සමාජයීය යහපත පිළිබඳව එක මොහොතකින් දැකලා අවබෝධ කර ගන්න බැහැ. නමුත් විශාල කාර්යභාරයක් පසුපස තමයි මේ සමාජ පරිවර්තනය සිද්ධ වෙන්නේ. ඩෙංගු රෝගය වෙන්න පුළුවන්. වෙනත් දෙයක් වෙන්න පුළුවන්. අප කථා කළා මතට තිත පිළිබඳව. රසකාරක ආදේශක සහිත ආහාර වර්ග මේ සමාජය තුළ පාරිභෝගිකයාට ලබා ගැනීම නිසා ඇති වන ව්‍යසනය පිළිබඳව. මේ සියලු කාරණා පිළිබඳව අපි අධ්‍යයනය කළත්, එකවර මේ පරිවර්තන සිදු කිරීමට වෙළඳ පොළේ පවතින සියලු රස කාරක ආදේශිත ආහාර වර්ග ඉවත් කරන්න අපට යම් ක්‍රමවේදයක් පවතිනවාද? රෝග වළක්වා ගැනීම, රෝග ප්‍රතිකාර කිරීමට වැඩිය ඉහළ තැනක පැවතිය යුතුයි කියන කාරණාව සහ මේ පිළිබඳව ජනතාවගේ දැනුවත් කිරීම සහ ජනතාව පෙළ ගැස්වීම සඳහා පවත්නා ප්‍රධානම ආයතනය හැටියට අපි සලකන්නේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල 39. මේ 39 හි සක්‍රීය භාවය, ඒවාට අවශ්‍ය කරන උපකරණ සහ මෙවලම් සැපයීම, ඒ වාගේම මානව සම්පත් සැපයීම තුළ අපට යම් ගැටළුවලට මුහුණ දෙන්න අසීමිත විධියට බාධාවන් තිබෙනවා.

ගරු සභාපතිතුමනි, මම මේ පුරා, පසුගිය වසර හතරහමාරක කාලය තුළ මමත් මගේ අමාත්‍යාංශයේ නිලධාරීනුත් කළ කැප වීම පිළිබඳව පැහැදිලිව වචනවලින් ප්‍රකාශයට පත් කරන්න බැරි වුණත්, අපි විශ්වාස කරනවා බස්නාහිර පළාතේ ජනතාවගේ යහපත පිණිස අපට හදවතට දැනෙන යමක් කරන්න ශක්තිය ලැබුණාය කියලා. තිබෙන සීමිත සම්පත් යටතේ.

ගරු සභාපතිතුමනි, මම සන්තෝෂ වෙනවා, බස්නාහිර පළාත් සභාවේ සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ ලක්ෂ තුනකට ආසන්න ජ්‍යෙෂ්ට පුරවැසියන් පිරිසක් අද අපට සංවිධානගත කරන්න පුළුවන් වෙලා තිබෙනවා. ලක්ෂ තුනකට ආසන්න ජ්‍යෙෂ්ට පුරවැසියන්, දයාබර මව් පියවරු අපි සමාජ සංවිධානවලට ඒකරාශී කරලා තිබෙනවා. මට නිතර ඇහැට දකින්නට ලැබෙන දර්ශනයක්. ඔවුන් වාර්ෂිකව විවිධ ප්‍රසංග පවත්වනවා. වාර්ෂිකව අවුරුදු උත්සවය පවත්වනවා. වෙනත් සංස්කෘතික වැඩ සටහන් පවත්වනවා. ආධ්‍යාත්මික සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරනවා. මේ බස්නාහිර පළාතේ හැම ගමක් පුරාම අපේ ජ්‍යෙෂ්ට පුරවැසියෝ මහා දැවැන්ත ප්‍රබෝධයකින් අද ජීවත් වෙනවා. මේවා සල්ලි දීලා කාටවත් ගන්න පුළුවන් වන තැනක් නොවෙයි. ඒ දයාබර දෙමව්පියන්ගේ හදවතින් මතු වන ඒ ප්‍රසාදනීය හැඟීම්, ඒ ආශිර්වාදාත්මක හැඟීම්, ඔවුන් තුළ තිබෙන, දෝර ගලා යන සතුට මගේ ජීවිතයට

[ගරු ජගත් අංගගේ - අමාත්‍යතුමා]

මහා විශාල ආශිර්වාදයක්, සැනසීමක් හැටියට මම දකිනවා. ඒක මගේ ජීවිතයෙන් කාටවත් පැහැර ගන්න බැරි, මහා විශාල දායාදයක් ලෙස මම සලකනවා.

ගරු සභාපතිතුමනි, ජ්‍යෙෂ්ඨ පුරවැසි සංවිධානවලට මම හිතන්නේ, අපේ හැම ප්‍රදේශයකම, ගමක් ගමක් ගානේ වසර හතරහමාරක කාලය තුළ සාමාජිකයන් ලක්ෂ තුනක් සමාජගත කරන්න, සමාජ සංවිධානවලට ගොනු කරමින් ඔවුන්ට සන්තෝෂයෙන් ජීවත් වෙන්නට පුළුවන් පරිසරය නිර්මාණය කරන්න ලැබීමම, සමාජ සේවා දෙපාර්තමේන්තුවේ හිටපු අධ්‍යක්ෂවරයාත්, වත්මන් අධ්‍යක්ෂවරයාත්, ඒ කාර්ය මණ්ඩලයත්, මගේ සමාජ සේවා නිලධාරී කණ්ඩායමත් කළ මහා වික්‍රමයක් හැටියට මා මේ මොහොතේදී ඔබ හැම ඉදිරියේ ඉතාමත් ගෞරවයෙන් යුතුව සිහිපත් කරනවා.

ගරු සභාපතිතුමනි, මා අමතක කරන්නේ නැහැ. බස්නාහිර පළාතේ ක්‍රියාත්මක වන මාතෘ සායන. මම දැඩි ලෙස සටනක් කළා, මේ මාතෘ හා ළමා සායන කියන නම මේ ආයතනවලින් ඉවත් කරන්න. මම ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමාගෙනුත් ඉල්ලීමක් කළා. ගරු ඇමතිතුමනි, අපි මේ වෙනුවට පවුල් සෞඛ්‍ය සායන කියන නම ආදේශ කර ගනිමුයි කියලා. එහෙම නැත්නම් තාත්තා නැතිව පවුලක සංරක්ෂණය කරන්න විධියක් නැහැ. පවුලක මන්ද පෝෂණය තුරන් කරන්න විධියක් නැහැ. පවුලක සෞඛ්‍ය ආරක්ෂා කරන්න විධියක් නැහැ. තාත්තා එළිපත්ත ළඟට ඇවිල්ලා කඩුල්ල ළඟ හිටගෙන ඉන්නවා. අම්මායි දරුවයි සායනයට ඇතුළු වෙනවා. තාත්තාගෙන් ඉටු වෙන්න තිබෙන බොහෝ සෞඛ්‍ය අවශ්‍යතාවයන් ඉෂ්ට කර ගන්න, පවුලට අවශ්‍ය කරන සහයෝගය ලබා ගැනීමේ අපහසුතාවයක් තිබෙනවා, තාත්තාවත් මේ ඒකකයට ඇතුළු කර ගන්නේ නැති නිසා. ඒ නිසා කරුණාකරලා මේ මාතෘ හා ළමා කියන වචනය වෙනුවට පවුල කියන වචනය එකතු කරන්නය කියලා අපි ආයාචනා කළා. අපි කළුතර දිස්ත්‍රික්කයේ මේ නියාමක ව්‍යාපෘතිය ආරම්භ කළා විතරක් නොවෙයි ගරු සභාපතිතුමනි, කළුතර දිස්ත්‍රික්කයේ මේ ජයග්‍රහණ අත්පත් කර ගන්න අපට හැකියාවක් වුණා, ශ්‍රී ලංකාවේ මාතෘ මරණ අඩුම දිස්ත්‍රික්කය බවට ශ්‍රී ලංකාවේ කළුතර දිස්ත්රික්කය පරිවර්තනය කරන්න. මන්ද පෝෂණය අඩුම දිස්ත්‍රික්කය බවට ශ්‍රී ලංකාවේ කළුතර දිස්ත්‍රික්කය පරිවර්තනය වුණා. ඒ විතරක් නොවෙයි. ශ්‍රී ලංකාවටම ඩෙංගු මර්දනය පිළිබඳව නියාමක ව්‍යාපෘති ඉදිරිපත් කිරීමේ ගෞරවය කළුතර දිස්ත්‍රික්කයට හිමි වුණා. මේ හිමි වීමට හේතුව වෙන කාරණාවක්වත් නොවෙයි. සම්පත්වල වැඩි ඒකරාශී වීමක්වත් නොවෙයි. මේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ඒ මානව සම්පත් සංරක්ෂණය කිරීමේ ක්‍රියාවලිය විධිමත් කරන්න අපට ලැබුණු අවස්ථාව නිසයි.

ගරු සභාපතිතුමනි, මීට එහායින් මම මේ පිළිබඳව කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. මම විශේෂයෙන්ම මේක අවස්ථාවක් කර ගන්නවා, අවසාන වශයෙන් මේ සියලු දේ කරන්න මට ශක්තියක් වුණු ඔබ සියලු දෙනාටම ස්තුති කරන්න. ගරු සභාපතිතුමනි, මට මේ ඉවසීමේ ගුණය ලබා දුන්නේ මම අදහන ආගම දහමයි. බුදුන් වහන්සේගේ දර්ශනයයි. මට බොහෝ ප්‍රශ්නවලට මුහුණ දෙන්න, බොහෝ තර්ජනාත්මක කරුණුවලට - විපක්ෂ නායකතුමා අවසාන මොහොතේ කළ ප්‍රකාශයට අනුකූලව ජගත් අංගගේ හොඳත් නැහැ. නරකත් නැහැ. පතෝල වාගේ. මම පතෝල වෙලා තිබෙන්නේ ගරු සභාපතිතුමනි කාටවත් පිහියෙන් ඇනලා, වෙඩි තියලා හිරේ ගිහිල්ලා නොවෙයි, අනුන්ගේ දේවල් මංකොල්ල කාලා, අනුන්ගේ කනට ගහලා, කවදාවත් හිරේ ගිහිල්ලා නැහැ. ලංකාවේ දේශපාලනය කිරීමේදී සිරගත වීම පළමු වන සුදුසුකම නිසා ජගත් අංගගේ පතෝල වාගේ දැනෙන ස්වභාවය වළක්වන්න බැහැ. ගරු සභාපතිතුමනි, ඊළඟ කාරණාව මම අතිශයින් සන්තෝෂ වෙනවා -

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

ඇයි අනික් ඇමතිවරු හිරේ ගිය අයද ඉන්නේ?

**ගරු ජගත් අංගගේ -**අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

මගේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා, මගේ කැබිනට් මණ්ඩලය, ආණ්ඩු පක්ෂයේත් විපක්ෂයේත් ගරු මන්ත්‍රීතුමන්ලා ඒ වාගේම අර පසුපස ඉන්න මගේ ගෞරවනීය නිලධාරී කණ්ඩායම, පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂතුමා, මගේ අමාත්‍යාංශ ලේකම්තුමා, ඒ වාගේම ආයුර්වේද කොමසාරිස්තුමා, පරිවාස කොමසාරිස්තුමිය, ඒ වාගේම සමාජ සේව කොමසාරිස්තුමිය. ඊට අදාළ සියලුම තරාතිරම්වල සියලු නිලධාරීන් පුරා වසර හතරහමාරක් තිස්සේ මේ වික්‍රමාන්විත ක්‍රියාවන් කරන්න මට දුන්න අසීමිත සහයෝගය මම අතිශයින්ම අගය කොට සලකනවා.

ඒ වාගේම රේඛීය අමාත්‍යාංශවල අපේ අතිගරු ජනාධිපතිතුමාගේ මෙහෙයවීම යටතේ, මහින්ද චින්තන ඉදිරි දැක්ම යටතේ අපට දුන්න ආදර්ශය. ඒ මහින්ද චින්තන ඉදිරි දැක්ම තුළ තමයි අපි ඇත්ත වශයෙන්ම මේ හැම දෙයක්ම හිතුවේ. ඒ සංකල්ප තුළ තමයි අපි ක්‍රියාත්මක වුණේ. ඒ වාගේම රේඛීය අමාත්‍යාංශයේ සෞඛ්‍ය අමාත්‍ය ගරු මෛත්‍රීපාල සිරිසේන අමාත්‍යතුමා ඉතාමත්ම සුවිශේෂී, ඉතාමත්ම ආදර්ශවත් අමාත්‍යවරයෙක් හැටියට, මුදල්වලට ගිජු නොවී, මේ රටේ දුම්කොළ ව්‍යාපාරයට, මේ රටේ දුම්වැටි ව්‍යාපාරයට මහා දැවැන්ත අභියෝගයක් එල්ල කරලා, ජාත්‍යන්තර ගෞරවයට පාත්‍ර වුණු නායකයෙක් හැටියට එතුමා දුන් නායකත්වය අතිශයින්ම අගය කොට සලකනවා.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, අපේ ක්ෂේත්‍රයට සම්බන්ධ ෆීලික්ස් පෙරේරා ගරු අමාත්‍යතුමා. ඒ රේඛීය අමාත්‍යාංශවලින් අපේ සමගාමී විෂයයන් සම්බන්ධ රේඛීය අමාත්‍යාංශවලින් දුන් සහයෝගය මා අතිශයින්ම අගය කොට සලකමින් ගරු සභාපතිතුමනි, ඔබතුමා මා වෙත දක්වන ලද සහයෝගය මෙම අයවැය විවාදයේදී මම අතිශයින්ම අගය කොට සලකනවා. ඒ වාගේම මගේ කණ්ඩායමේ සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාට යම් විධියකින් අපේ කාර්ය මණ්ඩලය තුළින් හෝ මා තුළින් යම්කිසි අතපසු වීමක් නිසා හෝ සිත් තැවුලක්, වේදනාවක් ඇති වුණා නම් ඒ පිළිබඳව ගරු ඔබතුමා මගින් සමස්ත මන්ත්‍රීවරුන්ගෙන් ඒ පිළිබඳව මගේ කනගාටුව සහ සමාව අයදමින් ඔබ සියලු දෙනාටම මේ පළාත් සභාවට එන්න ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු ඔබ සියලු දෙනාවම ඊළඟ පළාත් සභා වාරයේදීත් දකින්නට මා වෙත වාසනාව ලැබේවා යැයි ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

***අ.භා. 12.00 ට, අංක 105, 116, 117, 118 හා 119 යන ශීර්ෂ පිළිබඳ සාකච්ඡාව අවසාන විය.***

*Discussion on the Expenditure Head Nos 105, 116, 117, 118 and 119* was *concluded* at *12.00 p.m.*.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන හා කාන්තා කටයුතු, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යාංශය සම්බන්ධව ශීර්ෂ අංක 105, 116, 117, 118 හා 119 වැය ශීර්ෂයන් පිළිබඳ විවාදය මේ මොහොතේ අවසන් වෙනවා. ඒ පිළිබඳව සභාවේ බෙදීමක් තිබෙනවාද?

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

බෙදීමක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා සීනුව නාද කරන්න.

***ශීර්ෂ අංක 105 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, 61(3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 53 යි, විපක්ෂව 16 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***

*The question that the amount indicated in the Head No. 105 should be approved was put and the Committee of the Whole Council was divided under Rule No. 61(3) as 53 for, 16 against and 0 decliners.*

***ශීර්ෂ අංක 116 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, 61(3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 53 යි, විපක්ෂව 16 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***

*The question that the amount indicated in the Head No. 116 should be approved was put and the Committee of the Whole Council was divided under Rule No. 61(3) as 53 for, 16 against and 0 decliners.*

***ශීර්ෂ අංක 117 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, 61(3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 53 යි, විපක්ෂව 16 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***

*The question that the amount indicated in the Head No. 117 should be approved was put and the Committee of the Whole Council was divided under Rule No. 61(3) as 538 for, 16 against and 0 decliners.*

***ශීර්ෂ අංක 118 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, 61(3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 53 යි, විපක්ෂව 16 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***

*The question that the amount indicated in the Head No. 118 should be approved was put and the Committee of the Whole Council was divided under Rule No. 61(3) as 53 for, 16 against and 0 decliners.*

***ශීර්ෂ අංක 119 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, 61(3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 53 යි, විපක්ෂව 16 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***

*The question that the amount indicated in the Head No. 119 should be approved was put and the Committee of the Whole Council was divided under Rule No. 61(3) as 53 for, 16 against and 0 decliners.*

| | | |
|---|---|---|
| ශීර්ෂ අංක **- 107** | - | **ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමූපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදා හැරීම් කටයුතු සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය** |
| ශීර්ෂ අංක **- 122** | - | **මෝටර් රථ දෙපාර්තමේන්තුව** |
| ශීර්ෂ අංක **- 123** | - | **සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව** |
| ශීර්ෂ අංක **- 103** | - | **සමූපකාර සේවක කොමිෂන් සභාව** |
| Head no - 107 | - | Ministry of Transport, Sports and Youth Affairs, Culture and Arts Affairs, Cooperative Development, Food Supplies and Distribution affairs and Rural Development |
| Head no - 122 | - | Department of Motor Traffic |
| Head no - 123 | - | Department of Cooperative Development |
| Head no - 103 | - | Cooperative Employees' Comission |

***[සංකේත කපා හැරීම]***
*[Symbolic write-off]*

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමූපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදා හැරීම් කටයුතු සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය හා සමූපකාර කොමිෂන් සභාව සඳහා ශීර්ෂ අංක 107, 122, 123, 103 යන ශීර්ෂවලින් රු. 10/- ක මුදලක් අඩු කළ යුතු යැයි යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එම වැය ශීර්ෂයන් සම්බන්ධයෙන් අදහස් දැක්වීමට ඔබතුමාට විනාඩි 10 ක කාලයක් ලබා දෙනවා.

[අ.භා. 12.04]

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, මේ සමූපකාර විෂය සම්බන්ධව අයවැය විවාදයේදී පස්වන පළාත් සභාවේදී - හැම පළාත් සභාවකදීම මෙම වැය ශීර්ෂය සම්බන්ධව කථා කරපු මන්ත්‍රීවරයෙක් වශයෙන් අදත් මේ අවස්ථාවේ කථා කරන්න ලැබීම සම්බන්ධව මම සතුටු වෙනවා. ගරු සභාපතිතුමනි, උපාලි කොඩිකාර ගරු අමාත්‍යතුමාගේ වැය ශීර්ෂයක් කියන එකයි අපි දකින්නේ. කෙසේ වෙතත් යම් යම් ප්‍රශ්න තුළ, යම් ගමනක් ගිහිල්ලා, අද මේ වැය ශීර්ෂය ආරම්භ කරන අවස්ථාව. මේ අවස්ථාවේදී අපි සංකේතයක් වශයෙන් රුපියල් 10 ක මුදලක් අඩු කළේ, යෝජනා කළේ විවාදයක් අවශ්‍ය නිසා. ඒ විවාදය පටන් ගන්න මේ වෙලාවේ ගරු අමාත්‍යතුමා මේ ස්ථානයේ සිටිනවා.

ඇත්තටම සමූපකාරය ගැන කථා කරනවා නම්, සමූපකාර ක්ෂේත්‍රයෙන් මේ දේශපාලනයට පැමිණි මන්ත්‍රීවරයෙක් වශයෙන්, ඒ වාගේම සමූපකාර ප්‍රාදේශික තුළින් අධ්‍යක්ෂ ධූරය දරලා, ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයෙක් වෙලා අද මේ තත්ත්වයට ආපු මන්ත්‍රීවරයෙක් වශයෙන් අද මේ සමූපකාරය විවෘත ආර්ථිකයත් එක්ක ගැළපෙනවාද කියන එක අපි කල්පනා කරන්න ඕනෑ. එම නිසා අද සමූපකාර ක්ෂේත්‍රයේ ප්‍රාදේශික වෙන්න පුළුවන්. නැත්නම් විවිධ සේවා සමූපකාර සමිති වෙන්න පුළුවන්. අද කඩා වැටිලා තිබෙන බව කියන්න ඕනෑ නැහැ. ඒක කවුරුත් දන්නා දෙයක්. ඒකට යම් යම් හේතු ගණනාවක් තිබෙනවා. ඒ හේතු ගණනාව තුළ මම මේ පළාත් සභා විවාදවලදී නැත්නම් පළාත් සභාවේ පෙත්සම් කාරක සභාවට පෙත්සම් ඉදිරිපත් කළා වාගේම, සභා කටයුතු රැස්වීම්වලටත් මම යම් යම් ප්‍රශ්න ඉදිරිපත් කරලා තිබෙනවා. ගරු සභාපතිතුමා දන්නවා. කැලණිය දළුගම විවිධ සේවා සමූපකාර සමිතිය. මීරිගම විවිධ සේවා සමූපකාර සමිතිය. අත්තනගල්ල, කැලණිය විවිධ සේවා සමූපකාර සමිතිය වාගේම ග්‍රාමීය බැංකු පිළිබඳ විවේචන, ග්‍රාමීය බැංකුවල තිබෙන අඩුපාඩු, දූෂණ සම්බන්ධව අපි කථා කරලා තිබෙනවා. ප්‍රශ්න ඉදිරිපත් කරලා තිබෙනවා. ගරු අමාත්‍යතුමා යම් යම් උත්තර දීලා තිබෙනවා. ඒවා ක්‍රියාත්මක වෙලා තිබෙනවා. ඒත් මේ සමූපකාර ක්ෂේත්‍රයේ තිබෙන දැවැන්ත කඩා වැටීමට හේතුව වන්නේ, මම දකින විධියට මේ විවෘත ආර්ථිකය නිසා බව මම කියන්න ඕනෑ. කෙසේ වෙතත්,

බස්නාහිර පළාත් සභාවක් වශයෙන් අපි කොහොමද මෙයට එකතු වෙන්නේ කියන එකයි කල්පනා කරන්න ඕනෑ. මම දකිනවා. මම මෙතුමාව ප්‍රායෝගික අමාත්‍යවරයෙක් වශයෙන් දකින්නේ. අපේම පැළැන්තියේ, අපෙන්ම ආපු අමාත්‍යවරයෙක් වශයෙන් මෙතුමා යම් ගමනක් යනවා.

යම් යම් අඩුපාඩු තිබෙනවා. පත්තරවල දකිනවා. දැනුත් මේ පත්තරයක් මා ළඟ තිබෙනවා. පාදුක්ක බස් නැවතුම්පළ මඩ වගුරක්. ප්‍රවාහන කටයුතුවලදී යම් යම් විධියට මඩ ගා ගෙන ගමනක් යනවා. අද අපට සභා ලේකම් කාර්යාලයට ස්ථිර ගොඩනැගිල්ලක් නැහැ. ඒත් මෙතුමා ප්‍රවාහන අමාත්‍යාංශයට දර්ශනීය ගොඩනැගිල්ලක්, බත්තරමුල්ලේ හදලා තිබෙනවා. දැන් හෙට අනිද්දා විවෘත කරනවා. කෙසේ වෙතත් එවැනි දේවල් කරනවා. හැබැයි, අඩුපාඩු තිබෙනවා. ඒ වාගේම හොඳ නිලධාරී මණ්ඩලයකුත් ඉන්නවා. උපුල් ශාන්ත අල්විස් මහතා, දේශප්‍රිය මහතා, දුමින්ද මහතා, අමිල හොඳ දක්ෂ තරුණ කට්ටියක් ඉන්නවා. මේ අයගෙන් හොඳට වැඩ ගන්න ඕනෑ. මේ ඇමතිතුමාගෙන් මම ඉල්ලීමක් කරන්නේ ඒකයි. මේ දක්ෂ තරුණයන්ගෙන් වැඩ අරගෙන, දක්ෂ නිලධාරීන්ගෙන් වැඩ ගත්තොත් මේ පත්තරවල යන ඒවා, මේ මඩ ගැහිලි ඔක්කොම නැති වෙලා, මේ සියල්ල සංකලනය කර ගෙන හොඳ ගමනක් යන්න පුළුවන්. ප්‍රවාහන කටයුතු එහෙමයි.

ප්‍රවාහන කටයුතු බැලුවොත් අපි දන්නවා, ඒකාබද්ධ කාල සටහන්. ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මම දන්නවා. ලංගමයි, පෞද්ගලික බස් කියලා බස් වර්ග දෙවර්ගයක් තිබෙනවා. ඒ දෙවර්ගය ඒකාබද්ධ කාල සටහනක් යටතේ - තවම විශාල වශයෙන් පාරවල්වලට එය සකස් කරලා නැහැ. මේ තුළ රෑ නවය දහය වන කොට බස් නැතිව යනවා. පෞද්ගලික බස් නැතිව යනවා. මම උපදේශක කාරක සභාවේ මන්ත්‍රීවරයෙක්. මට දීලා තිබෙන්නේ, බස් ස්ටෑන්ඩ් එකක් විතරයි. වෙන දෙයක් නැහැ. ඇත්ත දේ කියන්න ඕනෑ. උපදේශක කාරක සභා මන්ත්‍රීවරයෙක් වුණත්. අපි උපදේශක කාරක සභා රැස්වීම්වලදී මෙතුමා සම්බන්ධව, මෙතුමාගේ වැඩ කටයුතු සම්බන්ධව - මෙතැන මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ඉන්නවා නම් සාක්ෂි දරයි. දීර්ඝ වශයෙන් විවේචනය කරලා, ඒ අමාත්‍යාංශය තුළ හරි දේ කර ගන්න උත්සාහ කරනවා. ඒ වාගේ තමයි අපිත්.

ග්‍රාම සංවර්ධන සමිති ගැන කථා කරන්න ඕනෑ. ජනතාව සමඟ ළඟින්ම තිබෙන සමිති. ගරු සභාපතිතුමනි, මම ඉල්ලීමක් කරනවා. ඒ සමිතිත් අද කොන්ත්‍රාත් සමිති බවට පත් වෙලා තිබෙනවා. මේ ග්‍රාම සංවර්ධන සමිති. ඔබතුමා මාර්ගයෙන් ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ඒ නිලධාරී මණ්ඩලය, ඒ අධ්‍යක්ෂවරු යොමු කරලා, මේ සම්බන්ධව පරීක්ෂණයක් කරලා, ඒ ශක්තිය ලබා දෙන්නය කියන එක ඉල්ලා සිටිනවා. අපි උපදේශක කාරක සභා මන්ත්‍රීවරු වශයෙන් මේ වැඩ කටයුතුවලදී - ඒ ඒ අමාත්‍යාංශවල උපදේශක කාරක සභා තියෙන්නේ, යම්කිසි දෙයක් කරන්න. ඒත් විපක්ෂයේ ඉන්න මන්ත්‍රීවරුන්ටත් යම්කිසි දෙයක් දීලා, ඒ සොච්චමත් - අපි රැස්වීම්වලට යනවා. අපට බස් ස්ටෑන්ඩ් එකක් විතරක් දීලා මේ ගමන යන්න බැහැ. මම ඉල්ලීමක් කරනවා අනෙක් පළාත් සභාවේදී හරි මේ ගරු අමාත්‍යතුමා මාර්ගයෙන් ඒ දේ කර දෙන්න ශක්තිය, ධෛර්යය ලැබේවායි කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 12.12]

**ගරු මහින්ද කුරුවිටගේ**
Hon. Mahinda Kuruwitage

ගරු සභාපතිතුමනි, පස් වන පළාත් සභාවේ අවසාන අයවැය විවාදයට සහභාගී වෙමින් ඔබතුමා යටතේ අපි කථා කරන්නේ, 2013 වර්ෂයේදී සමූපකාර හා ක්‍රීඩා, ප්‍රවාහන අමාත්‍යතුමාගේ වැය ශීර්ෂයෙන් කෙරුණු කාර්යභාරය හා 2014 වර්ෂයට බලාපොරොත්තු වන ප්‍රතිපාදන, අලුත් යෝජනා ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳවයි. අපි සතුටු වෙනවා. 2009 දී පැවති පළාත් සභා මැතිවරණයේදී අතිගරු ජනාධිපතිතුමාගේ විශේෂ දායකත්වය තුළ විෂය භාර අමාත්‍යවරයා වශයෙන් මෙම අමාත්‍යාංශය උපාලි කොඩිකාර ගරු අමාත්‍යතුමාට ලැබුණා. ගරු සභාපතිතුමනි, එතුමාට ලැබුණු විෂය ධාරාව තුළ මම හිතනවා, බස්නාහිර පළාත් සභාවේ ජනතාවට දැනෙන, ප්‍රවාහන අමාත්‍යාංශය, ජනතාවගේ අප්‍රසාදයට ලක් වෙලා තිබෙන ප්‍රවාහන අමාත්‍යාංශය. ඒ වාගේම සමූපකාර දෙපාර්තමේන්තුව. නාම මාත්‍රික ක්‍රීඩා අමාත්‍යාංශය. මෙවැනි අමාත්‍යාංශයන් තමයි එතුමාට ලැබිලා තිබුණේ. අවුරුදු හැට හැත්තෑවක ආයුෂ ප්‍රමාණයක් වින්දනය ලබපු සමූපකාර ක්ෂේත්‍රය මම හිතනවා, එතුමාට ලැබෙන කොට පොදු මහත් ජනතාවගේම අප්‍රසාදයට ලක් වෙලා තිබෙනවා.

[ගරු මහින්ද කුරුවිටගේ]

ඒ වාගේම 58 ලක්ෂයක ජනතාව ජීවත් වන මේ බස්නාහිර පළාත් සභාවේ ඒ ජනතාවට වැදගත් සේවාවක්, ප්‍රියජනක සේවාවක් නොලැබුණු ආයතනයක් වශයෙන් තමයි එතුමාට ලැබුණේ. පළාත් සභාවේ අවුරුදු 15 ක් විතර ආයු කාලයක් සේවය කරපු මන්ත්‍රීවරයෙක් වශයෙන් අපට කියන්න කනගාටුයි. පළාත් සභාවේ ක්‍රීඩා අමාත්‍යාංශයක් හරියාකාරව දැනෙන්න තිබුණාද කියලා අපට දැන ගන්නට තිබුණේ නැහැ. හැබැයි, මේ කටකාර කොඩිකාර මේ අමාත්‍යාංශය ගත්තාට පස්සේ එතුමාට පුළුවන් ආකාරයෙන් - කථාව අඩුවෙන් කරලා වැඩිය වැඩ කරපු, වැඩ කරන මහ ඇමතිතුමා යටතේ මේ ඇමතිවරයා නව අවස්ථාවන්, නව හැකියාවන් එතුමාට දැනෙන ආකාරයෙන් මේ බස්නාහිර පළාත් සභාව සතු කරන්න උත්සාහ කළා. මම හිතන විධියට සමූපකාර අමාත්‍යතුමාගේ විවාදය ආරම්භ කළේ, විපක්ෂයෙන් අපේ හිත මිත්‍ර ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා. එතුමාගේ මූලික අදහස් උඩ කියවුණේ ප්‍රායෝගිකම ඇමතිවරයා කියලයි. වැඩක් කරන්න උත්සාහ කරපු ඇමතිවරයා කිව්වා. වැඩ කෙරුණා කිව්වා. හොඳම නිලධාරීන් රාශියක් ඉන්නවා කිව්වා. ඒ අයගෙන් ප්‍රයෝජනය අරගෙන මේ සභාව සතු නැති, ආයතන රාශියක් ආරක්ෂා කරන්න උත්සාහ කළා කිව්වා. ඒකෙන්ම පෙනී යනවා උපාලි කොඩිකාර ගරු අමාත්‍යතුමා යමක් කළා කියලා. 2013 වර්ෂයේ මූලධන වියදම් වශයෙන් ග්‍රාම සංවර්ධන කටයුතු සඳහා මිලියන 14.7 ක් ලැබිලා තිබෙනවා. ඒ වාගේම විනෝද හා ක්‍රීඩා කටයුතු සඳහා මිලියන 14.2 ක් ලැබිලා තිබෙනවා. සංස්කෘතික අංශයට මිලියන 3.65 ක් ලැබිලා තිබෙනවා. මෝටර් රථ ප්‍රවාහන මිලියන 4.5 ක් ලැබිලා තිබෙනවා. සමූපකාර දෙපාර්තමේන්තුවට 0.95 ක ප්‍රතිපාදනයක් තමයි ලැබිලා තිබෙන්නේ. මිලියන 38 ක් මූලධන වියදම් වශයෙන් එතුමා ක්‍රියාත්මක කරලා තිබෙනවා. ඒ වාගේම 2014 වර්ෂයේදී ග්‍රාම සංවර්ධන කටයුතු සඳහා මිලියන 15.4 කුත්, ක්‍රීඩා කටයුතු සඳහා මිලියන 14.7 කුත්, සංස්කෘතික අංශය සඳහා මිලියන 3.4 කුත්, මෝටර් රථ ප්‍රවාහන සඳහා මිලියන 6.3 කුත්, සමූපකාර දෙපාර්තමේන්තුව සඳහා මිලියන 1.25 ක් අදාළ වැය ශීර්ෂ යටතේ එතුමාට ලැබිලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, මම හිතනවා, මේ සමූපකාර දෙපාර්තමේන්තුව සියලු දෙනාගේම අප්‍රසාදයට ලක් වෙලා තිබෙනවා. ඒකට මේ ගරු ඇමතිතුමා වග කියන්න ඕනෑ නැහැ. අවුරුදු හැට හැත්තෑවක ආයුෂ ප්‍රමාණයක් තිබෙන මේ සමූපකාර දෙපාර්තමේන්තුව 1956 දී පිලිප් ගුණවර්ධන අමාත්‍යතුමා අමාත්‍යාංශයක් වශයෙන් සම්මත කළත්, මේ බස්නාහිර පළාත් සභාව පස්වන වතාවට තේරී පත් වන තෙක් එහි සේවකයන් 7000 ක් ඉන්නවා. ඒ සේවකයන්ට විශ්‍රාම වැටුපක් නැතිව හිටියා. අපට පුළුවන් වුණා - ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇමති මණ්ඩලය සමඟ විශේෂයෙන් විෂය භාර අමාත්‍ය උපාලි කොඩිකාර ඇමතිතුමාත් අපේ පළාත් සභා මෙහෙයවපු හිටපු අමාත්‍යවරුන්ගේත් දායකත්වය තුළ, අපේ ආණ්ඩු පක්ෂ කණ්ඩායමේ දායකත්වය තුළ, මේ අපේ නිලධාරීන්ගේ සහයෝගය තුළ 2010/6 දරන ප්‍රඥප්තිය අපට සම්මත කරන්න පුළුවන් වුණා. ඒ සේවකයන් 2220 ක් අද වන කොට විශ්‍රාම වැටුප ලබන්නට සුදුසුකම් ලැබීමේ සහතික පත් ලබා ගෙන තිබෙනවා. ඒ විතරක් නොවෙයි ගරු සභාපතිතුමනි, 2012 වර්ෂයේදී 125 දෙනෙක් විශ්‍රාම වැටුප ලබලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, මම හිතනවා, මේ අමාත්‍යාංශ හරහා මේ අමාත්‍යාංශවලට වැඩියෙන් මීට වඩා ප්‍රතිපාදන ලැබෙනවා නම් මම හිතනවා, ඒක වැඩියෙන්ම ක්‍රියාත්මක කරන්න පුළුවන් හොඳම ඇමතිවරයා තමයි උපාලි කොඩිකාර ඇමතිතුමා. මම එහෙම කියන්නේ, අපේ ප්‍රදේශයේ තිබෙන සියලුම සමූපකාර ප්‍රධාන ගොඩනැගිලිවලට එතුමා ප්‍රතිපාදන වෙන් කරලා අපත් සමග එකතු වෙලා මීට අවුරුදු තිහ හතළිහකට උඩදී හදපු ගොඩනැගිලි අලුත් සංවර්ධනයකට යොමු කරන්න අපට පුළුවන් වෙලා තිබෙනවා. හැම විටම අපි උපාලි කොඩිකාර ගරු ඇමතිතුමා කරන දේ, විඳින දේ අඩුවෙන් කියලා වැඩියෙන් අපවාද ලබන අමාත්‍යාංශයක් වශයෙන් අපි සඳහන් කරනවා නම්, මම හිතනවා අපි කුහකයෝ කියලා. මම ඒකයි කිව්වේ. බස්නාහිර පළාත් සභාවේ ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන අමාත්‍යතුමා කිසිදු ප්‍රධාන අමාත්‍යවරයෙකුට දෙවැනි නොවන, වැදගත් වූ සුවිශේෂ වූ කාර්යභාරයක් ඉටු කරපු අමාත්‍යවරයෙක් වශයෙන් අපේ හදවත් පිරිලා තිබෙනවා. එම කැබිනට් එකේ සියලුම ඇමතිවරු මම හිතනවා, බස්නාහිර පළාත් සභාව 2013 වර්ෂයේදී මේ රටට, මධ්‍යම රජයට පූර්වාදර්ශයක් වන විධියට වැඩ කරපු පළාත් සභාවක් වශයෙන් සඳහන් කරන්න පුළුවන්.

අද වන කොට බස්නාහිර පළාත් සභාවේ ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරීම තුළදී මම හිතනවා, දෙපයින් ඉඳගෙන

ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රී කණ්ඩායමේ මන්ත්‍රීවරුන්ට මෙන්ම විපක්ෂයේ අයටද ජනතාව ඉදිරියට ගිහිල්ලා පළාත් සභාවක් වශයෙන් යමක් කරපු ආයතනයක් කියලා කියන්න පුළුවන්. ඒවායේ අඩුපාඩු විවේචනය කරපු ප්‍රති පක්ෂයේ වගකිවයුත්තන්ටද ජනතාව ඉදිරියට යන්න පුළුවන්. එහෙම නම් අපි සතුටු වෙනවා. එදා 2009 දී මේ ඇමතිකම ගන්න කොට උපාලි කොඩිකාර ගරු ඇමතිතුමාගේ මේ අමාත්‍ය ධුරය කඩා ගෙන වැටෙයි. වැඩ කරන්න බැහැ. මොනවා වෙයිද කියලා සමහර කොටස් බලාගෙන හිටියා. හරියට ගරු සභාපතිතුමනි, එළුවාගේ අර මොකක්ද වැටෙන කල් පිටිපස්සෙන් ගියා වාගේ. හැබැයි, අවුරුදු පහ අවසානයේ අද වන කොට දැනෙන අමාත්‍යාංශයක් ලෙස, දැනෙන කාර්යභාරයක් ඉටු කරලා, ඒ මැතිවරණයේදී අටවැනියාට ආපු උපාලි කොඩිකාර අද හීතිකාවක් ඇති කර ගෙන ගිහිල්ලා තිබෙනවා. එතුමාගේ පෞද්ගලික හැකියාව තුළ, එතුමාගේ පෞද්ගලික කැපවීම මත ජනතාවට පණිවිඩයක් දෙන්න උත්සාහ කරනවා, අනාගත මහ ඇමැති මමයි කියලා. එවැනි තත්ත්වයකට වැඩ කරලා, හැඩ වෙලා අද ජනතාව ළඟට යන්න පුළුවන් වුණා.

ගරු සභාපතිතුමනි, මේ ඇමතිකම මෙහෙයවපු කිසිදු ඇමතිවරයෙකුට එහෙම අදහසක් සමාජයට දෙන්න බැරි වුණා. මොකද, ඒකට හේතුව වැඩ කළා අඩු නිසයි. මෙන්න මේක තමයි වෙනස. ඒ විතරක් නොවෙයි ගරු සභාපතිතුමනි, මම කවදාවත් කෙනෙකුට හිරිහැර කරන්න යන්නේ නැහැ. අද සමාජයේ ප්‍රධාන වශයෙන්ම කථා වන දෙයක් තමයි බස්නාහිර පළාත් සභාව. ගරු සභාපතිතුමනි, මේ රට මෙහෙයවන මර්මස්ථානය බස්නාහිර පළාත් සභාවයි. එහෙම නම් කිසිදු ඇමති කෙනෙකුට, ප්‍රධාන ඇමති කෙනෙකුට නොදෙවෙනි සේවයක් මේ රජයට ලබා දුන්නේ ප්‍රසන්න රණතුංග මැතිතුමායි. ඒ වුණත් අද වන කොට කථිකාවක් ඇති වෙනවා. මොකක්ද ඒ කථිකාව. මහ ඇමතිකම ලැබෙනවාද? මහ ඇමතිකමට අරයා එනවාද? මෙයා එනවාද? උඩින් දානවාද? නැහැ. ගරු සභාපතිතුමනි, හදවතට එකඟව කථා කළොත් මම හිතනවා, මේ මහ ඇමතිතුමාගේ බර වාගේම වැඩත් වැඩියෙන් කරලා තිබෙනවා. මම හිතන විධියට අධ්‍යාපනය - (බාධා කිරීම්)

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

කවුද ඊළඟ මහ ඇමති.

**ගරු මහින්ද කුරුවිටගේ**
Hon. Mahinda Kuruwitage

ගරු සභාපතිතුමනි, මෙතුමන්ලාට ඕනෑ උත්තරය මගෙන් ලැබෙන්නේ නැහැ. මෙතුමන්ලා බලාපොරොත්තු වන උත්තරය මගෙන් ගන්න බැහැ. ගරු සභාපතිතුමනි, මේ මහ ඇමතිකමට මෙතෙක් බිහි වුණු බස්නාහිර පළාත් සභාවේ සුදුසුම පුද්ගලයා ප්‍රසන්න රණතුංගයි කියන එක භය නැතිව කියනවා. ගරු සභාපතිතුමනි, ඒක මම ඉස්සෙල්ලා කිව්ව විධියට වැඩ වැඩියෙන්, කථාව අඩුවෙන් කරපු එකම මහ ඇමති කියලා. එහෙම නම් ගරු සභාපතිතුමනි, මේ ඇමතිවරු එක්කෙනාට එක්කෙනා පරයන්නේ නැති විධියට මේ සියලුම ඇමතිවරු අපට උදව් කරලා තිබෙනවා. මේ බස්නාහිර පළාත් සභාව රැක ගෙන තිබෙනවා. මේ බස්නාහිර පළාත් සභාව තුළින් 2014 වර්ෂයේදී පළාත් සභා මැතිවරණයට අපි ඉදිරිපත් වෙන්නේ, වැඩ කරපු පළාත් සභා මහ ඇමති කෙනෙක් යටතේ. වැඩ කරපු සමූපකාර අමාත්‍යවරයා යටතේ. වැඩ කරපු කෘෂිකර්ම අමාත්‍යවරයා යටතේ. වැඩ කරපු අපේ ලාන්සා ඇමතිතුමා යටතේ. සෞඛ්‍ය අමාත්‍යතුමා යටතේ. ඒ නිසා දෙපයින් ගිහිල්ලා වැඩිම ජයග්‍රහණයක් නැවත අතිගරු ජනාධිපතිතුමාගේ මැතිවරණය තුළින් අපි බස්නාහිර පළාත් සභාව අපි සතු කර ගන්නා බව කියමින් ඔබ සියලු දෙනාටම සුභ අනාගතයක් පතමින් මම නිහඬ වෙනවා.

[අ.භා. 12.23]

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාවේ පස්වන අයවැය කථාව. ප්‍රවාහන, ක්‍රීඩා, තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමූපකාර සංවර්ධන, ආහාර සැපයීම හා බෙදා හැරීම්, ග්‍රාම සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ගරු උපාලි කොඩිකාර අමාත්‍යතුමාගේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂ ගැන කථා කිරීමට අවස්ථාව ලැබීම ගැන පළමුවෙන්ම මම ස්තුතිවන්ත වෙනවා. ඇත්ත වශයෙන්ම මට මෙතැන කථා කරන්න තිබෙන්නේ ගරු සභාපතිතුමනි, මහ ආණ්ඩුවෙන් (බාධා කිරීමක්) ගෙනාපු අයවැය හරියට අපේ ජනතාවට තේරුනේ නැහැ මොකක්ද මේ අයවැය කියලා. මම අල ළූණු ගැන කථා කරන්න මෙතැනට ආවේ නැහැ. ගරු සභාපතිතුමනි, ගරු ජනාධිපතිතුමාගේ අයවැය කථාවෙන් මිලියන 250 කට වැඩිය කෝටා එකට - ඒ කියන්නේ, මාස තුනකට සැරයක්

[ගරු එම්.එස්.එම්. ෆයිරෝස්]

අපි ගණන් දෙන කොට මිලියන 250 කට වැඩිය ආනයනය කරන, අත්‍යවශ්‍ය භාණ්ඩවලට 12% ක බද්දක් අය කරලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, ඔබතුමා දන්නවා ඇති. අවුරුදු ගණනක් මම කථා කරපු එකම දේ තමයි BTT ප්‍රශ්නය. අපේ උදය ගම්මන්පිල අමාත්‍යතුමාගේ කමිටුවෙත් මම හිටියා. BTT අය කරන්න ක්‍රමයක් ගේන්න ඕනෑය කියලා මම ඒ දවස්වල ඉඳලාම කථා කළා. මේ සභාවට මම දෙවැනි වර පත් වුණු කෙනා. BTT 1% ක් අය කරද්දී ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවෙන්ම අය කරන එක ලේසියි. නැත්නම් 10% ක් වත් මිනිස්සු ගෙවන්නේ නැහැ. ගිය අවුරුද්දේ ජනාධිපතිතුමා අපට තිබුණු, පළාත් සභාවට තිබුණු BTT අයිතිවාසිකම, අපට ලැබෙන්න තිබුණු BTT එක අයින් කළා. අයින් කරලා මොනවාද කළේ? අපට, පළාත් සභාවට NBT එකෙන් දෙන්නම් කියලා අත්‍යාවශ්‍ය භාණ්ඩ Item 14 කට මුලින් 12% යි, 20% යි බද්ද තිබුණේ. සම්පූර්ණයෙන්ම අත්‍යාවශ්‍ය භාණ්ඩ හතරකටම, කිලෝ එකට බද්දක් විධියට ක්‍රියාත්මක කළා. NBT ත් නැහැ. VAT නැහැ. මොනවත් නැහැ. දැන් සීනි ගත්තා නම්, ඒ දවස්වල තිබුණේ කිලෝ එකට රුපියල් හයයි. ඊට පස්සේ ඒක ක්‍රමයෙන් 3 ක් වැඩි කළා. 10 ක් කළා. ගිය අවුරුද්දේ රු. 10/- ට තිබුණු සීනි රු. 20/- ක් කළා. මේ අවුරුද්දේ දැන් මාස තුනකට කලින් නිදා ගෙන ඉන්න කොට රෑ 12.00 ට SMS එකක් එනවා, සීනිවලට බද්ද රු. 7/- ක් වැඩි කළා කියලා. ඒක බජට් එකට නැහැ. මොනවත් නැහැ. රු. 27/- ක් වැඩි කළා. මේ බජට් එකේ මොකක්ද කළේ. සීනිවලට තව රු. 3/- ක් වැඩි කරලා රු. 30/- ක් කළා.

මේ ආණ්ඩුව කළ හොඳම වැඩේ මොකක්ද ගරු සභාපතිතුමනි. මම මේක කථා කරන්න ඕනෑ. මේ අත්‍යවශ්‍ය ආහාර සමූපකාරයේ තිබෙනවා නම් මහජනතාවට මේවාට යන්න ඕනෑ. රු. 30/- ක් සීනිවලට ඩියුටි වාගේ Item 14 කට, ඒ කියන්නේ හාල්මැස්සෝ ගේනවා නම් කිලෝ එකට රු. 16/- ක් වැඩි කළා. මේ ආණ්ඩුව රජයේ සේවකයන්ට රු. 1200/- කින් වැඩි කළ දීමනාව ජනවාරි මාසයේ සිට දෙන්න මිලියන 35,000 ක් අය කරන්න කල්පනා කරලා තිබෙන්නේ, මේ අත්‍යවශ්‍ය භාණ්ඩ Item 14 න්. ජනවාරි පළමුවැනිදායින් පස්සේත් සුපර් මාර්කට් එකට ගිහිල්ලා බඩුවක් ගන්න ගියා නම්, අනිවාර්යයෙන්ම බිලට 12% ක් add කරන්න ඕනෑ. NBT 12% ක් add කරන්න ඕනෑ. ඉතින් දැන්ම සීනි කිලෝ එකක් රු. 120/- ට විකුණනවා නම්, සිල්ලර කඩේ 110/- ට, 105/- ට විකුණනවා නම් එහෙම නම් සීනි Import cost එක, ආනයන cost එක, අද රු. 95/- යි. මේ Vat බද්ද රු. 12/- යි. NBT බද්ද තව රුපියල් දෙකක් එකතු වුණා නම් තව රු. 50/- ක් එතැන add වෙනවා. ආණ්ඩුව මේ ජනතාවට රු. 40/- ක දවසක දීමනාවක් වැඩි කරලා තිබෙන්නේ. මේක පොඩි දෙයක් නොවෙයි. ඇත්ත වශයෙන්ම ඔක්කෝම ඔලුවට ගන්න ඕනෑ දෙයක්. මේක මම කියන්නේ, සීනි විතරක් නොවෙයි සෑම භාණ්ඩකටම. ගෑස්, කිරිපිටි, හාල්, පරිප්පු -

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

අල, ළූණු

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

සුදු ළූණු. මම අල, ළූණු ගැන කථා කරන්නේ නැහැ. මේ වෙලාවේ හොඳටම දන්නවා අල, ළූණු කොහොමද කියලා. හැම දේකටම. අද කිරිපිටි ගන්න ගියා නම්, වෙළඳ පොලේ කිරිපිටි නැහැ. කිරිපිටි නැහැයි කියන තේරුම මේකයි. කිරිපිටි ගේනවා නම් ජනවාරි මාසයට පස්සේ කිරිපිටි Import කරන කට්ටිය ආණ්ඩුවට 14% ක් ගෙවන්න ඕනෑ. ඉතින් මිලියන 250 ක් වැඩියෙන් -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඉතින් හොඳයි නේ? කිරි නිෂ්පාදනය වැඩි කරන්න නේ?

**ගරු උපාලි කොඩිකාර** (ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමූපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදා හැරීම් කටයුතු සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Upali Kodikara (Minister of Transport, Sports and Youth Affairs, Cultural and Arts Affairs, Cooperative Development, Food Supplies and Distribution and Rural Development)

ඒ වෙනුවට කැසිනෝ 20,000 ක් ගෙන්වනවා. 20,000 ක්.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

මොනවාද ගෙන්වන්නේ ඇමතිතුමා.

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

කැසිනෝ.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ගරු ඇමතිතුමා, ඔබතුමා කියන එක මම පිළිගන්නම්. මොනවා ගෙනාවත් වැඩක් නැහැ. සුදුවලට, කැසිනෝවලට බදු නැහැ. බදු අයින් කරපු මේ ආණ්ඩුව ඇයි මේ අත්‍යාවශ්‍ය භාණ්ඩ 14 කට බද්ද දැම්මේ. කැසිනෝවලට බදු නැහැ, මේ ආණ්ඩුවේ. බස්නාහිර පළාත් සභාවේ අනිවාර්යයෙන් කවුරු හරි කෙනෙක් මේ ගැන කථා කරන්න ඕනෑ. මම මේවා කථා කරන කොට ඇමතිතුමාට ඉන්න බැහැ. ඒකයි. ඊළඟට මහ ඇමතිතුමා කියලා වර්ණනා කර ගන්න ඇමති කෙනෙක් නේ? ඉතින් ඇමතිතුමා කොහොම හරි Score එක දාන්න එපැයි. Mark එක. ඒ කියන්නේ, මේක දුප්පත් ජනතාවට දැනෙන්නේ නැතිව - අද TV ඔක්කොමවල කට වහලා තිබෙන්නේ. එක ප්‍රවෘත්තියකවත් මේ ගැන කියන්නේ නැහැ. ජනවාරි ලැබුවාට පස්සේ 15% ක් -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ෆයිරොස් මන්ත්‍රීතුමා, දැන් මේ 14 අල ළූණු නැද්ද කියලා කියන්න කෝ මට.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ඒකත් තිබෙනවා. ඒක නැහැයි කියලා මට කියන්න බැහැ නේ? අනිවාර්යයෙන් අත්‍යාවශ්‍ය Item 14 කිව්වා නම් අල ළූණුත් එක්ක තමයි තිබෙන්නේ. අනිවාර්යයෙන්ම අපි මේක Import කරලා, මේක ආනයනය කරලා, මේ බද්ද ගන්න යන්නේ දුප්පත් ජනතාවගෙන්. කඩේට ගිහිල්ලා අපි බිල දාන්න ඕනෑ. ඒගොල්ලන්ගෙන් තමයි රු. 15/- ක් වැඩියෙන් අය කරන්න වෙන්නේ. ගරු සභාපතිතුමනි, මේක හොඳට තේරෙනවා, මේක හොඳටම වදිනවා කියලා අපේ කොඩිකාර අමාත්‍යතුමාට. මහ ඇමතිකම බලාපොරොත්තු වන ඇමතිතුමා නේ? මට හරි සන්තෝෂයි. ඒ වාගේ ඇමති කෙනෙක් මහ ඇමති වෙන එක ගැන. (බාධා කිරීම්) සාමාන්‍යයෙන් ආනයන කරන අවස්ථාවලදී විකුණුම් මිලෙන් මෙය ඉවත් කිරීමෙන් මෙම භාණ්ඩ 12% කින් පමණ වැඩි වෙනවා. මෙය සිදු වන්නේ, වැට් අය කර ගැනීම සඳහා යෙදුමක් නොමැති හෙයින් ගෙවීම් කරන, ආනයනය සිදු කරන අවස්ථාවේදී බැවින්, Vat වෙනුවට ඒ සියල්ල ආනයන කරන අවස්ථාවේ කරන ගෙවීම් -

ගරු සභාපතිතුමනි, ඔක්කොටම කථා කරන්න පුළුවන්. මොනවා කථා කළත් වැඩක් නැහැ ගරු සභාපතිතුමනි, අපි මහජනතාව ළඟට ගිහිල්ලා ඡන්දය ඉල්ලන්න ඕනෑ. බස්නාහිර පළාත් සභාව විසුරුවලා අනිවාර්යයෙන්ම මාර්තුවල මේ ඡන්දය එනවා. අපි විතරක් නොවෙයි. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුත් යන්න ඕනෑ. ජනවාරි මාසයේ 15% ක් හැම දේකටම වැඩි වෙලා, ගෑස් සිලින්ඩරය ඔලුවේ තියා ගෙන, පාන් රාත්තල ඔලුවේ තියා ගෙන, කිරිපිටි පැකට් එක ඔලුවේ තියාගෙන යන කොට - මේ ඇමතිවරුන්ට මහජනතාව ළඟට යන්න පුළුවන්ද? යන්න අමාරුයි. ඒ නිසා හොඳටම මෙය කල්පනා කර ගන්න. මේක අපට විතරක් නොවෙයි. ඔබතුමන්ලාටත් වදින බරපතළම දෙයක් කියමින් මගේ වචන ස්වල්පය මෙතැනින් අවසන් කරනවා. බොහොම ස්තූතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී ඒ.එම්. යූසුෆ් ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ වනවා ඇත.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ඒ.එම්. යූසුෆ් ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.***

*Accordingly the Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Yoosuf M.P.C took the Chair*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මීළඟට මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමාට විනාඩි 10 ක් තිබෙනවා.

[අ.භා. 12.33]

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ සභාව තුළ මීට ඉහතත් ක්‍රීඩා විෂය ගැන කථා කරලා තිබෙනවා. අද බස්නාහිර පළාතේ දිස්ත්‍රික්ක තුනේම ක්‍රීඩාවට වෙලා තිබෙන දේ කථා කළොත් මීට ඉහතත් මේ සභාව තුළ සංඛ්‍යා ලේඛන අරගෙන මම කථා කරලා තිබෙනවා. විශේෂයෙන්ම ගම්පහ දිස්ත්‍රික්කයේ සහ අනෙක් දිස්ත්‍රික්කවල ක්‍රීඩා විෂය ගැන. අමාත්‍යාංශ උපදේශක කාරක සභාවේදී සාකච්ඡා කරලා තිබෙන කරුණුත් දිහා

[ගරු මෙරිල් පෙරේරා]

අරගෙන බැලුවොත් අපි මේ අවුරුදු පහ තුළම අයවැයේදී ඉදිරිපත් කරපු කරුණු කාරණා අනුව අද ක්‍රීඩාව යම්කිසි මට්ටමකින් පහතට වැටිලා තිබෙනවාය කියන එක අපි කාටත් පිළිගන්න වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාගේ මාර්ගයෙන් මේ විෂය භාර ගරු අමාත්‍යවරයා වන උපාලි කොඩිකාර අමාත්‍යතුමාට මීට ප්‍රථමත් සඳහන් කරලා තිබෙනවා. මේ අවුරුද්දේ විසි වන ආසියාතික මළල ක්‍රීඩා ශුරතාවය 2013 ඉන්දියාවේ පූනේ නගරයේ පැවැත්වුණා. මීටර් 4 x 400 සහය දිවීමේ තරගාවලිය. වසර හයකට පසු ශ්‍රී ලංකාවේ සහාය දිවීමේ කණ්ඩායමක් ලබා ගත්ත වාර්තාගත ජයග්‍රහණයක්. තරගය අනුව ශ්‍රී ලංකාවට ලෝකඩ පදක්කම දිනා දීමට ඒ ක්‍රීඩකයන් හතර දෙනා සමත් වුණා. ඒ වාගේම ලෝක මළල ක්‍රීඩා පරිසාදන මට්ටම ඉක්මවා ගිය බැවින් පසුගිය අගෝස්තු මාසයේ ලෝක මළල ක්‍රීඩා ශුරතාලාභීන් ලෙස සහභාගී වෙන්න ඒ ක්‍රීඩකයෝ හතර දෙනාට - අවස්ථාව ලැබුණා. ශ්‍රී ලංකාවේ පළමුවැනි වතාවට තමයි ආසියානු ක්‍රීඩා තරගයට තරග කරපු ඒ ක්‍රීඩකයන් හතර දෙනාට ලෝක මළල ක්‍රීඩා තරගාවලියට තරග කරන්න අවස්ථාව ලැබුණේ.

ඒ වෙලාවේ ගම්පහ දිස්ත්‍රික්කයේ, විශේෂයෙන් ජා-ඇළ කොට්ඨාශයේ තරග කරපු තරගකරුවෙක් හැටියට ඩබ්ලිව්.ඒ.ඩී.සී. ආලෝක - රාගම ජීවත් වෙන්නේ. ඒ ක්‍රීඩකයා මේ ක්‍රීඩා අමාත්‍යාංශයට ඇවිල්ලා ක්‍රීඩා අධ්‍යක්ෂකගෙන් ඉල්ලීමක් කළා. මොකද, එතුමා බස්නාහිර පළාත නියෝජනය කරන, ඒ වාගේම ජා-ඇළ කොට්ඨාශයේ ක්‍රීඩා සමාජය නියෝජනය කරන, ඒ වාගේම ඉන්දියාවේ පූනේ නගරයේදී පැවැත්වුණු ආසියානු ක්‍රීඩා තරගාවලියේදී තමන් පාවිච්චි කරපු පාවහන් යුගල අබලන් නිසා බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයෙන් තරගකරුවන් තුන් දෙනෙක් ඉදිරිපත් වන කොට, පිට පළාතෙන් කෙනෙක් ඉදිරිපත් වන කොට, මේ ක්‍රීඩකයා විශේෂ ඉල්ලීමක් කළා, ලෝක මළල ක්‍රීඩා තරගයට සහභාගී වෙන්න මට දුවන්න පාවහන් යුගලක් ලබා දෙන්නය කියලා. මේකට ඇහුම්කන් දෙන්නේ නැතිව මේ ක්‍රීඩකයාට පාවහන් යුගලවත් අරන් දෙන්න මේ ක්‍රීඩා අධ්‍යක්ෂතුමා ඇතුළු ක්‍රීඩා අමාත්‍යාංශයේ නිලධාරීන් මැදිහත් වුණේ නැහැයි කියන එක මේ වෙලාවේ කනගාටුවෙන් ප්‍රකාශ කරනවා. ඒ තරගකරුවා ප්‍රදේශයේ මහජන නියෝජිතයෙකු හැටියට මා ළඟට පැමිණිලා ඉල්ලපුවාම අපි ක්‍රීඩාව සම්බන්ධයෙන් ගම්පහ දිස්ත්‍රික්කයේ අධීක්ෂණය කරන මන්ත්‍රීවරයෙක් හැටියට, ඒ වාගේම ක්‍රීඩා සමාජත් එක්ක, හැම ක්‍රීඩාවක් එක්ක සම්බන්ධ වන මන්ත්‍රීවරයෙක් හැටියට රු. 25,000/- ක් දීලා මන්ත්‍රී ප්‍රතිපාදන සහ ඒ වාගේම අමාත්‍යාංශ ප්‍රතිපාදන වෙන් නොවුණත් පෞද්ගලිකව මැදිහත් වෙලා ඒ පාවහන් යුගල ලබා දුන්නා. මේ ක්‍රියාවලිය මීට ප්‍රථමත් අමාත්‍යාංශ උපදේශක කාරක සභාවේත්, මේ සභාවේත් දැනුවත් කළේ ක්‍රීඩකයකුට සලකන හැටි පිළිබඳවයි.

ඒ වාගේම තමයි ප්‍රාදේශීය මට්ටමෙන්, දිස්ත්‍රික්ක මට්ටමෙන්, පළාත් මට්ටමට එන ක්‍රීඩකයන්ට ජාතික ක්‍රීඩා උළෙලට යන කොට හැමදාම අපි ඉල්ලපු දෙයක් තමයි ක්‍රීඩකයෝ ටික එක තැනකට ගෙනැල්ලා, පුහුණුවීම් කටයුතු කරලා, ඒ වාගේම සියලු පහසුකම් ටික ලබා දීලා, ජාතික ක්‍රීඩා උළෙලට සහභාගි වෙන්න ක්‍රීඩකයන්ට අවශ්‍ය පසුබිම හදලා දෙන්නය කියන එක. ඒකේ ප්‍රතිඵල හැටියට ගත්තොත් -1974 වර්ෂය ගත්තොත් අපි ඉසව් 26 යි ශ්‍රී ලංකාවේ පැවැත් වුණේ. ඉසව් 26 න් රන් පදක්කම් 07 ක් පිරිමි හැටියටත්, කාන්තාවන් හැටියට රන් පදක්කම් 06 කුත්, රන් පදක්කම් 13 ක් දිනාගෙන තිබෙනවා. අද මේ 2013. බස්නාහිර පළාතේ ක්‍රීඩා පිටි සංවර්ධනය වෙලා තිබෙන හැටියට, ඒ වාගේම පාසල්වල ක්‍රීඩාව දියුණු වෙලා තිබෙන හැටියට, ඒ වාගේම ක්‍රීඩා සමාජවල ක්‍රීඩකයන් දියුණු වෙලා තිබෙන හැටියට, ඒ වාගේම තාක්ෂණය දියුණු වෙලා තිබෙන හැටියට අද ක්‍රීඩා ඉසව් සම්පූර්ණයෙන්ම තිබෙන්නේ 48 යි. ඒ 48 න් ප්‍රධාන කණ්ඩායම් තරග 11 ක් තිබෙනවා. ඒ වාගේම කාන්තා හා පිරිමි තරග හැටියට අද දිනා ගන්න පුළුවන් වෙලා තිබෙන්නේ, 2013 වර්ෂයේ කාන්තා රන් පදක්කම් 03 කුයි, පිරිමි රන් පදක්කම් 03 කුයි, මුළු රන් පදක්කම් සංඛ්‍යාව මළල ක්‍රීඩාවලින් දිනා ගන්න පුළුවන් වුණේ හය දෙනෙකුට පමණයි. 1974 වර්ෂයේ රන් පදක්කම් 13 ක් දිනා ගත් ක්‍රීඩකයෝ බිහි වුණු මේ පළාතේ, අද මේ වන කොට ඒකට බාගයට බාගයක් අඩු වෙලා තිබෙන්නේ, ක්‍රීඩකයන්ව හඳුනාගෙන වැඩ සටහන් නොකරන නිසයි.

අපි හැමදාම කියන දෙයක් තමයි. අවුරුද්දෙන් අවුරුද්දට මේ ක්‍රීඩා තරගාවලිය හැමදාම පවත්වන නිසා ප්‍රාදේශීය මට්ටම, දිස්ත්‍රික්ක මට්ටම, පළාත් මට්ටමේ දක්ෂ ක්‍රීඩකයකු හඳුනාගත්තාම ඒ ක්‍රීඩකයාට අවශ්‍ය පසුබිම හදලා දෙන්නේ නැති එක තමයි ක්‍රීඩා අමාත්‍යාංශයේ තිබෙන දුර්වලකම.

එක පැත්තකින් බලන කොට ක්‍රීඩා අධ්‍යක්ෂතුමා ඒ වාගේම දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරිවරු ප්‍රාදේශීය ලේකම්වරයාගේ සිට සියලු නිලධාරීවරු මේ සියලු දෙනාම එකට එකතු වෙන්නේ නැතිව, සාමූහිකත්වයෙන් වැඩ නොකළොත් අපට හැමදාම වෙන්නේ ක්‍රීඩා අමාත්‍යාංශය හරහා මේ ක්‍රීඩාව නැති වෙලා යැමයි. ඒ හේතුවෙන් අද පහළ තත්ත්වයට වැටිලා තිබෙනවා. එක පැත්තකින් අධ්‍යක්ෂතුමා සහ නිලධාරී මණ්ඩලයට කියන්න පුළුවන්, පළාත් නවයෙන් ගත්තාම හැමදාම බස්නාහිර පළාත පළමුවැනියා කියලා. ඒ පැත්ත නොවෙයි බලන්න ඕනෑ. රන් පදක්කම්, රිදී පදක්කම්, ලෝකඩ පදක්කම් දිනා ගන්න එක නොවෙයි, ක්‍රීඩකයන් හැටියට බස්නාහිර පළාතේ ක්‍රීඩකයන් බිහි කිරීම, ක්‍රීඩකයන් වැඩි දියුණු කිරීම, ඒ වාගේම ක්‍රීඩාවට අවශ්‍ය පහසුකම් ටික ලබා දීම තමයි අපි බලාපොරොත්තු වෙන්න ඕනෑ.

ඒ වාගේම තමයි තව අත්‍යවශ්‍ය කරුණක් කියන්න ඕනෑ. මේ අමාත්‍යාංශය හරහා වුණු දෙයක්. මොකද, සාමාන්‍යයෙන් අමාත්‍යාංශයක නිලධාරීන් හැටියට යම්කිසි අලුත් ව්‍යාපෘතියක් ඉදිරිපත් කළොත් ඒකට මුදල් වෙන් කරලා, ඒ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්න වැඩ සටහනක් හැටියට ක්‍රමවේදයක් හදන්න ඕනෑ. බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා දහම් පාසල් ගැන හිතලා සරුදම් අරුණැල්ල කියලා වැඩ සටහනක් ක්‍රියාත්මක කරන්න පටන් ගත්තා. සුපසන් නිම්තෙර වැඩ සටහන යටතේ. ඒ වෙනුවෙන් 2012 වසරේ ලියාපදිංචි දහම් පාසල් සංඛ්‍යාව හැටියට 2709 ක් තෝරා ගෙන, හැම ජාතියටම, හැම ආගමටම වෙන් කරලා, ලක්ෂ 2641 ක් ගිය අවුරුද්දේ ලබා දීලා තිබෙනවා. ගරු ප්‍රධාන අමාත්‍යතුමා කණ්ඩායම් රැස්වීමේ කථා කරලා, ගරු මන්ත්‍රීවරු එකතු කර ගෙන, එක් එක් වශයෙන් එක් එක් මුදල් වෙන් කරන්න ඕනෑ නැහැ. සෑම දහම් පාසලකටම ලක්ෂය ගණනේ වෙන් කරලා මුදල් ප්‍රමාණයක් ලබා දුන්නා. ඒ මුදල් ප්‍රමාණය ලබා දෙන්න පෙර දහම් පාසල්වලට ළමුන් ඇතුළත් කිරීමේ වැඩ සටහන යටතේ දහම් පාසල්වලට සරුදම් අරුණැල්ල පොතක් නිර්මාණය කරලා, ඒ පොත පාසල්වලට යවලා, සිකුරාදා දරුවා ගෙදර යන විට ඉරිදා දහම් පාසලට සහභාගී වෙලා, ඒක අත්සන් කරලා නැවත සඳුදා පාසලට ගෙනැල්ලා පෙන්වන්න ඕනෑ කියන වැඩ සටහනෙන් තමයි ක්‍රියාත්මක කරන්න පටන් ගත්තේ. ඒ වැඩ සටහන පටන් ගන්න පෙර බස්නාහිර පළාතේ දහම් පාසල් ගිය දරුවන්ගේ සංඛ්‍යාව පන් ලක්ෂ අනූහත් දහස් තුන්සිය අනූ එකයි. ඒ වැඩ සටහන ක්‍රියාත්මක කරලා, මේ අවුරුද්ද වන කොට අවුරුදු දෙකක්. එහි ප්‍රගතිය බලන කොට, දහම් පාසල් සිසුන් සංඛ්‍යාව සහභාගී වුණු නව ලක්ෂ හතලිස් අට දහස් දෙසිය හැත්තෑ දෙකයි. මේ වන කොට තුන් ලක්ෂ පනස් දහස් අටසිය අසූ එකකින් දරුවන් සංඛ්‍යාව වැඩි වෙලා තිබෙනවා.

ඒ වැඩ සටහන එහෙම ක්‍රියාත්මක කරන කොට සංස්කෘතික අමාත්‍යාංශයේ නිලධාරීවරු අපේ විෂය භාර අමාත්‍යවරයාත් එක්ක එකතු වෙලා සසුනඹරට සවියක් දෙන්න කියලා දහම් පාසල්වලට චෙක්පත් බෙදා දීමේ උත්සවයක් පැවැත්වුවා. මම නම් ගියේ නැහැ. තවත් මන්ත්‍රීවරු ගියා බලන්න. ගියාම දැකපු දේ තමයි නමක් නිර්මාණය කරලා. මන්ත්‍රී ප්‍රතිපාදන, අමාත්‍යාංශ ප්‍රතිපාදන, යෝජනා ඉල්ලපු අයට වෙන් කරලා තිබුණු මුදල් ටික වෙන් කරලා, ඊට අදාළ චෙක්පත් ලබා දීමේ වැඩ පිළිවෙළක් පටන් අරන් නිර්මාණය කරලා එදා චෙක්පත් ලබා දුන්නා. නමුත් යම්කිසි වැඩ පිළිවෙළක් නැහැ.

අපි දකිනවා. මෙතැන ඉන්න අමාත්‍යවරු හැටියට උදය ගම්මන්පිල ගරු ඇමතිතුමා එක් එක් වැඩ සටහන් ක්‍රියාත්මක කරන්න පටන් ගත්තා. රෝද තුනට මනු සවියක් යනුවෙන් ත්‍රීවීල්වලට මීටර් ලබා දීමේ වැඩ සටහනක් පටන් ගත්තා. ඒ වාගේම හරිත බුබුළු කියලා වැඩ සටහනක් පටන් ගත්තා. ඒ වාගේම බිඳුනු පුටුවට දැතේ සවිය කියලා වැඩ සටහනක් පටන් ගත්තා. මහ ඇමතිතුමා හැටියට ගරු ප්‍රධාන අමාත්‍යතුමා සුපසන් නිම්තෙර වැඩ සටහනේදී ප්‍රධාන වැඩ සටහන් රාශියක් පටන් ගත්තා. නමුත් මේ වාගේ වැඩ සටහනක් ක්‍රියාත්මක කරලා, මුළු පළාතටම, හැම ජාතියකටම, හැම ආගමකටම ලක්ෂය ගණනේ මුදල් ලැබෙන කොට, මේ සසුනඹරට සවිය කියලා වැඩ සටහනක් ක්‍රියාත්මක කර ගෙන ලොකු බොරුවක් කළා. ඒක මම හිතන්නේ, උපාලි කොඩිකාර ගරු අමාත්‍යතුමාට නොදැනුනා වුණාට, නිලධාරීන් මුදල් වෙන් කර ගන්නේ නැතිව මන්ත්‍රී ප්‍රතිපාදන, අමාත්‍යාංශ ප්‍රතිපාදන වෙන් කර ගෙන ඒකට චෙක්පත් ලියලා උත්සවයක් තියලා ලබා දුන්නා. ඒකට යම්කිසි වැඩ සටහනක් නැහැ. යම්කිසි වැඩ සටහනක් ක්‍රියාත්මක කරනවා නම්, ව්‍යාපෘතියක් හදනවා නම්, ව්‍යාපෘතියට මුදල් වෙන් කරලා, නිර්මාණය කරලා ඒකට නිර්නායකයන් හදලා ඒක හැම අවුරුද්දේම ක්‍රියාත්මක කරන්න පුළුවන් විධියට ක්‍රියාත්මක කරයි කියන එක තමයි අපි බලාපොරොත්තු වෙන්නේ. ඒ නිසා මම කනගාටු වෙනවා, මහජන නියෝජිතයෙකු හැටියට.

[ගරු මෙරිල් පෙරේරා]

විශේෂයෙන් ක්‍රීඩා විෂය ගැනත්. අනික් විෂයයන් ගැනත් මීට වැඩිය අමාත්‍යවරයෙක් හැටියට, අමාත්‍යවරුත් එක්ක නිලධාරීන් එක්ක එකතු වෙලා ඒ වාගේම ඒ ක්ෂේත්‍රයේම ඉන්න නිලධාරීන් හා එක්ව සාමූහිකව එකට ඉදගෙන වැඩ කරනවාය කියන එක තමයි අපි විශ්වාස කළේ. නමුත් මේ අවුරුදු හතර තුළම ක්‍රීඩා විෂය කඩා වට්ටලා, ඒ වාගේම බොරු ව්‍යාපෘති හදලා මුදල් වෙන් කරලා - හැම උපදේශක කාරක සභාවකටම සහභාගී වුණු මන්ත්‍රීවරයකු හැටියට අපි දැකපු දේ තමයි උපදේශක කාරක සභාව ගන්න තීන්දුවත් ක්‍රියාත්මක කළේ නැහැ.

අනෙක් පැත්තෙන් බලන කොට ප්‍රවාහන අධිකාරිය. මම ගිය වසරේ අයවැයට කථා කළා. අද මේ වන කොට මාර්ග හැටියට ගත්තොත් මාර්ගයේ පටන් ගැන්ම සහ අවසානය තිබෙන්නේ දෙපැත්තකින්. අද රාගම - කොළඹ 262 මාර්ගය. පටන් ගන්නේ රාගම නගරයෙන්. ඒ වාගේම අනෙක් පැත්තෙන් ඉවර වෙන්නේ කොළඹ නගරයෙන්. නමුත් රාගම නගරයෙන් පටන් ගන්න බස් එක කොළඹ නගරයට ගිහිල්ලා කොළඹ නගරයට නැවත එන කොට මහබාගේ නගරයේ නවත්වලා විනාඩි 05 කට වැඩි කාලයක් එතැන තියාගෙන ඉන්නවා. එතැන වෙනම වේලා සටහන්කරුවෙක්, නීත්‍යානුකූල නොවන දෙන්නෙක් තියා ගෙන සටහන් කරලා තමයි නැවත රාගම නගරයට අරින්නේ. මේක අවුරුද්දක් තිස්සේ දැන් කථා කරනවා. අද වන කොට මුදල් ගසා ගැනීම - නීත්‍යානුකූල නොවන වේලා සටහන්කරුවන් දෙන්නෙක් තියා ගෙන ඒ ලොග් ෂීට් එක සම්පූර්ණයෙන්ම සටහන් කිරීම කරන්නේ නීත්‍යානුකූල නොවන ආකාරයට. මේ ගැන කථා කරලා ප්‍රවාහන අධිකාරියට මීට ඉස්සෙල්ලා දැනුම් දුන්නත් අද වන තුරු ප්‍රවාහන අධිකාරිය ගත් නීත්‍යානුකූල පියවරක් නැහැ.

ඒ වාගේම තමයි මේ ප්‍රවාහන අධිකාරිය ගැන කථා කරනවා නම්, මුළු බස්නාහිර පළාතටම තීන්දුවක් ගත්තා. සීට් 30 ට අඩු බස් ටික ඉවත් කරන්නය කියලා. අවුරුදු ගණනාවක් දුන්නා, අයින් කර ගන්න ක්‍රමවේදයන්. බස් අරගෙන අයින් වෙන්න කියලා. අපේ කොට්ඨාශයේ බස් රථ ගණනාවක් තිබෙනවා. 271 බස් රථ මාර්ගය. ඒ බස් රථ මාර්ගයේ තිබෙන බස් රථ සංඛ්‍යාවෙන් වැඩි කොටසක්, ඒ ක්‍රමවේදය තුළ ෆිනැන්ස් පහසුකම් ඇතිව ණයට මුදල් අරගෙන අලුත් බස් ටික ගත්තා. එක පුද්ගලයෙක් මේ වන තෙක් අවුරුදු පහම සීට් 26 ක බස් එකක් දුවනවා. මාස හයෙන් හයට දික් කරගෙන. මේකට ක්‍රියාමාර්ගයක් ගත්තේ නැහැ. එතකොට අසාධාරණය වුණේ, අර මහජනයාට සහ අනෙක් බස් අයිතිකරුවන්ට. එක පැත්තකින් අද බස් ටික දුවන කොට සීට් 26 බස් එකේ හිර වෙලා, දෙකට නැවිලා යන්නේ ඒ බස් එකේ යන කට්ටිය. මඟීන්ට අපහසුතාවයක් ඇති වෙලා තිබෙනවා. අනික් පැත්තෙන් මාර්ග බලපත්‍ර හිමියන්ට. එක්තරා එක් පුද්ගලයෙකුට මේ අවස්ථාව, පහසුකම ලබා දීලා අනික් අයට ණය වෙලා ෆිනැන්ස් පහසුකම් තුළ ගෙවා ගන්න ලබා දීම තුළ අසාධාරණයක් වෙලා තිබෙනවාය කියලා මතක් කරනවා.

මීට වඩා දීර්ඝව මම කථා කරන්නේ නැහැ. මම කියා සිටින්නේ, අපි අවුරුදු පහ තුළම ඉල්ලපු දේවල්වලට ඇහුම්කන් නොදී අමාත්‍යාංශ උපදේශක කාරක සභාවේ පෙන්නපු දේවල්වලට ඇහුම්කන් නොදී නිලධාරීන් කියන ඒවාට මැදිහත් වෙලා තමයි ක්‍රියාත්මක වුණේ කියන එක මතක් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 12.47]

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමූපකාර සංවර්ධන, ආහාර සැපයීම හා බෙදා හැරීම්, ග්‍රාම සංවර්ධන කටයුතු විෂය ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් අයවැය විවාදයට සහභාගී වෙමින් ප්‍රවාහනය ගැන මම මුලින්ම කථා කළොත් - අපි දන්නවා, ශ්‍රී ලංකාවේ ප්‍රවාහනයට අපි බස් රථ, දුම්රිය යොදා ගන්න බව. ඒ එක්කම ගුවන් සේවා ඇතුළු ප්‍රවාහන පද්ධතියක් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වෙනවා. එතකොට මේ ප්‍රවාහනයේදී පෞද්ගලික අංශයත්, රාජ්‍ය අංශයත් මැදිහත් වෙලා තියෙනවා. ශ්‍රී ලංගම බස් රථ රාජ්‍ය අංශයෙන් ක්‍රියාත්මක වෙනවා. දැන් මෙහි අපි දකින දෙයක් තමයි, අදටත් මේ ප්‍රවාහන ක්ෂේත්‍රයේදී මහජනතාව ගැන නිසි අවධානයක් යොමු වෙලා නැහැයි කියන එක. මොකද, මේ ආණ්ඩු පිහිටුවන්නේ මහජනතාව. ඒ මහජනතාවගේ එදිනෙදා ජන ජීවිතය පහසු කර ගැනීමේ ක්‍රමෝපායන් හඳුන්වා දෙන්න තමයි ආණ්ඩුවක් පිහිටුවා ගන්නේ. දැන් මේ ආණ්ඩුවට අමතක වෙලා තිබෙන්නේ. මේ මහජනතාවගේ සේවාවන් සපයන්න නොවයි අපි ඉන්නේ. අපට වුවමනා විධියට ක්‍රියා කරන්න කියන

මාර්ගයක් අනුගමනය කරමින් ක්‍රියාත්මක වන ආකාරයක් අපට පෙනී යන්නේ.

දැන් මේ ශ්‍රී ලංගම ගැන කථා කළොත් අද වීදුරු කැඩුණු, තහඩු ගැලවුණු, ටයර් ගෙවුණු බස්වල එල්ලිලා මහජනතාව ගමන් කරනවා. ඒ බස්වල ගමන් කරද්දී ජීවිත පවා අනතුරේ පවතින්නේ. නමුත් අද ශ්‍රී ලංගමය මේ වැටී ගෙන යන ආකාරය දිහා බැලුවාම මෙයට නිසි පිළිතුරක් දෙන්න කවුරුත් සමත් වෙලා නැහැ. සේවකයින්ට පඩි ගෙවා ගන්න බැරිව, මාසික පඩිය දෙවරකට තමයි ගෙවන්නේ. මේ ආසියාවේ ආශ්චර්යය කරා යන ගමනේදී තමුන්නාසෙලා මේ වාගේ කඩඉම් කිහිපයක්, මංසන්ධි කිහිපයක් පසු කරමින් යනවා. මේවා අමතක කරලා තමයි ආශ්චර්ය ගැන කථා කරන්නේ. 2011 වසර අරගෙන බැලුවොත් ශ්‍රී ලංගම බස් රථ 7821 ක් ධාවනය කරමින් තිබුණා. 2012 වන විට 7756 දක්වා අඩු වෙලා තිබෙනවා. ඒ කියන්නේ, ශ්‍රී ලංකාවේ ජනගහනය අඩු වෙනවා කියන මතයේ ඉඳන් තමයි මේ රජයත්, මේ පළාත් සභාවත් මේ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙලා තිබෙන්නේ. අද පුද්ගලික බස් රථ නොතිබෙන්න ඉතාමත්ම කරදරයකට මහජනතාව පත් වෙනවා. මේ පුද්ගලික බස් රථවලට කිසිම සහනාධාරයක්, ආශිර්වාදයක් රජයෙන් ලැබෙන්නේ නැහැ. යම්කිසි බලපත්‍රයක් ලබා ගන්න ගියාම ඔවුන්ගෙන් විශාල වශයෙන් මුදල් අය කරනවා. මේ සම්බන්ධයෙන් පුද්ගලික බස් හිමියන් ශ්‍රේෂ්ඨාධිකරණයට පවා ගියා. ඊට පසුව තමයි මේ ක්‍රමානුකූල කාල සටහන් ක්‍රමයක් හඳුන්වලා දුන්නේ. ඒ එක්කම නියෝගයක් තිබුණා, නව බස් රථ හඳුන්වලා දීමේදීත් සාමාන්‍ය එදිනෙදා කටයුතු කර ගෙන යන අයට වන අපහසුතාවයන් සලකලා ඒවා නිකුත් කරන්නය කියලා. නමුත් අපේ සමහර ඇමතිවරු හිතු මනාපයට අලුත් බලපත්‍ර දීලා බස් රථ ධාවනය කරන්න දීලා තිබෙනවා. ඉතාම කනගාටුවට කරුණක්. ඒකේදී කිසිම ප්‍රමිතියක් නැති විධියට තමයි මේ කාරණා සිද්ධ වුණේ.

අද ශ්‍රී ලංගම කියන රාජ්‍ය ප්‍රවාහන සේවය අපේ බස්නාහිර පළාතේත් අංශ කිහිපයකම ක්‍රියාත්මක වෙනවා. සමහර පළාත්වල බස් රථයක් එන්න පැය දෙකක් ඉන්න ඕනෑ. සමහර විට ඒ ගමන මිනිස්සු පයින් යනවා, මේ බස් රථ එනතෙක් බලාගෙන ඉන්නේ නැතිව. ඉතින් අපේ දුම්රිය සේවය ගැන කථා කළත්, එදා විදේශික රටවල් ආක්‍රමණය කරලා තනලා දීපු ඒ ස්ථාන හා ගමන් මාර්ග හැරුණු කොට ඉතාම සුළු වශයෙන් තමයි අපි වර්ධනයක් අත් කර ගෙන තිබෙන්නේ. ඉතින් මේ සම්බන්ධයෙන් මේ ඇමතිතුමන්ලා ඉතාම වුවමනාවෙන් තම තමන්ගේ අවධානය යොමු කරන්න ඕනෑය කියලා මම කියා සිටින්න කැමැතියි.

ඒ එක්කම විශේෂයෙන්ම මේ කෝට්ටේ අවට බස්නාහිර පළාත් සභාව පාර්ලිමේන්තුව සියලුම රජයේ කාර්යාල ස්ථානගත වෙලා තිබෙනවා. ජයවර්ධනපුර, බත්තරමුල්ල, සෙත්සිරිපාය, ඉසුරුපාය, විදේශ සේවා නියුක්ති කාර්යාංශය, පළාත් සභාව ඇතුළු රාජ්‍ය ආයතන ගණනාවක් ස්ථානගත වෙලා තිබෙනවා. නමුත් මෙහි සේවය කරන සේවකයන්ට බස් රථ කිහිපයක නැගලා එන්න සිද්ධ වෙනවා. අඩු වශයෙන් මෙවැනි රාජ්‍ය ආයතන ක්‍රියාත්මක වන ස්ථානවලට නගරාන්තර සේවයක් ක්‍රියාත්මක වෙන්න අවශ්‍යයි. මේ වැඩ කරන ජනතාවට ඉක්මණින් යන්නත්, වැඩ අවසන් වෙලා තමුන්ගේ නිවෙස්වලට ඉක්මණින් ගමන් කරන්න පුළුවන් විධියට. මෙවැනි තත්ත්වයන් ගැන කිසිඳු අවධානයක් මේ ආශ්චර්යට යන රටේ අවධානයට යොමු වෙලා නැහැ.

ඒ එක්කම මම තවදුරටත් කියන්න ඕනෑ. සමහර බස් රථ වාසි ලැබෙන ආකාරයට සමහර ගමනාන්තවල නවත්වාගෙන යනවා. උදාහරණයක් හැටියට, බත්තරමුල්ල - දෙහිවල බස් සේවාව. මොරටුව දක්වා යන්නේ නැහැ. දෙහිවලින් නවත්වනවා. එතකොට ඒ ජනතාවට එතැනින් බැහැලා තව බස් රථයක යන්න සිද්ධ වෙනවා. පානදුර - නුගේගොඩ දක්වා බස් සේවාව ගත්තොත් බත්තරමුල්ල දක්වා ගමන් කරන්නේ නැහැ. මගින් නතර වෙනවා. ඒ නිසා අපේ අමාත්‍යතුමාගේ අවධානය මා යොමු කර සිටිනවා. විශාල වශයෙන් රාජ්‍ය සේවයේ යෙදෙන නිලධාරීන් මේ පළාත්වලට ගමන් කරනවා. ඇත්තටම මේ අයගේ ගමන් පහසුව ගැන විශේෂයෙන් සැලකිලිමත් වෙන්න ඕනෑ. තමුන්නාන්සේලා අධිවේගී මාර්ග හදලා, ආශ්චර්ය ගැන කථා කළාට මේ වැඩ කරන ජනතාව නිසා තමයි මේ රාජ්‍ය සේවය පවතින්නේ. ඒ නිසා තමුන්නාන්සේලාගේ අවධානය යොමු නොවුණු අංශවලට යොමු කරන මෙන් මම ඉතා උවමනාවෙන් ඉල්ලා සිටිනවා.

ඒ එක්කම මේ සමුපකාර සේවාව ගැන පොඩ්ඩක් කථා කරන්න ඕනෑ. මම කටාන විවිධ සේවා සමුපකාර සමිතිය සම්බන්ධයෙන් ප්‍රශ්න කිහිපයක් යොමු කරලා, ඒ අකටයුතුම් රාශියක් ගැන ඉදිරිපත් කළා. කොමසාරිස්වරයෙක් මගින් පාලනය කරලා, ඒ සම්බන්ධයෙන් විමර්ශනයක්

[ගරු රෝස් ප්‍රනාන්දු]

පවත්වනවා කිව්වා. මම ප්‍රශ්න කිහිපයක් සභාවට යොමු කළත් ඒ සම්බන්ධයෙන් උත්තරයක් ලබා ගන්න බැරි වුණා. මේ වන විටත් ඒ සම්බන්ධයෙන් ඒ පරීක්ෂණ කරපු නිලධාරීන් දුන්න වාර්තාවට මොකද වුණේ? ඒ සම්බන්ධව ගත් නීති ක්‍රියාමාර්ග මොකක්ද? ඒ වැරදි හදන්න මේ අමාත්‍යතුමා ගත් ක්‍රියාමාර්ග මොනවාද කියන එක අද මේ පළාත් සභාව විසුරුවා හරිනකල්වත් දැන ගන්න ලැබෙන්නේ නැහැ. මේ ආශ්චර්ය තවත් පියවරක් තමයි කියලා මට නම් කරන්න සිද්ධ වෙනවා.

ඒ එක්කම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි හැම වෙලාවේම ආහාර සැපයීම බෙදා හැරීම ගැන කථා කළොත් මේ ලංකාවේ නිෂ්පාදනය අඩු වීමත් එක්ක කිසිම ප්‍රවාහන සේවයක් සම්බන්ධයෙන් ආදායමක් ජනතාවට ලබා ගන්න විධියක් නැහැ. සියල්ලම පිටරටින් ආනයනය කරන තත්ත්වයක් යටතේ මේ ආහාරපානවල තත්ත්වය කෙසේද කිව්වොත් අද බොහෝ දෙනා පිළිකා රෝගයට ගොදුරු වෙනවා. මේ විවිධ විෂ සහිත ආහාර ආනයනය කරලා අපට කවනවා. ඉතින් මේ සම්බන්ධයෙන් මේ අමාත්‍යවරු අවධානය යොමු කරන්න අවශ්‍යයි. සුභ අනාගතයක් කියලා හැම තිස්සේම බෝඩ් ලැල්ලක් ගහගෙන හිටියාට අසුභ අනාගතයක පෙර නිමිති තමයි අපට පෙනෙන්නට තිබෙන්නේ. ඒ නිසා මම ඉතාම කනගාටුවෙන් ප්‍රකාශ කරනවා. අද ආණ්ඩු පක්ෂයෙන් අයවැය විවාදයට සහභාගී වෙන්න, මේ ඇමතිතුමාට සහය දෙන්න හය, හත් දෙනයි ඇවිල්ලා ඉන්නේ. අද ගරු ඇමතිතුමාට සහයෝගය දෙන්න ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු ටිකවත් නැහැ. මේ නිසා මේ අසුභ අනාගතය බෝඩ් ලැල්ලෙන් වහ ගන්නේ නැතිව විපක්ෂ මන්ත්‍රීවරුන් එක්ක එකතු වෙලා යහපත් වැඩ පිළිවෙළකට අවතීර්ණ වෙන්නය කියලා යෝජනා කරමින්, මෙතුමාගේ වැය ශීර්ෂයට අපේ විරුද්ධත්වය ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 12.53]

**ගරු අර්ෂාද් නිසාම්ඩීන්**
Hon. Arshad Nisaamdeen

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රවාහන, ක්‍රීඩා හා සංස්කෘතික අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සම්බන්ධව කථා කරන මේ අවස්ථාවේදී අවුරුදු හතරහාමාරක කාලය පුරාවට මම දැකපු දෙයක් තමයි, මේ සංස්කෘතික අමාත්‍යාංශය මගින් පළමු වරට අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යොදවලා මුස්ලිම් බැතිමතුන්ට ඒ උපවාස කාලයේදී රටඉඳි ලබා දීම. කොළඹ, ගම්පහ සහ කළුතර දිස්ත්‍රික්ක තුනම ආවරණය වන පරිදි ඒ ජනතාවට රටඉඳි ලැබෙන්නට අවස්ථාව සලසා දීම ගැන මගේ හෘදයාංගම ස්තුතිය මේ අවස්ථාවේ පුද කරනවා. ඒ වාගේම පළමුවන වරට මම හිතන විධියට හින්දු ආගමික වැඩ සටහන් පවා මේ සංස්කෘතික අමාත්‍යාංශයෙන් කරලා තිබෙනවා.

ඒ වාගේම මේ පොතේ තිබෙන දත්ත අනුව මම තෝරා ගත්තා. මේ ක්‍රීඩා අමාත්‍යාංශය මගින් කර ගෙන යන්නා වූ වැඩ පිළිවෙළ. ඒකේ තිබෙනවා, 2017 පොදු රාජ්‍ය මණ්ඩල ක්‍රීඩා තරගාවලිය ඉලක්ක කර ගනිමින්, පාසල්වල ක්‍රීඩක ක්‍රීඩිකාවන් තෝරා ගෙන සංචිතයක් බිහි කරලා තිබෙන බවට. ඒ වාගේම පළාත් අධ්‍යාපන අමාත්‍ය ගරු ප්‍රසන්න රණතුංග මැතිතුමා හා ඔහුගේ අමාත්‍යාංශය සමග එක්ව පාසල් ක්‍රීඩා සංචිත පිහිටුවලා තිබෙනවා. ඒක දීර්ඝ කාලීන පුහුණුවක්. ඒ පුහුණුවේදී සෑම දෙයක්ම ඒ පුහුණුකරුවන්ට ලබා දීලා තිබෙනවා. ක්‍රීඩා උපකරණ, ක්‍රීඩාවලට අඳින ඇඳුම් පවා ඒ ක්‍රීඩකයන්ට ලබා දීලා තිබෙනවා.

තවත් දෙයක් මම කියන්න කැමැතියි. අපේ මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ. සෑම පළාතකම හොඳ ක්‍රීඩකයන් ඉන්නවා. දුප්පත් ක්‍රීඩකයෝ. මේ ක්‍රීඩකයන් අපි හඳුනාගෙන ඒ ක්‍රීඩකයන්ට ඒ පහසුකම් ලබා දීලා මේ බස්නාහිර පළාතට ඔවුන්ව අරන් ඔවුන්ගේ ඒ ක්‍රීඩා කෞශල්‍ය දියුණු කිරීම සඳහා අපි උදව් කළා නම් අපේ බස්නාහිර පළාත් සභාවට, අපට හොඳ ක්‍රීඩකයන් පුහුණු කරලා ගන්න පුළුවන්. ශ්‍රී ලංකාව නියෝජනය කරලා ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩා තරගවලට ඔවුන්ව යොමු කරලා ඒ ජාත්‍යන්තර මට්ටමේ පදක්කම් අපට ලබා ගන්න පුළුවන්. ඒ වාගේ වැඩ පිළිවෙළක් අපි යොදා ගන්න ඕනෑ.

ඒ වාගේම තවත් දෙයක් කියන්න තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ ප්‍රවාහන අමාත්‍යාංශය ගත්තොත් අද හැම පැත්තෙන්ම බස් මාෆියාවක් තිබෙනවා. එක පැත්තකින් බස් මාෆියාව කියන්නේ, පාතාලයේ මාෆියාව ඔවුන්ගෙන් සල්ලි ලබා ගැනීමයි. තවත් පැත්තකින් බස් මාෆියාවක් කියන්නේ, රෑ අටෙන් පස්සේ මේ පෞද්ගලික බස් රථ දුවන්නේ නැහැ. සෑම පළාතකම. කොළඹ පළාතේ පවා බස් නැහැ. පෞද්ගලික බස් නැහැ. පෞද්ගලික බස් හිමියන්ගේ, ඒ අයගේ පොඩි සොච්චමයි

ඉන්නේ.මේ සොච්චම තමයි සම්පූර්ණයෙන්ම ඒ පළාතම ආවරණය වන පරිදි ඒගොල්ලන්ගේ වැඩ කටයුතු කර ගෙන යන්නේ. අටෙන් පස්සේ බස් නැහැ. මම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මගින් ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මේකට මැදිහත් වෙලා මේ බස් හිමියන් එක්ක කථා කරලා, රෑ අටෙන් පස්සේ උදාහරණයක් හැටියට මේ ටවුන් හෝල් සිට අංගොඩ, මාර්ග අංක 164 කොළඹ බස් එක නැහැ. ඒ වාගේම මම දන්නවා. දෙල්ගොඩ - පිටකොටුව බස් එක. රෑ අටෙන් පස්සේ ඒකත් නැහැ. මේ වාගේ තත්ත්වයක් තිබෙන්නේ. තවත් එකක් තිබෙනවා. 134 අංගොඩ - ගල්කිස්ස බස් එකක් තිබුණා. ඒ බස් එක දැන් නැහැ. ඒ වාගේම 131 හෝ 132 කියලා සත්ව උද්‍යානයේ සිට මාවරමංඩියට යන බස් එකක් තිබුණා. ඒ වාගේම 116 මට්ටක්කුලිය - පිළියන්දල. ඒ වාගේම 167 දෙහිවල - තොටළඟ. ඒ වාගේම 195 හෙට්ටියාවත්ත - නුගේගොඩ. මේ බස් මාර්ගවල සැහෙන දහස් සංඛ්‍යාත ජනගහනයක් යන එන බස්. ඒ බස් දැන් දුවන්නේ නැහැ. ඒ වාගේම 104 වත්තල - බම්බලපිටිය. මේ බස් එක නම් දැනට තිබෙනවා. නමුත් හරියට ක්‍රියාත්මක නැහැ. ඒ බස් එක දවසට එකයි දෙකයි යන්නේ. අනික් වෙලාවට බස් නැහැ. ඒ වාගේ තත්ත්වයක් තමයි උදා වෙලා තිබෙන්නේ. ඇමතිතුමා සැහෙන මහන්සියක් ගන්නවා මේවා කරන්න. නමුත් මොන හේතු මතද දන්නේ නැහැ. මේ බස් මාෆියාව කරන අයගේ බල පුළුවන්කාරකම තියාගෙන, ඔවුන්ගේ ඒ වටපිටාව හදා ගෙන, ඔවුන්ගේ හිතු මනාපයට තමයි මේ පෞද්ගලික බස් ක්‍රියා කර ගෙන යන්නේ. ඒ නිසා මම ඉල්ලා සිටිනවා, මේකට මැදිහත් වෙලා, මේ ජනතාවට හොඳ බස් සේවාවක් ලබා දීමට බස්නාහිර පළාත් සභාවේ අපි විසින් කටයුතු කළ යුතුයි කියලා.

ඒ වාගේම ගරු ඇමතිතුමා තවත් වැඩ පිළිවෙළක් යොදා ගෙන තිබෙනවා. ළමා ක්‍රීඩාංගන හදන්න. මේ ළමයින්ගේ මනස හොඳ ආකාරයට තබා ගැනීමට හොඳ ළමා ක්‍රීඩාංගන බවට පත් කරලා ළමා ක්‍රීඩාංගනයට උවමනා දේ ලබා දීලා, සුදුසු පරිදි, හරියාකාරව ක්‍රීඩා උපකරණ ලබා දීලා ජනතාවටත් උදව් ලබා දීලා තිබෙනවා කියලා මේ පොතේ තිබෙනවා. මමත් ඒ පිළිබඳව දැනුවත්ව සිටිනවා. අපේ ප්‍රදේශයට පවා ඒ ක්‍රීඩාංගන ලබා දීලා තිබෙනවා. ඒ ගැන ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා.

ඒ වාගේම මම ඉල්ලා සිටිනවා. මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ඉතාමත් හොඳ කථාවක්, හරබර කථාවක් කළා. විපක්ෂයේ කාර්යභාරය අද එතුමා කළා. නමුත් එහෙමත් තියෙන්න ඕනෑ. විවේචනය තිබෙන්න ඕනෑ. මේ වැඩේ වැරදියි කියලා පෙන්නුම් කරන්න ඕනෑ. එතකොට කවුරු හෝ වේවා මේ වැඩේ නිවැරදි කර ගෙන ඒ වැඩ පිළිවෙළ කර ගෙන යයි. ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේකට මැදිහත් වෙලා මේ ක්‍රීඩකයන් තෝරා ගෙන, මේ ක්‍රීඩකයන්ව දියුණු කරලා, අපේ රටට ජාත්‍යන්තර පදක්කම් ලබා ගැනීමට උත්සාහ ගන්නය කියලා ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මෙම අවස්ථාවේදී පූර්ණ කාරක සභාව දිවා විවේකය සඳහා පස්වරු 02.00 දක්වා කල් තබනවා.

***ඊට අනුකූලව පූර්ණ කාරක සභාව තාවකාලිකව අත්සිටුවන ලදින් අ.භා. 02.04 ට යළිත් රැස් විය.***
*Accordingly the Whole Council Suspended and. it resumed at 2.04 p.m.*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

විකුම් ගුණසේකර ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 10 ක කාලයක් වෙන් වී තිබෙනවා.

[අ.භා. 02.04]

**ගරු විකුම් ගුණසේකර**
Hon. Wikum Gunasekara

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බස්නාහිර පළාත් සභාවේ ප්‍රවාහන, ක්‍රීඩා, තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමූපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදා හැරීමේ කටයුතු සහ ග්‍රාම සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ශීර්ෂ අංක 107, 122, 123 හා 103 යන වැය ශීර්ෂයන් යටතේ සාකච්ඡාවට සම්බන්ධ වීමට ලැබීම පිළිබඳව මම සතුටු වෙනවා. මම පළමුවෙන්ම පටන් ගන්නම්. අපේ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය. ප්‍රවාහනයෙන් පටන් ගන්න කියලා කල්පනා කළේ. යම් ප්‍රමාණයකට අද ඇත්ත වශයෙන්ම හොඳ ප්‍රවනතාවයක් පෙන්වන්න කටයුතු කරනවා. හැබැයි නිලධාරීන් තවම ධනාත්මක නැහැ. ඒ පිළිබඳව ගරු සභාපතිතුමා මොන

[ගරු විකුම් ගුණසේකර]

තීන්දු තීරණ ගත්තා වුණත් සමහර තැන්වලදී ගැටළු තිබෙනවා. ඒ නිසා ඔබතුමා බොහොම උනන්දු වෙන්න ඕනෑ. ඒ වාගේම මට විශේෂයෙන් කියන්න ඕනෑ, අපේ ආබාධිත රණවිරුවන්ට ගමන් බලපත්‍රයක් දීලා තිබෙනවා. මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය සතු සහ ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයට අයත් බස් රථවල යාම සඳහා නිශ්චිත දුරකට ආබාධිත රණවිරු බලපත්‍රයක්. ඉතින් මොකක් හරි අහිමි වීමක් මත තමයි ඒ අවස්ථාව දීලා තිබෙන්නේ. හැබැයි, මේ පෞද්ගලික බස් රථවල යන්නත් ඒකේ සම්පූර්ණයෙන්ම බලය දීලා තිබෙනවා. ඒ වුණාට මේ පිළිබඳව හුඟාක් කොන්දොස්තරවරුන් දැනුවත් වෙලා තිබුණත්, ආබාධිත රණවිරුවන්ව මේ තුළ ගොඩාක් අපහසුවට පත් කරනවා. ඒ නිසා මම පසුගිය කාලයේ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ කළුතර කාර්යාලයට මේ පිළිබඳව කිව්වා. අපේ බස් නැවතුම් පොළවල්වල දැන්වීම් පුවරුවේ දාන්න කියලා. එතකොට කාටත් පේනවා නේ. නැත්නම් තැන් දෙක තුනක විතර බෝඩ් එකක් ගහන්නය කියලා මේ ආබාධිත රණවිරුවන්ගේ ගමන් බලපත්‍රයට දෙන්න ඕනෑ සහයෝගය පිළිබඳව.

ඇත්ත වශයෙන්ම යම් ප්‍රමාණයකට මම කියපු දේට වඩා දැනට පොඩි සහනයක් කරලා තිබෙනවා. කළුතර දිස්ත්‍රික්කයේ බස් රථ හිමියන්ගේ සංගම් දැනුවත් කරලා තිබෙනවා. මම කියන්නේ, බස්නාහිර පළාතේම මේක කරන්න ඕනෑ. ගරු ඇමතිතුමාට මම යෝජනා කරනවා. මොකද, ඔවුන් මේ රට වෙනුවෙන් පුදුම කැප කිරීමක් කරපු අය. අද මේ බස් ව්‍යාපාරය හරි කරලා ඒ මිනිස්සු හම්බ කරන්නේ, මේ රණවිරුන් කරපු කැප කිරීම නිසා. ඒක අමතක කරන්න එපා කියන්න ඕනෑ. මොකද, ආබාධිත රණවිරුවන්ට මහා නරක විධියට සලකනවා. හැබැයි, මොවුන් බොහොම ආවේගශීලී අය. ඉතින් ඒ නිසා නිකම් ගැටළුවලට මැදි වෙන්න එපා කියන්න. විශේෂයෙන්ම සෑම බස් නැවතුම් පොළකම මේ පිළිබඳව ඔබතුමන්ලාගේ අවධානය යොමු කරලා, මේ ආබාධිත රණවිරුවන්ට ගමන් යාමට නිදහස් ගමන් බලපත්‍ර ලබා දීමේ අයිතියට ගරු කරන්නය කියන එක විශේෂයෙන්ම ඉල්ලීමක් කරනවා. මම ඒක ගරු ඇමතිතුමාට යෝජනා කරනවා. ඔබතුමා මෙය සඳහන් කර ගන්න. මෙය අනිවාර්යෙන්ම බස්නාහිර පළාත තුළම කළොත් - නැත්නම් රණවිරුවෝ හැටියට අපට පොඩි ගැටළුවක් වෙනවා. සමස්ථ ජනතාවටම මේක බොහොම ගැටළු සහගත තත්ත්වයක් වන නිසා මේ ගැන විශේෂයෙන්ම අවධානය යොමු කරන්න.

ඒ වාගේම ක්‍රීඩාව, ඇත්ත වශයෙන්ම ඔබතුමා දන්නවා මම ක්‍රීඩාව වෙනුවෙන් කොපමණ උනන්දුවක් දක්වනවාද කියලා. දැන් මම අවුරුදු 29 ක් තිස්සේ මේ රෝද පුටුවේ ඉන්නේ. යම් ක්‍රීඩාවක් කරලා ජීවිතයේ යම් සැහැල්ලු ගතියක් ඇති කර ගත් නිසා. මම හැමදාම ක්‍රීඩාව වෙනුවෙන් කටයුතු කරනවා. විශේෂයෙන් ඔබතුමාත් එක්ක සම්බන්ධ වෙලා, සෑම ක්‍රීඩා උළෙලකටම සම්බන්ධ වෙලා තිබෙනවා. හැබැයි, මෙවර ඔබතුමාගේ සෙනසුරාදා තිබුණු ක්‍රීඩා උළෙලේ ආරාධනා පත්‍රය ලැබුණේ අඟහරුවාදා. අපි ඒ පිළිබඳව බොහොම කනගාටු වෙනවා. පළාත් ක්‍රීඩා උළෙලේ. ගිය සැරේ මම 2010 හා 2011 අවුරුදුවල උදේ පටන් ගත් වෙලාවේ ඉඳලා අවසන් වෙන තෙක්ම සුගතදාස ක්‍රීඩාංගනයේ හිටියා. මෙවර මට ආරාධනා පත්‍රය ලැබුණේ - මට විතරක් නොවෙයි. අපේ මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ඇතුළු අපි සියලුම දෙනාට ආරාධනා පත්‍රය ලැබුණේ, බොහොම පරක්කු වෙලා. අඩු වශයෙන් දුරකථනයෙන් කථා කරලා හරි අපට කියන්න තිබුණා. ඒක කළේ නැහැ. ඒ ගැන බොහොම කනගාටු වෙනවා.

ඒ වාගේම අපි බොහොම සතුටු වෙනවා. කළුතර දිස්ත්‍රික්කයේ අඩුපාඩු තිබෙන ක්‍රීඩා නිලධාරීන් ඉන්නවා. නමුත් පසුගිය කාලේ යම් ප්‍රමාණයකට මට හරි සතුටක් දැනුනා. බුලත්සිංහල, මිල්ලනිය - බුලත්සිංහල ප්‍රාදේශීය ලේකම් කාර්යාල ක්‍රීඩා උළෙලේ Relay teams 14 ක් හිටියා. කොපමණ වටිනවාද බලන්න. එපමණ දුෂ්කර ප්‍රදේශයක Relay teams. ඒ කියන්නේ හරිම වටිනවා. මොකද, ඒ වාගේ බොහොම හොඳට බුලත්සිංහලත් සංවිධානය කරලා තිබුණා. හරිම දුෂ්කර ප්‍රදේශ. ඒ වාගේම මේ ක්‍රීඩා සමාජවලට දෙන පහසුකම් ලැබෙන්නේ නැත්තේ මොකද කියලා මට දැනෙන්නේ නැහැ. මොකද, හේතුව හුඟක් තැන්වලට ඇහුවොත් කාටවත් කිසි දෙයක් ලැබුණේ නැති විධියට තමයි කථා කරන්නේ. ඒ වුණාට අපි හැමදාම විශාල මුදලක් ක්‍රීඩා භාණ්ඩ වෙනුවෙන් වැය කරනවා. ඉතින් මේවා කොහෙන්ද? කොහාටද? යන්නේ කියන එක පිළිබඳව අපට ගැටළුවක් තිබෙනවා. ඒ නිසා ගරු ඇමතිතුමා මේ ගැන නියාමනයක් කරනවා නම් හුඟාක් හොඳයි කියන එකයි මගේ යෝජනාව. ගරු අමැතිතුමා ඒ ගැනත් අවධානය යොමු කරන්න. මේ ක්‍රීඩා භාණ්ඩ

ඒ නියම ක්‍රීඩා සමාජවලට ලැබෙනවාද කියන එක ගැන ඔබතුමා පසු විපරමක් කළොත් වඩා හොඳයි කියලා මම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මාර්ගයෙන් ඉල්ලා සිටිනවා.

ඒ වාගේම මේ ග්‍රාම සංවර්ධන සමිති ගැන කථා කරන කොට විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ. සෑම ග්‍රාම නිලධාරී වසමකටම එක ග්‍රාම සංවර්ධන සමිතියක් ගානේ තිබෙනවා. හැබැයි, ඔවුන් කරන්නේ කොන්ත්‍රාත්. මම මෑතකදී අපේ පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ තිබෙන ග්‍රාම සංවර්ධන සමිතියකට ශ්‍රම පදනම මත මාර්ග සංවර්ධනය කරන්න ලක්ෂ පහක මුදලක් දැම්මා. ඔවුන් ශ්‍රම පදනම මත දැම්මාම ඒ මුදල ගන්න කැමැති වුණේ නැහැ. ඔවුන් සල්ලිම හම්බ කරන්න තමයි බලන්නේ. මේකෙන් සේවයක් කරන්න බලාපොරොත්තුවක් නැහැ. ඉතින් මේවා පිළිබඳව පොඩ්ඩක් අවධානය යොමු කරන්න ඕනෑ. මේ ග්‍රාම සංවර්ධන සමිති මහජන සේවයට යොදා ගන්න. මේක ඔවුන්ගේ පෞද්ගලික සුඛ විහරනය සඳහා යොදා ගන්න ඉඩ තියන්න එපා, ගරු ඇමතිතුමනි. මොකද අපට හරිම ගැටළුවක්. මොකද, මම ශ්‍රම පදනම මත කියලා දුන්නාම අපෝ මේකේ ඇති වැඩක් නැහැ. මේකෙන් අපට කිසි දෙයක් ලැබෙන්නේ නැහැයි කියලා ඔවුන් මේවා ප්‍රතික්ෂේප කරනවා. ඒ නිසා මේ ග්‍රාම සංවර්ධන සමිති හදලා තිබෙන්නේ, ජනතාවට සේවය කරන්න. ඔවුන්ගේ පෞද්ගලික සාක්කුවට මුදල් දා ගන්න ක්‍රමවේදයකට නොවෙයි යන්න ඕනෑ. ඒ නිසා ඒකට මොකක් හරි ක්‍රමවේදයක් හදන්න. අපට ප්‍රධානම දේ තමන්ගේ ග්‍රාම සංවර්ධන සමිති සීමාවේ සංවර්ධනයක් වෙනවාද කියන එක බලා ගැනීමේ අවශ්‍යතාවයයි. ඒක කෙරෙන කොට ඒ තුළින් අයුතු ලාභ ගන්න, අයුතු ප්‍රයෝජන ගන්න ඒවාට ඉඩ තියන්න එපා. පැහැදිලිවම. මේක මට ලැබුණු අත්දැකීමක්. මම ඒ මුදල තවම තියාගෙන ඉන්නවා මොකක්ද කරන්නේ කියලා. මොකද, මේ ව්‍යාපෘතිය මාරු කරන්න විධියකුත් නැහැ. මේ වෙලාවේ මාරු කරන්න දෙන්නේ නැහැ. ඉතින් අපට හරි ගැටළුවලට මුහුණ දෙන්න සිදු වෙනවා. අපේ අවශ්‍යතාවය, මේ මුදලෙන් උපරිම ප්‍රයෝජන ගන්න. ඒ නිසා තමයි ග්‍රාම සංවර්ධන සමිතියකට දෙන්නේ. ඔවුන් කියන්නේ, මේක කොන්ත්‍රාත් එකක් කරන්න පුළුවන් විධියට දෙන්නය කියලා. කොපමණ වැරදිද බලන්න. ඒ නිසා මේ ගැන ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන්න. ඒ වාගේම අපට බොහොම සතුටුයි ගරු ඇමතිතුමා පසුගිය කාලයේ ග්‍රාම සංවර්ධන සමිති, ග්‍රාම සංවර්ධන චෝට් එකෙන් මාර්ග පද්ධතිය ගොඩ නගන්න අපට ගොඩාක් උදව් කළා.

ඒ වාගේම දහම් පාසල් ගොඩනැගිලි. අපට හරිම වැදගත්. අපට දහම් පාසල්වලට දෙන්න පුළුවන් වුණේ රු. 30,000/- යි. විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ. සුමිත් ලාල් මෙන්ඩිස් ගරු මන්ත්‍රීතුමා කරපු යෝජනාව තුළ එතුමා දැවැන්ත සහයෝගයක් දක්වලා අද දහම් පාසල්වලට විශේෂ සැලකිල්ලක් කරන්න පුළුවන් වුණා. මට වෙන් කරපු මුදලින් ලක්ෂ පහක් දක්වා දෙන්න මට පුළුවන් වුණා. අපි ඒවා පිළිබඳව බොහොම සතුටු වෙනවා. අඩුපාඩු තිබෙනවා. අපි ඒවාටත් බණිනවා තමයි. රථගාල්වලින් කප්පම් ගන්න ඒවා අපි එදා ඉඳලාම හෙළා දකිනවා. අපි ඒවාට බණිනවා. ඒ වාගේම ගරු ඇමතිතුමා කරපු හොඳ දේවල් අපි කියනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඇමතිතුමා කප්පම් ගන්නවාද?

**ගරු විකුම් ගුණසේකර**
Hon. Wikum Gunasekara

එතුමා නොවෙයි. එතුමාවත් දන්නේ නැහැ කවුද ඒවා කරන්නේ කියලා. ඒ වාගේ මහ පුදුම දේවල් කරනවා. ඉතින් ඒවා ගැන අපි හෙළා දකිනවා වාගේම ඔබතුමා කරපු හොඳ දේවල් ගැනත් පැහැදිලිවම අපි එදා ඉඳලාම - ඇත්ත වශයෙන්ම අපේ දහම් පාසල් පද්ධතියට, පන්සල්වලට ඒ දෙන්න පුළුවන් වුණු සහයෝගය ලබා දුන්නා. ඒ වාගේම ඔබතුමා මට වොලිබෝල් ක්‍රීඩාංගනයක් දුන්නා. දිවා රාත්‍රී ක්‍රීඩාංගනයක්. ඉතින් ඒවා ගැන අපේ බොහොම අගයක් තිබෙනවා. මොකද, අපට යම් ප්‍රමාණයකට අද මහජනතාවට සමීප වෙන්න ලැබුණේ ඔබතුමන්ලා ඇමතිවරු හැටියට අපට දක්වපු සහයෝගය නිසයි. ඒ දක්වපු සහයෝගය පිළිබඳව අපි කෘතඥ වෙනවා. ඊළඟට අපි හෙට අනිද්දා ඡන්දයකට යනවා. භය නැතිව යන්න පුළුවන්. ඔබතුමන්ලා අපිව රැකලා තිබෙන නිසා. ඒ නිසා අපි කියන්නේ, ඔබතුමාට බොහොම ගෞරවය දක්වනවා. ඒ වාගේම අඩුපාඩු තිබෙන ඒවා නම් හදා ගන්න.

මම සමූපකාර ව්‍යාපාරය ගැන නම් කථා කරන්නේ නැහැ. මට ඒ ගැන හරි දැනුමක් නැහැ. ඇත්ත වශයෙන්ම ෂෙඩ් එකක තෙල් ගහන්න කොල්ලෙක්වත් දාන්න අපට

[ගරු විකුම් ගුණසේකර]

ලැබුණේ නැහැ. එහෙම අවස්ථාවක් ලැබුණේ නැහැ. අපේ පැත්තේ තිබෙන සමූපකාර ෂෙඩ්වල ඉන්නේ, කොහේ කට්ටියද කියලාවත් අපි දන්නෙත් නැහැ. අනික් එක මම මන්ත්‍රීවරයෙක් කියලා ඔවුන් දන්නෙත් නැහැ. සමහර වෙලාවට ගියාම මාව දන්නේවත් නැහැ. ඒ අය කොහේ අයද කියලා දන්නේ නැහැ. අවිස්සාවේල්ල ද, මහරගම ද, කොහේද කියලා දන්නේ නැහැ. ඒ නිසා අපට ඒ පැත්ත ගැන නම් බොහොම කනගාටුවක් තිබෙනවා. සමූපාකාර ව්‍යාපාරයේ කොයිම වෙලාවකවත් අපව සම්බන්ධ කර ගන්නේ නැහැ. ඒ නිසා පරණ මිනිස්සුන්ට සලකනවා. ඒක කමක් නැහැ. කොහොම වුණත් අපි මේ ව්‍යාපාරවලට ඇඟිලි ගහන්නේ නැහැ. මේවා හරියට කෙරෙන්නයි අවශ්‍යතාවය. හොඳ විනයක් ඇතිව. ඉතින් අපි විශේෂයෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. සමූපකාර සේවකයන්ට විශ්‍රාම වැටුප. මම ඔබතුමාගේ සෑම සාකච්ඡාවකටම ගියා. ඔබතුමා ප්‍රඥප්තිය හදන වෙලාවේ. හරිම වැදගත්. ඇත්ත වශයෙන්ම ඔබතුමා කරපු දේවල් ගැන මගේ බොහොම අගය කිරීමක් තිබෙනවා. ගරු ඇමතිතුමා අවුරුදු හතරක් තිස්සේ ඒ ගැන බොහොම උනන්දු වුණා. ආපු දවසේ ඉඳන්ම. සමූපකාර සේවකයන් වෙනුවෙන් ඒ ගත්ත තීරණය. ඒ වාගේම අර කොළඹ වහපු සමූපකාර සේවකයන්ට වන්දි ප්‍රදානය. කොපමණ වැදගත් වැඩක්ද බලන්න. එක්සත් ජාතික පක්ෂ රජය කාලේ ඒ වහපු සමූපකාරය. සම්පූර්ණයෙන්ම ඔවුන් ඔක්කෝටම වන්දි දුන්නා. සමහර අය මිය ගිහිල්ලා. ඒ මිනිස්සුන්ට මිලියන ගණනක් වන්දි ගෙව්වා. ඒ වාගේ කටයුතු හරි වටිනවා. ඒ කරපු දේවල් ගැන අපේ බොහොම අගයක් තිබෙනවා. ඒ වාගේම ඔබතුමා ගත් තීන්දු තීරණත් එක්ක අපි හැමදාම හිටියා. සමූපකාර සේවකයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රඥප්තිය හදන කොට අපි සෑම රැස්වීමකටම මම ආවා. සෑම සැසිවාරයකටම ඇවිල්ලා අපි ගරු ඇමතිතුමාට දැවැන්ත සහයෝගයක් ලබා දුන්නා. ඒ නිසා ගරු ඇමතිතුමාට මේ වාගේ වැඩ කරන්න ධෛර්යය ශක්තිය ලැබේවායි කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. සියලු දෙනාටම සුභ අනාගතයක්.

[අ.භා. 02.15]

**ගරු දයාකාන්ත පෙරේරා**
Hon. Dayakantha Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හිතන්නේ පළාත් සභාවේ උපාලි කොඩිකාර ගරු අමාත්‍යතුමාගේ අමාත්‍යාංශය වෙනුවෙන් යම්කිසි අදහසක් ප්‍රකාශ කරන්න ලැබීම භාග්‍යයක් කොට සලකනවා. ඒකට විශේෂ කරුණ තමයි ඒ අමාත්‍යාංශයේ ඉතිහාසයේ කවදාවත් නොවුණු ආකාරයට, ඒ අමාත්‍යාංශයට වැඩ දායී ආකාරයටත්, ඒ එක්කම බස්නාහිර පළාත් සභාවේ ඒ සියලුම ජනතාව වෙතත් ඉතා දක්ෂ ලෙස, නිර්මාණශීලී ලෙස වැඩ කරපු ඇමතිවරයෙක් තමයි එතුමා. එතුමාට ලබා දුන් අමාත්‍යාංශ. අපි දැක්කා මීට පෙර ඉතිහාසයේ මේ පළාත් සභාවල මෙතුමාට පවරපු අමාත්‍යාංශවල හිටපු ඇමතිවරුන් පවා ඉක්මවා, උදාහරණයක් විධියට සමූපකාර අමාත්‍යාංශය ගත්තොත් ඉතිහාසයේ සමූපකාරය කියන කොට සමහර විට කථා කරන්නත් හරි බයයි. මොකද, ඒ තරම් අපකීර්තියට පත් වුණු අමාත්‍යාංශයක් බවට පත් වෙලා තිබුණු යුගයක් තිබුණා. නමුත් උපාලි කොඩිකාර ගරු ඇමතිතුමාගේ මේ සමූපකාර අමාත්‍යාංශය පිළිබඳව ආණ්ඩු පක්ෂය සහ විපක්ෂය විශේෂයෙන්ම හැම අවස්ථාවකදීම එතුමාට ප්‍රශංසනීය ලෙස තමයි කථා කළේ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ප්‍රශස්ති ගායනා?

**ගරු දයාකාන්ත පෙරේරා**
Hon. Dayakantha Perera

මම හිතන්නේ, ඒකට හේතුව අර අපේ විකුම් ගුණසේකර ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ එතුමා හරිම නිර්මාණශීලීයි. විශ්‍රාම වැටුප් ලබා දෙන ගමන් දේශපාලන භේදයෙන් තොරව අසාධාරණයට ලක් වුණු සමූපකාර සේවක පද්ධතිය වෙනුවෙන් සුවිශේෂ වැඩ කොටසක් කරපු අමාත්‍යවරයෙක් බවට ඉතිහාසයට එක් වෙනවා. එපමණක් නොවෙයි. ඒ අමාත්‍යාංශය හැරුණාම එතුමාට පවරපු අනික් අමාත්‍යාංශය තමයි සංස්කෘතික අමාත්‍යාංශය. හැබැයි, ඒ එක්කම ඉතිහාසයේ ඒ ඇමතිවරු කළාට වඩා වැඩි යමක් එතුමා මේ වන විට කරලා තිබෙනවා. අපි විශේෂයෙන්ම දකින්නේ ආගමික සහජීවනය, එකමුතුකම ඇති කරන්න එතුමා සුවිශේෂ කටයුතු රාශියක් කළා. වෙසක් උත්සවය ඉතාමත් අලංකාර ලෙස එතුමාගේ අමාත්‍යාංශය මුළු පළාත් සභාව තුළම කටයුතු කළා. එපමණක් නොවෙයි, පොසොන් උත්සවය, නත්තල් උත්සවය, හින්දු ආගමික උත්සව සහ ඉස්ලාම් ආගමික උත්සව ආදී ඒ සියලුම ජාතීන්ගේ ආගමික උත්සවවලදී එතුමා අමාත්‍යාංශයෙන් විය යුතු යුතුකම් කොටස හරියට ඉටු කරපු ඇමතිවරයෙක්

විධියට අපි දැක්කා. ඒ නිසා අපි හිතනවා, අතිගරු ජනාධිපතිතුමා එතුමාට පවරපු ඒ සංස්කෘතික අමාත්‍යාංශයේ වගකීම, යුතුකම බස්නාහිර පළාත් සභාවේ සියලුම ආගමික කොටස්වලට සියලුම ජාතීන්ට නිසි ලෙස ඉටු කරපු ඇමතිවරයෙක් විධියට මේ අවස්ථාවේ අපි එතුමාව දකිනවා.

ඒ වාගේම තවත් විශේෂයෙන් සඳහන් කරන්නට දේවල් තිබෙනවා. අපි කවදාවත් දැක්කේ නැහැ මේ අමාත්‍යාංශවල ඉතිහාසයේ නාට්‍ය කලාව කියන එක ඉදිරියට ගේන්නට, ඒ නාට්‍ය කලාවට නව ජීවයක් ලබා දෙන්නට කටයුතු කරපු ඇමතිවරයෙක්. අපි දැක්කා, උපාලි කොඩිකාර ගරු ඇමතිතුමා නිහඬව මේ නාට්‍ය කලාව පිළිබඳව විශේෂ ඇල්මක් තිබෙන අමාත්‍යවරයෙක් විධියට විවිධ ආකාරයේ පුහුණු පාඨමාලා ඇති කරලා, ගම්පහ, කොළඹ සහ කළුතර කියන දිස්ත්‍රික්ක තුනේ - මම හිතන්නේ, විශේෂයෙන්ම විවිධ ආකාරයේ වැඩ සටහන් ක්‍රියාත්මක කරලා නාට්‍ය කලාව ඉදිරියට ගේන්නට විශාල මෙහෙවරක් කරපු ඇමතිවරයෙක්. එපමණක් නොවෙයි. නර්තනය සඳහා දක්ෂ දරුවන් තෝරා ගෙන, ඒ නර්තනය සඳහා සුවිශේෂ හැකියාවක් තිබෙන දරුවන් සඳහා ඒ අයට නිසියාකාර පුහුණුවක් ලබා ගැනීමට විශේෂ පුහුණු පාඨමාලා ඇති කළා. අපි ඒකත් ඉතා අගය කොට සලකනවා.

ඒ වාගේම අපි විශේෂයෙන්ම දකිනවා. සංස්කෘතික මධ්‍යස්ථාන වැඩි දියුණු කරන්නට එතුමා එතුමාගේ අමාත්‍යාංශයට වෙන් කරපු මුදල්වලින් විශාල මුදල් සම්භාරයක් ලබා දුන්නා. අපේ දිස්ත්‍රික්ක පුරා විසිරිලා තිබෙන මේ සංස්කෘතික මධ්‍යස්ථාන එතුමා අලුත් මුහුණුවරක් දෙන්න විශාල ප්‍රමාණයක් අලුත් වැඩියා කළාය කියන එකත් මේ අවස්ථාවේ සඳහන් කරන්නට ඕනෑ. අපේ සමාජයෙන් ගිලිහිලා යන, අපේ සංස්කෘතියේ විශාලතම අංගයක් වන මංගල පෝරු වාරිත්‍ර. මම හිතන්නේ, අපට මේ මෑත යුගයක් වන තෙක් මේ මංගල පෝරු වාරිත්‍ර කරන්නට අපේ වයෝවෘද්ධ කපු මහත්වරු, වැඩිහිටියෝ සොයා ගන්නට විශාල කාලයක් වැය කරන්නට සිදු වුණා. නමුත් මේ පිළිබඳව එතුමාගේ දක්ෂ නිලධාරී මණ්ඩලයේ උපදෙස් අරගෙන පළමු වරට බස්නාහිර පළාත් සභාවේ මංගල පෝරු වාරිත්‍ර පුහුණු පාඨමාලා ඇති කරලා, මම හිතන්නේ අපේ ඒ කටයුත්ත කරපු වයෝවෘද්ධ පිරිස වෙනුවෙන් අලුත් පරම්පරාවක්, තරුණ පරම්පරාවක් අපේ පළාතට හඳුන්වා දීම මම හිතන්නේ, ඇමතිතුමාගේ නිර්මාණශීලී කොටසේ අංගයක් කොට සලකනවා.

ඒ එක්කම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක් පැත්තකින් එතුමා මංගල පෝරු වාරිත්‍ර පාඨමාලා පවත්වලා, අපේ පළාතට අලුතෙන් තරුණ පරපුරක් බිහි කරන කොට කවදාවත් අත නොගසපු තවත් විශේෂාංගයකට එතුමාගේ අවධානය යොමු වුණා. ඒ තමයි පළමු වතාවට ජ්‍යොතිෂය පිළිබඳව ඉගෙන ගැනීමට පළාත් සභාවේ පාඨමාලාවක් ඇති කරන්නට නිර්මාණශීලී ඇමතිවරයෙක් විධියට කටයුතු කළා. මම හිතන්නේ, මේවා තමයි අතිගරු ජනාධිපතිතුමා උපාලි කොඩිකාර අමාත්‍යතුමාට මේ අමාත්‍යාංශය භාර දෙන කොට බලාපොරොත්තු වුණේ. අතිගරු ජනාධිපතිතුමාගේ බලාපොරොත්තු ඉටු කරමින්, ඒවා මල් ඵල ගන්වමින් මහින්ද චින්තනයට නව අරුතක් එක් කරපු අපේ සුවිශේෂ ඇමතිවරයෙක් තමයි අපේ ගරු උපාලි කොඩිකාර ගරු ඇමතිතුමා. (බාධා කිරීමක්) ඒ එක්කම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම සඳහන් කරන්නට ඕනෑ. ඉතාමත් ක්‍රීඩාශීලී, ක්‍රීඩාවට බර, නිතර ක්‍රීඩාවේ යෙදෙන මම හිතන්නේ, ඇවිදින්නේත් බොටම් එක ගහ ගෙන. එහෙම ක්‍රීඩා ඇමතිවරයෙක් බිහි වීම බස්නාහිර පළාත් සභාවේ අපේ භාග්‍යයක් කොට සලකනවා. ක්‍රීඩා ඇමතිවරයා විධියට පාසල් මට්ටමේ, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ, දිස්ත්‍රික් මට්ටමේ සුවිශේෂ ලෙස ක්‍රීඩා කරන පුද්ගලයන්ට තමන්ගේ අනාගතය වෙනුවෙන් මාර්ගය විවර කරලා දුන්න අපේ ක්‍රීඩා ඇමතිවරයාට මේ අවස්ථාවේ මුළු බස්නාහිර පළාත් සභාවේ ජනතාවගේ ගෞරවය ප්‍රණාමය පුද කරනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එතකොට මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා බොරු නේ කියලා තිබෙන්නේ.

**ගරු දයාකාන්ත පෙරේරා**
Hon. Dayakantha Perera

අපි කියන්නේ ඇත්ත.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

හරි. මේ කථා කරන්නේ දයාකාන්ත මන්ත්‍රීතුමා නේ. ඒක මෙරිල් පෙරේරා මන්ත්‍රීතුමාගෙන් අහන්න.

**ගරු දයාකාන්ත පෙරේරා**
Hon. Dayakantha Perera

මගේ කාලය.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

තව විනාඩි තුනක් තිබෙනවා.

**ගරු දයාකාන්ත පෙරේරා**
Hon. Dayakantha Perera

දැන් මේගොල්ලෝ විනාඩියක් ගත්තා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

නැහැ. නැහැ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

අපි ඇහුවේ ක්‍රීඩාවල කොටු පැනීමක් තිබෙනවාද කියලා. මේ ක්‍රීඩාවලට කොටු පැනීමත් තිබෙනවාද?

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමා කථා කරන්න.

**ගරු දයාකාන්ත පෙරේරා**
Hon. Dayakantha Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ සඳහන් කර ගෙන ආවේ බස්නාහිර පළාත් සභාව ක්‍රීඩා අංශයෙන් සමස්ත ජයග්‍රහණය කරන කොට, මේ බස්නාහිර පළාත් සභාවට ක්‍රීඩා ජයග්‍රහණ කරන්නට ප්‍රධාන ඉලක්කය වුණේ කොළඹ කලාපය. නැත්නම් කොළඹ දිස්ත්‍රික්කය. කොළඹ නගරය. මේකට සුවිශේෂ හේතුව තමයි පාසල් මට්ටමින් ගත්තත් මුළු බස්නාහිර පළාත් සභාවම ජයග්‍රහණය කරන්නේ කොළඹ නගරයේ, කොළඹ කලාපයේ තිබෙන පාසල්වල සිටින ඒ දක්ෂ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ සුවිශේෂ හැකියාව නිසා. ඒක තේරුම් ගත් අපේ ක්‍රීඩා ඇමතිවරයා අපේ කොළඹ කලාපයේ පාසල් මට්ටමින් සුවිශේෂ ක්‍රියාවලියන් හඳුන්වලා දුන්නා. එතුමාගේ අමාත්‍යාංශයේ ඒ ක්‍රියා පටිපාටියේ නැති වුණත් එතුමා පළමුවරට වෙනත් අමාත්‍යාංශයක කාර්යභාරයක් කළා. ඒකට අපේ ගෞරවය, ප්‍රණාමය එතුමාට පුද කරන්නට ඕනෑ. මම ආසන සංවිධායකත්වය දරන නැගෙනහිර කොළඹ ආසනයේ මහාමාත්‍ය විද්‍යාලයේ දීර්ඝ කාලයක් තිස්සේ අපට මායිම් තාප්පය හදා ගන්නට බැරි වුණා. ඒ ක්‍රීඩා පිට්ටනිය වටා තාප්පයක් නැතිකම නිසා රට සමාජ විරෝධී ක්‍රියා සිදු වුණා. නමුත් එක් උත්සව අවස්ථාවකදී ගරු උපාලි කොඩිකාර ගරු ඇමතිතුමාව ගෙනිහිල්ලා පෙන්නුවාම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සතියක් යන්න ඉස්සරවෙලා එතුමා ඒ සම්පූර්ණ පිට්ටනිය වටා තාප්පයක් ඉදි කරලා, ගේට්ටුවකුත් සවි කරලා අපේ ප්‍රදේශයේ තිබුණු පාසලට ක්‍රීඩා පිට්ටනිය ලබා දුන්නා. එහෙම ක්‍රීඩා ඇමතිවරයෙක් තමයි උපාලි කොඩිකාර ඇමතිතුමා.

එපමණක් නොවෙයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ප්‍රවාහන ක්ෂේත්‍රය ගැන විවේචන ඉදිරිපත් කරපු මන්ත්‍රීවරුන්ගේ සමහර අදහස් පිළිබඳව මට දැඩි කනගාටුවක් ඇති වෙනවා. අපට මතකයි අපි පාසල් යන කාලේ බස් රථ රියදුරා, බස් කොන්දොස්තර බුලත්විට කාලා කෙළ ගහන්නේ ජනේලයෙන් එළියට. බස් කොන්දොස්තර සිගරට් එක පත්තු කර ගෙන, ඒක බොන ගමන් තමයි ටිකට් එක දුන්නේ. බස් එක එළවන රියැදුරා සිගරට් එක අතේ තියාගෙන තමයි සුක්කානම අල්ලා ගෙන හිටියේ. ඒ යුගය වෙනස් කරන්නට උපාලි කොඩිකාර ගරු ඇමතිතුමාට හැකියාව ලැබුණාය කියන එක මේ අවස්ථාවේදී සඳහන් කරන්නට ඕනෑ. දැන් අපි ආඩම්බරයෙන් කියනවා. බස් කොන්දොස්තරලා ජනේලයෙන් එළියට බුලත් කෙළ ගහන්නේ නැහැ. දැන් සිගරට් එක බොන්නේ නැහැ. බස් කොන්දොස්තරලාව පුහුණු කළා. බස් රියැදුරන්ව පුහුණු කළා. මේ තමයි නිර්මාණශීලී ඇමතිවරයාගේ හැකියාව. මම හිතන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උපාලි කොඩිකාර ගරු අමැතිතුමාගේ සුවිශේෂ හැකියාවන් තවත් කියන්න තිබුණත් කාලය මදි කම නිසා ඒ කරුණු සියල්ල කෙටි කරලා, විශේෂයෙන්ම උපාලි කොඩිකාර ගරු ඇමතිතුමා නැවත සැරයක් ජනතාවට සේවය කරන්න පළාත් සභාව -

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

මහ ඇමති නේ? මොකටද ඇමතිකම්.

**ගරු දයාකාන්ත පෙරේරා**
Hon. Dayakantha Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හිතන්නේ අපේ උපාලි කොඩිකාර ගරු ඇමතිතුමාට ඇමතිකම ලැබුණා නම්,

අනික් ඒවා අපි දන්නේ නැහැ. අතිගරු ජනාධිපතිතුමා අතේ ඒක තිබෙන්නේ. ඒ නිසා එතුමා බලාපොරොත්තු වන ආකාරයට සියල්ල සිදු වේවා, ඉෂ්ට වේවායි කියමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 02.25]

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඉතාමත්ම සන්තෝෂ වෙනවා අද දිනයේදී අපි බොහොම ආදරය කරන ගරු අමාත්‍යවරයෙක් හැටියට කටයුතු කරන උපාලි කොඩිකාර ගරු අමාත්‍යතුමාගේ ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමූපකාර අමාත්‍යාංශය පිළිබඳව අද දිනයේ කථා කරන්න ලැබීම පිළිබඳව. එහිදී විශේෂයෙන්ම අපේ ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් ප්‍රකාශ කළා වාගේම සැබෑ ලෙසම ජනතාවට බොහොම සමීප වුණු, බස්නාහිර පළාත් සභාව තුළ සැබෑ වෙනසක් කරපු අමාත්‍යවරයෙක් හැටියටයි මම උපාලි කොඩිකාර ගරු අමාත්‍යතුමාව දකින්නේ. එහිදී විශේෂයෙන්ම අපි කථා කළ යුතුයි. ප්‍රවාහන අමාත්‍යාංශය පිළිබඳව. අද මේ වන විට ප්‍රවාහන අමාත්‍යාංශයේ අපේ ග්‍රාමීය ජනතාවට පහසුකම් ලබා දීමට අලුතෙන් බස් ඇති කරලා, ඒ ජනතාවට පහසුකම් ලබා දීමට එතුමා කටයුතු කළා. ඒ නිසා අද මම හිතන්නේ, පාසල් යන පුංචි දරුවාගේ ඉඳලා ජ්‍යෙෂ්ට පුරවැසියා දක්වාම එතුමාගේ මේ ප්‍රවාහන කටයුත්ත පිළිබඳව ඉතාමත්ම හොඳ ඇගයීමකට ලක් කළා.

ඒ නිසා එතුමාගේ එම වැඩ පිළිවෙළ සම්බන්ධයෙන් අපි ආඩම්බර වෙනවා. අපේ දයාකාන්ත ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ සමහර අවස්ථාවලදී අපි පුංචි පුංචි අඩුපාඩු දකිනවා. හැබැයි, අමාත්‍යතුමාගේ නොවෙයි. අද බසයට නැග්ගාට පස්සේ ක්‍රීඩාංගනයක තිබෙන දැවැන්ත මහා සංගීත ප්‍රසංගයක් වාගේ ප්‍රසංග පැවැත්වෙනවා. ඊළඟට අම්මයි, තාත්තායි, දරුවන්ටයි එකට බලාගෙන ඉන්න බැරි වීඩියෝ දර්ශන ඒ බස් එක තුළ ප්‍රචාරය වෙනවා. ඒ නිසා මම හිතනවා, මෙතෙක් කරපු වැඩ පිළිවෙළත් එක්ක එතුමාට මේ වෙනසත් ඇති කරන්න පුළුවන් වෙයි කියලා. මොකද, බසයට නැග්ගාට පස්සේ තමන්ගේ මානසික තත්ත්වය හොඳින් තියා ගන්න පුළුවන් ආකාරටය මේ බසය තුළ යම් යම් සම්පත් පාවිච්චි කිරීමේදී ඒ අය දැනුවත් කරනවා නම් ඉතාමත්ම හොඳයි කියලයි මගේ අදහස.

ඊළඟට මේ ප්‍රවාහන අමාත්‍යාංශයේ මෑත කාලයේදී මම දැක්ක දෙයක් තමයි මේ වෙනදාට වඩා විධිමත් භාවයක්, ක්‍රමවත් භාවයක් අපි දකිනවා. ඒකට ප්‍රධාන හේතුව තමයි වර්තමාන සභාපතිතුමා. අපි එතුමාගේ වැඩ පිළිවෙළ පිළිබඳව හොඳට අවධානය යොමු කර ගෙන හිටියා. ඒ අවස්ථාවේදී අපි දැක්කා බොහොම විධිමත් ආකාරයට එම අමාත්‍යාංශය සියලුම නිලධාරීන් එක්ක එකතු වෙලා අධිකාරිය මෙහෙයවනවා. ඒ නිසා මම හිතන්නේ, අමාත්‍යතුමා ඉතාමත්ම වේගවත්ව යම්කිසි සංවර්ධන කාර්යයක් කරන කොට නිලධාරීන් හැටියට එතුමාට දායකත්වය දෙනවා නම්, අපට මේ තිබෙන සුළු සුළු අඩුපාඩුත් හදා ගන්නත් පුළුවන් කියන එකයි මගේ අදහස.

ඊළඟට මම කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ සමූපකාර සංවර්ධනය පිළිබඳව. එහිදී මට මතක් වෙන්නේ සුනිල් පෙරේරා කියන මේ ගීතය.

සමූපකාරේ දැන් මීයෝ බෝ වෙලා.
හරි අපාරාදේ. ගමේ සමූපකාරේ බංකොලොත් වෙලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා බේරුවල සමූපකාර ක්ෂේත්‍රයට මහා දැවැන්ත කාර්යභාරයක් ඉටු කරපු කෙනෙක්. අද වන විට බේරුවල සමූපකාර පද්ධතිය මහා දැවැන්ත ලෙස කඩා වැටිලා තිබෙනවා. ඒකට යම් යම් හේතු තිබෙනවා. මම කියන්නේ නැහැ ඒ හේතු, නිලධාරීන්ගේ හේතු කියලා. යම් යම් දේශපාලන බලපෑම් උඩ අද බේරුවල සමූපකාරය සම්පූර්ණයෙන්ම ඇද වැටිලා තිබෙනවා. ඊළඟට වගකිවයුතු නිලධාරීන් නිසා අද බේරුවල සමූපකාර ඉස්කාගාරය කසිප්පු තිප්පලක් බවට පත් වෙලා තිබෙනවා. ඒක මම හිතන්නේ රහසක් නොවෙයි. එය රහසක් නොවෙයි. පැහැදිලිවම බස්නාහිර පළාතේ ඉන්න සියලු දෙනාම දන්නවා. ඒ සමූපකාර ඉස්කාගාරයෙන් නිෂ්පාදනය කරන්නේ මොනවාද කියලා. ඒ නිෂ්පාදනය කරන ස්ප්‍රීතුවලට පාවිච්චි කරන ද්‍රව්‍යයත් අපේ මේ බස්නාහිර පළාතේ ඉන්න ගොඩාක් දෙනෙක් දන්නවා. මොනවාද පාවිච්චි කරන්නේ කියලා. ඒ නිසා අද ඉතාමත්ම කනගාටු වෙනවා. ගිය පාරත් මම මේ ඉස්කාගාරය පිළිබඳව කථා කළා ඔබතුමන්ලාට මතක ඇති. මම ගරු අමාත්‍යතුමාගේ අවධානය යොමු කළා. මේක ලොකු අපරාධයක්. මේ බස්නාහිර පළාත් සභාවටම ලොකු අපකීර්තියක් මේ ඉස්කාගාරය කියලා. නමුත් ඒකට මේ වන විටත් කිසිදු පියවරක් ගැනීමට වගකිවයුතු

[ගරු පියල් නිශාන්ත]

නිලධාරීන්ට හැකියාව ලැබිලා නැහැ. ඒකට හේතුව? හිතා ගන්න මොකක්ද හේතුව කියලා. උඩ ඉඳලා පල්ලෙහාට යන කල් ඒ ඉස්කාගාරයේ ඉන්න නිලධාරීන් මුදලට යට වෙලා. පැහැදිලි ලෙසම මම කියනවා. මේ කටයුත්තේදී මුදලට යට වෙලා. ඒ කසිප්පුකාරයන්ට දායකත්වය දෙනවාය කියන එක මම මේ අවස්ථාවේදී වගකීමෙන් කියනවා.

ඊළඟට අපි විශේෂයෙන්ම මෙතුමාගේ අමාත්‍යාංශයේ සංස්කෘතික විෂය පැත්ත ගත්තත් අපට ආඩම්බර වෙන්න පුළුවන් මට්ටමක් තිබෙනවා. ඒ තමයි අද වන කොට සෑම ආගමික ජන කොට්ඨාශයකම අනන්‍යතාවය රැකෙන ආකාරයට උපාලි කොඩිකාර ගරු අමාත්‍යතුමා කටයුතු කරලා තිබෙනවා. ඒ නිසා අපි බේරුවල සහ කළුතර දිස්ත්‍රික්කයේ බෞද්ධයන් වෙනුවෙන් වෙනම වැඩ පිළිවෙළක්, ඒ වාගේම ඉස්ලාම් භක්තිකයන් වෙනුවෙන් වෙනම වැඩ පිළිවෙළක්, කිතුනු භක්තිකයන් වෙනුවෙන් වෙනම වැඩ පිළිවෙළක්, දමිළ ජනතාව වෙනුවෙන්, හින්දු භක්තියකයන් වෙනුවෙන් වෙනම වැඩ පිළිවෙළක් දියත් කරලා, විවිධ වැඩ සටහන් අමාදම් සර, ඊළඟට දීපවාලී වැඩ සටහන්, කිතුනු වැඩ සටහන්, ඉස්ලාමීය වැඩ සටහන් ක්‍රියාත්මක කරන්නට හැකියාව ලැබුණා. හැබැයි, මීට ප්‍රථම අපි මෙවැනි වැඩ සටහන් දැකලා නැහැ. හැමදාම ඒකාකාරී පළාත් සභාවක අමාත්‍යාංශයක් හැටියටයි මේ සංස්කෘතික අමාත්‍යාංශය අපි දැකලා තිබෙන්නේ. ඒ නිසා අපි එතුමාගේ ඒ වැඩ පිළිවෙළට අපේ ගෞරවනීය ප්‍රණාමය සමස්ත බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ අපේ ජනතාව වෙනුවෙන් පුද කර සිටිනවා.

ඒ වාගේම අපි ගත්තොත් දැන් මේ වන විට විහාරස්ථානවලට මේ අමාත්‍යාංශය හරහා ඉතා සුවිශේෂී වූ දායකත්වයක් ලබා දීලා තිබෙනවා. සෑම කටයුත්තකදීම. එතුමා එතුමාගේ වගකීම තේරුම් අරගෙන ඒ සියලු ආගමික ස්ථාවලට මුදල් ලබා දීලා ඒවා සංවර්ධනය කරන්නට අවශ්‍ය කරන කටයුතු ක්‍රියාත්මක කරලා තිබෙනවා. ඒ නිසා ගරු අමාත්‍යතුමාගේ අමාත්‍යාංශයට කථා කරන්න ලැබීම ගැන අද මම ඉතාමත්ම සන්තෝෂ වෙනවා. ඒ වාගේම ඒ අමාත්‍යාංශයේ තිබෙන අඩුපාඩු, අපේ සමහර නිලධාරීන් කරන අඩුපාඩුත් මඟ හරවා ගෙන කටයුතු කරන්න පුළුවන් නම් ඉතාමත්ම හොඳයි කියන එක කියා සිටිමින්, අවසාන වශයෙන් එතුමාගේ සියලු කටයුතු සාර්ථක වේවා කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 02.32]

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ඇමැතිතුමා ගැන අපේ දයාකාන්ත ගරු මන්ත්‍රීතුමා කථා කරපු ආකාරයට එතුමා පුහුණු කරලා තිබෙනවා, හඳහන් බලන්න. ඒ වාගේම හස්ත රේඛා ශාස්ත්‍රය. මම හිතන්නේ, කසාද බැඳීම ගැන උනන්දුවෙන් එතුමා පුරුදු පුහුණු කරන බව තමයි අපට පෙනෙන්නේ. මොකද, පොරොන්දන් බලන්නයි, එතුමා කසාද බැඳීම ගැනයි වැඩියෙන් හිතලා තිබෙන්නේ. ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපිට දීපු දෙයක් ගැන කියන්න පුළුවන්කමක් නැහැ. අඩුම ගණනේ එතුමාගේ අමාත්‍යාංශයෙන් අපට ටෙනිස් බෝලයක්වත් හම්බ වෙලා නැහැ. ඒ ගැන අපි කනගාටු වෙනවා. විශේෂයෙන්ම එතුමාගේ අමාත්‍යාංශය මහජනතාවට ඉතාම සමීප අමාත්‍යාංශ. සමූපකාර ව්‍යාපාරය මහජනතාවගේ මුදල් ඒකරාශියක් තුළින් බිහි වුණු ආයතනයක්. ඒ වාගේම ගමනා ගමනය මහජනතාවගේ ඉතාම සමීප අවශ්‍යතාවයක්. විශේෂයෙන් පුද්ගලික බස් ගැන කථා කළොත්, පුද්ගලික බස් සේවාව දවල්ට කොයිතරම් දිව්වත් රාත්‍රී කාලය තුළ පුද්ගලික බස් රථ දුවන්නේ නැහැ. ලංගම බස් විතරයි දුවන්නේ. ඒ නිසා සල්ලි හම්බ කරන වේලාවට විතරක් ඒ අය අවස්ථාවක් කර ගන්නවා. අනික් වේලාවට ලංකා ගමනා ගමන මණ්ඩලය නැත්නම් මහජනතාවට යන්න විධියක් නැහැ. අවශ්‍යතාවයට අනුව ඒ බස් යන්නෙත් නැහැ. මහජනතාවට ලොකු කරදයක් බවට පත් වෙනවා. මම ගරු ඇමැතිතුමාගේ අවධානය යොමු කරනවා, මේ බස් දුවන සෑම වාර ගණනාවටම සරිලන විධියට සමානුපාතික ක්‍රමයක් සකස් කරලා රාත්‍රී කාලයේදීත් පෞද්ගලික බස් යෙදීම ක්‍රියාත්මක කරනවා නම්, මහජනතාවට අවශ්‍ය වන සේවය ලැබෙනවා කියන එක.

ඒ වාගේම මම විශේෂයෙන් මතක් කරනවා, ඉංගිරිය - කොළඹ බස් සේවය. ඉංගිරියේ සිට එන බස් එකක් ඉංගිරියේ සිට කොළඹට එන්න පැය 2 1/2 ක් ගන්නවා. ඉංගිරියේ ජනතාව හොරණට ගිහිල්ලා, හොරණින් බස් එකක් අරන් කොළඹට යනවා. ඒ තත්ත්වයට පුරුදු වෙලා තිබෙනවා. මොකද හේතුව, බස් ඉතාම සෙමින් ධාවනය කරනවා. කාලය අපතේ යනවා. හේතුව මොකක්ද කියලා අපට තේරෙන්නේ නැහැ. බස් හිමියන් කියන්නේ, ආදායම් මදී නිසාය කියලයි. මම ගරු ඇමැතිතුමාගේ අවධානයට

යොමු කරනවා. ඉංගිරිය - කොළඹ බස් සේවය ඉක්මණින් ගමන් කරන විධියේ වැඩ පිළිවෙළක් සකස් කළොත් ඉංගිරියේ ජනතාවට ලොකු සහනයක් ලැබෙනවා කියලා.

සමූපකාරය ගැන විශේෂයෙන් කථා කරන්න ඕනෑ. සමූපකාර ව්‍යාපාරයට සම්බන්ධ වුණු කෙනෙක් හැටියට සමූපකාර ව්‍යාපාරය මහජනතාවගේ මුදල්වලින් යැපෙන, මහජන මුදල්වලින්ම බිහි වුණු දෙයක්. ග්‍රාමීය බැංකු අංශයත් අද පිරිහෙන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. සමූපකාරය දියුණු වුණා කිව්වාට පාලක මණ්ඩලය ගෙනියන වැඩ පිළිවෙළ තුළින් සමූපකාරය බිඳ වැටිලා තිබෙනවයි කියන එක මම මතක් කරන්න කැමැතියි. බේරුවල ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ,බේරුවල විතරක් නොවෙයි. ඉංගිරිය විවිධ සේවා සමූපකාර සමිතිය ගැන මම ගරු ඇමැතිතුමාගෙන් එක් අවස්ථාවක ප්‍රශ්නයක් ඇහුවා. එතුමා කිව්වා, 46(1) පරීක්ෂණයක් කරනවා කියලා. නමුත් ඒක සම්පූර්ණයෙන් යට ගහලා, ඔබතුමන් කොමසාරිස්තුමාට භාර දීලා, ඒ අය නිදොස් කළයි කියන එක සභාපතිතුමා ප්‍රකාශ කරලා තිබෙනවා. මම මේ අවස්ථාවේ යොමු කරනවා ඉංගිරිය ප්‍රාදේශීය සංවර්ධන කමිටු වාර්තාවක්. 2013.09.30 වැනිදා තිබුණු ඉංගිරිය ප්‍රාදේශීය සංවර්ධන කමිටු වාර්තාවේ සභාපතිවරයා කියනවා,

*"මෙම කරුණු සම්බන්ධයෙන් 2011 වසරේ ගරු පළාත් සභා මන්ත්‍රී පී.ඩී. අබේරත්න මන්ත්‍රීතුමා බස්නාහිර පළාත් සභාවේදී ප්‍රශ්න මතු කර තිබුණි. මේ පිළිබඳව පරීක්ෂණයක් කරන ලෙස විෂයය භාර අමාත්‍යවරයා විසින් සමූපකාර අමාත්‍යාංශය වෙත පැවරූ අතර මුදල් වංචාවක් සිදු වී ඇති බවට කරුණු අනාවරණය නොවුණි. ඒ අනුව අප සමූපකාර සමිතිය නිදොස් කොට නිදහස් වුණි."*

මෙහෙම කිව්වාට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ඇමැතිතුමා මට දුන්නු උත්තරේ තිබෙනවා, එක්කෝටි තිස් අට ලක්ෂයක් වංචා වුණාය කියලා පිළිගන්නවා කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාගේ මාර්ගයෙන් මම අහන්න කැමැතියි. එක්කෝටි තිස් අට ලක්ෂයකට වැඩි පාඩුවක් වුණාය කියලා ගරු ඇමැතිතුමා මේ සභාවේදී පිළිගත්තා නම් මේ අයව නිදොස් කොට නිදහස් කරන්නේ කොහොමද?

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

මම පරීක්ෂණයක් කළා.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

ඔබතුමා පරීක්ෂණයක් කළේ නැහැ. ඒක යට ගැහුවා. මම ඒකයි කියන්නේ. 46(1) යටතේ පරීක්ෂණයක් කරනවා කියලා පොරොන්දු වුණා. එහෙම කරන්නේ නැතිව යට ගැහුවා. මේ වාගේ අපරාධ කරන, මහජන මුදල් ගරාගෙන කන නිලධාරීන් ආරක්ෂා කරන්න ගරු ඇමැතිතුමා කටයුතු කර තිබෙනවාය කියලා මම මේ වේලාවේ චෝදනා කරනවා. එහෙම නැත්නම් මෙහෙම වෙන්න විධියක් නැහැ.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

පාඩු වුණා කියලාද ඔබතුමා කියන්නේ.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

පාඩු වුණා නොවෙයි. වංචා කළා. හොරකම් කළා.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

කාරණා දෙකක්. පාඩු වුණා කියන එකයි, වංචාව කියන එකයි කරුණු දෙකක්.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

පාඩු වුණා නොවෙයි. හොරකම් කළා. ගරු ඇමැතිතුමා පිළි අරගෙන තිබෙනවා. ඒ විතරක් නොවෙයි. ඒ අවස්ථාවේදී මේ අධ්‍යක්ෂක මණ්ඩලය මේ වංචාවට ලක් වුණු මිනිස්සුන්ගේ ඉල්ලා අස්වීම් පිළි අරගෙන තිබෙනවා. ඒ වගේ විශාල වංචාවක් කරලා තිබෙන අවස්ථාවක කොමසාරිස්තුමාගේ මාර්ගයෙන් ඒ අය නිදහස් වුණා නම් 46(1) යටතේ පරීක්ෂණයක් පැවැත් වූයේ නැත්තේ ඇයි කියලා මම අහන්න කැමැතියි. ඒ වාගේම මුදල් කෝටි ගණන් වංචා කරපු සමිතියට තව පෙට්‍රල් ෂෙඩ් එකක් කරන්න ඇනුමැතිය දීලා තිබෙනවා. පෙට්‍රල් ෂෙඩ් එකක්

[ගරු පී.ඩී. අබේරත්න]

හදන සැලැස්මට විතරක් දැනට ලක්ෂ 10 ක් වියදම් කරලා තිබෙනවා. සැලැස්ම හදන්න ලක්ෂ 10 ක්. මම අහන්න කැමැතියි, පෙට්‍රල් ෂෙඩ් එක හදන එකේ සැලැස්ම හදන්න ලක්ෂ 10 ක මුදලක් දීලා හදන්නේ කොහොමද කියලා. එතැනත් විශාල වංචාවක් කෙරීගෙන යනවා.

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ඒක තහනම් කළා. දැන් පරීක්ෂණයක් යනවා.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

දැන් ආයේ පටන් අරගෙන තිබෙනවා. 46(1) පරීක්ෂණය තිබුණේ නැත්තේ ඇයි කියලා ගරු ඇමැතිතුමාගෙන් මම අහන්න කැමැතියි. 46(1) පරීක්ෂණයක් කරනවා කියලා ඔබතුමා පොරොන්දු වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2011.10.25 වන දින අපේ විවාද වාර්තාව මම ඉදිරිපත් කරනවා. ගරු ඇමැතිතුමා කියනවා,

*" අදාළ බඩු අඩුවීම් සම්බන්ධව සියලු සේවකයින්ගේ වැඩ තහනම් කරන ලෙස 82 අංක 12 දරන පොදු දේපළ විෂයෙහි ලා සිදු කරනු ලබන වැරැදි පිළිබඳව පහත යටතේ කටයුතු කරන ලෙස සමිතියට උපදෙස් ලබා දී ඇති අතර, සමිතියේ අධ්‍යක්ෂක මණ්ඩලය ගෙන ඇති ක්‍රියාමාර්ග කෙරෙහි සෑහීමකට පත්වීමට නොහැකි බැවින් බස්නාහිර පළාත් සභාවේ 1998 අංක 03 දරන සමුපකාර ප්‍රඥප්තිය යටතේ 46(1) වගන්තිය යටතේ පරීක්ෂණයක් සිදු කර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට අපේක්ෂා කරමි."*

අද වනතුරුත් ඒ පරීක්ෂණය පවත්වලා නැහැ. ඇමැතිතුමා කොහොමද නැහැයි කියන්නේ. ඒ වාගේ වංචාකාරී අධ්‍යක්ෂක මණ්ඩලයකට මේ වාගේ පරීක්ෂණයක් පවත්වන්නේ නැත්නම් ඒ අය ආරක්ෂා කරනවා නම් මේ සමුපකාර ව්‍යාපාරය ඉදිරියට ගෙන යන්න බැහැයි කියන එක, මම විශේෂයෙන් මතක් කරන්න කැමැතියි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි සමුපකාර ව්‍යාපාරය මේ රටේ ජනතාවගේ මුදල්. මේ සමුපකාර සමිතිය සමුපකාර ග්‍රාමීය බැංකුවල සල්ලිත් අරගෙන තිබෙනවා. ඒවා අනික් ඒවාට ගෙවන්න පුළුවන්කමක් නැහැ. ග්‍රාමීය බැංකුවල මුදල් අනික් ඒවාට යොදවමින් අද විශාල ආගාධයකට වැටිලා තිබෙන සමිතියක්. ඉතින් මේ වාගේ තත්ත්වය යටතේ ඒ වාගේ සමුපකාර සමිතියක් ආරක්ෂා කරනවා නම් මම හිතන්නේ නැහැ, මේ සමුපකාර ව්‍යාපාරය ඉදිරියට ගෙන යන්න පුළුවන් වෙයි කියලා. සමුපකාර සමිතියකින් අපි අද බලාපොරොත්තු වන්නේ, ජනතාවට සහන මිලකට බඩු දෙන්න. අද තිබෙන තත්ත්වය අනුව විවෘත ආර්ථිකයත් එක්ක සමුපකාර සමිතිය අගාධයකට වැටුණොත් එහෙම කරන්න බැහැ. මොකද, සමුපකාර සමිතියෙන් ණයට අරගෙන පොළිය ගෙවන කොට ඒ පොළිය අල්ලන්නෙත් මහජනතාවගෙන්. එතකොට සමුපකාරයෙන් බඩු වැඩි මිලට ගන්න වෙනවා. පොළියට අමතරව අධ්‍යක්ෂවරු ගිහිල්ලා කොමිස් ගහනවා. ඒවා ඔක්කෝම එකතු වෙලා ආපුවාම පුද්ගලික අංශයේ කඩේට වැඩිය සමුපකාරයේ බඩු මිල වැඩි වෙනවා. ඒ තත්ත්වය පාලනය කරගන්න හොඳ අධ්‍යක්ෂක මණ්ඩලයක් පත් කර ගත යුතුයි.

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ඔබතුමා නැහැ කියනවා නේ? මේ තිබෙන්නේ, 46(1) පරීක්ෂණය. මම දඩුවම් කරන්න තීරණය කරලා පරීක්ෂණය ඉවර කරලා තිබෙනවා. දන්නේ නැතිව කථා කරන්න එපා.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

ඔබතුමා දඩුවම් කළා කියනවා. සභාපතිතුමා නිදොස් වුණා කියනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ඇමැතිතුමා කියනවා දඩුවම් කරන්න නියම කළා කියලා. සභාපතිතුමා කියනවා නිදොස් කොට නිදහස් වුණායි කියලා.

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

සභාපතිතුමා වැඩක් නැහැ නේ?

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

මේ මම ඉදිරිපත් කරන්නේ ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සම්බන්ධීකරණ රැස්වීම් වාර්තාව. මට සභාගත කරන්න පුළුවන්.

[සභාවේ ඝෝෂා]

ගරු ඇමැතිතුමා දැන් මෙතැන කිව්වාට අපට දැනගන්න වෙලා නැහැ. 46(1) පරීක්ෂණයක් කළා කියලා.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු මන්ත්‍රීතුමා කවුද ඔය කියන්නේ?

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

මේ කියන්නේ සභාපතිතුමා.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

වැරැදිකාරයා කියන්නේ නැහැ නේ කවදාවත් වැරැද්දක් කළා කියලා.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

දඬුවම් නියම කළා කියලා මෙතුමා කියනවා.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

දඬුවම් කරන එක කියන්නේ ඇමැතිවරයා හෝ කොමසාරිස්වරයා. සභාපතිවරයා කියන්නේ නැහැ නේ මට දඬුවම් කළා කියලා.

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ප්‍රාදේශීය සංවර්ධන සමිතියට ඕනෑ දෙයක් කියන්න පුළුවන්.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

එහෙමනම් වරදක් කළා නම්, අධ්‍යක්ෂක මණ්ඩලය අස් කරන්න ඕනෑ නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපිත් සමූපකාරයේ හිටපු අය. සභාපතිවරයෙක් වශයෙන් මමත් කටයුතු කරලා තිබෙනවා. 46(1) යටතේ වරදකරුවෙක් වුණා නම් අධ්‍යක්ෂක මණ්ඩලය ක්‍රියාකාරී වෙන්න බැහැ. අයින් කරන්න ඕනෑ. අද වනතුරු ඒ අධ්‍යක්ෂක මණ්ඩලය අයින් කරලා නැහැ. එහෙම වුණා නම් ගෙදර. ආයේ තියාගන්න බැහැ. මම අහන්න කැමැතියි, වැරැදිකරුවන් බවට පත් වෙලා දඬුවම් කරන්න නියම වුණා නම් මේ අධ්‍යක්ෂක මණ්ඩලය තවත් ක්‍රියාත්මක වෙන්නේ කොහොමද කියලා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

හොඳයි. කථාව අවසන් කරන්න.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

ඒ නිසා සමූපකාර ව්‍යාපාරය පිළිබඳව මීට වඩා වගකීමෙන් වැඩ නොකළොත් -

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ඔබතුමා මේ සභාවේ ඉඳලත් සමූපකාර ප්‍රඥප්තිය කියවලා නැහැ නේ?

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු ඇමැතිතුමා, ඒක පිළිතුරු කථාවේදී සඳහන් කරන්න.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම දන්න විධියට නම් සමූපකාරයේ අධ්‍යක්ෂක මණ්ඩලය වැරැදිකාරයෝ වුණොත් පවත්වාගෙන යන්න පුළුවන්කමක් නැහැ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රිතුමා කාලය අවසන්. වාඩි වෙන්න. මම වැඩිපුර විනාඩි 03 ක් ලබා දීලා තිබෙනවා.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

ඔබතුමාට බොහොම ස්තුතියි. මම ගරු ඇමැතිතුමාට ප්‍රාර්ථනා කරනවා, ඉදිරි කාලයේදී මහ ඇමැතිකම ලැබේවා කියලා.

[අ.භා. 02.46]

**ගරු ලාල් කුලරත්න**
Hon. Lal Kularathne

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ප්‍රවාහන, ක්‍රීඩා හා සංස්කෘතික ගරු ඇමැතිතුමාගේ අයවැය විවාදයට සම්බන්ධ

[ගරු ලාල් කුලරත්න]

වීමට අවකාශ ලබා දීම සම්බන්ධයෙන් මුලින්ම ස්තුතිවන්ත වෙනවා. මම අනික් අමාත්‍යාංශ කෙසේ වෙතත්, මට අදාළ අමාත්‍යාංශයක් වන සංස්කෘතික අමාත්‍යාංශය සම්බන්ධයෙන් කථා කිරීමට තමයි මම වැඩි කාලයක් යොදවන්නේ. ඒකට හේතුවක් තිබෙනවා. මම මේ සභාවට පැමිණි දවසේ සිට හැම අයවැය විවාදයකදීම කියපු දෙයක් තමයි රටේ කොයිතරම් භෞතික දියුණුවක් සිද්ධ වුණත් ඒ භෞතික දියුණුවට සාපේක්ෂව ආධ්‍යාත්මික දියුණුවක් සිද්ධ වුණේ නැත්නම් ඒ භෞතික දියුණුවෙන් පළක් නැහැයි කියලා. එතකොට මේ අධ්‍යාත්මික දියුණුව ලබා ගන්නට නම් ක්‍රම දෙකක් තිබෙනවා. එකක් තමයි මට එහා පැත්තේ වැඩ සිටින අපේ ගෞරවනීය ස්වාමීන් වහන්සේලා ඇතුළු අනිකුත් ආගමික ධර්මතාවයන් අනුගමනය කිරීම. අනික් කාරණය තමයි සාහිත්‍ය කලාව ආශ්‍රය කරමින් රස වින්දනාත්මක මනුස්සයෙක් බිහි කිරීම. රසිකයෙක් බිහි කිරීම. සියුම් සංවේදී මනුස්සයෙක් බිහි කිරීම. දැන් ඒ කාරණය පදනම් කරගෙන මෙතුමාගේ අමාත්‍යාංශයෙන් යෝජනා කරලා තිබෙනවා. ක්‍රියාත්මක කරලත් තිබෙනවා. කලා ආලෝකය දැල්වීම කියලා. ලක්ෂ 25 ක් වෙන් කරලා තිබෙනවා. තව එකක්, නාට්‍ය හා රංග කලාව දියුණු කිරීමට ලක්ෂ 10 ක් වෙන් කරලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම පෞද්ගලිකවත් විශ්වාස කරනවා. අනික් අමාත්‍යාංශ සියල්ලේම වියදමට වැඩිය මෙන්න මේ සොච්චම් මුදල එක්තරා කාරණාවක් නිසා මම අගය කරනවා.

ඒකට හේතුව තමයි මහාචාර්ය සරත්චන්ද්‍රතුමා දැනට අවුරුදු 50 කට කලින් පොතක් ලිව්වා, කල්පනා ලෝකය කියලා. ඒ කල්පනා ලෝකය පොතේ එතුමා කියනවා, මනුස්සයෙක් හදන්න පුළුවන් ක්‍රම තුනක් තිබෙනවා. එකක් තමයි අණ කිරීම. එකක් තමයි බණ කීම. අනික් එක තමයි ඇහවීම. අණ කිරීම අයිති වන්නේ, වෙනත් අමාත්‍යාංශ කිහිපයකට. අධිකරණයට. පොලීසියට. හමුදාවට. බණ කීම සහ ඇහවීම කියන කාරණා දෙක අයිති වන්නේ අපේ උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමාගේ සංස්කෘතික අමාත්‍යාංශයට. දැන් මේකට සම්බන්ධ කථාවක් තියෙනවා. 1979 හිටපු ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා මාතර සාහිත්‍ය උත්සවයකට ගිහිල්ලා, එතුමා සාහිත්‍ය උත්සවයේදී ඇහුවා, සාහිත්‍ය කොරලා වාහන කට්ටක් ගන්න පුළුවන්ද? සාහිත්‍ය කොරලා කන්න පුළුවන්ද? කියලා. එදා ඒ කථාව අහපු සරත්චන්ද්‍ර මහත්මයා ප්‍රමුඛ පඬිවරු කිව්වා, තව අවුරුදු ගණනාවක් යන කොට මේ සාහිත්‍ය කලාව පාසල්වලින් අයින් කිරීමේ බේදවාචකය දැනගන්න හම්බ වෙනවා කියලා. දැනට අවුරුදු 35 කට කලින් මෙය කිව්වේ. අද ඒවායේ ප්‍රතිඵල තිබෙනවා.

තමුන්නාන්සේලා ඊයේ පත්තරේ බලන්න. ලංකාවේ මේ මාස 11 ට ස්ත්‍රී දූෂණ දෙදහස් හත්සිය ගණනක්, මංකොල්ලකෑම් පන්දහස් පන්සියය ගණනක් සිදු වෙලා තිබෙනවා. අපි විශ්වාස කරන්නේ, මේ සාහිත්‍ය කලාවෙන් මනුස්සයා ඈත් කිරීමේ ප්‍රතිඵල තමයි මේ සිද්ධ වන්නේ කියලා. දැන් මම කිව්වා වාගේ මෙතුමාගේ අමාත්‍යාංශයෙන් නාට්‍ය කලාව දියුණු කරන්න, සාහිත්‍ය කලාව දියුණු කරන්න ඒ වාගේ දේවල් කරනකොට අර අඳුරට සාප නොකර පහනක් දැල්ලුවා වාගේ එතුමා ඒ කාර්යය කරනවා.

දැන් අපි දන්නවා, ආගමික පැත්තෙන් ගත්තාම, අපේ පැත්තෙන් ගත්තාම බුදුරජාණන් වහන්සේ අංගුලිමාල මෙල්ල කරන්න කඩු අරගෙන ගියේ නැහැ. හෙල්ල අරගෙන ගියේ නැහැ. භාෂාව පාවිච්චි කළේ. ඒ භාෂාව පාවිච්චි කරලා තමයි ඒ මිනීමරුවාව මෙල්ල කරලා රහතන් වහන්සේ නමක් බවට පත් කළේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඉතාම භයානක වෙනම සංස්කෘතියක් ඇති වෙලා තිබෙනවා. ඊයේ පෙරෙයිදා මාතර පැත්තේ මිනීමරුවෙක් කියලා සැක කරන එක්තරා පුද්ගලයෙක් පොලිස් වෙඩි පහරින් මැරුණා. ඒ පැත්තේ මිනිස්සු මොකද කළේ? රතිඤ්ඤා පත්තු කරලා කිරිබත් කෑවා. ඒ පැත්තේ ඒ කරදර විඳපු මනුස්සයෝ නම් සන්තෝෂ වෙන්න ඇති. නමුත් අපි දකින්නේ, බුදුරජාණන් වහන්සේ දීපු ආදර්ශය ඕනෑම මිනීමරුවෙක් වුණත් යහපත් සමාජයකට ගන්න පුළුවන් කියලා පෙන්වපු පූර්වාදර්ශයයි. අද ඒක නැති කරලා තිබෙනවා. මේවා දකින බාල පරම්පරාව හිතනවා, මිනී මැරුමට සැක කළ පුද්ගලයෙක් ගහලා මරන්න ඕනෑ. මේක පටන් ගත්තේ අද ඊයේ නොවෙයි. ප්‍රේමදාස ජනාධිපතිතුමා මරපු වෙලාවේ රතිඤ්ඤා පත්තු කළා. ඊළඟට ප්‍රභාකරන් මරපු වෙලාවේ රතිඤ්ඤා පත්තු කරලා කිරිබත් කෑවා. දැන් ඒකේ දිගුව ඇවිල්ලා තිබෙනවා. දැන් මිනී මරුවෙක් මැරුවාම රතිඤ්ඤා පත්තු කරලා කිරිබත් කන තත්ත්වයට පත් කරලා තිබෙනවා. මේවා දකින බාල පරම්පරාව හිතන්නේ මේක තමයි ක්‍රමය. මේවා වැරදි සංස්කෘති. අද වනකොට නීත්‍යානුකූලව මිනී මැරුවයි කියලා ඔප්පු වෙලා මරණ දණ්ඩනය නියම වුණු

අය හිරගෙදර කකා බිබී ඉන්න කොට සැකකරුවන් මරනවා. ජනතාව කිරිබත් කනවා. අපි උදාහරණයක් ගනිමු. මේ සභාවේම ඉන්න මන්ත්‍රීවරයෙක් මිනී මැරුමකට සැක හිතනවා. පොලීසියෙන් අල්ලන්න කියලා නියම කරනවා. අල්ලන්න හම්බ වෙන්නේ නැහැ. ඇයි? ගමේ මිනිස්සු වට කරලා මරනවා. මේක වැරැදි සංස්කෘතියක්. ආගම පැත්තෙන් බැලුවත්, සදාචාරය පැත්තෙන් බැලුවත් මේක වැරැදිම සංස්කෘතියක්. ඒක නිසයි මම කියන්නේ, මම මුලින් කිව්වා වාගේ අණ කිරීම කියන එක අයිති වෙන්නේ වෙන වෙන අමාත්‍යාංශවලට. අණ කරලාවත්, උගන්වලවත් මේක දියුණු කරන්න හම්බ වෙන්නේ නැහැ. දැන් සමහරවිට කල්පනා කරන්න පුළුවන් මේක අයිති වන්නේ අධිකරණ අමාත්‍යාංශයට. එහෙම නැත්නම් ආරක්ෂක අමාත්‍යාංශයට. නැහැ. ඒවා අයිති වෙන්නේ දඬුවම් කිරීමට විතරයි. නමුත් මනුස්සයෙක් හදන එක අයිති වෙන්නේ සංස්කෘතික අමාත්‍යාංශයට. දැන් තව කෙනෙක් කියන්න පුළුවන් ඒක අධ්‍යාපන අමාත්‍යාංශයට අයිති වෙන එකක් නේද කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි විශ්වාස කරන්නේ එහෙම නොවෙයි. උගත්කම පමණක් තිබිලා මේ රටේ මනුස්සයන් හදන්න බැහැ.

ඔබතුමාට මතක ඇති. ආදායම් බදු දෙපාර්තමේන්තුවේ වැට් බදු වංචාවක් සිදු වුණා. ලංකාවේ දේශීය ආදායමෙන් භාගයක් හොරකම් කළා. ඒ හොරකම් කළේ ගමේ දුප්පත්, අහිංසක මෝඩ මනුස්සයෝද? නැහැ. උගත්තු හොරකම් කළේ. ඒ නිසා පොත පතේ අධ්‍යාපනය විතරක් ගැළපෙන්නේ නැති බව අද වන කොට ඔප්පු වෙලා හමාරයි. ඒ නිසා මේ උගත්කමත් එක්කම සංස්කෘතික පැත්තෙන් සාහිත්‍ය කලාවට මනුස්සයෝ යොමු කරලා, දහම් පාසලට යොමු කරලා මනුස්සයෝ සංවේදී මනුස්සයෝ බවට පත් කරන්න ඕනෑ.

ගරු ස්වාමීන් වහන්සේ දන්නවා. අද ටියුෂන් පන්ති නිසා ඉරිදා දහම් පාසල්වල ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා. අපි කොච්චර කිව්වත් දෙමව්පියන් කල්පනා කරන්නේ, විභාගයට ළමයා යවලා පාස් කරන්න මිසක් විභාගය පාස් වුණු ළමයා මනුස්සයෙක් කරන්න නොවෙයි. තමුන්නාන්සේලාට මම මීට කලිනුත් කියලා ඇති. අද ඉන්දියාවේ ගර්භනී මාතාවකට තමාගේ දරුවා හම්බ වෙන්න ගිහිල්ලා සැත්කමක් කරන්න භයයි. ඇයි? දරුවා අරන් එනකොට වකුගඩුවකුත් නැහැ. කපාගෙන. ඒවා කරන්නේ මෝඩයෝ නොවෙයි. ඇටෙන්ඩන්ලා නොවෙයි. වෛද්‍යවරු. ඉතින් මේක නිසා මම කියන්නේ, මේ සංස්කෘතික අමාත්‍යාංශයට ඉතා බරපතළ වගකීම් රාශියක් තිබෙනවා. නමුත් අවාසනාවකට අපේ රටේ මහ ආණ්ඩුවෙත් එකයි. අනික් හැම පළාත් සභාවමත් එකයි. අඩුවෙන්ම අවධානය යොමු කරන්නේ, සංස්කෘතික අමාත්‍යාංශයට. ඒ අමාත්‍යාංශයට අඩුවෙන් වෙන් කරන මුදලින් උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමා මම කියපු සාහිත්‍ය කලාවට තමන්ට හැකි අයුරින් උපකාර කරනවා. මම අගය කරන්නේ ඒකයි. අනික් අමාත්‍යාංශවල සියලු වියදම්වලට වැඩිය. ඊයේ පත්තරේ තිබුණු ප්‍රතිඵලය මොකක්ද? මම අර කිව්වා වාගේ. ඒ ප්‍රතිඵල අවම කරන්න නම් මේ සාහිත්‍ය කලාවෙන් රස විඳින්න පුරුදු වුණු, රසවින්දනාත්මක මනුස්සයෙක්, සංවේදී මනුස්සයෙක්, නිවුණු මනුස්සයෙක් බිහි කරන්න ඕනෑ. අන්න ඒකට අපේ ගරු ඇමැතිතුමා දක්වන උනන්දුව, දක්වන කැපවීම මම අගය කරන්නේ ඒකයි. නිකන් මූනිච්චාවට නොවෙයි. එතුමා සමඟ අපි වැඩ කළා, ගම්පහ, කළුතර, කොළඹ දිස්ත්‍රික්කවල. නාට්‍ය වැඩමුළු කෙරුවා. එකම දෙයක් තිබෙනවා. මේවා මහා දේවල් නොවෙයි. අඳුරට සාප නොකර පහනක් දැල්වීම පමණයි. අන්න ඒ පහන දැල්වීමට මෙතුමාට තව තවත් ශක්තිය, ධෛර්යය ලැබේවා කියලා ප්‍රාර්ථනය කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

පූජ්‍ය තෙඹුවන පියනන්ද ස්වාමීන් වහන්සේ. ඔබ වහන්සේට විනාඩි 05 ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 02.55]

**පූජ්‍ය ගරු තෙඹුවන පියනන්ද ස්ථවිර**
Hon. Revrn. Thebuwana Piyannada Thero

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළමු කොටම කනගාටුව ප්‍රකාශ කරනවා. පළාත් සභාව නියෝජනය කරන එකම භික්ෂූන් වහන්සේ. සංස්කෘතික අමාත්‍යාංශය යටතේ කථා කිරීම පිළිබඳවට අඩු කාලයක් ලබා දීම පිළිබඳව. ඔබතුමාට චෝදනා නොවුණත්, මම කනගාටුව ප්‍රකාශ කරනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මගේ කාලයෙන් විනාඩි 02 ක් එකතු කරලා ලබා දෙන්නම්.

**පූජ්‍ය ගරු තෙඹුවන පියනන්ද ස්ථවිර**
Hon. Revrn. Thebuwana Piyannada Thero

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හිතන්නේ, අපේ උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමාගේ අමාත්‍යාංශය පිළිබඳව හුඟාක් අදහස් දැන් ප්‍රකාශ වුණා. භික්ෂූන් වහන්සේ කෙනෙක් හැටියට මම හිතන්නේ, මේ අමාත්‍යාංශයේ හුඟාක් කොටස් තිබෙනවා. මම විශේෂ අවධානය යොමු කරන්න බලාපොරොත්තු වන්නේ සංස්කෘතික අමාත්‍යාංශය පිළිබඳව. අපේ ලාල් කුලරත්න ගරු මන්ත්‍රීතුමා මේ පිළිබඳව අදහස් හුඟක් ප්‍රකාශ කළා. ඊට අදාළවම කථා කරනකොට මට මතක් වුණා, අපේ සංස්කෘතික සාහිත්‍යයේ තිබෙනවා ඉතාමත්ම හොඳ කියමනක්.

සාහිත්‍ය සංගීත කලා විහීනා
සමාන මේ තත්
පසුබිඃ නරා නාම්

කියලා. එහි තේරුම, , කලාව, සංගීතය කියන මේ අංශවලින් වියුක්ත වුණොත්, තොර මනුස්සයෙක් වුණොත් ඒ මනුස්සයා සමාන කරන්න වෙන්නේ පසුබිඃ නරා නාම්. පශු කියලා කියන්නේ තිරිසනාට. තිරිසන් සතෙකුටයි කියලා. එතකොට මිනිහා මිනිහෙක් වෙන්න නම් ඒ මිනිහා සාහිත්‍ය, සංගීතය, කලාව රස විඳින කෙනෙක්, ඒක ආස්වාදනය කරන්න පුළුවන් කෙනෙක් බවට පත් විය යුතුයි කියන එකයි ඒකේ තේරුම. එතකොට සංස්කෘතික අමාත්‍යාංශයට මෙන්න මේ ක්ෂේත්‍රයේදී ලොකු වගකීමක් තිබෙනවා, සමාජයක් හදන්න. මම හිතන්නේ, මෙතුමා කියපු කාරණය අපට පුන පුනා කියන්න වෙනවා.

අපි ජීවත් වන්නේ, අපේ රට යන්නේ පශ්චාත් යුධ සමයක. අවුරුදු 30 ක යුද්ධයක් පැවැතිලා තවම අවුරුදු 04 යි ගෙවිලා තිබෙන්නේ. ලෝකයේ යුද්ධය පැවැතුණු රටවල්වල පශ්චාත් යුධ සමය මම හිතන්නේ, හුඟාක් සංස්කෘතික අංශයෙන්, සදාචාරය පිළිබඳ අංශයෙන් හුඟාක් දුරට පහත වැටුණු අවස්ථා අපි දකිනවා. අපේ රටේ වුණත් මම හිතන්නේ, අපේ මිනිස්සුන්ගේ හදවත් දරුණු වෙලා තිබෙනවා. කුරිරු වෙලා තිබෙනවා. දැන් උදාහරණයකට ගත්තොත්, අපි ඉස්සර ගමක කවුරු හරි මිනියක් මරලා දාලා තිබෙනවා කිව්වොත්, පිහියෙන් ඇණලා හරි, මොකක් හරි කරලා මිනියක් මරලා තිබෙනවා කිව්වොත් මේක මාස ගණනක් කථා කරන මාතෘකාවක් බවට පත් වෙනවා. දැනට අවුරුදු 40 කට, 50 කට උඩදී අපේ රටේ තිබුණා, කවි කොළේ ගහලා මිනිස්සු විකුණනවා. එතකොට මේක හැමෝම කථා කරන දෙයක්. මහත් භීතියෙන් ඇළලිලා. අහල ගම් හතක මිනිස්සු මේ මළ මිනිය බලන්න එනවා. නමුත් අද අපි පදිංචි වෙලා ඉන්න තැනට කිලෝ මීටර් භාගයක් එහායින් මිනියක් මරලා දාලා තිබෙනවා කියලා කිව්වත්, ආ.. ඇත්තද? කවුද? කියලා අහනවා මිසක් ඒක බලන්න යන කෙනෙක් නැහැ. ඒක මහ අමුතු දෙයක් නොවෙයි. මොකද, අර පසුගිය යුධ සමය තුළ අපි මිනී කඳු දැකලා, බෝම්බ පත්තු වුණු තැන්වල මිනී දැකලා, දැකලා දැන් අපට මේක හුරු වෙලා . ඒ කියන්නේ, අපේ හදවත් දරුණු වෙලා. එදා මිනියක් ගැන ඇහුවාම, මිනී මැරුමක් ගැන ඇහුවාම සංවේදී වුණු අපේ හදවත් අද සංවේදී වෙන්නේ නැහැ. ඒකේ තේරුම අපේ හදවත් දරුණු වෙලා. අවුරුදු 30 ක් යුද්ධයක් පැවැතුණු රටක ඒක ස්වභාවිකයි. ඒ නිසා පශ්චාත් යුධ සමයක පවතින රටක මෙන්න මේ සංස්කෘතියෙන්, මෙන්න මේ තත්ත්වයෙන් මිදිලා සංවේදී හදවත් ඇත්තවුන් පත් කරන්නට පුළුවන් වන විධියේ වැඩ සටහන්, සංස්කෘතික අංශයෙන් අනිවාර්යයෙන් ක්‍රියාත්මක විය යුතුමයි. ඉතින් ඒ නිසා මම හිතන්නේ, මේ වකවානුව තුළ විශේෂ අභියෝගයක් තිබෙනවා, රටක සංස්කෘතික අමාත්‍යාංශයට. පළාත හැටියට ගත්තාම අපේ පළාතේ සංස්කෘතික අමාත්‍යාංශයට. මම හිතන්නේ, ඒ අභියෝගය ජයග්‍රහණය කරන්න අපේ උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමා සැලකිය යුතු වැඩ කොටසක් කරලා තිබෙනවා කියන එක භික්ෂූන් වහන්සේ නමක් හැටියට මම පිළිගන්නවා. ආගමික අංශයට මිනිස්සු නැඹුරු කරන්න, මිනිස්සුන්ගේ ආගමික අවශ්‍යතාවයන් සම්පූර්ණ කරන්න පුළුවන්කම ඇති වන්නට ඕනෑ, අර දරුණු හදවත් නිවන්න නම්. ඒ සඳහා මම හිතන්නේ, අපේ ගරු ඇමැතිතුමා ශාසනික පැත්තට හුඟාක් ලොකු - හැම ආගමකටම ලොකු ශක්තියක් ලබා දීලා තිබෙනවා.

බෞද්ධාගමික පැත්තෙන් විශේෂයෙන් මම මතක් කරන්නට ඕනෑ, ශාසනාරක්ෂක මණ්ඩලවලට ලබා දීලා තිබෙන සහයෝගය. මම දොඩංගොඩ ශාසනාරක්ෂක මණ්ඩලයේ සභාපතිවරයා හැටියට, ලේකම්වරයා හැටියට අවුරුදු 15 කට වැඩි කාලයක් කටයුතු කරලා තමයි මේ පළාත් සභාවට පත් වුණේ. ඒ නිසා මෙහි කටයුතු කරගෙන යනකොට තිබෙන අපහසුතා අපි දන්නවා. විශේෂයෙන්ම අපේ ගරු ඇමැතිතුමා පත් වුණාට පස්සේ, සිසු නිපුණතා ඇගයීම් ශාසනාරක්ෂක මණ්ඩල මට්ටමෙන් පවත්වන්න එතුමා කටයුතු කරලා තිබෙනවා. වාර්ෂිකව

මෙය පවත්වනවා. මෙය පවත්වන්න ගියාම බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවෙන් ඊට සරිලන මුදලක් ඇත්තටම ලැබෙන්නේ නැහැ. ඒ නිසා බස්නාහිර පළාත් සංස්කෘතික අමාත්‍යාංශයෙන් රුපියල් 25,000/- ක මුදලක් ශාසනාරක්ෂක මණ්ඩලයට ලබා දෙනවා. ඒ එන නිපුණතා ඇගයීම් පවත්වන්න අනික් දහම් පාසල්වලින් එන අය නඩත්තු කරන්න. ඒ අයට අහාරපාන දෙන්න. ලිපි ලේඛන ටික සකස් කරගන්න. ශාසනාරක්ෂක මණ්ඩලවල ලේඛකාධිකාරී හාමුදුරුවරු මට විශේෂයෙන් මතක් කළා මේ වැය ශිර්ෂයේදී ඒක ඉතාම ඇගයීමෙන් කථා කරන්න කියලා. ඒ සඳහා රුපියල් දහතුන් ලක්ෂ පනස් දාහක් ගරු ඇමැතිතුමා මේ කාලය තුළ වියදම් කරලා තිබෙනවා.

ඒ වාගේම තමයි දහම් පාසල් ගොඩනැගිලි. අපි දන්නවා, ගුණ නැණ සපිරි දරුවන් ගැන අපි කථා කරන්නේ. පාසලෙන් නැණ ලබා දෙන අතරේ ගුණ ලබා දෙන්න, ගුණවත් දරුවෙක් බිහි කරන්න දහම් පාසල අපි උපයෝගී කර ගන්නේ. ඒ නිසා දහම් පාසල් අධ්‍යාපනය සඳහා, විශේෂයෙන්ම දහම් පාසල්වල ඉඩ නැති තැන්වලට දහම් පාසල් ගොඩනැගිලි ඉදි කිරීම සඳහා විශේෂ ප්‍රතිපාදන ලබා දෙමින් මේ වර්ෂය තුළ පමණක් මම හිතන්නේ, ලක්ෂ 29 කට වැඩි ප්‍රමාණයක් ලබා දීලා විශාල අනුග්‍රහයක් දහම් පාසල් ක්ෂේත්‍රයට ලබා දීලා තිබෙනවා. ඒ වාගේම සසුනඹරට සවිය මේ වැඩ සටහන යටතේ මම හිතන්නේ අපි බෞද්ධාගමික පැත්තෙන් ගත්තොත් විහාරස්ථාන රාශියකට එතුමාගේ අනුග්‍රහය ලබා දීලා තිබෙනවා, විහාරස්ථාන වැඩි දියුණු කර ගැනීම සඳහා. මම හිතන්නේ, මේ වසරේ මිලියන 20 කට වැඩි මුදලක් ඒ සසුනඹරට සවිය වැඩ සටහන සඳහා මේ අමාත්‍යාංශයෙන් වියදම් කරලා තිබෙනවා.

ඒ වාගේම අපේ දයාකාන්ත ගරු මන්ත්‍රීතුමා මංගල පෝරුවේ චාරිත්‍ර පිළිබඳව ඇගයීමෙන් කථා කළා. දැනට අනූ දෙනෙකුගේ කණ්ඩායමක් මේ සඳහා පුහුණු කරලා තිබෙනවා. අභාවයට යමින් තිබුණු අංශයක්.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබ වහන්සේට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**පූජ්‍ය ගරු තෙඹුවන පියනන්ද ස්ථවිර**
Hon. Revrn. Thebuwana Piyannada Thero

සමහරවිට පැවැතුණු කාලයේ තත්ත්වය අනුව අපට හිතාගන්න බැරි වුණා, ඉදිරි කාලයේදී මේවා කරන්න කෙනෙක් ඇති වෙයිද කියලා. ඒ නිසා කාලීන අවශ්‍යතාවයක් සම්පූර්ණ කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විනාඩියක් දෙන්න. මට ගරු ඇමැතිතුමාට විශේෂයෙන්ම කාරණා දෙකක් පිළිබඳව යෝජනා කරන්න තිබෙනවා. එකක් තමයි ලබන වර්ෂයේදී දහම් පාසල් ගුරු පුහුණුව සඳහා විශේෂ අවධානයක් යොමු කරන්න කියන එක. මොකද, දහම් පාසල කියලා කියන්නේ, හැම තිස්සේම ගුරුවරු අලුත් වන තැනක්. මොකද, ටික කාලයක් වැඩ කරලා ගුරුවරු ඉවත් වෙනවා. දහම් පාසල පවත්වාගෙන යන්න අලුතෙන් ගුරුවරු ගන්න වෙනවා. ඒ නිසා හැම අවුරුද්දක්ම දහම් පාසලකට අලුත් ගුරුවරු අඩුම ගණනේ තුන් හතර දෙනෙක් එකතු වෙනවා. ඒ අයට පුහුණුවක් නැති වුණාම උගන්වන්න හරි අමාරුයි. ඒ නිසා සෑම වර්ෂයකම හැම ශාසනාරක්ෂක මණ්ඩලයකට අඩුම ගණනේ එක් වතාවක් ගුරු පුහුණු වැඩ සටහනක් පැවැත්වීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා දෙන්න කියන කාරණය මම විශේෂයෙන්ම ගරු ඇමැතිතුමාට යෝජනා කරනවා.

ඒ වාගේම සංගීත ක්ෂේත්‍රය ගත්තාම, ඔබතුමා කලායතනවලට සංගීත භාණ්ඩ ලබා දීමේ වැඩ පිළිවෙළ අනුගමනය කරලා තිබෙනවා. නමුත් සංගීත භාණ්ඩ පරිහරණය කරනකොට, අබලන් වුණාම මේවා නැවත ප්‍රතිසංස්කරණය කරගන්න, නැත්නම් අලුතෙන් සංගීත භාණ්ඩ නිෂ්පාදනය කරගන්න තිබෙන ස්ථානවල හිඟයක් ලොකුවට අපේ පළාතේ පවතිනවා. ඒ නිසා අඩුම ගණනේ දිස්ත්‍රික්කයකට එක තැනක්වත් සංගීත භාණ්ඩ අලුතෙන් නිෂ්පාදනය කරන්න සහ ප්‍රතිසංස්කරණය කරන්න. ඒ වාගේම ඒ අංශයට පුහුණුව ලබා දෙන්න ස්ථානයක් එක දිස්ත්‍රික්කයකට එකක් ගණනේ ආරම්භ කරන්න කියන යෝජනාවත් මම කරනවා. හුඟාක් කරුණු කථා කරන්න තිබෙනවා. ඇත්තටම කාලවේලාව නැහැ. ඔබතුමාගේ අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය පිළිබඳව මතක් කරන්න ඕනෑ. බොහොම ආචාරශීලී කාර්ය මණ්ඩලයක්. ඒ නිසාම ඔබතුමාට වැදගත් වැඩ කොටසක්, දැනෙන වැඩ කොටසක් මේ ක්ෂේත්‍රය තුළ අපේ පළාතට කරන්න පුළුවන්කම ලැබිලා තිබෙනවා. ඒ සඳහා තවදුරටත් ශක්තිය, ධෛර්යය,

**[** පූජ්‍ය ගරු තෙඹුවන පියනන්ද ස්ථවිර ]

වාසනාව ලැබේවා කියලා හෘදයාංගමව ප්‍රාර්ථනා කරමින් මගේ වචන කිහිපය අවසන් කරනවා. සැම දෙනාටම තෙරුවන් සරණ ප්‍රාර්ථනා කරනවා.

[අ.භා. 03.02]

**ගරු එම්. ෂාෆි රහීම්**
Hon. M Shafi Raheem

බිස් මිල්ලාහිර් රහ්මානිර් රහීම්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2014 ප්‍රවාහන, ක්‍රීඩා, තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමූපකාර සංවර්ධන වැය ශීර්ෂය පිළිබඳව කථා කරන්නට අවස්ථාව ලබා දීම ගැන මම මුලින්ම ස්තුතිය පුද කරනවා. ඇත්ත වශයෙන්ම අද ප්‍රවාහනය ගැන කථා කරනකොට එතුමාගේ අමාත්‍යාංශයෙන් කටයුතු කරලා තිබෙනවා. එහිදී අද බස්වල ගමන් කරනකොට මම කිහිප වතාවක් බස්වල ගමන් කරන කාන්තාවන් වෙනුවෙන් ඉල්ලීමක් කළා. කාන්තාවන්ට වන හිංසාව අවම කිරීම සඳහා එයාලට බස් රථයේ ආසන 10 ක් වත් වෙන් කරලා ලබා දෙන්නය කියලා. ඒකේ මහා ලොකුවට කරන්න දෙයක් නැහැ. ගරු ඇමැතිතුමාගේ අනුමැතියෙන් ඒ ආසන 10 වෙන් කරලා දෙන්න පුළුවන්. ඇත්ත වශයෙන්ම බස් රථයේ යද්දී කාන්තාවන් විඳින දුක - මමත් එක දවසක් බස් රථයේ ගමන් කරනකොට අම්මයි දුවයි වාඩි වෙලා ඉන්න අතරේ එක පුද්ගලයෙක් ඒ අම්මාගේ ඇඟේ හේත්තු වෙලා. ජනේලය ළඟට එනතුරු ඒ පුද්ගලයා හේත්තු වෙලා ඉන්නවා. නමුත් ඒ ගැන හරියාකාරව කථා කරන්නවත් කෙනෙක් නැහැ. එතැන භයෙන්, නිහඬතාවය පෙන්නුම් කළා. කවුරුත් ඒකට කථා කළේ නැහැ. නමුත් මම මොකද මේ කියලා ඇහුවාම, ඔහු මටත් ඔරවලා බැලුවා. මම කිව්වා, මෙහාට එනවා කියලා. ඊට පස්සේ එක්කෙනෙක් දෙන්නෙක් කථා කළාම, ඒ කොල්ලා එතැනින් බැහැලා ගියා. ඒ වාගේ ලොකු අසාධාරණයන්, ලොකු අපරාධ සිද්ධ වෙනවා. ගරු ඇමැතිතුමාට ඒක කරන්න පුළුවන්. මහ දෙයක් නැහැ. ඒ වාගේම ගැබිණි මව්වරුන්, අපේ අම්මලා, ආච්චිලා බස් එකට ගොඩ වෙනකොට බස් එක හරි උසයි. අඩි දෙකකට වැඩිය උසයි. කකුළ උස්සලා තියන්න බැරිකමක්, ඒ බස් රථවල තිබෙනවා. එම නිසා ඒ පිළිබඳවත් අවධානය යොමු කරලා, ඒවාට අවශ්‍ය පියවරයන් ඉදිරි කාලය තුළ ගරු ඇමැතිතුමාට නිසි ලෙස අනුගමනය කරලා අවශ්‍යතාවයන් ඉටු කරලා දෙන්නය කියලා ඉල්ලා සිටිනවා.

ඒ වාගේම තමයි ගරු ඇමැතිතුමාගේ අමාත්‍යාංශයේ අපි උපදේශක කාරක සභාවේ කථා කරපු අවස්ථාවක ආදායම් බලපත්‍රය ගන්න එක පිළිබඳව මම අදහසක් දුන්නා. අපේ සහෝදරයන් සමහර වේලාවට නිවාඩු දාලා මේ අදායම බලපත්‍රය ගන්න සමහර වේලාවට දුර පළාත්වලට යන්න සිද්ධ වෙනවා. එතකොට, රුපියල් 1250/- ක්, 1500/- ක් එක්කෝ රුපියල් 2000/- ක වටිනාකමක් තිබුණත් ඊට වඩා වියදමක් කරලා යන්න ඕනෑ. නමුත් මම යෝජනා කරපු දෙයින්, ගරු ඇමැතිතුමා ඇත්ත වශයෙන්ම ඒක අවබෝධ කරගෙන එතුමා Online ආදායම් බලපත්‍රය ගන්න, ගෙදර ඉඳලා තමන්ගේ Credit Card එකෙන් - ඒ වේලාවේම Print Out එකක් ගන්න හැකියාවක් අද හදලා තිබෙනවා. ඇත්ත වශයෙන්ම ඒක තමයි අපේ උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමාගේ දක්ෂතාවය. එතුමාගේ අඩුපාඩු කිහිප දෙනෙක් මේ සභාවේ කථා කළා. නමුත් මනුස්සයෙක් වුණාම හැම දෙයක්ම නිවැරදිව කරන්න පුළුවන් පුද්ගලයෙක් මේ ලෝකයේ බිහි වෙලා නැහැ.

ගරු ඇමැතිතුමා මගේ පරණ මිත්‍රයෙක්. විදේශ රටවල ගියාම අපි එකට ඉඳලා සහෝදරත්වයෙන් කටයුතු කරලා තියෙනවා. අපි මන්ත්‍රීවරු වශයෙන් ඉන්න කාලය තුළත් මගේ හොඳ මිත්‍රයෙක්. ගරු ඇමැතිතුමා මේ ඇමැතිකම් ගත්තාට පස්සේ මේ බස්නාහිර පළාතේ ඉන්න ජනතාවට යම්කිසි සේවයක් කරන්න උවමනාවක් එතුමාට තිබුණා. එම නිසා එය ඉෂ්ට කරන්න එතුමා සැහෙන මහන්සි වුණා. එක දෙයක් කියලා මම නතර කරනවා. ආදායම් බලපත්‍රය ගත්ත අයගේ සමහර වේලාවට අදායම් බලත්‍රය නැති වුණාම ගරු ඇමැතිතුමනි, මුළු මුදලම දීලා තමයි ඒ ආදායම් බලපත්‍රය ගන්න වෙලා තිබෙන්නේ. නමුත් මෙය නැති වුණාට එහි පිටපතක් දෙන්න මුළු මුදලක් ගෙවන්න අවශ්‍යතාවයක් නැහැ. ජනතාවගෙන් යම්කිසි මුදලක් අය කරලා ඒ පිටපත ලබා දෙන්නට කටයුතු කරනවා නම් හොඳයි. ඔබතුමාට මීන් ඉදිරියට අමාත්‍යාංශය කරගෙන යාමට, ඉදිරි මැතිවරණයේදී ලොකු ජයග්‍රහණයක් ලබා ගෙන අපේ බස්නාහිර පළාතේ ජනතාවට සේවය කිරීමට අපි හැමෝම එකතු වී කටයුතු කරමුයි කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ.භා. 03.08]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අපේ උපාලි කොඩිකාර ගරු අමාත්‍යතුමාගේ ප්‍රවාහන, ක්‍රීඩා, තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමූපකාර සංවර්ධන හා ආහාර අමාත්‍යාංශය සම්බන්ධව කථා කිරීමට මේ කාලය ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මම හිතන්නේ, පසුගිය වසර හතරත් එක්ක ගත්තාම මේ පස්වැනි වසරේ පස්වැනි පළාත් සභාවේ අවසාන අයවැය. අපට විශාල වෙනසක් දකින්න ලැබෙනවා. පසුගිය වසර අයවැයේදී එතුමාට බහුතරයක් චෝදනා ගොඩක් එල්ල වුණා. අද මේ අවසාන වසර නිසාද දන්නේ නැහැ, ගොඩක් දෙනෙක් එතුමාට ප්‍රසංශා කරනවා. මම හිතන්නේ, ඒක සුභ ලකුණක්. ඡන්දයට යන අවුරුද්ද නිසාද මන්දා. ටිකක් ප්‍රතිපාදන වැඩියෙන් දීලා නිසාද මන්දා. එහෙමත් නැත්නම් මනාපයක් වැඩිපුර ගන්න කොළඹ දිස්ත්‍රික්කයට ප්‍රතිපාදන වැඩියෙන් ලබා දීලාද මන්දා. කොහොම හරි උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමාට හොඳ කියන කට්ටිය අද වැඩියි. අනාගත මහ ඇමැති නිසාද දන්නෙත් නැහැ. අපේ උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමා පොඞ්ඩක් භය වෙලා වාගේ මට පෙනෙන්නේ. මොකද, මනාප පොරය තිබෙනවා නේ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට ලැබී තිබෙන කාලය ඉතාමත් අවම නිසා එතුමා ගැන හොඳ කියන්න බලාපොරොත්තු වන්නේ නැහැ. මොකද, හොඳ කියන්න ගියොත් මට නරක කියන්න කාලයක් නැතිව යනවා. ඒක නිසා මුලින්ම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ක්‍රීඩාව සම්බන්ධයෙන් පොදු කටයුතු සාකච්ඡාවේදීත් කිව්වා. ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුත් කිව්වා, විශාල සේවයක් කරලා තිබෙනවා කියලා. තාප්පයක් ඉදි කරලා දුන්නා කියලා. ක්‍රීඩාව සංවර්ධනය සම්බන්ධයෙන් මෙවැනි දේවල් නොවෙයි අපි බලාපොරොත්තු වන්නේ. අපි ගමේ ක්‍රීඩාව දියුණු කරන්න, අපේ පළාතේ ක්‍රීඩාව දියුණු කරන්න පාසල් පද්ධතිය තුළ ක්‍රීඩාව දියුණු කරන්න අපි බලාපොරොත්තු වන්නේ තාප්පයක් ඉදිකර දීම තුළින් නොවෙයි. එහෙම නැත්නම් විශාල ක්‍රීඩාංගණයක් හදලා ඒ ක්‍රීඩාංගණයට සියලුම මුදල් වැය කිරීම තුළින් නොවෙයි. පාසල් පද්ධතිය ගත්තාම ක්‍රීඩාව ඉතාමත් පහත් තත්ත්වයක තිබෙනවා. අපි දන්නවා, ලංකාව තුළ ගත්තාම බස්නාහිර පළාත් ක්‍රීඩාව උඩින් ඉන්නවා කියලා. නමුත් මේ බස්නාහිර පළාතේ ක්‍රීඩාව කියන්නේ හැමදාම මේක ඉහළ මට්ටමක තිබුණු දෙයක්. මොකද, විශාල වශයෙන් කොළඹ දිස්ත්‍රික්කයේ පෞද්ගලික පාසල් තුළින්, පෞද්ගලික ක්‍රීඩා සමාජ තුළින් මේ ක්‍රීඩාව ඉහළ මට්ටමක තිබුණා. නමුත් අද අපි සාපේක්ෂව ගත්තොත් බස්නාහිර පළාතට එළියෙන් බිහිවන ක්‍රීඩකයන් මීට වැඩියෙන් බිහි වෙලා තිබෙනවා. දැන ලංකාවේ ක්‍රිකට් ටීම් එක ගත්තත් බස්නාහිර පළාතට වැඩිය පිට පළාත්වලින් තමයි දක්ෂ ක්‍රීඩකයන් බිහි වෙලා තිබෙන්නේ. ඉතින් අපි ඒ පැත්තෙන් ගත්තොත් මම හිතන්නේ, අපට ඉතාමත් පසුබෑමක් තමයි ඇති වෙලා තිබෙන්නේ. මීට පෙර කොළඹ පාසල්වලින්, ක්‍රිකට් Club වලින් තමයි මේ ක්‍රීඩකයෝ ඔක්කෝම බිහි වුණේ. නමුත් අද ඒක එක අතකින් හොඳ දෙයක්. නමුත් අපේ බස්නාහිර පළාතේ ක්‍රීඩාවට දක්වන අවම අවධානය නිසා තමයි මෙය සිදු වෙලා තිබෙන්නේ කියන එක ප්‍රකාශ කරන්න ඕනෑ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

සතුටු වෙන්න ඕනෑ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අපි සතුටු වෙනවා. නමුත් අපි කථා කරන්නේ බස්නාහිර පළාත ගැන නේ. අපට ඕනෑ, බස්නාහිර පළාත උඩට ගෙනෙන්න. ඉතින් විශේෂයෙන්ම මෙතුමාගේ අමාත්‍යාංශය ගැන කථා කරද්දී වෙස්කෝ අයාතනය ගැන කථා නොකර බැරි තත්ත්වයට පත් වෙලා තිබෙනවා. අද ක්‍රීඩා අමාත්‍යාංශය සියලුම භාණ්ඩ ගන්නේ මේ වෙස්කෝ ආයතනයෙන්. මේ වෙස්කෝ ආයතනයට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂ කැබිනට් මණ්ඩලයකට මීට වසර දෙකකට පෙර යෝජනාවක් දාලා එය අනුමත කරගෙන තමයි මේ ක්‍රීඩා භාණ්ඩ විදේශයෙන් ආනයනය කරන්න අනුමැතිය අරගෙන තිබෙන්නේ. අද ඉතාමත් කනගාටුවෙන් කියන්න ඕනෑ. මේ ආයතනය විශාල වශයෙන් බඩු ගන්නේ, ආනයනය කරන බඩු කියන්නේ වෙන කවුරුත් ආනයනය කරන බඩුවක් තමයි ගන්නේ. මෙතුමන්ලා ආනයනය කරන්නේ නැහැ. කොළඹ වෙළඳ පොළෙන් අරගෙන තමයි මේ ආනයනය කළයි කියලා දෙන්නේ. ඉතින් මේ බඩු විශාල වශයෙන් ප්‍රමිතියෙන් තොර බඩු. එවැනි ක්‍රීඩා භාණ්ඩ අද විශාල වශයෙන් ලැබිලා තිබෙනවා.

**[** ගරු ශ්‍රීනාත් පෙරේරා]

ඒ එක්කම මතක් කරන්න ඕනෑ. මේ පොල්වත්තේ තියෙන ක්‍රීඩා පාසලට කියලා හැම වසරේම ලක්ෂ 50 ක් වෙන් කර ගන්නවා. දැන් මේ ලක්ෂ 50 න් වෙන්නේ මොනවද කියලා කවුරුත් දන්නේ නැහැ. අපි දන්න තරමට නම් මේ ලක්ෂ 50 න් එතුමාගේ පෞද්ගලික ඡන්ද ව්‍යාපාරයට, දේශපාන ව්‍යාපාරයට තමයි මෙය වියදම් කරන්නේ. ටී ෂර්ට් ගහගන්න. ඔය වාගේ දේවල්වලට තමයි. ඡන්ද ව්‍යාපාරයට සෙනඟ යද්දී ටී ෂර්ට් අන්දවන්න, තොප්පි ගහන්න තමයි හැම වසරේම මේ මුදල් පාවිච්චි කරන්නේ. මේ ගැන බලන්න කවුරුවත් නැහැ. මම හිතන්නේ, ඒකට විශේෂ අවධානය යොමු කරන්න ඕනෑය කියලා අපි විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ එක්කම මම ඊයෙත් ඇහුවා, මේ පාසල් පද්ධතිය තුළ - මම දන්නේ නැහැ, කොළඹට විතරක් මෙය දීලා තිබෙනවාද කියලා. නමුත් ගම්පහ දිස්ත්‍රික්කයේ පාසල් පද්ධතියට ක්‍රීඩා අමාත්‍යාංශයක් වශයෙන් කිසිම දෙයක් දීලා නැහැ. මම දන්න තරමින් නම් ලැබිලා නැහැ. දැන් මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමාත් කිව්වා. අපේ රට නියෝජනය කරන්න යද්දීවත් ඒ සපත්තු ජෝඩුව ලබා දෙන්න අසමත් වුණු අමාත්‍යාංශයක් හැටියට තමයි අපි දැක්කේ. පසුගිය වසරේත් මම කිව්වා, අර කායවර්ධන වැඩ සටහනකට ගිහිල්ලා අපේ ගම්පහ දිස්ත්‍රික්කයේ ක්‍රීඩකයෙක් ආසියාවේ ජයග්‍රහණය කරලා ආවා. නමුත් මේ වසරේ මුල ඒ අයම ගියා, ලෝක ශූරතාවය ගන්න. ඒ වේලාවෙත් කිසිම උදව්වක්, ආධාරයක් ලැබිලා නැහැ. ඒක නිසා මොකක් හරි ජයගහ්‍රණයක් කරගෙන පැමිණියාම නම් අපේ ගරු ඇමැතිතුමා දුවගෙන එයාර්පෝර්ට් එකට ගිහිල්ලා මල් මාලයක් දාලා පිළිඅරගෙන හොඳ ෆොටෝ එකකට ඉඳලා පුළුවන්නම් ටීවී එකෙත් දාගෙන, පත්තරේ පුළුවන් නම් දාගෙන -

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

දන්නේ නැත්නම් දැන ගන්න. මම මුදලක් දුන්නේ -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒ දිනලා ආවට පස්සේ නේ.

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

තමුන්නාන්සේගේ දිස්ත්‍රික්කයේ අයට.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අපි කිව්වාට පස්සේ. ඊට ඉස්සෙල්ලා දුන්නේ නැහැ නේ? ඒක තමයි මම කිව්වේ. ඔබතුමා දින්නට පස්සේ නම් යනවා. මල් මාලයක් අරගෙන, ඕනෑ නම් පොඩි සල්ලි මිටියකුත් අරගෙන ජනාධිපතිතුමා ළඟටත් ගිහිල්ලා ඕනෑ නම් එතැනත් ෆොටෝ එකක් අරගෙන, පත්තරේ දාගෙන, ටීවී එකේ පෙන්න ගෙන ඒවා ඔක්කෝම කර ගන්නවා.

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ලංකා ඉතිහාසයේ පළමුවැනි වතාවට කැරම් ෆෙඩරේසන් එකෙන් රන් පදක්කමක් ගෙනාවේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා කැරම් ගැහුවාද? ඔබතුමා කැරම් ගහපු නිසාද ගෙනාවේ? නැහැ නේ? ඉත්තට හරියට ගහනවා. මම දන්නවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි යයි තිබෙන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඇමැතිතුමා හොඳට කොටු පනින්නත් දන්නවා. ඒක හොඳයි නේ. දක්ෂකම කියන්නේ ඒකයි. ඊළඟ පාර ඔබතුමා මහ ඇමැති වුණොත් ඒකටත් අපි පුදුම වෙන්නේ නැහැ. ඒකත් මේ ආසියාවේ අලුත් ආශ්චර්යයක් වෙනවා, ඔබතුමා ඊළඟට මහ ඇමැති වුණාම. ඒක නිසා අපට ඕක පුදුමයක් නොවෙයි. නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ක්‍රීඩාව සම්බන්ධයෙන් ඉතාමත් ඉහළ මට්ටමෙන් දූෂණ වංචා සිදුවන අමාත්‍යාංශයක් මෙය. ක්‍රීඩා භාණ්ඩ ගෙනෙද්දී. මම හිතන්නේ අර ක්‍රිකට් බෝලද, එල්ලේ බෝලද මන්දා ගෙනත් තියෙනවා. ගරු ඇමැතිතුමාගේ කණ්ඩායමක් ඉන්නවා. එක එක රටවල සැමන් ටිං එකක් අරගෙන යනවා. ෆුට් බෝලයක් අරගෙන යනවා. ගිහිල්ලා මෙහාට වැඩිය කෙහෙන්ද අඩුවෙන් ගන්න පුළුවන් කියලා බලනවා. අපි දැක්කා, එහෙම කණ්ඩායමක් චීනෙත් ගිහිල්ලා ඉන්නවා. මම හිතන්නේ, වැඩිදුර ඒවා ගැන විස්තර කියන්න හොඳ

නැහැ. අපේ වැදගත් ඇමැතිතුමෙක් නේ? ඒක නිසා අපි වැඩිදුර ඒවා කියන්නේ නැහැ. චීනෙත් ගිහිල්ලා සිටියා, එක කණ්ඩායමක්. ඒ කණ්ඩායම මෙතුමාත් එක්ක යද්දී වෙනම යනවා. ටෙනිස් බෝලයක් අරගෙන යනවා. මේකට වැඩිය අඩුවෙන් ගන්න පුළුවන්ද? කොහොමද මාටියා පාර මේකෙන් හොඳට ගහන් පුළුවන්ද කියලා බලනවා. කොමිස් එක ටිකක් වැඩිපුර තියා ගන්න පුළුවන් නම් චීනෙන් නොවෙයි බලුකිස්තානයෙන් බල්ලෙක් හරි ගෙනෙයි. ඔය වාගේ තත්ත්වයක් තමයි අද ක්‍රීඩාවට ඇති වෙලා තිබෙන්නේ.

විශේෂයෙන්ම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් කොච්චර දූෂිතද කිව්වොත් මේ පළාත් සභා සංකීර්ණය ඇතුළේ අර බලන්න, නවත්තලා තිබෙන වාහනවල මෙතුමාගේ බිරිඳගේ කටවුට් ඇතුළේ තිබෙනවා. මම අභියෝග කරනවා. දැන් ගිහිල්ලා බලන්න. මහරගම සංවිධායක. මම දන්නේ නැහැ, මෙතුමා පළාත් සභාවේ ඇමැතිකම කරනවාද? මෙතුමාගේ බිරිඳ කරනවාද කියලා. සමහර වේලාවට ඇමැතිකම බිරිඳ කරනවාද දන්නෙත් නැහැ. මම ඒක දන්නේ නැහැ. කටවුට් ටික තවම තිබෙනවා. මොනවාට තිබෙනවාද කියලා මම දන්නේ නැහැ. පළාත් සභාවේ ඇතුළේ. මේ වාගේ දූෂණ, වංචා, හොකරම් තමයි මේ අමාත්‍යාංශය තුළින් බහුතරයක් වන්නේ. අපි ටීවී එකේ, පත්තරවල දැක්කා, බස් බලපත්‍රයක් දෙන්න ලක්ෂ 20 ක් ගන්නවා. ලක්ෂ 25 ක් ගන්නවා. මමයි, මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමයි දෙන්නම බොරු කියන්න විධියක් නැහැ නේ? අපි දෙන්න පක්ෂ දෙකක නේ?

**ගරු මහින්ද කුරුවිටගේ**
Hon. Mahinda Kuruwitage

එතකොට මෙරිල් ගරු මන්ත්‍රීතුමා හොඳයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා එක පක්ෂයක. මම වෙන පක්ෂයක. එතකොට අපි දෙන්නම බොරුකාරයෝ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා කාලය අවසන්. වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අපි දෙන්නාම බොරුකාරයෝ වෙන්න විධියක් නැහැ නේ?

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඊළඟට ගාමිණී සිල්වා ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අපි දෙන්නාගෙන් කවුරු හරි ඇත්ත කියන්න ඕනෑ නේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කාලය ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මෙතුමා මහ ඇමැති පුටුවේ වාඩි වුණාම ලබන වසර වෙද්දී මම හිතන්නේ, ආසියාවේ අනික් ආශ්චර්යත් අපට බලාගන්න පුළුවන් කියන එක මතක් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඊළඟට ගාමිණී සිල්වා ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 10 ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 03.18]

**ගරු ගාමිණී සිල්වා**
Hon. Gamini Silva

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රවාහන, ක්‍රීඩා, තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමූපකාර සංවර්ධන හා ආහාර සැපයීම්, බෙදා හැරීම් සහ ග්‍රාම සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශය අපේ උපාලි කොඩිකාර අමාත්‍යතුමාගේ අමාත්‍යාංශය. මම හිතන්නේ බස්නාහිර පළාත් සභාවේ අපි දන්නා තරමින් - මට මතකයි, උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමා අපි හඳුනා ගන්නේ, 1991 පළාත් පාලන මැතිවරණයේදී. එදා මට මතකයි එක්තරා අවධියක පිළියන්දල ප්‍රදේශයේ රැස්වීමකට ආවා. ඒ එන අවස්ථාවේදී අපේ සංවිධායකවරයා හැටියට හිටියේ ඩික්සන් ජේ. පෙරේරා මන්ත්‍රීතුමා. එතුමා තමයි මෙතුමා දිහා බලලා කිව්වේ, හැඩකාර, වැඩකාර, කටකාර උපාලි කොඩිකාර කියලා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

දහකාර.

**ගරු ගාමිණී සිල්වා**
Hon. Gamini Silva

දඟකාරත් කිව්වා. ඔක්කෝම තිබෙනවා. නැතිවා නොවෙයි. හොඳ දක්ෂයෙක්. දක්ෂ ඇමැතිවරයෙක්. බස්නාහිර පළාත් සභාවට පත් වුණු දක්ෂ ඇමැතිවරයෙක්. යම්කිසි නිර්මාණශීලී හැකියාවන් පෙරට අරගෙන ඉදිරිපත් කරලා, අලුත් අලුත් දේ ජනතාවට හඳුන්වා දෙන්න පුළුවන් දක්ෂතාවයක් තිබෙන ඇමැතිවරයෙක් හැටියට තමයි වර්තමානයේ අපි බස්නාහිර පළාත් සභාවේ කොළඹ දිස්ත්‍රික්කය නියෝජනය කරන උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමා පිළිබඳව කථා කරන්නේ. මම හිතන්නේ, එතුමා අපි හැමෝටම එක හා සමානව සැලකුවා කියන එක මම දන්නවා. මන්ත්‍රීවරු හැටියට ඒ මන්ත්‍රීවරුන්ට ප්‍රතිපාදන බෙදා දීමේදී එතුමාගේ කාර්ය භාරය හරියට ඉටු වුණා. ඒ නිසා තමයි අපට ගම්වල යම්කිසි වැඩ කොටසක් කරගන්න ශක්තිය, ධෛර්ය ලැබුණේ කියන එක මම මතක් කරනවා. විශේෂයෙන්ම එතුමාගේ ප්‍රතිපාදන යටතේ ප්‍රදේශයේ තිබෙන ග්‍රාම සංවර්ධන සමිති, ඒ වාගේම සංස්කෘතික ආයතන, ඒ විතරක් නොවෙයි ප්‍රජා ශාලා ගොඩනැගිලි මේ හා සමානව විශාල වැඩ කොටසක් කරන්න, ඒ වාගේම එතුමාගේ ඒ කාර්ය භාරය තුළ මම දකිනවා, ප්‍රවාහන ක්ෂේත්‍රය තුළ එතුමාට කරන්න පුළුවන් හැකියාව තිබෙන ආකාරයෙන් එතුමා කටයුතු කළා.

අද ප්‍රවාහන සේවය අපි දකින්නේ, 100% ක් ගොඩගන්න පුළුවන් ආයතනයක් හැටියට නොවෙයි. රටේ ප්‍රවාහන පිළිබඳව කථා කිරීමේදී අද ප්‍රවාහන සිදු වන්නේ, පුද්ගලයින්ට අවශ්‍ය විධියට තමයි. අපි මොන විධියට එය හදන්න හැදුවත් ඒක හදන්න පුළුවන්කමක් නැහැ. මට මතකයි, අපේ රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය ලංගමය පිළිබඳව කථා කළා. අපට අයිති නැති වුණත් මධ්‍යම රජයට අයිත් ලංගමය ගැන කථා කිරීමේදී අපට අද කනගාටුවක් ඇති වෙනවා. එදා ලංගමය නැති කළේ කවුද කියන එක. ශ්‍රී ලංගම කියන එක නැති කළේ එදා එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කියන එක අපි මතක් කරනවා. පෞද්ගලික බස් සේවය මේ රටට හඳුන්වලා දීලා එදා ලංගම නැති කළේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව. ඇත්ත වශයෙන්ම එදා කරපු වරද නිසා තමයි එය තවම නිවැරදි කරගන්න බැරි වුණේ. වර්තමානයේ එතුමාට ලැබුණු ඇමැති ධුරයේදී පෞද්ගලික ප්‍රවාහන සේවය එතුමාට අයිති වෙලා තිබෙනවා. එතුමා ඒක කොහොම හරි කරගෙන යනවා. එතැනට ඇද දමන්න, මේ රටට ලංගමය කියන එක නැති කරලා ගෙනාවේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කියන එක අපි මතක් කරනවා. මට මතකයි, මගේ පියා ලංගම සේවකයෙක්. ලංගම ආරක්ෂක අංශයේ සේවකයෙක් හැටියට මගේ පියා කටයුතු කළේ. අපට ඒ කාලයේ පුදුම ආඩම්බරයක් තිබුණා. ඒ කාලයේ ලංගම බස් එකක බස් කොන්දොස්තර කෙනෙකුට, ඩ්‍රයිවර් කෙනෙකුට බොහොම ඉහළින් මිනිස්සු සැලකුවා. මම මේ කථාව අද ඊයේ කියන කථාවක් නොවෙයි. හැමදාම කියන කථාවක්. එදා හිටපු බස් කොන්දොස්තරට, ඒ බස් එකේ හිටපු රියැදුරාට මිනිස්සු බොහොම ගරුත්වයක් තිබුණා. ඒ තත්ත්වය අද ඇති කරන්න පුළුවන්කමක් නැහැ. ඒක නැති වෙලා තිබෙන්නේ. මුදල් පස්සේ හඹා යන සමාජයක් තුළ, මුදල් එකතු කිරීමේ කටයුත්ත තුළ අද ප්‍රවාහන ක්ෂේත්‍රය අපේ ගරු ඇමැතිතුමා ගොඩගන්න උත්සාහ කළත් එය 100% ක් සාර්ථක වෙන්නේ නැහැයි කියලා කියන්න පුළුවන්කම තිබෙන්නේ එදා ලංගමයට කරපු විනාශය නිසා. එදා ලංගම බස් කොන්දොස්තර කෙනෙකුට, රියැදුරෙකුට මම හිතන්නේ පාසල් ගුරුවරියක් පවා විවාහ කරගන්න ඒ කාලයේ සුදුසුකම වී තිබුණා. කැමැත්තෙන් ඒ කටයුත්ත කෙරුනා. අපි අහනවා, අද ඒ කටයුත්ත කරනවාද කියලා. නැහැ.

අද ගුරුවරියක් බලන්නේ නැහැ. පෞද්ගලික බස් සේවයේ ඉන්න කොන්දොස්තරලා, ඩ්‍රයිවර්ලා දිහා බලන කාලයක් නොවෙයි දැන් තිබෙන්නේ. එදා එහෙම යුගයක් තිබුණා. ඒ බස් එකේ කොන්දොස්තරට, රියැදුරුට මිනිස්සු පුදුම ආදරයක් දැක් වූවා. ඒ නිසා අපි කියනවා, මේ ලංගම විනාශ කිරීමත් එක්ක ඇති වුණු පෞද්ගලික බස් සේවය ගොඩගන්න අපේ උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමා, එතුමා දන්නා තරම් දක්ෂතාවයන් දක්වලා ඒ කටයුත්ත කළා. අද වර්තමානයේ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ ඉන්න සභාපතිවරයා ගැන අපි කථා කරනවා. එතුමාගේ අමිල රත්මණ්ඩල කියන්නේ අපිත් එක්ක කැස්බෑවෙන් දේශපාලනයට පැමිණි පුද්ගලයෙක්. එතුමා දක්ෂයෙක්. අමිල රත්මණ්ඩල කියන පුද්ගලයා දක්ෂ සභාපතිවරයෙක්. අපට ඕනෑ තැනක ඒ පිළිබඳව හය නැතිව කථා කරන්න පුළුවන්. එදා පෞද්ගලික සේවයේ තිබුණු ප්‍රශ්න අද බොහෝදුරට අපට අහන්න ලැබෙන්නේ නැහැ. එදා ප්‍රයිවට් බස් සම්ගම් හැදිලා ඒ අය පාරට බැහැලා පිකටිං කරන තත්ත්වය අද බොහෝදුරට අඩු වෙලා තිබෙනවා. දක්ෂ සභාපතිවරයෙක් එතැනට පත් වුණු නිසයි කියලා අපි මතක් කරලා දෙන්න ඕනෑ. දක්ෂ කෙනෙකුට, හැකියාව

තිබෙන කෙනෙකුට ඒ කාර්ය භාරය ඉටු කරන්න පුළුවන් කියන එක අපි දන්නවා.

ඒ වාගේම තමයි අද ග්‍රාම සංවර්ධන සමිති. ප්‍රදේශයේ තිබෙන ග්‍රාම සංවර්ධන සමිති මම හිතන්නේ, එදත් මම ගරු ඇමැතිතුමාට මතක් කළා. වර්තමානයේ ග්‍රාම සංවර්ධන සමිතිවලට දැන් කණ කොකා හඬන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ග්‍රාම සංවර්ධන සමිති මඟින් තමයි පළාත් පාලන ආයතන තුළට, එහෙම නැත්නම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට යන කොන්ත්‍රාත් එක භාර ගන්නේ. ග්‍රාම සංවර්ධන සමිති. ග්‍රාම සංවර්ධන සමිතියට ලැබෙන කොන්ත්‍රාත් බොහෝවිට අපි දන්නවා ග්‍රාම සංවර්ධන සමිතිය මඟින් නොවෙයි ක්‍රියාත්මක වෙන්නේ. වෙනත් බාහිර පුද්ගලයෙක් මඟින්. එහෙම නැත්නම් කොන්ත්‍රාත්තුවක් කරන්න, ඒ හැකියාව තිබෙන පුද්ගලයෙක් මඟින් තමයි ඒ කටයුත්ත කරන්නේ. ග්‍රාම සංවර්ධන සමිතිය ලිපි ගොනුවලට අත්සන් කරන එක විතරයි කරන්නේ. එහෙම අත්සන් කරන ග්‍රාම සංවර්ධන සමිති 5% ක කොමිස් මුදලක් තැන්පත් වුණා, ඒ ග්‍රාම සංවර්ධන සමිතියේ තැන්පතු මුදලට. 5% ක කොමිස් මුදල තැන්පත් වනකොට අපි දැක්කා, ගමේ ග්‍රාම සංවර්ධන සමිති මුදල් අතින්, සම්පත් අතින් පිරුණු සමිති බවට පත් වෙනවා. අද ඒ තත්ත්වය බොහෝදුරට අවසන් වෙලා තිබෙනවා.

අද ග්‍රාම සංවර්ධන සමිතියකට වැඩිදෙනෙක් කොන්ත්‍රාත් පවරන්නේ නැහැ. ඒකට හේතුවක් තිබෙනවා. අපි දන්නවා, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය හරහා, වෙනත් අමාත්‍යාංශ හරහා එන මුදල් සියයට ගණනක් අඩු කරලා තමයි, 20% ක් හෝ ශ්‍රම දායකත්වයෙන් ලබා ගන්න කියලා තමයි ඒ කොටස භාර දෙන්නේ. නමුත් ශ්‍රම දායකත්වය ලබා දෙන්න අද කිසිම කෙනෙක් ඉදිරිපත් වෙන්නේ නැහැ. මේ නාගරික ප්‍රදේශවල ජීවත් වන ජනතාව, ඒ ශ්‍රම දායකත්වය ලබා දෙන්නේ නැහැ. එතකොට 20% ක් එතැනට කැපෙනවා. තව 5% ක් කැපුණොත් 25% ක් අඩු වෙනවා. ඒ නිසා ග්‍රාම සංවර්ධන සමිතිවලට කොන්ත්‍රාත් ලබා දීමේ ක්‍රමය අද කෙමින් කෙමින් ඈත් වෙලා තිබෙනවා. ඒ ඈත් වෙන්න හේතුව තමයි, අර විශාල මුදලක් අඩු වෙලා ඒ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට භාර ගන්න කොන්ත්‍රාත්කරුට කරන්න නොහැකි වීම නිසා ඔහු වෙනත් සමිති කරා යනවා. ගමේ තිබෙන සමෘද්ධි සමිතියට, පාසල් සංවර්ධන සමිතියට ඒ හා වෙනත් සමිතියකට යනවා. නමුත් ග්‍රාම සංවර්ධන සමිතියට මේ මුදල් එනකොට ගමේ දියුණුව සඳහා යම්කිසි වැඩ පිළිවෙළවල් ග්‍රාම සංවර්ධන සමිතිවල ඉන්න නිලධාරීන් ක්‍රියාත්මක කළා අපි දුටුවා. ඒ තත්ත්වය අද කෙමෙන් කෙමෙන් මැකී යනවා.

ඒ වාගේම තමයි සමූපකාර ක්ෂේත්‍රය. මම හැමදාම කියන දෙයක් තමයි මේ සමූපකාරය පොඩ්ඩක් ඔළුව උස්සාගෙන සිටියේ, සමෘද්ධි ලාභීන් නිසා. සමෘද්ධි ලාභීන් නිසා සමූපකාර සමිතිය පොඩ්ඩක් ඔළුව උස්සාගෙන සිටියා. දැන් ඒ තත්ත්වය නැති වෙලා තිබෙනවා. ඒකට හේතුව, අර සමෘද්ධිලාභීන් එදා තමන්ගේ අවශ්‍ය කරන කූපන් පත, නැත්නම් තමන්ට ලැබෙන මුදල ගත්තේ සමූපකාරයට ගිහිල්ලා. ඒ සමූපකාරයෙන් ගැනීම අද නතර කිරීම තුළ අද විශාල වශයෙන් සමූපකාරයේ කඩ, ගමේ තිබෙන සමූපකාර ආයතන යම් යම් විධියට පවත්වාගෙන යාමට බැරි තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ නිසා අපේ ගරු ඇමැතිතුමා මේ සඳහා යම්කිසි වැඩ පිළිවෙළවල් රාශියක් ගත්තා. කෝප් සිටි දැම්මා. ඒ වාගේම නිර්මාණශීලීව ගමේ අද සුපර් මාර්කට් තත්ත්වයට පත් වෙන, ඒ සුපර් මාර්කට් ක්‍රමය හා සමානව යන කාගිල්ස් මිලර්ස් වාගේ ආයතන, එහෙම නැත්නම් ඒ හා සමානව යන්න පුළුවන් තත්ත්වයට සමූපකාරයටත් යම්කිසි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න එතුමාගේ දායකත්වය ලබා දීලා තිබෙනවා. ඒ ක්‍රමය හරියට ක්‍රියාත්මක වුණොත් ඉදිරියේදී සමූපකාරය නඟා සිටුවීමට ශක්තිය ලැබෙනවා කියන එක අපි මතක් කරන්න ඕනෑ.

ඒ විතරක් නොවෙයි. අපි දන්නවා, මෙතුමාගේ අමාත්‍යාංශය යටතේ අපේ තරුණ තරුණියන් වැඩි දෙනෙක්ට රියැදුරු පුහුණුව ලබා දුන්නා. අපි සන්තෝෂ වෙනවා. යම්කිසි රැකියාවක් බලාපොරොත්තුවෙන් ඉන්න කෙනාට වෘත්තීය හැකියාවක් ලබා දෙන්න පුළුවන් ආකාරයේ වැඩ පිළිවෙළවල් රාශියක් උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමාගේ ඒ අමාත්‍යාංශය හරහා කෙරුණා. කාන්තාවන් සඳහා මනාලියන් හැඩගැන්වීමේ වැඩමුළු පැවැත් වුවා. ඒ වාගේම තමයි සංගීත කණ්ඩායම්, නැටුම් කණ්ඩායම්.

ඒ විතරක් නොවෙයි. ජ්‍යෝතිෂය පිළිබඳව හැදෑරීමට අවශ්‍ය ජ්‍යෝතිෂය ඉගෙන ගන්න පුළුවන් පිරිසක් මේ රටට ඇති කරන්න නිවැරැදි ජ්‍යෝතිෂය පිළිබඳව ඒ හැකියාව තිබෙන පිරිසක් තෝරාගන්න එතුමාට හැකියාව ලැබිලා තිබෙනවා. අද අපේ ප්‍රදේශයේ තිබෙන පූජනීය ස්ථාන සඳහා

**[** ගරු ගාමිණී සිල්වා]

ඍජුව ප්‍රතිපාදන ලබා දීමට හැකි වන ආකාරයෙන් එතුමාගේ අමාත්‍යාංශය හරහා මුදල් ලබා දීමට හැම අවස්ථාවේදීම කටයුතු කළා. අපේ ප්‍රදේශයේ තිබෙන පන්සලකට, ඒ පන්සල වැඩි දියුණු කරගන්න, ඒ පන්සලට ගොඩනැගිල්ලක් හදන්න, පන්සලේ තිබෙන දහම් පාසල දියුණු කරන්න ඒ සඳහා අවශ්‍ය කරන උපකරණ ලබා දෙන්න උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමාගේ අමාත්‍යාංශය හරහා විශාල වැඩ කොටසක් සිද්ධ වුණාය කියන එක අපි මතක් කරන්න ඕනෑ. මම මතක් කරනවා, අපේ ලාල් කුලරත්න ගරු මන්ත්‍රීතුමා මෙතැන නොසිටියත් එතුමා කිව්වා, අද සංස්කෘතිය අතින් රට පිරිහිලා කියලා. එතුමා මිනී මැරුම් සම්බන්ධව කටයුතු කිරීමේදී රටේ හිටපු පාතාලයන්ව අද ජනතාව විසින්ම මරණ තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒකට හේතුව තමයි මේ රටේ එල්ලුම් ගහ නොමැති වීම කියන එක මම මතක් කරනවා. එල්ලුම් ගහ තිබුණා නම්, මේ රටේ එල්ලුම් ගහ නැවත ඇති කළා නම් මේ මිනී මරණ පිරිස මීට වඩා අඩු කරගන්න පුළුවන්කම අපට තිබෙනවා. නිවැරැදිව මිනී මරපු එවුන් තෝරා බේරාගෙන ඒ අවශ්‍ය කටයුත්ත කරන්න ජනාධිපතිතුමාට ශක්තිය, ධෛර්ය ඇති වෙන්න කියලා ප්‍රාර්ථනය කරමින්, උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමාගේ අමාත්‍යාංශය තුළින් අපි වැඩි දෙනෙක් වැඩි සේවයක් ලබා ගත්තාය කියමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 10 ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 03.30]

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ශෝකාකුල අවස්ථාවේ විශේෂයෙන්ම -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, කරුණාකරලා ඒ වචනය පාවිච්චි කරන්න එපා. සභාවට ගැළපෙන්නේ නැහැ.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ප්‍රවාහන, ක්‍රීඩා, තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමුපකාර සංවර්ධන හා ආහාර සැපයීම්, බෙදාහැරීම්, ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශයේ අවසන් මොහොතට සහභාගි වෙලා මේ අවස්ථාවේ ශෝක ප්‍රකාශයක් කිරීමට අවස්ථාව ලබා දුන්න මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට පළමුකොටම මගේ ගෞරවය පිරිනමනවා. විශේෂයෙන්ම අද දිනයේ මේ විවාදයට මා සහභාගි නොවෙන්න සිටියත් උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමාගේ විශේෂ ඉල්ලීම පරිදි මම මේ විවාදයට අද සහභාගි වෙනවා. ඒ පිළිබඳව එතුමාටත් මගේ ගෞරවය, ස්තුතිය මේ අවස්ථාවේදී පිරිනමනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංකාවේ අද දවසේ ඉන්නේ දේශපාලන පවුල් තුනයි. පළමුවැනි පවුල රාජපක්ෂ පවුල. දෙවැනි පවුල රණතුංග පවුල. තුන්වැනි පවුල තමයි කොඩිකාර පවුල. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රතු ඉන්දියානුවන් ඇමරිකාවට ගිහිල්ලා, සුදු ජාතිකයන් තමන්ගේ රටේ තිබුණු සාරය විනාශ කරන කොට, ගස් කපන කොට, බිම දාන කොට, අතු කපන කොට, රතු ඉන්දියානුවෝ කිව්වේ, මේ විනාශ කරන්නේ අපේ ප්‍රෞඪ ඉතිහාසය. මේ විනාශ කරන්නේ අපේ මුතුන් මිත්තන්ගේ දහඩිය. මේ විනාශ කරන්නේ අපේ අභිමානය. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉදිරියේ කියනවා. පසුගිය අවුරුදු පහේ මේ අමාත්‍යාංශය හරහා විනාශ වුණේ, පළාත් සභාවේ අභිමානය. මේ පසුගිය අවුරුදු පහේ මේ අමාත්‍යවරයාගේ ක්‍රියාකාරීත්වය තුළ භූමිදානය කළේ පළාත් සභා ක්‍රමයේ අභිමානය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ඇමැතිවරු දැකලා තිබෙනවා. අපි ඇමැතිවරුත් එක්ක වැඩ කරලා තිබෙනවා. ඒ ඇමැතිවරුත් එක්ක විවාදවලට වැටිලා තිබෙනවා. හැප්පිලි වෙලා තිබෙනවා. මතවාදවල ඉඳලා තිබෙනවා. හැබැයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙහෙම පළාත් සභාවේ අභිමානය විනාශ කරපු ඇමැතිවරයෙක් තුන් ලෝකයේම සිටියේ නැහැයි කියන එක ඉතාමත්ම කනගාටුවෙන් මේ සභාවට මතක් කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමුපකාර ව්‍යාපාරයේ - ලෝකයේ කොයි රටේද සමුපකාරයේ තැන්පතුකරුවන්ගෙන් තැන්පතු අරගෙන, ඔවුන්ගේ තැන්පතුවලට 10% ක් පොළිය දෙන්න කැමැති වුණු සමුපකාර ව්‍යාපාරයේ තමන්ගේ තැන්පතු

අරගෙන ගිහිල්ලා ලංකාවේ වාණිජ බැංකුවක 7% පොළියට දාලා, සීනි ගෙන්වන්න ණයවර ලිපි ඇරලා පෞද්ගලික ව්‍යාපාරිකයෙක්ට දීලා මිලියන ගණනක් හොරකම් කරන්න දුන්න ලෝකයේ එකම පළාත් සභාව, ලංකාවේ බස්නාහිර පළාත් සභාව කියන එක ඉතාමත්ම කනගාටුවෙන් මතක් කරනවා. මම දන්නේ නැහැ, මේ විගණන වාර්තා හදපු මිනිස්සුන්ට ඉතිහාසයේ මේවා අහු වුණේ නැත්තේ කොහොමද කියලා. මම දන්නේ නැහැ, විගණන නිලධාරීන් අද උදේ සිටියා නම්, සෞඛ්‍ය අමාත්‍යාංශය හරහා තිබුණු සෞඛ්‍ය සායනයේදී දුර පේන්නේ නැද්ද? ළඟ පේනනේ නැද්ද? කියලා බලවන්න තිබුණා. එක්කෝ නැත්නම් ඉලක්කම් කියවන්න දන්නේ නැද්ද? පරීක්ෂණ පවත්වන්න දන්නේ නැද්ද? කියන එක අපට අහන්න තිබුණා. එහෙම අපරාධ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේවා Crime විධියට යන්නේ. මේවා අපරාධ. මේ පළාත් සභාවේ අහිංසක මිනිස්සුන්ගේ තැන්පතු තමයි එහෙම විනාශ කළේ. පෞද්ගලික වාණිජ බැංකුවක දාලා ණයවර ලිපි යවලා ඉතිහාසයේ එහෙම අපරාධ කරපු සභාවක - මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය කාලයේ අපි මොකක්ද දැක්කේ?

අපි එක දෙයකට මේ ඇමැතිවරයා සම්බන්ධයෙන් අපි සතුටු වුණා. එක්සත් ජාතීන්ගේ සංවිධානයට මහින්ද රාජපක්ෂ මහත්මයාට පස්සේ වැඩියෙන්ම සහභාගි වුණු පුද්ගලයා බස්නාහිර පළාත් සභාවේ අපේ අමාත්‍ය උපාලි කොඩිකාර කියන එක එතුමාට ගෞරවයක් විධියට මතක් කරනවා. බුෂ් කියන්නේ පඳුරක් කියන එක - ජෝර්ජ් බුෂ් නොවෙයි. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනාධිපතිතුමාටත් ඉස්සෙල්ලා ගිහින් ඔබාමව හම්බ වෙන්න පුළුවන් වුණා නම්, ජනාධිපතිතුමාට ඉස්සෙල්ලා ගිහිල්ලා බුෂ්ව හම්බ වෙන්න පුළුවන් වුණා නම් ඒ අපේ පළාත් සභාවේ පසුගිය අවුරුදු පහේ සිටිය සමූපකාර ඇමැති උපාලි කොඩිකාර කියන එක එතුමාට ගෞරවයක් විධියට මතක් කරනවා. හැබැයි,එතුමා කොච්චර හොඳට මේ අමාත්‍යාංශය කළාද කියනවා නම් මේ ඇමැතිතුමාට තමන්ගේ විෂයය පද්ධතිය පිළිබඳව අවබෝධයක් තිබුණේ නැහැ. තමන්ට අයිති නැති දේවල්වලට හැම තිස්සේම අත ගැහුවා. තමන්ගේ අමාත්‍යාංශයේ පසුගිය මාස අටේම කළේ දේශපාලන න්‍යාය පත්‍ර. ගුරුවරුන්ව ගෙනැල්ලා සමූපකාරය ඇතුළේ සමූපකාර අමාත්‍යාංශයේ මුදල්වලින් ගුරුවරුන්ට කෑම බීම දුන්නා. දන්සල් කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පළාත් සභාවේ මේ අහිංසක මිනිසුන්ගේ බදු මුදල් තිබෙන්නේ ඇමැතිවරුන්ගේ ප්‍රතිරූප නගග ගන්න නොවෙයි. ප්‍රතිරූප හදා ගත්තාට කමක් නැහැ. අදාළ අමාත්‍යාංශවල කරන්න වැඩ තියෙනවා. ඒවාට වෙන ඒවා තිබෙනවා. ඒවා කරන අනික් ඇමැතිවරුත් ඉන්නවා. මෙහෙම මුදල් නාස්ති කරපු අමාත්‍යාංශයක් බස්නාහිර පළාතේ තිබුණේ නැහැ. මෙතුමා භය නැහැ. මෙතුමා ලැජ්ජා නැහැ. ඒ නිසා එතුමාගේ අමාත්‍යාංශය තුළ කරන්න තිබෙන සියලුම පහත් වැඩ සියල්ලම සිද්ධ වුණා කියන එක කනගාටුවෙන් මේ සභාවට ප්‍රකාශ කරන්න වෙනවා.

මම පසුගිය කාලයේ ප්‍රශ්න ටිකක් ඇහුවා. මේ සභාවට ඇවිල්ලා උත්තර දුන්නේ නැහැ. එතුමා අමාත්‍යාංශයට වෙලා වාඩි වෙලා සිටියා. අපි අහනවා බස්නාහිර පළාත් සභාවේ සල්ලිවලින් අරන් දීපු ත්‍රීවිල් මීටර්වල කාන්ති කොඩිකාර මැතිනියගේ ඡායාරූපය අලවන්න බස්නාහිර පළාත් සභාව තුළ ඇයට තිබෙන වරප්‍රසාදය මොකක්ද? කර්මාන්ත අධිකාරිය යටතේ උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමා රුපියල් 7000/- ට ගෙනත් දීපු ත්‍රීවිල් මීටරය ප්‍රවාහන අමාත්‍යාංශය කීයටද ගත්තේ කියලා අපි ඇහුවා. දැන් සභා තුනකදී උත්තර දුන්නේ නැහැ. පළමුවැනි කොටස ගත්ත ගණන අපි දන්නවා. අපි උත්තරය දෙන තුරු ඉන්නේ, අපි ගාව තිබෙන Copy එක පෙන්වන්න. අපි බලාගෙන ඉන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මහජන මුදල් හොරකම් කරන්නේ. රතු ඉන්දියානුවන්ගේ රට ඇමරිකාවට සුදු ජාතිකයන් ගිහිල්ලා ගස් ටික කැපුවා වාගේ මේ කපාගෙන යන්නේ බස්නාහිර පළාතේ අහිංසක මිනිස්සුන්ගේ සල්ලි ටික.

පසුගිය කාලයේ චෝගම් එකේ දූෂණ වංචා ගැන අපි කථා කළා. අපි අදත් අහනවා මධ්‍යම ආණ්ඩුවෙන්, බිලියන් කීයක් මේ සඳහා වියදම් කළාද කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙම අහන්නේ කොහොමද? අපේ සමූපකාර අමාත්‍යාංශයෙන් පිළියන්දල පෙට්‍රල් ෂෙඩ් එකට අඩි 10 X 10 චෝගම් කටවුට් එකක් ගහන්න කියලා 27,100/- ක Payment එකක් ඉල්ලා. ලංකාව පුරා සමූපකාරවලට යැව්වා. අපි දැකලා තිබෙනවා දේශපාලන පක්ෂවල විනය පද්ධතියේ ස්වරූපය. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දැකලා තිබෙනවා. ප්‍රචාරණ කටයුතු ඒ විස්තර 10 X 10 කටවුට් එකක අඩියකට රුපියල් 35 යි. 10 වැඩි කිරීම 10 අඩි 100 යි. කටවුට් එක රුපියල් 3500/- යි. Frame එකක් දාලා ගෙනැල්ලා දුන්නත් උපරිමය රුපියල් 7000/- යි. රුපියල් 27,000/- ක්

[ ගරු නිරෝෂන් පාදුක්ක]

සමූපකාරයෙන් ඉල්ලනවා නම් මේවා සහගහන අපරාධ. මේවා හොකරම්. මේවා වංචා. මේවා අපරාධ කියන එක තමුන්නාන්සේලා සියලු දෙනාටම මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පළාත් සභා ක්‍රමය තුළ ඇමැතිවරු බස්නාහිර පළාත් සභාවේ අභිමානය ආරක්ෂා කරන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය අවුරුදු 05 දී සමූපකාර අමාත්‍යාංශය හරහා විනාශ කළේ, මේ සභාවේ අභිමානය කියන එක ගෞරවයෙන් තමුන්නාන්සේට මතක් කරනවා. මේ ඇමැතිවරු තමන්ගේ කාර්ය භාරය කළා. ගාමිණී සිල්වා මහත්තයා කියනවා එල්ලුම් ගහ ගේන්න ඕනෑලු. ඔව්, ගේන්න ඕනෑ. එල්ලන්න ඕනෑ එවුන් මේ පළාත් සභාව ඇතුළේත් ඉන්නවාය කියලා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම තමුන්නාන්සේට මතක් කරනවා. මේ පළාත් සභාවේදී මම ඇහුවා එතුමාගෙන් විදේශ සංචාර කීයක් ගියාද කියලා. අද වනතුරු උත්තරය දුන්නේ නැහැ. එතුමා හා සමානව එතුමාටත් වැඩිය මේ පළාත් සභාවේ සල්ලි අනිසි ලෙස පාවිච්චි කළා එතුමාගේ අමාත්‍යාංශයේ නිලධාරීන් කියන එකත් මේ සභාවට කනගාටුවෙන් මතක් කරනවා.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

පවුලේ අයත් ගියා.

**ගරු එම්. නවුසර් ෆවුසි**
Hon. M. Nauzer Fowzie

ඒ ගෙවලා ගියේ.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මෙතුමාගේ Airline එකෙන් තමයි ටිකට් ගත්තේ.

**ගරු එම්. නවුසර් ෆවුසි**
Hon. M. Nauzer Fowzie

නැහැ, නැහැ. මාව නිකම් ගාව ගන්න එපා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ තත්ත්වය තුළ තමයි අපි හිටියේ. ඒ නිසා අපි ඔබතුමාට මතක් කරනවා. සමූපකාර කොමිෂන් සභාව වැය ශීර්ෂයක් ඉදිරිපත් කරලා තිබෙනවා. සමූපකාර කොමිෂන් සභාව තරම් දූෂිත කොමිෂන් සභාවක් මේ පළාත් සභා ඉතිහාසයේම තිබුණේ නැහැ. උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමාට හතර පාරක් මම කථා කරලා කිව්වා, ශ්‍රේෂ්ඨාධිකරණයෙන් දීපු නඩු තීන්දුවකට අනුව ඔහුගේ වැටුප් තලයේ පිහිටුවලා ගෙවීම් කරන්න කියලා කිව්වාම පසුගිය අවුරුදු 3 ½ ම අවුරුදු 58 ක 60 ක ඒ මනුස්සයාව රස්තියාදු කළා. විසඳුම් දුන්නේ නැහැ. කොහොමද මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ කොමිෂන් සභාව එන්නේ? එකේ සභාපති පත් කිරීමේ නෛතික බලය තිබෙන්නේ ඇමැතිවරයාට. හොරාගෙ අම්මාගෙන් පේන අහලා වැඩක් නැහැ. සමූපකාර කොමිෂන් සභාවේ සභාපති පත් කරන්නේ, අදාළ ඇමැතිවරයා. එහෙම තත්ත්වයක් තුළ කොමිෂන් සභාව අක්‍රියයි.

ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා හරහා මතක් කරන්නේ, මෙන්න මේ අවස්ථාවේ තමයි බස්නාහිර පළාත් සභාවේ මිනිස්සු එන්නේ. අපි බලාපොරොත්තු වුණා ප්‍රවාහන අමාත්‍යාංශය යටතේ ත්‍රීවීල් සඳහා ප්‍රඥප්තියක් එයි කියලා. අපි බලාපොරොත්තු වුණා, ප්‍රවාහන අමාත්‍යාංශය හරහා පාසල් දරුවෝ ප්‍රවාහනය කරන වාහන සඳහා ප්‍රඥප්තියත් එයි කියලා. අපි බලාපොරොත්තු වුණා, උදේට පෞද්ගලික අංශයේ රැකියා සඳහා කොළඹ නගරයට යන වාහන සඳහා ප්‍රඥප්තියක් එයි කියලා. මේවා ආවේ නැහැ. මේ පළාත් සභාවට මේවා ආවේ නැහැ. ආවේ වංගු විතරයි. පසුගිය කාලේ මේ පළාත් සභාව තමන්ගේ ආදායම් මාර්ගයක් කර ගත්තා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා අපි තමුන්නාන්සේට මතක් කරනවා, මේ ක්‍රමවේදය තුළ - දැන් මේ අවසන් මොහොත යන්නේ. පාංශුකූලය දෙන මොහොත. ඒ නිසා ඉතිහාසය කථා කරලා වැඩක් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා අවසාන වශයෙන් මම එකක් කියනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී පාදේ යනකොට සෙල් ලිපියක් තිබෙනවා. ඒ සෙල් ලිපියේ තිබෙනවා, මහජන මුදල් හොරකම් කළොත් ලබන ආත්මේ ඉපදෙන්නේ බල්ලෝ, කපුටෝ වෙලා කියලා. ඒ නිසා මම මතක් කරනවා මහරගම නගර සභාව ඉස්සරහා බල්ලෝ, කපුටෝ හිටියොත් මේ එක මන්ත්‍රීවරයෙක්වත් නොවෙයි. අපිත් නොවෙයි. ඒ බල්ලෝ කපුටෝ කවුද කියන එක බස්නාහිර පළාතේ ජනතාවට භාර දෙමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු උපාලි කොඩිකාර** (ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමූපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදා හැරීම් කටයුතු සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Upali Kodikara (Minister of Transport, Sports and Youth Affairs, Cultural and Arts Affairs, Cooperative Development, Food Supplies and Distribution and Rural Development)

අහගෙන ඉන්න හරිද?

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මේ අවස්ථාවේදී ගරු සභාපතිතුමා මූලාසනාරූඪ වෙනවා ඇති.

***ඊට අනුකූලව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා [ඒ.එම්. යූසුෆ් මහතා ] මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.***
*Accordingly Hon. Presiding Member [Mr. A.M. Yoosuf M.P.C] left the Chair and Hon. Chairman [Mr. Sunil Wijeratne] took the Chair.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමා, ඔබතුමාට විනාඩි 17 ක කාලයක් වෙන් වී තිබෙනවා.

[අ.භා. 03.14]

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ගරු සභාපතිතුමනි, මම විශේෂයෙන්ම සතුටු වෙනවා. පස්වැනි පළාත් සභාවේ අවසාන අයවැය විවාදයට ආණ්ඩු පක්ෂයේ විපක්ෂයේ මන්ත්‍රීවරු රාශියක් කථා කරලා මට හොඳ නරක කියා දීම සම්බන්ධයෙන්. මේ පළාත් සභාවට වැඩිම ආදායමක් ගෙන එන දෙපාර්තමේන්තුවක් තිබෙන්නේ, මගේ අමාත්‍යාංශය යටතේ. පළාත් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් කාර්යාලයෙන් අපි දස ලක්ෂ 3385 ක් මේ පළාත් සභාවට උපයලා දෙනවා. ඒ ඉපයීම තුළ තමයි මේ පළාත් සභාව අද දුවන්නේ. එතකොට මේ පළාත් සභාවෙන් මගේ අමාත්‍යාංශයට වෙන් කරලා තිබෙන මුදල් සම්බන්ධව අපේ මන්ත්‍රීවරු කථා කළා. ග්‍රාම සංවර්ධන කටයුතු සඳහා ගිය අවුරුද්දේ මට තිබෙන්නේ මිලියන 14.7 යි. මේ අවුරුද්දේ මිලියන 15.4 යි. විනෝද හා ක්‍රීඩා කටයුතු සඳහා මිලියන 14.2 යි. මේ අවුරුද්දේ මිලියන 14.7 යි. සංස්කෘතික අංශය සඳහා මිලියන 3 ½ යි. මේ අවුරුද්දේ මිලියන 3.4 ට අඩු වෙලා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මිලියන කීයද?

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

1.65 ක් තිබුණු එක -

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මිලියන කීයද?

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

3.4 ට අඩු වෙලා තිබෙනවා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

වැරැදියි.

[සභාවේ ඝෝෂා]

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

එතකොට මෝටර් රථ ප්‍රවාහන -

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්. ගණන වැරැදියි. අපව නොමඟ යවනවා නේ? සංස්කෘතික අමාත්‍යාංශයේ හරි ගණන කියන්න, කියන්න කෝ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

රීති ප්‍රශ්නයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා පොඩ්ඩක් ඉන්න.

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

මේ අනුව අපේ මහ ආණ්ඩුවට -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

පොඩ්ඩක් ඉන්න.

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

අපේ නිලධාරී මණ්ඩලයටත් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා -

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

මගේ ගෞරව ස්තූතිය පුද කර සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අර මන්ත්‍රීතුමා වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කරනවා. ඔබතුමා පොඩ්ඩක් වාඩි වෙන්න.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, එතුමා සඳහන් කළා සංස්කෘතික අමාත්‍යාංශයේ මිලියන් ප්‍රමාණයක්. ඒක අපේ තිබෙන පොතත් එක්ක වැරැදියි. හරි ප්‍රමාණය නැවතත් කියන්න කියලා ඉල්ලීමක් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක වරප්‍රසාද ප්‍රශ්නයක් නොවෙයි.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

වරප්‍රසාද ඉල්ලුවේ නැහැ. වැරැදි විධියට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොතේ කීයද තියෙන්නේ?

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මෙතුමා වැරැදියට කියන්නේ. 360 ට, 3.6 යි කිව්වා.

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

ගරු සභාපතිතුමනි -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා නිවැරැදි කරන්න.

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

ගරු සභාපතිතුමනි, අපේ ලෝකේ ගත්තාම විවිධ මනුස්ස ජාති ඉන්නවා. මේකේ සත්ත්වයෝ වර්ග ඉන්නවා. මේකේ ඉන්නවා, පූසෝ -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ලෝකේ ගැන නෙවෙයි අහන්නේ. ගාණ කීයද කියලා.

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

බල්ලෝ, බළල්ලු, බූරුවෝ. බූරුවෙකුත් ඉන්නවා. එක්සත් ජාතික පක්ෂයේ බූරුවෝ දෙන්නෙක් ඉන්නවා.

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගාණ කීයද කියලා අහන්නේ?

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

තමා මේ රටට සේවයක් කරන්න මහජන නියෝජිතයෙක් හැටියට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනයෙන් පිහිටුවා තිබෙන පළාත් සභාවට ඇවිල්ලා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට බාධා කිරීම් කරන්න එපා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ඉදිරිපත් කරන කොට -

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

වෙන්න ඕනෑ අර ඉන්න මන්ත්‍රීවරු.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්.

[සභාවේ ඝෝෂා]

එතුමා එක්සත් ජාතික පක්ෂයේ -

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

තොප්පිය දාගන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වරප්‍රසාද ප්‍රශ්නයට පස්සේ කාලය දෙන්නම්.

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ගරු සභාපතිතුමනි, මගේ කාලය ඕනෑ.

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

ඔය නැඟිටලා ඉන්නේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

දෙන්නා තමයි.

[සභාවේ ඝෝෂා]

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට කාලය දෙනවා.

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

නිරෝෂන් පාදුක්ක කියන්නේ මේ සභාවේ ඉන්න -

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි -

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, ඒක ඉල්ලා අස්කර ගන්න කියන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා සභාව නිශ්ශබ්ද වෙන්න. එතුමාට බාධා කිරීම් කරන්න එපා.

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

බූරුවෝ දෙන්න කවුද කියලා කියන්න.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, මේ පොත විසි කළා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කවුද ඒ පොත විසි කළේ? කරුණාකර -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අර ඉන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ සභාවේ එහෙම හැසිරෙන්න බැහැ.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

අපට කරන්න දෙයක් නැහැ. අපි නැඟිටිනවා.

[සභාවේ ඝෝෂා]

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

ගරු සභාපතිතුමනි, සමාවෙන්න. බූරුවොත් රටේ ඉන්නවා කියලා මම තේරුම් කරලා දුන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි එතුමා සමාව ගත්තා. ප්‍රශ්නයක් නැහැ.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

පොත සම්බන්ධන්ධව ඔබතුමා මේ සභාවේ Action එකක් ගන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ පිළිබඳව මම පස්සේ තීරණයක් ගන්නම්.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

එහෙම කියන්න බැහැ. සභාවක අභිමානයක් තිබෙනවා. ඔබතුමාගේ මන්ත්‍රීවරුන්ව ඔබතුමා හදා ගන්න.

[සභාවේ ඝෝෂා]

සභාව ඇතුළේ එහෙම කරන්න බැහැ. අපි පොත් විසි කළේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු කාමල් කුරුප්පු**
Hon. Karmal Kuruppu

හුළඟට ගියේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ සභාව ඇතුළේ කොහොමද හුළඟට පොත් යන්නේ. බොරු කියන්න එපා මන්ත්‍රීතුමා. වරදි වැඩක් කරලා මේ සභා ගර්භය තුළ බොරු ප්‍රකාශ කරන්න එපා. මන්ත්‍රීවරුන්ගේ ගෞරවය ආරක්ෂා කරන්නට ඕනෑ. කවුරු කළත් වැඩේ වැරදියි. කරුණාකරලා වාඩි වෙන්න කෝ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගහපු එක්කෙනාට සමාව ගන්න කියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සංවිධායකතුමා ඔබතුමාත් වාඩි වෙන්න. මම Action එකක් ගන්නම්. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීතුමන්ලා කරුණාකරලා සභාව නිශ්ශබ්ද වෙන්න. ඇමැතිතුමාගේ කාලය තමයි අවසන් වෙන්නේ. ගරු ඇමැතිතුමා, ඔබතුමා මේ පළාත් සභාවේ ජ්‍යෙෂ්ට ඇමැතිවරයෙක්. ඔබතුමාට

විනාඩි 17 ක කාලයක් දුන්නා. ඔබතුමාගේ පිළිතුරු කථාවේදී ඔබතුමා ප්‍රවේශම් වෙන්න ඕනෑ. ඔබතුමා වෙන වෙන ප්‍රශ්නවලට ගියාම තමයි ගැටුම් ඇති වෙන්නේ. ඔබතුමා පළාත් සභාවේ ඇමැතිවරයෙක්.

කාමල් කුරුප්පු ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා පොතක් විසි කළා. මේ සභා ගර්භය තුළ ඔබතුමා බරපතළ වැරැද්දක් කළේ. සභා ගර්භයේ මන්ත්‍රීතුමන්ලාගේ ආරක්ෂාව සම්බන්ධයෙන් මම සම්පූර්ණයෙන්ම වග කියන්න ඕනෑ. බොහොම පල්ලෙහා මට්ටමේ ක්‍රියාවක් ඔබතුමා කළේ. පොතක් හුළඟේ එන්නේ නැහැ. වැරැදි වැඩක් කරලා වැරැදි දේවල් ප්‍රකාශ කරන්න එපා. වැරැද්ද පිළිගන්න.

**ගරු කාමල් කුරුප්පු**
Hon. Karmal Kuruppu

ගැහුවේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම දැක්කා මන්ත්‍රීතුමා. ඔබතුමා පොත විසි කරනවා, මම දැක්කා. ඒ පිළිබඳව මේ සභාවෙන් සමාව ඉල්ලා සිටින්න. පොතක් නිකම් යන්නේ නැහැ නේ?

**ගරු කාමල් කුරුප්පු**
Hon. Karmal Kuruppu

මේ සභාවට බාධා කළේ මන්ත්‍රීවරුන් නැගිටලා. අපි අතින් පොතක් විසි වුණා. එහා පැත්තට ගියා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ, නැහැ. ඒක වැරැදියි.

**ගරු කාමල් කුරුප්පු**
Hon. Karmal Kuruppu

එහෙම වුණා නම් සමාවෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා සමාව ගත්තා ප්‍රශ්නය ඉවරයි. ගරු ඇමැතිතුමා ඔබතුමා කථා කරන්න.

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ගරු සභාපතිතුමනි, මම මෙතුමාගේ ත්‍රීවිල් මීටර් ප්‍රශ්නයට උත්තර දුන්නේ නැහැ කිව්වා. මෙන්න අහගන්න උත්තර ටික. මෙතුමා ප්‍රශ්නයක් අහලා තිබෙනවා, ඒකට පිළිතුර ලින්ක් කම්පැණි එකෙන් තමයි මීටර් ගන්නේ. මීටරයේ නිෂ්පාදිත නාමය ලින්ක් ලංකා. මේකේ ගාණන රුපියල් 8775 යි. මෙතුමා කිව්වා මම ගත්තේ රුපියල් 12,000 ට කියලා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් දෙන්න බැහැ. වාඩි වෙන්න.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මම අහපු ප්‍රශ්නයකට උත්තර දෙන්නේ.

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

නමුත් ගරු සභාපතිතුමනි, මේ ලින්ක් කම්පැණි එක තෝරා ගත්තේ ලංකාවේ තිබෙන ප්‍රධානම ප්‍රවෘත්ති පත්‍ර සියල්ලේ දැන්වීම් දාලා, ටෙන්ඩර් එකකින් තමයි අපි තෝරා ගත්තේ. ඊට පස්සේ මේ මීටරය සම්බන්ධව තිබෙන අලුත් දේවල් - ඉස්සෙල්ලාම ඔබතුමන්ලා අහගන්න. මේ මීටරය ඇතුළේ ප්‍රදර්ශන පුවරු 04 ක් තිබෙනවා. ගමන් කළ දුර තිබෙනවා. ගාස්තුව තිබෙනවා. නවතා තබන කාලය තිබෙනවා. වේගය තිබෙනවා. GPS තාක්ෂණය මේකේ තිබෙනවා. මේවාට නේ අපට මඩ ගහන්නේ? ඔබතුමන්ලා බලන්න.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, මම අහපු ප්‍රශ්නයකට නේ මේ උත්තර දෙන්නේ.

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

මෙතුමාගේ කට -

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මම අහපු ප්‍රශ්නයකට නේ මේ උත්තර දෙන්නේ.

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ගරු සභාපතිතුමනි, මෙතුමාට වෙලා තිබෙන්නේ කොළඹ දිස්ත්‍රික්කයේ මේ මැතිවරණයෙන් කැස්බෑව ආසනය -

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, මට High quality උත්තරයක් ගන්න එපැයි. බැහැ නේ?

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ගාමිණී සිල්වා ගරු මන්ත්‍රීතුමාත් එක්ක මෙතුමාට අභියෝගයක් තිබෙනවා. මේ මැතිවරණය පරදින නිසා. ඒ නිසා මඩ තියෙන්න එපැයි. දැන් එතුමා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නයට මම අවස්ථාවක් දෙන්නම්.

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ගරු සභාපතිතුමනි, මේ බලන්න ත්‍රීවිල් ප්‍රඥප්තිය. මෙතුමන්ලා මේවා කියවලා තියෙනවාද? කියවන්නේ නැතුව කට ගහනවා. මෝඩයෝ වගේ කට -

[සභාවේ ඝෝෂා]

දෙවියන් වහන්සේ මනුස්ස ජීවිතය දීලා තියෙන්නේ කටක් එක්ක. අතපය එක්ක. ඇස්, කන් එක්ක අංග සම්පූර්ණ ජීවිතයක් දීලා තියෙන්නේ හොඳ වැදගත් විධියට හැසිරෙන්න. වැදගත් විධියට කථා කරන්න. මේ වාගේ -

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ඔළුව.

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

මේ වාගේ නූගත් මිනිස්සු ඉන්නකොට තමයි -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔළුව දීලා. මොලේ නැහැ.

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

මේ රටේ වැඩ කරන්න බැරි - නූගත්කමට බෙහෙත් නැහැ. වෙනම දෙන්න ඕනෑ ඉන්ජෙක්ෂන් තිබෙනවා. ඉන්ජෙක්ෂන් තමයි දෙන්න ඕනෑ මෙතුමන්ලාට -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, ක්‍රීඩා භාණ්ඩ ගත්තේ ටෙන්ඩර් දාලාද කියලා අහන්න. ඇමැතිතුමා ක්‍රීඩා භාණ්ඩ ගත්තේ ටෙන්ඩර් දාලාද?

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ටොප් එක දාගන්න -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා ටොප් එක දාගනියි. ඔබතුමා ඉන්න කෝ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ක්‍රීඩා භාණ්ඩ ගත්තේ ටෙන්ඩර් දාලාද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වාඩි වෙන්න ගරු මන්ත්‍රීතුමන්ලා. එතුමාට අවස්ථාව දෙන්න.

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ඔන්න බලන්න. මෙන්න මගේ ගිය ගමන අයවැය පොත. මෙන්න මේකේ ඉස්සෙල්ලාම දාලා තියෙනවා, අපි

සමූපාකාර නිවාස හදනවා කියලා. මෙන්න බලා ගන්න. යන්න ගිහිල්ලා බලන්න. මේ ගහන ඒවා.

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔය කාගේ අමාත්‍යාංශයද?

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

චීනය, මැලේසියාව, සිංගප්පූරුව අපේ සමූපකාර සණසෙන් අපේ මහ ඇමැතිතුමාගේ දිස්ත්‍රික්කයේ කඩවත හදන අපේ සමූපකාර ගම්මානය. මෙන්න තිබෙනවා, කඩ කාමර 540 යි. ගෙවල් 1100 යි. මෙන්න බලාගන්න. මෙන්න බොරල්ලේ ගහන එක. මේවා දන්නේ නැත්නම්, මේවා ගැන හිතන්නේ -

[සභාවේ ඝෝෂා]

ඇවිල්ලා කයිවාරු ගහනවා. ගරු සභාපතිතුමනි, මම සතුටු වෙනවා, මගේ අමාත්‍යාංශය එක්ක -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මොකක්ද මේ අයවැය කථාව?

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ගරු සභාපතිතුමනි, මෙතුමාගේ තාත්තාගේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කථාව කරන්න. මෙතැන තාත්තාලා ගැන කථා කරන්න එපා. විෂයයට අදාළව කථා කරන්න.

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ගරු සභාපතිතුමනි, ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා මගෙන් ප්‍රශ්නයක් අහුවා නේ? මම උත්තර දෙන්න එපැයි. මෙතුමා අහනවා ක්‍රීඩා භාණ්ඩ ගත්තේ -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

වරප්‍රසාද ප්‍රශ්නයක්. මගේ තාත්තා ගැන කිව්වා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ තාත්තා ගැන කිව්වේ නැහැ.

[සභාවේ ඝෝෂා]

වාඩි වෙන්න ගරු මන්ත්‍රීතුමා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

සියලුම ක්‍රීඩා භාණ්ඩ අඩු ගාණට ගෙනැල්ලා හොඳම ප්‍රමිතියේ භාණ්ඩ තමයි අපි අද ළමයින්ට දීලා තියෙන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අපට මෙලෝ දෙයක් ඇහෙන්නෙත් නැහැ. මොනවා කියනවාද දන්නෙත් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට ඇහෙන්නෙත් නැහැ කියන ඒවා.

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ගරු සභාපතිතුමනි, මම මේ පළාත් සභාවට ආදායම් -

[සභාවේ ඝෝෂා]

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා, ඔබතුමාට තව විනාඩි 02 ක කාලයක් තිබෙනවා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. ඉල්ලීමක්. එතුමාගේ කථාවේ අන්තිම හරිය සිංහලත් නොවෙයි. දෙමළත් නොවෙයි. ඉංග්‍රීසිත් නොවෙයි. උර්දුද කොහේද. ඒ නිසා එහි සිංහල Translate එක අපට හැන්සාඩ්ගත කරලා ලබා දෙන්න.

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ගරු සභාපතිතුමනි, මම බස්නාහිර පළාත් සභාවට අපේ ප්‍රවාහන අධිකාරියේ ගොඩනැගිල්ලත් එක්ක තිබෙන ඉඩම අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමා -

[සභාවේ ඝෝෂා]

පොල්වත්තේ ක්‍රීඩා පාසලටත් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කාලය අවසන්. කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

කාලය දික් කරලා දෙන්න.

***අ.භා. 03.59 ට, අංක 107, 122, 123, හා 103 යන ශීර්ෂ පිළිබඳ සාකච්ඡාව අවසාන විය.***
*Discussion on the Expenditure Head Nos 107,122,123 , and 103 was concluded* at *03.59 p.m.*.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වෙන්න. ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමූපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදා හැරීම් කටයුතු හා ග්‍රාම සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ වැය ශීර්ෂ අංක 107, 122, 123 හා 103 ශීර්ෂයන් පිළිබඳ විවාදය අවසන් වෙනවා. ඒ පිළිබඳව සභාවේ බෙදීමක් තිබෙනවාද?

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, බෙදීමක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාවේ බෙදීමක් තිබෙන නිසා කරුණාකර සීනුව නාද කරන්න.

***ශීර්ෂ අංක 107 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, 61 (3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 56 යි, විරුද්ධව 13 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***
*The question that the amount indicated in the Head No.107 should be approved was put and the Committee of the Whole Council was divided under Rule No 61(3) as 56 for, 13 against and 00 decliners.*

***ශීර්ෂ අංක 122 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, 61 (3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 56 යි, විරුද්ධව 13 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***
*The question that the amount indicated in the Head No.122 should be approved was put and the Committee of the Whole Council was divided under Rule No 61(3) as 56 for, 13 against and 00 decliners.*

***ශීර්ෂ අංක 123 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, 61 (3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 56 යි, විරුද්ධව 13 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***
*The question that the amount indicated in the Head No.123 should be approved was put and the Committee of the Whole Council was divided under Rule No 61(3) as 56 for, 13 against and 00 decliners.*

***ශීර්ෂ අංක 103 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, 61 (3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 56 යි, විරුද්ධව 13 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***
*The question that the amount indicated in the Head No.103 should be approved was put and the Committee of the Whole Council was divided under Rule No 61(3) as 56 for, 13 against and 00 decliners.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, අවසාන මොහොතේ හරි අවස්ථාවක් ලබා දීම සම්බන්ධයෙන් ස්තූතියි. දැන් අවසානයි නේ? දැන් භූමදානය නේ තියෙන්නේ. කමක් නැහැ.

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

වරප්‍රසාද ප්‍රශ්නය.

[සභාවේ ඝෝෂා]

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

දැන් බැහැ. දැන් බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පුළුවන්.

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. මට නීත්‍යානුකූල නැතුව මඩ ගහපු නිසා නිරෝෂන් පාදුක්ක මැතිතුමාව සතියකට මේ සභාව තහනම් කරන්න කියලා ඉල්ලා සිටිනවා.

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, මටත් යෝජනාවක් කරන්න තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම කරන්න බැහැ. ඔබතුමා වාඩි වෙන්න.

[සභාවේ ඝෝෂා]

අපට සුළු කාලයක් තිබෙන්නේ. කරුණාකරලා වාඩි වෙන්න.

| | |
|---|---|
| **ශීර්ෂ අංක:108** | **මාර්ග සංවර්ධන, සත්ව නිෂ්පාදන හා සංවර්ධන, නිවාස හා ඉදි කිරීම්, ධීවර හා සංචාරක කටයුතු අමාත්‍යාංශය** |
| **ශීර්ෂ අංක:124** | **සත්ව නිෂ්පාදන හා සත්ව සෞඛ්‍ය දෙපාර්තමේන්තුව** |
| **ශීර්ෂ අංක:125** | **නිවාස කොමසාරිස් දෙපාර්තමේන්තුව** |
| Head No: 108 | Ministry of Road Development, Animal Production and Livestock Development, Housing and Construction, Fisheries and Tourism Affairs |
| Head No: 124 | Department of Animal Production and Animal Health |
| Head No: 125 | Department of Commissioner of Houses |

***[සංකේත කපා හැරීම]***
*[Symbolic write-off]*

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, මාර්ග සංවර්ධන, සත්ව නිෂ්පාදන හා සංවර්ධන, නිවාස හා ඉදි කිරීම්, ධීවර හා සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ වැය ශීර්ෂ අංක 108, 124 හා 125 යන වැය ශීර්ෂයන්ගෙන් රුපියල් 10/- ක මුදලක් අඩු කරන මෙන් යෝජනා කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඔබතුමාට අවස්ථාව ලබා දෙනවා එකී විවාදය ආරම්භ කිරීමට. ඔබතුමාට විනාඩි 10 ක කාලයක් වෙන් වී තිබෙනවා.

[අ.භා. 04.03]

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, පස්වන පළාත් සභාවේ අන්තිම අයවැය විවාදයේදී මාර්ග සංවර්ධන අමාත්‍යාංශය යටතේ වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලබා දීම

[ ගරු යූ.ජොර්ජ් පෙරේරා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා]

සම්බන්ධව අපේ හෘදයාංගම ස්තුතිය පුද කරනවා. ඇත්තටම මෙම වැය ශීර්ෂය කියන්නේ, බස්නාහිර පළාතේම තිබෙන සමස්ත අයවැයෙන් දෙවැනියට මුදල් වෙන් වන අමාත්‍යාංශය. ඒ කියන්නේ දෙවැනි අවස්ථාවට වැඩිම මුදල් වෙන් වෙන අමාත්‍යාංශය තමයි නිමල් ලාන්සා ගරු ඇමැතිතුමාගේ අමාත්‍යාංශය. පළමුවෙන්ම අධ්‍යාපන කටයුතුවලටත්, -

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

වැරැදියි. වැරැදියි. දෙක සෞඛ්‍යය.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

වැරැදියි. දෙක සෞඛ්‍යය.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ජ්‍යෙෂ්ට මන්ත්‍රීතුමා, දෙක සෞඛ්‍යය.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

පොඩ්ඩක් ඉන්නකෝ කියන්න. කියන එක අහගන්න. ඒ මුදල වැඩි වෙන්නේ ආර්ථික කටයුතු අමාත්‍යාංශයෙන් ලැබෙන මුදලත් එක්කම තමයි එම අමාත්‍යාංශයේ මුදල් ප්‍රමාණය වැඩි වෙන්නේ. මාර්ග පද්ධතිය කිරීම. එම නිසා තමයි ජනතාවට සමීප අමාත්‍යාංශයක් බවට අද මාර්ග අමාත්‍යාංශය පත් වෙලා තිබෙන්නේ. ඉතින් එම අමාත්‍යාංශය සම්බන්ධව වසරක් පාසා පැවැති හැම අයවැය විවාදයකදීම මම වචන ස්වල්පයක් කථා කළා. ඇත්තටම මෙම අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවේ ඉන්න මන්ත්‍රීවරයෙක් වශයෙන් අපි දකිනවා, ඉතාම කාර්ය බහුල අමාත්‍යාංශයක වුණත්, ඒ කාර්ය බහුල තත්ත්වය වෙනතක දාලා අමාත්‍යාංශ උපදේශක කාරක සභාව පවත්වනවා. අද බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයට වෙන්න පුළුවන්, කොළඹ දිස්ත්‍රික්කයට වෙන්න පුළුවන්, කළුතර දිස්ත්‍රික්කයට වෙන්න පුළුවන් ඒ ශක්තිය ලබා දීම සම්බන්ධව අපි ස්තුතිවන්ත වෙනවා.

ඒ වාගේම පළාත් සභා මාර්ග පිළිබඳව කථා කරන්න ඕනෑ ගරු සභාපතිතුමනි. බස්නාහිර පළාත් සභාවේ මෙම අමාත්‍යාංශයට අයත් පළාත් සභා පාරවල් සම්බන්ධව කථා කරනවා නම්, කවුරු මොනව කිව්වත් පළාත් සභා පාරවල් සංවර්ධනය කර තිබෙන බවත්, නමුත් ප්‍රාදේශීය සභා පාරවල්, නගර සභා පාරවල් ප්‍රතිසංස්කරණය නොවීමත්, නඩත්තු නොකිරීමත් හේතුවෙන් ඒ පාරවල් කඩා වැටීම නිසා පළාත් සභාවට ඒ අපවාදය විඳීමටත් සිදුවන බව මහජන නියෝජිතයින් වශයෙන් අපි දකිනවා. එයට හේතු ගණනාවක් තිබෙනවා. ගරු සභාපතිතුමනි, අද පළාත් සභා පාරවල්, PRD පාරවල් කඩිනම් විධියට කාපට් දමලා, කොන්ක්‍රීට් දමලා ඉතාමත් සාර්ථක විධියට ක්‍රියාත්මක වෙනවා. යම් යම් අඩුපාඩුකම් තිබෙන්න පුළුවන්. කෙසේ වුවත් ඉතාමත් කඩිනමින් කෙරුනත්, අද පළාත් පාලන ක්ෂේත්‍රයේ පාරවල් පද්ධතිය ඉතාමත් නරක තත්ත්වයට පත් වී තිබෙන බව කවුරුත් දන්නවා. එම නිසා තමයි අපි මන්ත්‍රීවරු වශයෙන් විටින් විට, උපදේශක කාරක සභාවේ වෙන්න පුළුවන්, නැත්නම් වෙනත් ආකාරයෙන් අමාත්‍යාංශ නිලධාරීන්, ගරු ඇමැතිතුමාට කියලා පළාත් සභා පාරවල් වාගේම ප්‍රාදේශීය සභාවලටත් මුදල් වෙන් කරලා, නැත්නම් යම්කිසි මුදලක් ප්‍රාදේශීය සභාවලට ලබා දීලා හරි එම මාර්ග නඩත්තු කරන්න කියලා ඉල්ලීම් ගණනාවක් මහජන නියෝජිතයන්ගෙන් විශේෂයෙන් අපගේ පළාත් සභා රැස්වීම්වලදී, නැත්නම් මහ සභා රැස්වීම්වලදී, උපදේශක සභා රැස්වීම්වලදී කිහිප වතාවක්ම ප්‍රකාශ කරනු ලැබුයේ.

ඒ වාගේම අපි කියන්න ඕනෑ. කැලණිය ආසනයේ පළාත් සභා පාරවල් සම්බන්ධයෙන් කථා කරනවා නම් කැලණිය, පිලපිටිය, ගෝනගම්පල පාර - මෙතැන නිලධාරී මහත්වරු ඉන්නවා. ගරු සභාපතිතුමා මගින් ඉල්ලීමක් කරනවා. ඒ ගෝනගම්පල පාරට කියන්නේ, ශ්‍රීමත් ඩී.බී. ජයතිලක මාවත. ශ්‍රීමත් ඩී.බී. ජයතිලක මැතිතුමා කියන්නේ ලංකාවේ නිදහස වෙනුවෙන් උර දුන් මැතිතුමෙක්. එහෙම නම් එතුමාට ගෞරවයක් විධියට තමයි ගෝනගම්පල පාර ශ්‍රීමත් ඩී.බී. ජයතිලක මාවත කියලා නම් කළේ. එම පාර අපේ බස්නාහිර පළාත් සභාවට අයිති පාරක්. කිහිප වතාවක් පළාත් සභා මුදලින් සංවර්ධනය කළා. ගංවතුර කාලයේදී එම ඇළ මාර්ගය, කුඹල් ඔය පිටාර ගැලීම නිසා යට වෙනවා. එම නිසා මම ඉල්ලීම් ගණනාවක් කළා. ගරු සභාපතිතුමා මගින් ඉල්ලා සිටින්නේ, එම ඉවුර තිබෙන බැම්බ බැඳීමත්, ඒ වාගේම එහි තිබෙන පාලම පළල් කරලා සංවර්ධනය කරනවා වාගේම පාලමත් සංවර්ධනය කරන්න කියලා ඉල්ලීම් කළා. එක

අවස්ථාවකදී එහෙම මුදල් වෙන් කරලා, ඒ පාර නිසියාකාරව නඩත්තු වුණත්, දියුණු කළත් ඒක සාර්ථක වුණේ නැති බවයි මම දකින්නේ. එම නිසා මම ඉල්ලීම් ගණනාවක් කළා. එක අවස්ථාවක ගරු ඇමැතිතුමාගේ මැදිහත්වීම තුළින් ලක්ෂ 100 ක මුදලක් මේකට වෙන් වුණා. ඒ බැම්ම බැඳීමට. කොහොම වුණත් මම දන්නේ නැහැ, කුමන නිලධාරීන්ගෙන් ඒ ලක්ෂ 100 ගියාද කියලා. ඒක ක්‍රියාත්මක වුණේ නැහැ. අපේ කැලණිය ආසනයේ ආණ්ඩු පක්ෂයේ පළාත් සභා මන්ත්‍රීවරු දෙදෙනෙක් ඉන්නවා. රෙහෙන්සිරි වරාගොඩ ගරු මන්ත්‍රීතුමාත්, සිසිර ජයකොඩි ගරු මන්ත්‍රීතුමාත්. මේ සියලුම දෙනා මේ සිද්ධිය දන්නවා. එම නිසා මම ගරු සභාපතිතුමා මගින් ගරු ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, එම ව්‍යාපෘතියට කඩිනමින් මුදලක් වෙන් කරන්න කියලා. මේ අයවැය විවාදයේදී ඒ කරුණු සිහිපත් කරනවා. ඒ විතරක් නොවෙයි, කොහොල්විල පාර. කැලණිය සිට කිරිබත්ගොඩට ඇති ළඟම පාර තමයි බස්නාහිර පළාත් සභාවට අයත් කොහොල්විල PRD පාර. ඒකත් වෙල ආශ්‍රිත ප්‍රදේශයේ ගංවතුරට යට වෙනවා.

ඒ සම්බන්ධවත් ගරු සභාපතිතුමා මාර්ගයෙන් ගරු ඇමැතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ඒ වාගේ යට වන ප්‍රදේශ මොනවා හරි ක්‍රමයකින්, කොන්ක්‍රීට් දමලා හරි නැත්නම් පාර උස්සලා කොන්ක්‍රීට් දැමීමෙන් හරි අලුත් ක්‍රමවේදයකට ඒක නඩත්තු කරන්න කියන ඉල්ලීම මම මේ වෙලාවේ කරනවා. කැලණිය රජමහ විහාරස්ථානයට, විශාල බැතිමතුන් ප්‍රමාණයක් එන අවස්ථාවක්. ඒ වාගේම ජනවාරි 25 වැනිදා කැලණි රජමහා විහාරස්ථානයේ වාර්ෂික මහ පෙරහැර පවත්වනවා. ඒ නිසා ඒ අවට තිබෙන පාරවල් ගැන තමයි මම මේ කියන්නේ. කැලණිය පන්සල අවට තිබෙන පාරවල්. කැලණි පන්සල අවට තිබෙන පාරවල් තමයි අද මේ විධියට හදලා දෙන්න කියන්නේ. නැත්නම් නවීකරණය කරලා, ප්‍රතිසංස්කරණය කරලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා. විශේෂයෙන් කැලණි රජමහ විහාරස්ථානයට කරන ගරුත්වයක් වශයෙන් ඉල්ලීමක් කරනවා. දිප්පිටිගල, හුණුපිටිය පාරත් ඊට යාබද පාරත්. මට දැන ගන්න ලැබුණා, ඒක කරගෙන යනවා කියලා. කෙසේ වෙතත් ජල සම්පාදන මණ්ඩලයෙන් මුදල් වෙන් වුණා කියලා ආරංචියක් ලැබිලා තිබෙනවා. කෙසේ වෙතත් එයත් මන්දගාමී ආකාරයට කෙරීම නිසා එම අවස්ථාවත් මඟ හැරී තිබෙනවා.

ගරු සභාපතිතුමනි, ඒ වාගේම සංචාරක ව්‍යාපාරය සම්බන්ධව කථා කරන්න ඕනෑ. ගරු ඇමැතිතුමා සිටින්නේ, සංචාරක ව්‍යාපාරය බහුලව පත්වාගෙන යන මීගමුව ප්‍රදේශයේ. සංචාරක ව්‍යාපාරය බහුල වශයෙන් පවතින ප්‍රදේශයක්. අපි සතුටු වෙනවා. අද මීගමුව ප්‍රදේශයත්, ඒ ආශ්‍රිත ප්‍රදේශයත් ඉතා අලංකාර මට්ටමින් දියුණු වෙනවා වාගේම ගරු ඇමැතිතුමාගේ සංකල්පයක් මතත්, ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගේ සංකල්පයක් මතත් ආරම්භ කරපු හැමිල්ටන් ඇවුරේ ව්‍යාපෘතිය දිගටම කරලා ඒ ශක්තිය ගම්පහ දිස්ත්‍රික්කයට ලබා දෙන්න කියලා අවංක ඉල්ලීමක් කරනවා. කොටසක් කරලා තිබෙනවා. ඒක අපි අගය කරනවා වාගේම, ඉතිරි කොටසත් කරලා මේ හැමිල්ටන් ඇළ සංවර්ධනය කරලා බෝට්ටු ප්‍රවාහන පද්ධතියට නැත්නම් භාණ්ඩ ප්‍රවාහන පද්ධතියට, මීගමුවේ ඉඳලා වෙන්න පුළුවන්. පුත්තලමේ ඉඳලා වෙන්න පුළුවන්.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

කථාව නිකම් මේ පැත්තට එන්න වාගේ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

කොළඹ දක්වා ඇති කරන්න කියන ඉල්ලීම මම කරනවා. ඒ වාගේම ගරු සභාපතිතුමනි, පශු සම්පත් විෂයය සම්බන්ධවත් අපි කථා කරන්න ඕනෑ. ගරු සභාපතිතුමනි, විනාඩියක් දෙන්න. අපි දකිනවා, මේ අමාත්‍යාංශය තුළින් එළු පැටවුන්, කිකිළි පැටවුන් නොයෙකුත් ආකාරයෙන් බෙදා හැරීම් කරනවා. අපි අගය කරනවා, ස්වයං රැකියාවක් වශයෙන් කිරීම සම්බන්ධව.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

එතුමා මේ පැත්තට එනවා. ඒකයි.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ගොඩක් එළු පැටව්, කිකිළි පැටව් බෙදනවා. මම ගරු සභාපතිතුමා මාර්ගයෙන් ගරු ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

[ ගරු යූ.ජොර්ජ් පෙරේරා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා]

ඒ පිළිබඳව පසු විපරමක් කරන්න කියලා. මේ ස්වයං රැකියාවෙන් ප්‍රතිලාභ ලබනවාද? මේ පිළිබඳව විධිමත් ආකාරයට විපරමක් කරන්න. (බාධා කිරීම්)

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා මූලාසනය අමතන්න.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. U. George Perera - Chief Opposition Whip

ඔබතුමාගේ මතය. ඕනෑ විධියක් කථා කරන්න. ඒක මට වැඩක් නැහැ. ගරු සභාපතිතුමනි, ඒක මට අවශ්‍ය නැහැ. ඔබතුමන්ලාට ඕනෑ දෙයක් කථා කරන්න පුළුවන්. ඒක ඔබතුමන්ලාගේ වැඩක්. මම කථා කළේ විෂයය සම්බන්ධව. ඒ නිසා මේ ස්වයං රැකියා සම්බන්ධව කරන ව්‍යාපෘතිවලදී නිලධාරීන් යොදවලා, උපදේශක සභාව සම්බන්ධ කරගෙන, සංචාරක ව්‍යාපාරයේ නිලධාරීන් සම්බන්ධ කරගෙන පසු විපරමක් සිදු කරන්න. විශේෂයෙන්ම මෙතුමාට හොඳ කාර්ය ශූර නිලධාරී මණ්ඩලයක් ඉන්නවා. ඒ සියලු දෙනාම සම්බන්ධ කරගෙන කරන්න කියලා ඉල්ලීමක් කරනවා. ඒ වාගේම නිවාස සම්බන්ධව අපි කථා කරන්න ඕනෑ. නිවාස සංවර්ධනයට දෙන්නේ, සොච්චම් මුදලක්. මම දැක්කා ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ අයවැය කථාව තුළින් ඒක වර්ධනය කරන්න උත්සාහ කරලා තිබෙනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ලබන පාර වැඩියෙන් හම්බ වෙනවා. මේ පැත්තෙනේ ඉන්නේ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. U. George Perera - Chief Opposition Whip

ඔබතුමා ඕනෑ දෙයක් හිතන්න. ඒක ඔබතුමාගේ සිහිනයක්. ඔබතුමා සිහියෙන් හිතන්න. ඒකට කමක් නැහැ. මම නම් ඉන්නේ එක්සත් ජාතික පක්ෂයේ. ජනතාවට නිවසක් හදා ගන්න පුළුවන් විධියට එම මුදල වැඩි කරලා ඒ ශක්තිය ලබා දෙන්න කියලා මම ඉල්ලීමක් කරනවා. එම නිසා ජනතාව සමග සමීප අමාත්‍යාංශයක් තමයි මෙතුමාට තිබෙන්නේ. එම විෂයයන් තුළින් හොඳ සේවාවක් කරන්න පුළුවන්. දැනෙන සේවාවක් කරන්න පුළුවන්. අද ගරු ඇමැතිතුමා කරලා තිබෙනවා වාගේම පසු විපරමක් කරලා, ඒ ශක්තිය ගම්පහ දිස්ත්‍රික්කයට වාගේම බස්නාහිර පළාත් සභාවට ලබා දීලා - ඉදිරි කාලයේදී අනිවාර්යයෙන්ම අපි ඡන්දයකට ඉදිරිපත් වෙනවා. ඒ කරපු දේවල් තමයි ඡන්ද ප්‍රතිඵලයෙන් ලැබෙන්නේ. කවුරු කවුරුත් කරපු දේවල්වලින්. අපි විපක්ෂයේ ඉඳලා අපට එපමණ දේවල් ලැබෙන්නේ නැහැ. සොච්චමක් ලැබිලාත් අපි ගමනක් යනවා. එක්සත් ජාතික පක්ෂයෙන් අපි ඡන්ද ගන්න ඕනෑ. ගරු ඇමැතිතුමා මන්ත්‍රීවරුන්ට දීලා -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

පක්ෂයෙන් සලකපු විධියට තමයි ලැබෙන්නේ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. U. George Perera - Chief Opposition Whip

ඒ ප්‍රතිඵලය අපි බලාගනිමු. එම නිසා එම ඉල්ලීම කරමින්, මම සියලු දෙනාගෙන්ම ඉල්ලීමක් කරනවා උපදේශක සභාව මාර්ගයෙන් හැම දෙයක්ම කරනවා වාගේම ඉදිරියේදීත් මේ අමාත්‍යාංශවලින් කරන දේවල්වලට අපවත් සම්බන්ධ කරන ගනිමින් - ගරු සභාපතිතුමා මඟින් ඉල්ලීමක් කරනවා. මම දකිනවා, ගරු ඇමැතිතුමා උදේ 06.30 වනකොට කාර්යාලයට ඇවිල්ලා ඉතාමත් කාර්යක්ෂමව වැඩ කරනවා. ඉතාම අගය කරනවා. ඒක වෙන්න ඕනෑ. නිලධාරීනුත් ඒ විධියට ඉන්න ඕනෑ. අමාත්‍යතුමා විතරක් ඉඳලා බැහැ. නිලධාරීනුත් ඒකට ලැහැස්ති වෙන්න ඕනෑ. සැලැස්මකට අනුව වැඩ කරන්න ඕනෑ. ඒ දේ වෙන්න ඕනෑ. එහෙම නම් ඒ දේ කරන්න කියන ඉල්ලීම කරමින් මෙම අවස්ථාව ලබා දීම සම්බන්ධව මගේ හෘදයාංගම ස්තූතිය පුද කරමින් මම නිහඬ වෙනවා.

[අ.භා. 04.15]

**ගරු ප්‍රදීප් උඳුගොඩ**
Hon. Pradeep Undugoda

ගරු සභාපතිතුමනි, ශීර්ෂ අංක 108, 124 හා 125 යටතේ බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන, සත්ව නිෂ්පාදන හා සංවර්ධන, නිවාස හා ඉදි කිරීම්, ධීවර හා සංචාරක කටයුතු අමාත්‍යාංශය යටතේ පස්වන පළාත් සභාවේ අවසන් අයවැය ප්‍රකාශය තුළ වචන කිහිපයක් කථා කිරීමට ලැබීම මා ලද භාග්‍යයක් කොට සලකනවා. ඇත්තෙන්ම අප බස්නාහිර

පළාත් සභාවේ අමාත්‍යවරුන්, අමාත්‍යාංශ පිළිබඳව සැලකීමේදී, අපේ නිමල් ලාන්සා ගරු ඇමැතිතුමාගේ අමාත්‍යාංශය පිළිබඳව අපි කථා කරන්නේ, මහත් අභිමානයෙන්. අපි බස්නාහිර පළාත් සභාව හැටියටත්, මේ පළාත් සභාව තුළ එතුමාට අයිති සියලුම අමාත්‍යාංශ යටතේ පසුගිය වර්ෂ 4 ½ ක් වැනි කාලසීමාවක් තුළ දැක්කේ යහපත් ප්‍රතිරූපයක්. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් පමණක් නොවෙයි, විපක්ෂයේ මන්ත්‍රීවරුන් හැටියටත් එතුමාගේ අමාත්‍යාංශ කාර්ය භාරය පිළිඳව සෑම මන්ත්‍රීවරයෙක්ම පැසසුමෙන් කටයුතු කරපු, කථා කරපු අමාත්‍යාංශ කිහිපයක අමාත්‍යවරයෙක් හැටියට, අපි ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු විධියට ඉතාමත් අභිමානයෙන් එතුමාගේ අමාත්‍යාංශය ගැන කථා කරනවා. අපි දකිනවා එතුමාට ලබා දීලා තිබෙන අමාත්‍යාංශ පිළිබඳව සැලකීමේදී මාර්ග සංවර්ධනය කියන්නේ රටක ආර්ථික සංවර්ධනයේ ප්‍රතිරූපය. අපි රටක් හැටියට සංවර්ධනය වනකොට රටේ තිබෙන මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම ඒ රටේ ආර්ථික සංවර්ධනයට ඉතාමත් ඉවහල් වෙනවා. අපේ නිමල් ලාන්සා ගරු ඇමැතිතුමා එතුමාගේ අමාත්‍යාංශය මෙහෙයවීමේදී අනෙකුත් සියලුම නිලධාරීන්ට ආදර්ශවත් වෙමින්, ඒ වාගේම පක්ෂ විපක්ෂ භේදයකින් තොරව මේ රට සංවර්ධනය කිරීමේ ක්‍රියාදාමය සඳහා ඉතාමත් කැපවීමෙන් කටයුතු කරන අමාත්‍යවරයෙක්. අපේ අතිගරු ජනාධිපතිතුමාගේ 2005 වර්ෂයේ මහින්ද චින්තන ප්‍රතිපත්ති මාලාවට අනුව එහි 65 වැනි පිටුවේ සඳහන් වෙනවා,

*"මාගේ අභිප්‍රාය වන්නේ රටේ ජනතාව සඳහා දියුණු මාර්ග පද්ධතියක් හා තෘප්තිමත් වූ ප්‍රවාහන සේවයක් ලබා දීමයි."*

ඇත්තෙන්ම අපි එක්සත් ජනතා නිදහස් සන්ධානය විධියට මේ රට ත්‍රස්තවාදයෙන් නිදහස් කරලා, මේ රටට සාමය ලබා දුන්නු රජයක් හැටියටත් මේ රට සංවර්ධනය කිරීමේ අභියෝගයටත් මුහුණ දීලා තිබෙනවා. අපි රටක් නිදහස් කරගත්තු පමණින්ම ඒ නිදහසේ ප්‍රතිලාභ රටේ ජනතාවට හම්බ වෙන්නේ නැහැ. මේ රටේ නිදහසේ නියම ප්‍රතිලාභ ලබන්නට නම්, මේ රට සංවර්ධනය කිරීමේ අභියෝගය අපි ජය ගන්නට ඕනෑ. මේ රට සංවර්ධනය කිරීමේ අභියෝගය ජය ගන්නට පුළුවන්, කාර්යශූර ඒ ක්‍රියාදාමයන්ට කැප වුණු පිරිසක් මේ රට පාලනය කරන්නට ඕනෑ. බස්නාහිර පළාත් සභාව හැටියට නිමල් ලාන්සා ගරු ඇමැතිතුමා ගැන අපි අභිමානයෙන් කථා කරන්නේ, මේ රට නිවැරැදි සංවර්ධන ක්‍රියාදාමය සඳහා යොමු කරනවකොට ඒ නිවැරැදි සංවර්ධන ක්‍රියාදාමය සඳහා කැප වෙලා වැඩ කරන අමාත්‍යවරයෙක් හැටියට අපි ඇත්තටම සන්තෝෂයට පත් වෙන්නට ඕනෑ. එතුමා කරනු ලබන සියලුම ක්‍රියාදාමයන්වල ප්‍රතිලාභ ලබන්නේ, අහිංසක දුප්පත් ජනතාව. අද අපි දකිනවා, මේ රටේ මාර්ග පද්ධතිය සංවර්ධනය වනකොට, අපේ තිබෙන දැනුම ලබා ගැනීමේ ඒ වාගේම වෙළඳ පොළ සමග දුරස්ථ භාවය අවම වෙනවා. අපි දකිනවා, අප රට අවට තිබෙන අනෙකුත් රටවල් ගැන සංසන්දනය කරනකොට දියුණු වෙමින් පවතින රටක් හැටියට අපි අනෙකුත් රටවල්වල ආදර්ශය ලබා ගන්නට ඕනෑ. සිංගප්පූරුව, මැලේසියාව වැනි රටවල් ගැන අපි සොයා බලනකොට මුලින් මේ රටවල් දියුණු කළේ, තමන්ගේ රටේ තිබෙන මාර්ග පද්ධතිය. අද අපි දියුණු වෙමින් පවතින රටක් හැටියට, සීඝ්‍රයෙන් සංවර්ධනය වන රටක් හැටියට අපේ මාර්ග පද්ධතිය විශාල ලෙස සංවර්ධනය වෙලා තිබෙනවා. ඒ නිසා අපි දකිනවා පසුගිය කාල සීමා ඇතුළත අපේ නිමල් ලාන්සා ගරු ඇමැතිතුමා තමන්ගේ තිබෙන මුදල් ප්‍රමාණය පමණක් නොවෙයි, මධ්‍යම රජයෙන් ගන්න පුළුවන් හැම මුදලක්ම ලබාගෙන අපේ පළාත් සභාවේ අභිමානය රකිමින්, මේ පළාත් සභාව තුළින් ක්‍රියාත්මක කරන්න පුළුවන් උපරිම ශක්තිය යොදවලා මේ රටේ සංවර්ධනයට දායක වෙලා තිබෙනවා. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ රන් අරුණ, සපිරි ගමක සුපිරි රටක් යන තේමාවන් යටතේ නිම වුණු සියලුම ව්‍යාපෘති සාර්ථකව නිම කරන්න පුළුවන් ශක්තිය එතුමාට තිබුණා. එතුමා පළාත් සභාව තුළින් ක්‍රියාත්මක වන ව්‍යාපෘති පමණක් නොවෙයි, මේ රටේ සංවර්ධනය සඳහා කළ හැකි මධ්‍යම රජයද, පළාත් සභාවද, පළාත් පාලන ආයතනයද යන්න පිළිබඳව හොයලා බැලුවේ නැහැ. එතුමා හැමදාම බැලුවේ අපි රටක් හැටියට ඉදිරියට යනකොට රටේ සංවර්ධනයට තමාට දායක වෙන්න පුළුවන් නම්, ඒ දායක වෙන්න පුළුවන් කුමන ක්‍රියාදාමයන් තුළදීද යන්න විතරයි. එතුමා හැමදාම තමන්ගේ රට ගැන හිතපු අමාත්‍යවරයෙක් හැටියට අපි අද සන්තෝෂයට පත් වෙන්නට ඕනෑ.

මට මතකයි, 2012 වර්ෂයේ එතුමාගේ ව්‍යාපෘති ඉටු කිරීමේ භෞතික ප්‍රගතිය 93% යි. මා හිතනවා, එතුමා 93% ක භෞතික ප්‍රගතියක් ලබා ගන්නට පුළුවන් ශක්තියක් තිබෙන කාර්ය ශූර අමාත්‍යවරයෙක් බව. ඒ වාගේම තමයි රටක් සංවර්ධනය වනකොට, රටක් සංවර්ධනය කරා ඉදිරියට යනකොට මෙතුමාගේ ආයතනයේ තිබෙන ව්‍යූහය

**[** ගරු ප්‍රදීප් උඳුගොඩ]

වෙනස් කිරීමේ අවශ්‍යතාවයන් ඇති වෙනවා. එතුමා හැමදාම බැලුවේ, මට මීට වැඩිය වැඩි වැඩ ප්‍රමාණයක් කරන්නට පුළුවන් නම් මගේ ආයතනයේ තිබෙන ඒ ව්‍යුහය වෙනස් කරලා හරි, ඒ ආයතනයේ තිබෙන ප්‍රඥප්තිය සංශෝධනය කරලා හරි කරන්නට තිබෙන වැඩ ප්‍රමාණය වැඩියෙන් කිරීමේ විශ්වාසය එතුමාට තිබුණා. ඒ නිසා එතුමාගේ අධිකාරියේ තිබෙන ප්‍රඥප්ති එතුමා වෙනස් කරන්නට අද වැඩ කටයුතු ආරම්භ කරලා තිබෙනවා. එතුමා ප්‍රඥප්තිය වෙනස් කරලා, මේ රටේ සංවර්ධනයට තමාගේ අමාත්‍යාංශය තුළින් කරන්නට පුළුවන් දායකත්වය පුළුල් කරලා එතුමා උපරිම දායකත්වයක් ලබා දෙන්නට අද කටයුතු කරලා තිබෙනවා. ඒ නිසා පසුගිය කාල සීමාව තුළ එතුමා ඉටු කළ කාර්ය භාරයන් මම සංඛ්‍යාත්මක වශයෙන් ඉදිරිපත් කරන්නට යන්නේ නැහැ. එතුමා පසුගිය වර්ෂය තුළ ඉතාමත් විශිෂ්ට සේවාවක් කරපු අමාත්‍යවරයෙක් හැටියටත්, ඒ වාගේම මම අවිවාදයෙන් මතක් කරන්නට ඕනෑ, එතුමා වටා ඒකාරාශී වෙලා තිබෙන එතුමාගේ කාර්ය මණ්ඩලය පිළිබඳව. එතුමාගේ කාර්ය මණ්ඩලය ගැන කථා නොකළොත් මා ඇත්තෙන්ම කුහක මන්ත්‍රීවරයෙක් වෙනවා. මොකද, අපේ අවශ්‍යතාවයන් ඉෂ්ට කර ගැනීමට එතුමාගේ අමාත්‍යාංශය තුළට යනකොට ඉතාමත් සහෝදරත්වයෙන්, ඉතාමත් කාර්ය ශූරව අපගේ අවශ්‍යතාවයන් ඉෂ්ට කර දෙන්නට පෙළඹුණු හොඳ නිලධාරී මණ්ඩලයක් එතුමාට ඉන්නවා. ඒ නිසා මා දීර්ඝ වශයෙන් කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. මා දකිනවා, එතුමාගේ නායකත්වය වටා ගොඩ නැගුණු ඒ නිලධාරී මණ්ඩලය එතුමා මෙහෙය වන්නේ, ඉතාමත් කාර්ය ශූර විධියට. පළාත් සභාව තුළ ඒ කළ කාර්ය භාරයට වඩා ඉදිරියට ගොස් මේ රටේ සංවර්ධනය වෙනුවෙන් තවත් ශක්තිමත්ව, කාර්ය ශූරව මේ රටේ අනාගතය වෙනුවෙන් වැඩ කරන්න පුළුවන් ශක්තිය, ධෛර්ය, වාසනාව එතුමාට ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ඔබ සැමට ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී සුමිත් විජයමුණි ද සොයිසා ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ වෙනවා ඇති.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, සුමිත් විජයමුණිද සොයිසා ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.***

*Accordingly the Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Sumith Wijayamuni de Soysa M.P.C took the Chair*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මීළඟට එම්.එම්.එම්. අම්ජාඩ් ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව. ඔබතුමාට විනාඩි 10 ක කාලයක් වෙන්ව තිබෙනවා.

[අ.භා. 04.26]

**ගරු එම්.එම්.එම්. අම්ජාඩ්**
Hon. M.M.M. Amjad

ස්තුතියි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ශීර්ෂ අංක 108, 124 හා 125 යටතේ බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන, සත්ත්ව නිෂ්පාදන, නිවාස හා ඉදි කිරීම්, ධීවර හා සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශය යටතේ මට කථා කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව මා මේ අවස්ථාවේදී සන්තෝෂ වෙනවා. පස්වන පළාත් සභාවේ අවසාන මුදල් ප්‍රකාශය තුළ මම ඉතාමත්ම සන්තෝෂ වෙනවා. බස්නාහිර පළාත් සභාවේ කීර්ති නාමය පරදවමින් වයඹ පළාත් සභාවේත්, සබරගමුව පළාත් සභාවේත් මාර්ග සංවර්ධනය බස්නාහිර පළාත් සභාව හරහා කරන්නට මූලිකත්වය ගත්තු අමාත්‍යාංශයක් වශයෙන් මාර්ග සංවර්ධන අමාත්‍යාංශය තුළ කරන ලද මෙහෙවර පිළිබඳව කථා කරනකොට අපට ආඩම්බර වෙන්න පුළුවන්.

බස්නාහිර පළාත් සභාවේ C සහ D පන්තියේ මාර්ග කිලෝ මීටර් 1953 ක් තිබෙනවා. බස්නාහිර පළාත් සභාව තුළ භූමි ප්‍රමාණය ගත්තා නම් වර්ග කිලෝ මීටර් 3782 කට ආසන්න සංඛ්‍යාවක් වනකොට අපට පේන එක්තරා කරුණක් තිබෙනවා. හැම වර්ග කිලෝ මීටර් දෙකකටම බස්නාහිර පළාත් සභාවේ C පන්තියේ හෝ D පන්තියේ මාර්ග කිලෝ මීටරයක් ආවරණය වෙනවා කියන එක සන්තෝෂයෙන් මතක් කරන්න කැමැතියි. එතකොට මේ වර්ග කිලෝ මීටර් තුන්දහස් හත්සිය අසූ ගණනෙන් අපේ පළාත්බද මාර්ග පද්ධතිය කිලෝ මීටර් 1953 ක් වනකොට අපට සන්තෝෂ වෙන්න පුළුවන්, පස්වන පළාත් සභාවේ ආයු කාලය අවසන් වනකොට මේ සියලු මාර්ග පද්ධතීන් කාපට් වෙලා ජනතාවට ප්‍රයෝජනවත් විධියට, ජනතාවට ඵලදායී විධියට, අපට මේ මාර්ග පාවිච්චි කරන්න පුළුවන් හැකියාව ඇති වන විධියට මාර්ග කාපට් කරන්න පුළුවන් තත්ත්වයක් උදා වෙලා තිබෙනවා. මේ වාගේ ව්‍යාපෘති ක්‍රියාත්මක කරනකොට අපි දැක්කා රන් අරුණ 1, රන් අරුණ 2 ඒ ව්‍යාපෘති තුළින් පසුගිය කාල වකවානුව තුළ කිලෝ මීටර් 803 ක ප්‍රමාණයක් කාපට් කළා.

ඒ වාගේම රන් අරුණ 3 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්නට, බල ගන්වන්නට අද වනකොට කටයුතු සූදානම් කරලා තිබෙනවා. ඒ තුළින් කිලෝ මීටර් 433 ක ප්‍රමාණයක් කාපට් වෙනවා. මම හිතන්නේ, සමස්තයක් වශයෙන් රන් අරුණ තුළ අපේ C සහ D පන්තියේ මාර්ග කිලෝ මීටර් 1236 ක් කාපට් වෙලා අවසන් වෙනවා. ඒ වාගේම සුපිරි ගමක් - සපිරි රටක් වැඩ සටහන යටතේ අපට පුළුවන් වුණා පසුගිය කාල වකවානුව තුළ කිලෝ මීටර් 682 ක ප්‍රමාණයක් කාපට් කරන්න. ඒ නිසා සන්තෝෂයෙන් කියන්න පුළුවන්. අපේ ප්‍රදීප් උඳුගොඩ ගරු මන්ත්‍රීතුමාත් ප්‍රකාශ කළා වාගේ, මේ සඳහා නායකත්වය දුන්නු බස්නාහිර පළාතේ මාර්ග අමාත්‍ය ගරු නිමල් ලාන්සා මැතිතුමාගේ නායකත්වය මට මතක් වෙනවා. ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ හිටපු ඇමැතිතුමාගේ නායකත්වයට, ඒ අඩුව මැකීමට ඒ පරපුරෙන් බිහි වුණු නායකයෙක් වශයෙන් අපට ගම්පහ දිස්ත්‍රික්කයෙන් නිර්භීත, එඩිතර යුග පුරුෂයෙක් ලෙස නිමල් ලාන්සා ගරු ඇමැතිතුමා ලැබිලා තිබෙනවා කියන එක මේ සභාවේදී මම සන්තෝෂයෙන් මතක් කරන්න කැමැතියි. ඒ නිසා අපි දකිනවා, අපේ බස්නාහිර පළාත් සභාවේ මාර්ග මේ ආකාරයෙන් කඩිනම් විධියට, වැදගත් විධියට කාපට් වනකොට මේ සඳහා නායකත්වය දුන්නු පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියේ නිලධාරීන්ටත් මේ අවස්ථාවේ ප්‍රශංසා කරන්න ඕනෑ.

ඒ අයගේ කැප වීම තුළ, විශේෂයෙන්ම සාමාන්‍යාධිකාරීතුමා, සභාපතිතුමා, ප්‍රධාන ඉංජිනේරු ඇතුළු සියලු දෙනාගේම කැපවීමට සෘජු නායකත්වය දුන්නු නිමල් ලාන්සා ගරු ඇමැතිතුමා තුළ තිබුණු මහ පෙන්වීම මත අපි ලබා ගත්තු ජයග්‍රහණය මම හිතන්නේ, බස්නාහිර පළාත් සභාවේ අද අපට සන්තෝෂයෙන් මතක් කරන්න පුළුවන්. අපි හන්දියක්, හන්දියක් ගාණේම ගියාම, හැම වටරවුමක් ගාණේම ගියාම අපේ පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියේ දැවැන්ත ව්‍යාපෘතිවල සාර්ථකත්වය පෙනෙනවා. හැම පාරක්ම කාපට් වෙලා තිබෙනවා. හැම ගමක්ම නගරයට ළඟා වනකොට අපේ පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියේ මාර්ග තුළින් ඒ ලබපු ජයග්‍රහණයන් අපි භුක්ති විඳිනවාය කියන එක මේ අවස්ථාවේදී සන්තෝෂයෙන් කියන්න පුළුවන්. ඒ වාගේම පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය තමන්ගේ මාර්ග පමණක් සංවර්ධනය කිරීමට විතරක් සීමා වුණේ නැහැයි කියන එකත් මම මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි. පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය හරහා ශාරීරික සුවතා ස්ථාන ඉදි කළා. මාතෘ සායන ස්ථාන ඉදි කළා. දිවි නැගුම සති පොළවල් නිර්මාණය කළා. හැමිල්ටන් ඇළ මාස තුනක් වැනි කෙටි කාලයක් තුළ රමණීය ඇළක් ලෙස නිර්මාණය කරලා සංචාරක පුරවරය ආකර්ෂණය කරන්න පුළුවන් තත්ත්වයට පත් කළා කියන එක කියන්න පුළුවන්. ඒ වාගේම පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය සඳහා යන්ත්‍රෝපාගාර ආරම්භ කරලා, ඇස්පෝර්ට් ප්ලාන්ට් ආරම්භ කරලා මම හිතන්නේ අපට ආදායම් මාර්ග උපදවන්න පුළුවන් තත්ත්වයට පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය ප්‍රාණවත් කළා කියන එකත් මේ අවස්ථාවේ සන්තෝෂයෙන් කියන්න කැමැතියි. ඒ නිසා අපි දකිනවා, බස්නාහිර පළාත් සභාවේ මාර්ග සංවර්ධනය වනකොට ඒවාට නායකත්වය දීලා, මම හිතන්නේ සබරගමුව පළාත් සභාව, වයඹ පළාත් සභාව වැනි පළාත්වල මාර්ග පවා සංවර්ධනය කරන්න අපට සෘජු නායකත්වයක් දුන්නු මේ මාර්ග සංවර්ධන අධිකාරිය පිළිබඳව සන්තෝෂ වෙන්න පුළුවන්.

ඒ වාගේම අපි මාර්ග පිළිබඳව විතරක් කථා කරන්න අවශ්‍ය නැහැ. අපි මේ අවස්ථාවේ එතුමාගේ ධීවර, සංචාරක අමාත්‍යාංශය පිළිබඳවත් වචන කිහිපයක් කථා කරන්න ඕනෑ. මම බේරුවල ආසනය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් වශයෙන්, මගේ සහෝදර ගරු මන්ත්‍රී පියල් නිශාන්ත මැතිතුමාත් මේ ස්ථානයේ ඉන්නවා. අපි දැක්කා සංචාරක ව්‍යාපාරය ප්‍රාණවත් කරන්නට, සංචාරක ව්‍යාපාරය බලගන්වන්නට එතුමා බේරුවල ආසනය තුළ විශාල මෙහෙවරක් කරනවා. බේරුවල ආසනයේ සංචාරක පුරවරයක් නිර්මාණය කරන්නට, බේරුවල පමණක් නොවෙයි කළුතර ආසනය, ඒ වාගේම පානදුර ආසනය ඇතුළු කළුතර දිස්ත්‍රික්කය මෙන්ම ගම්පහ දිස්ත්‍රික්කය, කොළඹ දිස්ත්‍රික්කය කියන බස්නාහිර පළාත තුළ සංචාරකයින් ආකර්ෂණය කර ගැනීමේ නිර්මාණශිලී වැඩ කොටසක් කරපු අපේ අමාත්‍යාංශය තුළ සංචාරක අමාත්‍යාංශයේ සභාපති ක්ලෝඩ් තෝමස් මැතිතුමා, රත්නායක මහත්මයලා කරපු කැපවීමත් මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි. අපි දැක්කා, ජාත්‍යන්තර ප්‍රමිතියට අනුකූල ඉතාමත් නිර්මාණශීලී මැගසින් එකක් ගහලා, මම හිතන්නේ ඉතාම ප්‍රශංසනීය විධියට කථා කරන්න පුළුවන් නිර්මාණශිලී සංචාරක වැඩ සටහන් තිබෙනවා. ඒ වාගේම අපි දැක්කා, සංචාරක කර්මාන්තය පිළිබඳ තොරතුරු ඒකරාශී කරලා මුළු බස්නාහිර පළාත් සභාව තුළම තිබෙන සියලුම සංචාරක

**[** ගරු එම්.එම්.එම්. අම්ජාඩ්]

කාර්මාන්තවල තොරතුරු දත්ත නිර්මාණය කරලා, ඒවා Computerize කරලා Database එකක් නිර්මාණය කර තිබෙනවා. ඒ වාගේම අපි දැක්කා, හැමිල්ටන් ඇළ නිර්මාණය කරලා විදේශ සංචාරකයන් ආකර්ෂණය කරන්න පුළුවන් නිර්මාණශීලී වැඩ කොටසක් නිර්මාණය කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, අපි සියලු දේවල් මෙහෙම සංචාරක කර්මාන්තයෙන් දියත් වනකොට ධීවර අමාත්‍යාංශය තුළින් අපි ලබා ගත්තු ජයග්‍රහණයන් අපි දැක්කා.

මම මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි, පසුගිය මාස 06 කට කලින් අපට මුහුදු ව්‍යසනයක් ආපු වෙලාවක, ධීවර ජනතාව ඉතාමත් අසරණ වෙලා හිටපු මොහොතක නිමල් ලාන්සා ගරු ඇමැතිතුමා හම්බ වෙලා කිව්වා, ගරු ඇමැතිතුමනි බේරුවල ආසනයේ ධීවර ජනතාවගෙන් විශාල සංඛ්‍යාවක් මේ මුහුදු ව්‍යසනයෙන් අනාථ වෙලා තිබෙනවා. ඔවුන්ට මේ කුණාටුව නිසා සති ගණනක්, මාස ගණනක් මුහුදු යන්න බැරි තත්ත්වයක් උදා වෙලා තිබෙනවා. ඒ නිසා මේ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා අපි ඉල්ලීමක් කළා. එතුමා ක්ෂණිකව මැදිහත් වෙලා ඒ වෙලාවේම ආරක්ෂක කබායන් 250 ක් ලබා දුන්නා. මහ ආණ්ඩුවෙන් ලබා නොදුන්නු වැඩ කොටසක් පළාත් සභාව තුළින් ඉටු කෙරුණා. විශේෂයෙන් ඒ ධීවර ජනතාව කැඳවලා ඔවුන්ට ආධාර ලබා දීලා, ඒ ව්‍යසන අවස්ථාවේදී මුහුදු යන්න පුළුවන් තත්ත්වයට පත් කරන්න බස්නාහිර පළාත සභාවේ ධීවර අමාත්‍යාංශයට හැකි වුණාය කියන එක මේ අවස්ථාවේදී සන්තෝෂයෙන් කියන්න කැමැතියි. මෙන්න මේ වාගේ නිර්මාණශීලී වැඩ කොටසක් කරපු, මේ වාගේ නිර්මාණශීලී වැඩ කොටසක් කරන්න අපට ශක්තිය ධෛර්ය ලබා දුන්නු බස්නාහිර පළාත් සභාවේ සංචාරක අමාත්‍යාංශය, ධීවර අමාත්‍යාංශය, මාර්ග අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවේ මන්ත්‍රීවරයෙක් වශයෙන් අපට අභිමානයෙන්, ගෞරවයෙන් කථා කරන්න අවස්ථාවක් ලැබීම සතුටට කරුණක්.

මේ කරුණ තුළ බස්නාහිර පළාත් සභාව මේ අමාත්‍යාංශයෙන් ලැබූ ජයග්‍රහණය ගැන කථා කරනකොට විශේෂයෙන්ම සන්තෝෂ වෙන්න පුළුවන්. තෘප්තිමත් වෙන්න පුළුවන්. ඒ නිසා අපි මේ අවස්ථාවේ දකිනවා බස්නාහිර පළාත් සභාවේ මාර්ග සංවර්ධනය වෙන්න පුළුවන්, සත්ව නිෂ්පාදනය වෙන්න පුළුවන්, ධීවර වෙන්න පුළුවන්, සංචාරක වෙන්න පුළුවන් ඒ ලබපු ජයග්‍රහණය තුළ බස්නාහිර පළාත් සභාවේ ඉදිරි පිම්ම, බස්නාහිර පළාත් සභාවේ ඉදිරි අනාගතය සුහදායී දැක්මක් තුළ, විජයග්‍රාහී දැක්මක් තුළ ගමන් කරන්න පුළුවන් හැකියාව ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තුතියි.

[අ.භා. 04.37]

**ගරු විකුම් ගුණසේකර**
Hon. Wikum Gunasekara

බොහොම ස්තුතියි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මාර්ග සංවර්ධන, සත්ව නිෂ්පාදන හා සංවර්ධන, නිවාස හා ඉදි කිරීම්, ධීවර හා සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ වැය ශීර්ෂ අංක 108, 124 හා 125 පිළිබඳ විවාදයට සහභාගී වෙන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමා මාර්ගයෙන් ගරු ඇමැතිතුමාට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම මේ අමාත්‍යාංශය ගැන බොහොම සතුටින් කථා කරන්නේ. විපක්ෂ පක්ෂ වේවා. කොළඹ, ගම්පහ, කළුතර මන්ත්‍රීවරු කවුරු වුණත් යමක් කර ගත්තේ එතුමාගෙන්. ගරු ප්‍රධාන ඇමැතිතුමා වාගේම එතුමාත් අපට දැවැන්ත කාර්ය භාරයක් කරලා දුන්නා, මන්ත්‍රීවරුන්ගේ ගෞරවය රැකෙන්න. අපි විශේෂයෙන්ම එතුමා පිළිබඳව කථා කරන්න ලැබීම පිළිබඳවත් සතුටු වෙනවා. මොකද, එතුමා පුදුම විධියට ජාතික වශයෙන්ම ජනප්‍රියයි. ඒක විශේෂයෙන්ම කියන්න ඕනෑ. මොකද, හේතුව (බධා කිරීමක්) ඒ අය කරපු දේවල් ඒ අය ගෙනියයි. ඒ වුණාට අපට බොහොම සතුටුයි. ආදර්ශවත් ඇමැතිවරයෙක්. මොකද, මම විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ පොළොන්නරුව පැත්තේ ගියත් නිමල් ලාන්සා ඇමැතිතුමා කිව්වාම එතුමාව දන්නවා. ඒ වාගේම රත්නපුරේ ගියත් දන්නවා. ආණමඩුවට ගියත් දන්නවා. අපේ ප්‍රදේශයේත් එහෙම තමයි. ලාන්සා ඇමැතිතුමා කිව්වාම හැම හන්දියකම කටවුට් එකක් ගහන්න පුළුවන් විධියට එතුමා අපට වැඩ කරලා දුන්නා. සියලුම මාර්ග, ඇත්ත වශයෙන්ම පානදුර ආසනය ගත්තාම තව කිලෝ මීටරයක්වත් නැහැ කාපට් කරන්න. එතුමා සියලුම පළාත් සභා මාර්ග කාපට් කරලා දුන්නා. අපි බොහොම සතුටු වෙනවා. ඇත්තටම පොඩි ගණන් නොවෙයි, කෝටි ගණන්වලින්. එක පාරක කිලෝ මීටරයක් කාපට් කරන්න රුපියල් කෝටියක් යනවා. ඉතින් එතුමා කරලා දීලා

තිබෙනවා. ඒ නිසා ඇත්ත වශයෙන්ම බොහොම සතුටු වෙනවා, ඔබතුමා දුන් දායකත්වය පිළිබඳව.

මාර්ග සංවර්ධන අධිකාරියේ හිටපු ඉංජිනේරු මහත්මයෙක් අම්ජාඩ් ගරු මන්ත්‍රීතුමා. එතුමා ජාතික වශයෙන් තිබෙන ආයතනයක හිටපු ඉංජිනේරු මහත්මයෙක්. අපේ මාර්ග අමාත්‍යාංශය පිළිබඳව එතුමා කථා කරන හැටි පේනවාද? අපට හරි සතුටුයි. පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය යොදාගෙන කරන සේවය පිළිබඳව අපි ඉතාම සතුටු වෙනවා. ඇත්ත වශයෙන්ම අපේ පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය හරහා මම පාලම් තුනක වැඩ අවසන් කළා. අපට විශිෂ්ට සේවයක් කළා. සභාපතිතුමා, සාමාන්‍යාධිකාරීතුමා ඇතුළු විධායක ඉංජිනේරුවරු. අපේ තෙන්නකෝන්වෙල මහත්මයා ඇතුළු සියලුම විධායක ඉංජිනේරුවරු පුදුම කැප කිරීමක් කළේ. මම බොහොම සතුටු වෙනවා ඊයේ පෙරේදා මම සංගිලි පාලමක් විවෘත කළා. හරිම අමාරුයි සංගිල පාලමක් හදන්න. මොකද, අපි හමුදාවල ඉංජිනේරු අංශයේ හිටපු කට්ටිය. අපි දන්නවා සංගිලි පාලමක් හැදීම කොපමණ අමාරුද කියලා. ඒ වුණාට දවස් 1 ½ ක් ඇතුළත මට හරි සතුටුයි විධායක ඉංජිනේරු අගලවත්ත වීරසිංහ මහත්මයාද කොහේද, එතුමා ඇතුළු නිලධාරීන් පුදුම කැපවීමක් කරලා දවස් 1 ½ ක් ඇතුළතදී සම්පූර්ණ සැලැස්ම හදලා දුන්නා. සියලුම දේවල් කරලා. ඊට පස්සේ අපි ඊයේ පෙරේදා විවෘත කළා. අපි බොහොම සතුටු වෙනවා. ඒවා අභියෝග. අභියෝග භාර ගන්න අපි හැමදාම කැමැතියි. ඒ තුළ තමයි අභියෝග ජය ගත්තේ. ඒ නිලධාරීන් කරපු සේවය පිළිබඳව ඇත්ත වශයෙන්ම අපි හරිම අගය කරනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

උප සභාපතිතුමා කිව්වේ නැහැ.

**ගරු විකුම් ගුණසේකර**
Hon. Wikum Gunasekara

උප සභාපතිතුමාත් ආවා. එතුමා තමයි මාව රෝද පුටුවේ තල්ලු කරගෙන ගියේ. උප සභාපතිතුමා තමයි Wheel-chair එක උස්සගෙන ගිහිල්ලා දාගෙන තල්ලු කරගෙන ගියේ. අපේ කීර්ති කාරියවසම් ගරු මන්ත්‍රීතුමා, එතුමන්ලා ඔක්කෝම එකතු වෙලා බොහොම සාමයෙන් ඒ වැඩ කටයුතු කළා. ඇත්ත වශයෙන්ම එම වැඩ සටහන පිළිබඳව හරිම සතුටුයි. මම හරිම තෘප්තිමත්. ගිණිකොළ පාලම මේ දවස්වල හදනවා. මම හිතන්නේ දෙසැම්බර් මාසයට කලින් ඉවර කරලා දෙයි. අපට හරිම තෘප්තිමත්. මොකද, අපි මෙතුමාගේ අමාත්‍යාංශය පිළිබඳව ආශාවෙන් කථා කරන්නේ.

ඒ වාගේම විශේෂයෙන්ම කියන්න ඕනෑ නිවාස වැඩ සටහන. අපේ පැත්තේ බොහොම දුප්පත් මිනිස්සු ඉන්නවා. අගලවත්ත ඒ වාගේම හොරණ, ඉංගිරිය, බුලත්සිංහල දුප්පත් මිනිස්සු ඉන්නවා. ගෙවල් ප්‍රශ්නය විශාල ගැටළුවක් වෙලා තිබෙනවා. ඔබතුමාගේ කාලය තුළ ඔබතුමා අපට මිලියන හතරක පහක විතර නිවාස ආධාර ලබා දීලා තිබෙනවා. අපි බොහොම සතුටු වෙනවා. හැම අවුරුද්දේම මම වැඩියෙන්ම දාන්නේ නිවාස ආධාර තමයි. නිවාස ආධාර තුළ ඒ අවශ්‍යතාවය ඉෂ්ට කරලා දෙනවා. ඒ වාගේම තමයි ධීවර ප්‍රජාව. මම ඉන්නේ ධීවර ප්‍රජාව ඉන්න ප්‍රදේශයක. පානදුර සිට අලුත්ගම දක්වා ධීවර ප්‍රදේශ නියෝජනය කරමින් මුහුදුබඩ සීමාවෙන් ඉන්නේ. ඒ තුළ ධීවරයන්ට ඔබතුමා දැවැන්ත සහයෝගයක් දැක් වූවා. ඇත්ත වශයෙන්ම ඔබතුමාගේ ධීවර ප්‍රවර්ධන නිලධාරීතුමා ඇතුළු ඒ සියලුම දෙනා දුන්නු සහයෝගය පිළිබඳව මේ අවසාන කාලයේ අපේ කෘතගුණ සලකන්න ඕනෑ. ඇත්ත වශයෙන්ම ඔවුන් සමහර වෙලාවට අපෙන් බැණුම් අහනවා. ඒත් එතුමන්ලා කවදාවත් අධෛර්යමත් වෙන්නේ නැතුව අපට හුඟක් උදව් කළා. මම ඉන්නේ සංචාරක ප්‍රදේශයක. ඒ පිළිබඳව නම් මට කිසිම දෙයක් කර ගන්න බැරි වුණා. මොකද, දන්නේ නැහැ මගේ වෙලාව නරකද කියන එක පිළිබඳව ගැටළුවක් තිබෙනවා. අනෙක් ඒවා ඔක්කෝම ඔබතුමා කරලා දුන්නාට මට සංචාරක ක්ෂේත්‍රයෙන් යම් ප්‍රගතියක් කරගන්න ලැබුණේ නැහැ. මොකද, හේතුව නිලධාරීන් අපව සම්බන්ධ කරගන්න කැමැති නැති වුණාද දන්නේ නැහැ. කොහොම වුණත් මම සංචාරක ප්‍රදේශයේ ඒ දාපු යෝජනා -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඔබතුමා සුදු නැහැ. ඒකයි.

**ගරු විකුම් ගුණසේකර**
Hon. Wikum Gunasekara

සුදු නැති එක -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

ජගත් අංගගේ ඇමැතිතුමාට දුන්නා.

**ගරු විකුම් ගුණසේකර**
Hon. Wikum Gunasekara

එතුමාට දුන්නාට මට ප්‍රශ්නයක් නැහැ. අපි දෙන්නා එක ළඟ නේ ඉන්නේ? අපි සහෝදරාත්මකව ඉන්න කට්ටිය. ඔබතුමන්ලා අපට ගහන්න, ගහන්න අපි එකතු වෙනවා. අපට තියෙනවා වෙන ලෙඩක්. ඒක අපි වෙනම බලාගන්නම්. අපි දෙන්නා හරි එකමුතුයි. මොකක්ද ඔබතුමාට තියෙන ප්‍රශ්නේ? අපි දෙන්නා එක ප්‍රදේශයේ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා -

**ගරු විකුම් ගුණසේකර**
Hon. Wikum Gunasekara

සමාවෙන්න මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේවාට පිළිතුරු දුන්නේ නැත්නම් ආයිත් දෙන්න වෙන්නේ නැහැ නේ? මෙතුමන්ලා අපට එන්න දෙන්නෙත් නැති වෙන්න නේ ලැහැස්ති වෙලා ඉන්නේ. ඒ නිසා පිළිතුරු දෙන්න ඕනෑ, මේ අවසන් කාලේ. ආයිත් එන්න වෙන්නේ නැහැ. මෙතුමන්ලා කියන දේවල්වල හැටියට ඔබතුමන්ලාව දකින්නට හම්බ වෙයිද දන්නේ නැහැ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

ඇයි ඒ පැත්තේ ඇමැතිතුමාට එන්න දෙන්නේ නැත්තේ?

**ගරු විකුම් ගුණසේකර**
Hon. Wikum Gunasekara

අපි බොහොම සහෝදරත්වයෙන් ඉන්නේ. කවුද කියන්නේ? අනේ මේ නිකම් ඉන්න. අපි දෙන්නා තරම් කවුරුවත් යාළු නැහැ. ඔබතුමන්ලා මොනවද දන්නේ? අපි විරුද්ධ ඕගොල්ලන්ට විතරයි. විරුද්ධ පක්ෂයට. අපේ එහෙම දෙයක් නැහැ. ඇත්තෙන්ම අපිව ගොඩ ඇරියේ ගරු ඇමතිතුමා. ඒ වාගේම අපේ මහ ඇමතිතුමායි ඔබතුමායි අපිව ගොඩ යැව්වා. අපි බොහොම සතුටු වෙනවා. මොකද, අපි පාරක දැක්කා නම්, හැම තැනකම ගරු ඇමතිතුමා අපට මැදිහත් වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමා මට වෙනමම මිලියන 12 ක් දුන්නා. මම හරි සතුටෙන් කියනවා. රණවිරුවන් වෙනුවෙන්.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

පාර හදන්නද?

**ගරු විකුම් ගුණසේකර**
Hon. Wikum Gunasekara

මොනවා හරි කළා නේ? ඒ නිසා ඇත්ත වශයෙන්ම රණවිරුවෝ හැටියට ගරු ඇමතිතුමා වෙනුවෙන් අපේ ගෞරවයක් තිබෙනවා. එතුමා කරපු සේවය පිළිබඳව. අපි, රණවිරුවෝ ඒ පාරවල්වල රෝද පුටුවෙන් යන කොට මඩ වලවල්වල ගියේ. ඒ රණවිරු ගම්මානයේ ඇත්ත වශයෙන්ම ඔබතුමා නිසා ඔවුන්ට කිසි කරදරයක් නැතිව - බෝක්කු පද්ධතිය හදලා දීලා ඉතා විශිෂ්ට සේවයක් කළා. බොහොමත්ම ස්තූතියි ඔබතුමා ඒ කරපු දේවල්වලට. ඒ නිසා ඉදිරියටත් ඔබතුමාගේ කටයුතු සර්වප්‍රකාරයෙන්ම සාර්ථක වේවා. ඔබතුමාට - (බාධා කිරීම්)

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

සෞඛ්‍ය ඇමතිතුමාට -

**ගරු විකුම් ගුණසේකර**
Hon. Wikum Gunasekara

නැහැ. එතුමාත් එහෙම තමයි. එතුමාත් සැලකුවා. ඒක තමයි ඔබතුමාගේ දිස්ත්‍රික්කය ගත්තොත් - මම යථාර්ථය කියන්න ඕනෑ. මනාපයක් හරි දෙනවා ඔබතුමාට. ඒ තරම් ආදරෙයි ඔබතුමාට. මේ විපක්ෂයේ කට්ටියත් ඒක කියනවා. උදව් කරනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා, එතුමා දෙපා නැති රණවිරුවෙක්. කරුණාකරලා එතුමාගේ කථාවට බාධා පමුණුවන්න එපා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. U. George Perera - Chief Opposition Whip

සෞඛ්‍ය ඇමතිතුමාට පානදුරට එන්න දෙන්නේ නැහැ. වැරදියි.

**ගරු විකුම් ගුණසේකර**
Hon. Wikum Gunasekara

අපි දෙන්නා එහෙම නැහැ. අංගගේ ඇමතිතුමායි මමයි කියන්නේ, මීටර් දහයක පහළොවක දුරක ඉන්න දෙන්නා. අපි දෙන්නා පුදුම විධියට එකට දුවලා යන්නේ ගමන. අපව ඕගොල්ලන්ට පේනවා. ඔබතුමාට බොහොමත්ම ස්තුතියි. විහිළුවක් නොවෙයි. ඇත්ත වශයෙන්ම ගරු ඇමතිතුමා කරපු සේවය පිළිබඳව අපට අගයක් තිබෙනවා. එතුමා අපට ඇත්ත වශයෙන්ම ජාතික වශයෙන් හුභාක් වැදගත් කෙනෙක්. එතුමාට ජාතික තලයටම යන්න ලැබේවායි කියලා මම නවතිනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 04.47]

**ගරු ජේම්ස් ප්‍රිමිලස් කොස්තා**
Hon. James Primilus Costa

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මාර්ග සංවර්ධන, සත්ව නිෂ්පාදන හා සංවර්ධන, නිවාස හා ඉදි කිරීම්, ධීවර හා සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශය සම්බන්ධව වචන ස්වල්පයක් කථා කිරීමට මටත් අවස්ථාවක් ලබා දීම සම්බන්ධව ප්‍රථමයෙන්ම මගේ ස්තුතිය පුද කරන්න කැමැතියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම අමාත්‍යාංශය ගැන කථා කරනවා නම් ප්‍රථමයෙන්ම ඇමතිතුමා ගැන වචනයක් කියන්න කැමැතියි. මම මේ අවුරුදු දෙක තුළදී එතුමා ගැන අහලා තිබෙනවා. මම සම්බන්ධ වෙලා කිසිම දෙයක් කළේ නැහැ. නමුත් අපේ මන්ත්‍රීවරුන් පවා එතුමා යම්කිසි සේවයක් භේදයකින් තොරව කරන බවට අපට පෞද්ගලිකව කියලා තිබෙනවා. මම මේක සඳහන් කරන්නේ, මේ රට තුළදී පක්ෂ දේශපාලනය දිහා බැලුවාම එක කාලයක්, අවුරුදු 17 ක් පාලනය කරන්නේ එක පක්ෂයක්. තව කාලයක් අවුරුදු 17 ක් වෙන පක්ෂයක් පාලනය කරනවා. ඒ තුළදී සේවයක් කරද්දී පක්ෂ භේදයෙන් තොරව කරන්න ඕනෑ. නැත්නම් අපේ රට තුළදී ජනතාව දෙපැත්තකට බෙදිලා ඉන්නවා. එක කොටසකට සේවයක් වෙනවා නම්, තව කොටසකට තව අවුරුදු 17 ක් සේවයක් වෙන්නේ නැහැ. ඒ වාගේ දේවල් අදත් සිදු වෙනවා. මේ අවුරුදු දෙක තුළදී මම ඉල්ලීමක් කළා. අපට ලැබෙන ලක්ෂ 35 ක ප්‍රතිපාදන මුදල් - අපට කළ යුතු සේවාවන් ප්‍රමාණය ඉතාම මදියි කියන තර්කය මම අවුරුදු දෙකේම ඉදිරිපත් කළා. ඒක තමයි මම කියන්නේ, පක්ෂ භේදයෙන් තොරව වැඩ කරන්න ඕනෑය කියලා.

ඒ වාගේම මේ ඇමතිතුමාව වර්ණනා කළා. ඒ වාගේම මම තව දෙයක් මතක් කරන්න කැමැතියි. ඔබතුමන්ලාට මතක ඇති කොළඹ නගරයේ චෝගම් කියන මේ සමුළුව සඳහා අපේ කොළඹ නගර සභාවේ, ඒ කියන්නේ එක්සත් ජාතික පක්ෂ පාලනය තිබෙන කොළඹ නගර සභාවේ විශාල මුදලක්, කෝටි ගණනක මුදලක් වෙන් කර ගෙන මාර්ග සංවර්ධනයක් සිදු වුණා. මේ සම්බන්ධව දේශපාලන වශයෙන් විවේචනය තිබෙනවා. ඔය ඔබතුමන්ලා කියනවා වාගේ විපක්ෂ අයට මුදල් වැඩියෙන් දෙන්න එපාය කියනවා වාගේ අනික් පැත්තෙනුත් විවේචන තිබෙනවා. ආණ්ඩුවෙන් කරන මේ සමුළුවකට එක්සත් ජාතික පක්ෂ පාලනය කොළඹ නගර සභාව මෙපමණ වියදම් කළේ ඇයි කියලා. නමුත් මේ වාසිය යන්නේ ජනතාවට. කොළඹ නගරයේ බදු ගෙවන ජනතාවට. අන්න එතැන තමයි අපි ඉන්න ඕනෑ. නමුත් යූ.එන්.පී. එකෙන් කළා, ශ්‍රී ලංකා එකෙන් කළා කියන තර්කය කරන්න ගියා නම්, මේ රටේ ජනතාව තමයි පරදින්නේ. යූ.එන්.පී. අය වේවා, ශ්‍රී ලංකා අය වේවා මේ රටේ පුරවැසියා කියන ආඩම්බරයෙන් අපි වැඩ කළ යුතුයි.

ඒ වාගේම ගරු අමාත්‍යතුමා යටතේ තිබෙන නිවාස සංවර්ධන කටයුතු සම්බන්ධව කථා කරනවා නම්, අපේ කොළඹ නගරය තුළදී විශාල විධියේ බියක් අද ජනතාවට තිබෙනවා. අද ගෙවල් කඩා ගෙන යද්දී මේ මිනිස්සුන්ට හරියාකාර නිවසක් හම්බ වෙයිද කියන ප්‍රශ්නය කොළඹ ජනතාවගේ සියලු දෙනාගේම හිතේ තිබෙනවා. කොළඹ පිහිටලා තිබෙන්නේ, වතු ක්‍රමය - ඒ කියන්නේ එක වත්තකට ගියොත් ගෙවල් 30 යි. 50 යි. ඒ වාගේ බොහොම ජනාකීර්ණ විධියට ජනතාව ජීවත් වෙනවා. ඒ වාගේම පැල්පත් ගොඩාක් තිබෙනවා. මම හිතන්නේ, කොළඹ නගරය නියෝජනය කරන අපේ නවුසර් ෆවුසි ගරු මන්ත්‍රීතුමාත් දන්නවා. නමුත් මේවා සංවර්ධනය විය යුතුයි. නමුත් ජනතාවට තිබෙන බිය - ඇත්තටම මේ ඇමතිතුමාගේ පොතේ දාලා තිබෙන ෆොටෝ එකක් තිබෙනවා. මේ අත් දෙක තුළදී පොඩි නිවසක් පේන විධියට.

දැන් ළඟදී අතිගරු ජනාධිපතිතුමා විවෘත කරපු නිවාස යෝජනා ක්‍රමයෙනුත් විවේචනයක් තිබෙනවා. කුකුල් පැටව් දානවා වාගේ පොඩි නිවාස කෑල්ලක් කියන තර්කය තිබෙනවා. නමුත් අපි කියන්නේ රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමා මේ රටේ දුප්පත් ජනතාවට නිවසක් හදන්න උදව් කරපු නායකයෙක්. අද නිදහස් පක්ෂයෙනුත් ඒක කියනවා. නමුත් කොළඹ අද මොනවාද වෙන්නේ? ගෙයක් හදනවාය කියන්නේ, ඒ ජනාධිපතිතුමා හදපු ගෙවල්වලට තීන්ත ගාලා ඇමති කෙනෙක් ගිහිල්ලා විවෘත කරනවා. ඒක තමයි ගොඩක්ම වෙන්නේ. ඉතින් අපි කියන්නේ හොඳ දෙයක් කරනවා නම් ඒක හරි විධියට වෙන්න ඕනෑ. ඒ මුදල් හරියාකාරයෙන් ප්‍රයෝජනය වෙන්න ඕනෑ. ඒ ජනතාවට පක්ෂ භේදයෙන් තොරව ඒක ලැබෙන්න ඕනෑ.

ඒ වාගේම මේ අමාත්‍යාංශයේ තිබෙනවා, සත්ව නිෂ්පාදන කියන අංශයක්. ඒකේදීත් ගරු ඇමතිතුමා ගොඩාක් යෝජනා ක්‍රියාත්මක කරලා තිබෙනවා. නමුත් මම හිතන්නේ, කොළඹ නගරය වාගේ, දුප්පත් ජනතාවට ස්වයං රැකියාලාභීන්ට මේවා හම්බ වෙලා නැහැ. කුකුල් පැටව්. එළු පැටව්. මේ වාගේ පුළුවන් දේවල්. අපේ අයටත්. නගරයේ ජනතාවටත්. කොළඹ නගරය තුළදී විශාල විධියේ වැඩ සටහනක් කරන්නේ. කොළඹ නගර සභාව තුළින්. අපි කියන්නේ පළාත් සභාව තුළිනුත් යම්කිසි සේවයක් ඉටු විය යුතුයි. අපේ වීදියේ ගෙයක් කඩා ගෙන වැටෙන්න ඔන්න මෙන්න කියලා තිබෙනවා. අවුරුද්දක්, අවුරුදු දෙකක් තිස්සේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට යනවා ඒ නිවසක් හදා ගන්න.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

කොළඹ නගරය අද ගෝඨාභය මහත්තයාගේ. නගර සභාවේ යැ.

**ගරු ජේම්ස් ප්‍රිමිලස් කොස්තා**
Hon. James Primilus Costa

ඒගොල්ලෝ ෆෝම් එකක් දුන්නා, ගෘහ මූලිකයන් ආබාධිත නම් ඒගොල්ලන්ට නිවසක් හදලා දෙන්න ආණ්ඩුවෙන් පුළුනවන්කමක් තිබෙනවා කියලා. ඒ කාන්තාව අවුරුදු දෙකක් තිස්සේ ගිහිල්ලා රස්තියාදු වෙනවා. නමුත් අද වන තෙක් රුපියලක් දුන්නේ නැහැ ඒ ගේ හදා ගන්න. නමුත් මම මට පුළුවන් ආකාරයෙන් ෂීට් ටිකක් බෙදුවා. ඒ වාගේම ඒ පාරේම ජීවත් වන නිදහස් පක්ෂයට වැඩ කරපු, ඒ පැත්තේ ඉන්න ශාඛා ලේකම් කෙනෙකුගේ ගේ. ඒ වාගේ හැම තැනටම අපට පුළුවන් ආකාරයෙන් මේ පොඩි ප්‍රතිපාදනවලින් වැඩ කරන්න වෙලා තිබෙනවා. ෂීට් දෙන්න කොපමණ ලක්ෂ ගණනක් වියදම් කළත් ප්‍රමාණවත් නැහැ. එක ෂීට් එකක් අද රුපියල් දෙදාහක් වෙනවා. ඇස්බැස්ටස් ෂීට්. ෂීට් ටිකක් ඉල්ලා ගෙන ආවාම ෂීට් පහක් දීලා ප්‍රමාණවත් නැහැ. සමහර ගෙවල්වල ෂීට් 15 ක් ඉල්ලනවා. 10 ක් ඉල්ලනවා. මේවා දෙන්න අපි කැමැතියි. නමුත් අපට තිබෙන මුදලින් කළ යුතු සේවාවන් ඉතාම වැඩියි. ඒ ගැන තර්කය තමයි මම ඉදිරිපත් කරන්නේ.

ඒ වාගේම මාර්ග සංවර්ධන, සත්ව නිෂ්පාදන, නිවාස සංවර්ධන, මේ වාගේම සංචාරක කටයුතු ඇමතිතුමා ගැන වර්ණනා කළා. අද සංචාරක කටයුතු සම්බන්ධව ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු. මේ මෑතකදී කොළඹ ලොකු උද්ඝෝෂණයක් පැවැත්වුවා. සංචාරක ව්‍යාපාරය දියුණු කරනවාය කියලා ආණ්ඩුව විසින් අද කොළඹ නගරයේ විශාල ඉඩමක් පවරා ගෙන ඒ තුළදී කැසිනෝ ව්‍යාපාරය හඳුන්වලා දීමට කටයුතු කරන බවට විශාල සැකයක් සහ ප්‍රශ්නයක් තිබෙනවා. එක අතකින් කොළඹ නගරයේ මිනිස්සුන්ගේ ගෙවල් කඩන අතරේදී ඒ මිනිස්සුන්ට නිසි ආකාරයෙන් ගෙවල් නොලැබෙන බවත්, අනෙක් පැත්තෙන් විදේශ සමාගම්වලට මේ ඉඩම් පවරලා සංචාරක දියුණුව සඳහා, කැසිනෝ ව්‍යාපාරයට මේ ඉඩම් ලබා දීම සම්බන්ධව මම හිතන්නේ, පක්ෂ විපක්ෂ භේදයෙන් තොරව විශාල විරෝධතාවයක් තිබෙනවා. ඒ වාගේම -

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

අර තට්ටු නිවාස ගහන්නේ කාටද? කොළඹින් පිට අයටද?

**ගරු ජේම්ස් ප්‍රිමිලස් කොස්තා**
Hon. James Primilus Costa

කොළඹ තුළදී. ඒ වාගේම කොළඹ නගරය තුළත් ධීවර කර්මාන්තයේ යෙදෙන විශාල ධීවරයන් සංඛ්‍යාවක් ඉන්නවා. මේ කියන්නේ උතුරු කොළඹ. මම හිතන්නේ මෝදර ප්‍රදේශය සහ මට්ටක්කුලිය. ඒ වාගේ ප්‍රදේශවලින් ධීවරයෝ විශාල පිරිසක් ජීවත් වෙනවා. ඒ ප්‍රදේශ දිහා බැලුවාම ඒගොල්ලන්ටත් විශාල අඩුපාඩුකම් තිබෙනවා. ඔරු නැහැයි කියනවා. ඒගොල්ලන්ට අද වන තෙක් මම

හිතන්නේ අපේ අමාත්‍යාංශවලින් නිසි පරිදි උදව් පදව් ලැබිලා නැහැ. ඒ නිසා -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ගරු මන්ත්‍රීතුමා දීලා තිබෙනවා. මෝදරට, මට්ටක්කුලියට.

**ගරු ජේම්ස් ප්‍රිමිලස් කොස්තා**
Hon. James Primilus Costa

මම ඉතාම බැගෑපත්ව ඉල්ලා සිටින්නේ - මේ ඇමතිතුමා කරලා තිබෙන සේවය මේ පොතේ තිබෙනවා. ඇමතිවරුන්ගේ සේවාවන් තමන්ගේ පාක්ෂිකයන්ට පමණක් නොව, තමන්ට ඡන්දය දෙන, මනාපය දෙන අයට පමණක් නොව, සියලුම දෙනාටම. ඒ කියන්නේ මුළු බස්නාහිර පළාතටම පක්ෂ භේදයකින් තොරව අවශ්‍ය තැනට, අවශ්‍ය විධියට ලැබිය යුතු බව තමයි මම සඳහන් කරන්නේ. ඒ වාගේම මේ ඇමතිතුමා පක්ෂ භේදයෙන් තොරව වැඩ කළාය කියලා කිව්වා. ඒ ගැනත් මම අගය කරන්න කැමැතියි. ඒ වාගේම එතුමා දැන් කථා කළේ, හොඳ කිව්වේ ඔක්කොම ආණ්ඩු පක්ෂයේ සම්බන්ධතා තිබෙන මන්ත්‍රීවරුන්. මම කියන්නේ එහෙම නැතිව සියලු දෙනාටම එක ක්‍රමවේදයකින් මේක යා යුතුයි. එහෙම කළොත් තමයි මේ පළාත් සභාව ගැන ජනතාවට තිබෙන විශ්වාසය වැඩි වීමක් - ඒ කියන්නේ අපිත් මන්ත්‍රීවරුන් හැටියට ඉදිරියට පැවැත්වීමට නියමිත මැතිවරණයකට යන්න ඕනෑ. ඒ නිසා අපි ඇමතිතුමාට සුභ පතනවා. ඉදිරි කාලයේදීත් එතුමාට ශක්තිය, ධෛර්යය ලැබේවා. සියලු දෙනාටම වාසනාව ලැබේවා. නැවත මේ පළාත් සභාව තුළින් ජනතාවට සේවය කිරීමට ඔබ සියලු දෙනාටම සුභ පතමින්, මට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 04.55]

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

ගරු සභාපතිතුමනි, මට ප්‍රථම කථා කළ මන්ත්‍රීතුමා කොළඹ තමයි ජීවත් වෙන්නේ. මම දන්නේ නැහැ කොහොමද ඉන්නේ කියලා. දැන් එතුමාට මේ කොළඹ සංවර්ධනය පෙනිලා නැහැ. පොදු රාජ්‍ය මණ්ඩලයේ සම්මේලනය පැවැති වෙලාවේ විදේශීය රටවල්වලින් ආපු අය පුදුම වුණා ශ්‍රී ලංකාවේ දියුණුව දැකලා. අද එතුමා නිවාස ප්‍රශ්නය ගැන කථා කළා. දැන් කොළඹ නගර සභාවට -

**ගරු විකුම් ගුණසේකර**
Hon. Wikum Gunasekara

හිටියේ මුඩුක්කුවල.

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

මුඩුක්කුවල හිටියේ සියලුම දෙනා දැන් තට්ටු ගෙවල්වල ඉන්නේ.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

කුකුල් කූඩු හදලා තිබෙන්නේ. ගෙවල් නොවෙයි.

**ගරු විකුම් ගුණසේකර**
Hon. Wikum Gunasekara

ඕගොල්ලෝ හිටියේ මුඩුක්කුවල. කිසිම දෙයක් නැතිව.

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

ඊයේ පෙරෙයිදාත් තමුන්නාන්සේලාට තට්ටු නිවාස ක්‍රමයක් විවෘත කළා. ඒ නිසා මේ ජෝර්ජ් පෙරේරා සංවිධායකතුමා, ආණ්ඩු පක්ෂයට පක්ෂව ටිකක් කථා කළා. මම දන්නේ නැහැ මොකක්ද කියලා. ඒ පක්ෂයේම අනෙක් මන්ත්‍රීතුමා දැන් විරුද්ධව කථා කරනවා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

ජෝර්ජ් එන්න ළඟයි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ජෝර්ජ් ගම්පහ නේ?

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

ගම්පහ නේ. ඒ නිසා අපි සන්තෝෂ වෙනවා. ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා පහුවෙලා හරි තේරුම් අරන් තිබෙනවා. තමුන්නාන්සේත් තේරුම්

**[** ගරු සුමිත් ලාල් මෙන්ඩිස්]

ගන්න මේ රජයේ යන වැඩ පිළිවෙළ. ඒ නිසා මම ඒ ගැන වැඩිය කථා කරන්නේ නැහැ.

ඇත්ත වශයෙන්ම අපේ නිමල් ලාන්සා ඇමතිතුමා පිළිබඳව ලොකු විශ්වාසයක් අපේ රජයට තිබෙනවා. ඒ නිසා තමයි 2014 දී පැවැත්වෙන දැයට කිරුළ වැඩ සටහනේ සංවර්ධන කටයුතු සම්පූර්ණයෙන්ම ලාන්සා ඇමතිතුමාට තමයි භාර දීලා තිබෙන්නේ. අපි සන්තෝෂ වෙනවා. ඒ මොකද, රටේ මෙපමණ පළාත් සභා තිබෙද්දී, මධ්‍යම රජයේ විෂයයක් අද 2014 දැයට කිරුළ වැඩ සටහන. මේ පොත බැලුවාම පේනවා. එතුමාට භාර දීලා තිබෙනවා. අපි සන්තෝෂ වෙනවා. ඒ වාගේ පළාත් සභාවක් මේක. ඒ නිසා විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමා කොහේ ඉඳන් කථා කළාද කියලා මම දන්නේ නැහැ.

ඊළඟට, සංචාරක ව්‍යාපාරය ගැන කථා කරන කොට. මේ රටට විදේශිකයන් වැඩියෙන්ම ආපු අවුරුද්ද තමයි 2013 කියන්නේ. ඒවා සොයලා බලලා ලියලා තියා ගන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

එතුමා පොත බලලා තිබෙන්නේ එක පිටුවයි.

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

මම හිතන්නේ පොතේ එක පිටුවයි බලලා තිබෙන්නේ. මේවා බලලා ලියා ගන්න. අපි සන්තෝෂ වෙනවා. ශ්‍රී ලාංකිකයන් හැටියට හැමෝම සන්තෝෂ වෙන්න ඕනෑ. ඒ නිසා ඒවා තේරුම් අරගෙන වැඩ කරන්නය කියලා මම තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටිනවා.

ඒ වාගේම ධීවර ක්ෂේත්‍රය. ඇත්ත වශයෙන්ම එතුමා හොඳ යෝජනාවක් කරලා තිබෙනවා. මම මේකේ බැලුවා. අපේ ධීවරයන්ට වාරකන් කාලයක් එනවා. ඒ ගැන තමුන්නාන්සේලා දන්නවා. ඒ වාරකන් කාලයට අපේ ධීවරයන්ට මුහුදු යන්න බැහැ. මම කළුතර නගර සභාවේ මන්ත්‍රීවරයෙක් වෙලා හිටියා. එතකොට එක්සත් ජාතික පක්ෂයට පාලන බලය තිබුණේ. ඒ.එම්. යූසුෆ් ගරු මන්ත්‍රීතුමා දන්නවා. මම තමයි සියලුම ධීවරයන්ට වාරකන් කාලයේදී නගර සභා අරමුදලින් අරන් දුන්නේ. ඒ නිසා මෙතුමාට ඒ අදහස පහළ වෙලා තිබෙනවා. මම මේකේ දැක්කා, ධීවර කාන්තාවන්ගේ ස්වයං රැකියා වැඩ පිළිවෙළක් ආරම්භ කරන්න. හොඳ අදහසක් ඒක. වාරකන් කාලයට ධීවරයාට ආදායම නැති වන කොට තමන්ගේ පවුලේ කෙනෙක් ස්වයං රැකියාවක් ආරම්භ කරලා, ඒ මාර්ගයෙන් තමන්ගේ පවුලේ දියුණුව ඇති කර ගන්න කටයුතු කරන්න. ඒ නිසා අපි සන්තෝෂ වෙනවා. කළුතර දිස්ත්‍රික්කයේ - ඇත්ත වශයෙන්ම අපි සන්තෝෂ වෙනවා අපේ

**ගරු එම්.එම්.එම්. අම්ජාඩ්**
Hon. M.M.M. Amjad

කාන්තා විෂය භාර අමාත්‍යතුමාවත් කරලා නැහැ. වැඩේ ඒකයි.

**ගරු විකුම් ගුණසේකර**
Hon. Wikum Gunasekara

කාන්තා කටයුතු විෂය භාර අමාත්‍යතුමාටත් වැඩිය වැඩ කරලා තිබෙනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු සභානායකතුමාට අවස්ථාව සභාවේ කාලය දීර්ඝ කිරීම සඳහා.

# රීති අංක 50(6) යටතේ යෝජනාව
MOTION UNDER RULE NO : 50(6)

**ගරු සුනිල් ජයමිණි - සභානායකතුමා**
Hon. Hon. Sunil Jayamini - Leader of the House

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "*අද දින සභාවේ කටයුතු අවසන් වන තුරු කාලය දීර්ඝ කළ යුතු යැයි*" මම යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

සුමිත් ලාල් මෙන්ඩිස් ගරු මන්ත්‍රීතුමාට නැවත අවස්ථාව.

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

කළුතර දිස්ත්‍රික්කයේ මහා මාර්ග, වරාය අමාත්‍යවරු දෙන්නෙක් ඉන්නවා. ඒ නිසා අපි නිර්මල කොතලාවල

ගරු අමාත්‍යතුමාට තමයි මහා මාර්ග විෂය භාර දීලා තිබෙන්නේ. ඒ නිසා කළුතර දිස්ත්‍රික්කයේ පාරවල් ගැන අහන්න දෙයක් නැහැ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

රෝහිත අබේගුණවර්ධන?

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

එතුමා වරාය බලාගෙන ඉන්නවා. එහෙම බෙදලා දීලා තිබෙන්නේ ජනාධිපතිතුමා. නැව් ටික බලා ගෙන, වරාය බලා ගෙන හොඳ ඇමතිකමක් කර ගෙන ඉන්නවා. එතුමා සංවර්ධනයට සම්බන්ධ වෙලා තිබෙනවා. නිර්මල කොතලාවල ගරු අමාත්‍යතුමා ඇත්ත වශයෙන්ම පාරවල් පිළිබඳව හොඳට අධ්‍යයනය කරලා, කළුතර දිස්ත්‍රික්කයේ පමණක් නොවෙයි මුළු රටේම අපි යන යන තැන්වල ඒ පාරවල් ටික ජේනවා. අතිගරු ජනාධිපතිතුමාගේ ලොකු විශ්වාසයක් ඇති වෙලා තිබෙනවා. ඒ නිසා අද අධිවේගී මාර්ග ඉදි වෙලා තිබෙනවා. මේ රට විශාල සංවර්ධනයක් කරා යන මොහොතක්. ඒ නිසා අපි හැමෝම මේ පිළිබඳව සතුටු වෙන්න ඕනෑ. මේ පළාත් සභාවේ ඉන්න මන්ත්‍රීවරු හැටියට. ඒ නිසා මීළඟ පළාත් සභාවේ අපි ප්‍රාර්ථනා කරනවා සියලුම මන්ත්‍රීවරුන්ට නැවත මේ පළාත් සභාවට එන්න ලැබේවායි කියලා. ඒ නිසා විපක්ෂයේ සිටින ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාට ඇවිල්ලා අපිත් එක්ක වැඩ කරන්න ලැබේවායි කියලා ප්‍රාර්ථනා කරනවා. අද මේ පළාත් සභාවේ අපේ ලාන්සා ඇමතිතුමාගේ වැය ශීර්ෂය ගැන වචනයක් දෙකක් හරි කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

***පූර්ණ කාරක සභාව නැවත පළාත් සභා තත්ත්වයට පත් කිරීම.***
*THE PROVINCIAL COUNCIL RESUMED.*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මෙම අවස්ථාවේදී පූර්ණ කාරක සභාව පළාත් සභාව බවට පත් වෙනවා.

*ඊට අනුකූලව අ.භා. **05.03** ට පූර්ණ කාරක සභාව පළාත් සභාව බවට පත් විය.*
*Accordingly at 05.03 p.m. the Provincial Council resolved itself in to a committee of the whole Council.*

**[පූර්ණ කාරක සභාවේ ප්‍රගතිය ]**
[Progress of the whole council]

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

2014 වසර වෙනුවෙන් පවත්වනු ලබන අයවැය විවාදයේ තුන්වන දවස වන අද දිනයේ පූර්ව භාගයේ පැවැත්වූයේ, අංක 105, 116,117, 118 හා 119 යන සෞඛ්‍ය අමාත්‍යාංශයට අදාළ වැය ශීර්ෂයන් පිළිබඳ විවාදයයි. එකී විවාදය සඳහා ගරු මන්ත්‍රීවරුන් 14 දෙනෙකු සහභාගී වූ අතර, විවාදය අවසානයේ සභාවේ බෙදීමක් මතු වූ බැවින්, ඡන්ද විමසීමේදී යෝජනාවට පක්ෂව ඡන්ද 53 ක් ද, විපක්ෂව ඡන්ද 16 ක් ද ලැබුණු අතර, වැඩි ඡන්ද 37 කින් ශීර්ෂ අංක 105, 116,117, 118 හා 119 ට අදාළව සෞඛ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂයන් සභා සම්මත වූ බව පවසනවා.

ඉන් අනතුරුව පැවතියේ ප්‍රවාහන අමාත්‍යාංශයට අදාළ ශීර්ෂ අංක 107, 122, 123 හා 103 යන වැය ශීර්ෂයන් පිළිබඳ විවාදයයි. එම විවාදය අවසානයේදී ද නැවතත් බෙදීමක් ඉල්ලා සිටි බැවින්, එහිදී පැවති ඡන්ද විමසීමේදී එකී වැය ශීර්ෂයන්ට පක්ෂව ඡන්ද 56 ක් ද, විපක්ෂව ඡන්ද 13 ක් ද ලැබුණු අතර, වැඩි ඡන්ද 43 කින් ප්‍රවාහන අමාත්‍යාංශයට අදාළ ශීර්ෂ අංක 107, 122, 123 හා 103 යන වැය ශීර්ෂයන් සභා සම්මත විය. අනතුරුව, මාර්ග සංවර්ධන අමාත්‍යාංශයට අදාළ ශීර්ෂ අංක 108, 124 හා 125 යන වැය ශීර්ෂයන් පිළිබඳ විවාදය ආරම්භ විය. මෙදින එකී වැය ශීර්ෂයන් පිළිබඳ විවාදය අවසන් නොවුණු අතර, යළිත් හෙට දින පෙරවරුවේ යළි ආරම්භ කිරීමට නියමිත බව අද දවසේ පූර්ණ කාරක සභාවේ ප්‍රගතිය වශයෙන් සඳහන් කරනවා.

# කල් තැබීම
# ADJOURNMENT

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

*"දැන් මම මෙම සභාව කල් තබනවා."*

*ඊට අනුකූලව පළාත් සභාව අ.භා. **05.06** ට, **2013** දෙසැම්බර් මස **06** වන දින පූ.භා. **09.00** වන තෙක් කල් ගියේය.*
*Accordingly, the Provincial Council was adjourned at 05.06 p.m till 09.00 a.m, on 06.12.2013.*